
කොවිඩ් ව්‍යාප්තිය




★

# දිනමිණ


The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ මැදින් පුර තියවක ලත් කුජ දින | කාණ්ඩය 112 | පත්‍රය 77 | පිටු 28 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මාර්තු 16 අඟහරුවාදා





සතියේ තුහුහ මයියයලේ
බද්දර මල්ල
අද පත්‍රය සමග

## පාස්කු කොමිසමේ නිර්දේශ අප්‍රේල් 21ට පෙර වහාම ක්‍රියාත්මක කරන්න

ජනපති නියෝග කර ඇති බව ඇමැති ජීඑල් කියයි

රක්ෂණ ශ්‍රියන්ත

පාස්කු කොමිසමේ නිර්දේශ නීතිමය රාමුව තුළ කාටත් දැකගත හැකි ලෙස අප්‍රේල් 21 වැනිදාට පෙර වහාම ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නියෝග කර ඇති බව අධ්‍යාපන ඇමැති, මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා පැවසීය.

පිට 06



## ලලිත් වීරතුංග අනූෂ පැල්පිට සිල් රෙදි නඩුවෙන් නිදහස්

තීන්දුව කියවා දී නඩුව අවසන් කරයි

පිට 06





බංග්ලාදේශ නිදහස් සැමරුමට අගමැතිට ආරාධනා පිට 06

සියලු පාසල් අප්‍රේල් 19 දා ආරම්භ කරනවා

අධ්‍යාපන ඇමැති

පිට 06

කලාකරුවන්ට පිදෙන 'ප්‍රේක්ෂා'

රක්ෂණ හිමිකම් ඔප්පු ප්‍රදානය අගමැති ප්‍රධානත්වයෙන් අද පිට 06

සජබ ආණ්ඩුවක් සාදා 2025 සංවත්සරය සමරනවා පිට 06



## සමෘද්ධිලාභීන් ව්‍යවසායකයන් කරන වැඩපිළිවෙළක් අවශ්‍යයි



මහින්ද අලුත්ගෙදර

සමෘද්ධිලාභීන් ණය සහ ආධාර මත පමණක් ජීවත් වන පිරිසක් බවට පත් නොකර ව්‍යවසායකයන් ලෙස ස්වයංව නැගී සිටීමේ හැකියාව ඇති පිරිසක් බවට පත් කිරීමේ ක්‍රමවේදයක් අවශ්‍ය බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රකාශ කරයි. පිට 06

2016-2019 කාලයේ රිය අනතුරුවලින් 14,317ක් මිය ගිහින්

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

පිට 06

## මහජන චීන බැංකුවෙන් රුපියල් කෝටි 30,000ක්

මහින්ද අලුත්ගෙදර

ශ්‍රී ලංකාවේ අවශ්‍යතාව අනුව ලබා ගත හැකි පරිදි රුපියල් කෝටි 30,000ක මුදලක් මහජන චීන බැංකුව විසින් අනුමත කර තිබේ. පිට 06

එජා මානව හිමිකම් කවුන්සිලයේදී ශ්‍රී ලංකාවට අසාධාරණයක් කරන්නේ නැහැ

ඉන්දියාව සහතික වෙයි පිට 06

## ජාතික ලේඛනාගාරයට ඩිජිටල් කෝෂ්ඨාගාරයක්

ධනුෂ්ක ගොඩකුඹුර

ජාතික ලේඛනාගාරයේ විශ්වාසදායක ඩිජිටල් කෝෂ්ඨාගාරයක් ස්ථාපිත කිරීමට රුපියල් කෝටි දහයක මුදලක් වෙන් කිරීමට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය තීරණය කර තිබේ. පිට 06




පාස්කු කොමිසමේ අවසන් වාර්තාව අසම්පූර්ණයි



පිට 06

## එජාපයේ දෙවැනි ප්‍රතිසංවිධාන වැඩසටහන මාර්තු අග

ශිරෝමි අබයසිංහ

එක්සත් ජාතික පක්ෂයේ දෙවැනි ප්‍රතිසංවිධාන වැඩසටහන මාර්තු මස අවසන් සතියේ ආරම්භ කිරීමට නියමිතය. පිට 06

## මිල පාලනයට සහල් ආනයනය කරනවා



නුවන් හෙට්ටිආරච්චි

ඉහළ ගොස් ඇති සහල් මිල පාලනය කිරීම සඳහා සහල් ආනයනය කරන බව වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා පැවසීය. පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික දිනය ඊයේට (15) යෙදීම නිමිත්තෙන් නාරාහේන්පිට ප්‍රදේශයේ පැවති වැඩසටහනකට එක් වෙමින් අමාත්‍යවරයා මේ බව ප්‍රකාශ කළේය. පිට 06

## වාහන එකලස් කිරීමේ සම්මත මෙහෙයුම් පටිපාටිය එළිදකී



ඡායාරූපය - දුෂ්මන්ත මායාදුන්නේ


රක්ෂණ ශ්‍රියන්ත

මෙරට වාහන එකලස් කිරීමේ සහ අමතර උපාංග නිපදවීමේ කර්මාන්ත පිළිබඳ "සම්මත මෙහෙයුම් පටිපාටිය" එළි දැක්වීමේ උලෙළ කොළඹ ෂැංග්‍රිලා හෝටලයේදී ඊයේ (15) අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් මහත් උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි. පිට 06





වසරකට ආසන්න කාලයක් දිවයිනේ පාසල් වසා තැබීමෙන් අනතුරුව ඊයේ (15) සමස්ත පාසල් පද්ධතියම විවෘත කෙරිණි. ඒ අනුව බස්නාහිර පළාතේ පාසල් විවෘත කර තිබූ අයුරු..


හිත ඇති කියනකං **Scroll** කරන්න
ඇඟිලි ඇති කියනකං **Chat** කරන්න
ඇස් ඇති කියනකං **Video** බලන්න

ඔබ කැමතිම ඇප් 9ට ඇති වෙනකං data සහ වැඩිපුර 2GB අමතරව.

රුපියල් 398කට #170# අමතා හෝ SELFCARE APP එක හරහා දැන්ම ඇක්ටිවේට් කරගන්න.


*කොන්දේසි සහිතයි. TRC/M/PRO/20/07

www.sltmobitel.lk

SLTMOBITEL
එකම එක සබැඳියාව

# කොරෝනා ආසාදිතයෝ ඊයේත් 307ක්

## එක් මරණයක්



**සුභාෂිණී සේනානායක සහ රක්ෂණ ශ්‍රියන්ත**

මෙරටින් කොවිඩ් ආසාදිත පුද්ගලයන් 307 දෙනකු ඊයේ (15) උදෑසන වන විට හඳුනාගෙන ඇති බව කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය පවසයි. එම පුද්ගලයන් අතරින් 25 දෙනකු විදේශගතව සිට මෙරටට පැමිණි අය ලෙස වාර්තා වේ. අනෙක් පුද්ගලයන් 282 දෙනා දේශීයව හඳුනාගත් ආසාදිතයන්ය.

ඊයේ හඳුනාගත් ආසාදිතයන් අතරින් වැඩිම ආසාදිතයන් පිරිසක් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර,එම සංඛ්‍යාව 50කි. ඊට අමතරව මාතර දිස්ත්‍රික්කයෙන් ආසාදිතයන් 49ක් සහ ගම්පහ දිස්ත්‍රික්කයෙන් ආසාදිතයන් 47ක් ලෙස වාර්තා වේ. අනෙක් ආසාදිතයන් 136 දෙනා දිවයිනේ සෙසු දිස්ත්‍රික්කවලින් වාර්තා වේ.

ඊයේ (15) දින උදෑසන වන විට, මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් පොකුරට සහ කොළඹ මත්ස්‍ය වෙළෙඳපොළට සම්බන්ධ පොකුරෙන් වාර්තා වූ කොවිඩ් ආසාදිත සම්පූර්ණ පුද්ගලයන් සංඛ්‍යාව 84,000කි. එයින් පුද්ගලයන් 83,218 දෙනකු මේ වන විට පූර්ණ සුවය ලබා රෝහල්වලින් බැහැරව ගොස් ඇත.

ඊයේ (15) දින උදෑසන වන විට, මෙරටින් කොවිඩ් ආසාදනය වු සම්පුර්ණ රෝගීන් සංඛ්‍යාව 87,906ක් වන අතර එයින් පුද්ගලයන් 84,647ක් පූර්ණ සුවය ලබා රෝහල්වලින් බැහැරව ගොස් ඇත. ඊයේ (15) දින උදෑසන වන විට, රෝහල්ගතව සහ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානවල පුද්ගලයෝ 2,732 දෙනකු තව දුරටත් ප්‍රතිකාර ලබති.

ඊයේ (15) දින උදෑසන 06.00 වන විට ගත වූ පැය 24 තුළ රෝහල්ගතව සහ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් පුද්ගලයි න් 395ක් පූර්ණ සුවය ලබා පිටව ගොස් ඇත.

ඊයේ (15) දින උදෑසන වන විට මෙරටින් කොවිඩ් ආසාදනය වී එක් පුද්ගලයකු මිය ගොස් ඇත. ඔහු වැලිගම ප්‍රදේශයේ පදිංචි පුද්ගලයකු ලෙස වාර්තා වේ. ඒ අනුව, ඊයේ (15) උදෑසන වන විට මෙරටින් කොවිඩ් ආසාදිත සම්පූර්ණ මරණ සංඛ්‍යාව 527ක් දක්වා ඉහළ ගොස් ඇත.

ඊයේ (15) දිනයේදී ත්‍රිවිධ හමුදාවෙන් පාලනය කරන නිරෝධායන මධ්‍යස්ථාන 106ක පුද්ගලයන් 10,370 දෙනකු නිරෝධායනය වෙමින් සිටියි. පෙරේදා (14) දිනයේ පීසීආර් පරීක්ෂණ 6,918ක් සිදු කර ඇති බව කොවිඩ්19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය වැඩි දුරටත් පවසයි .

# ලොව පුරා කොරෝනා ආසාදිතයන් ගණන කෝටි දොළහ පසු කරයි



**බුද්ධි කරුණාරත්න**

ගෝලීය කොරෝනා රෝගීන් ගණන මෑතකදී කෝටි දොළහ පසු කරමින් වේගයෙන් ඉදිරියට ඇදෙමින් පවතී. හරියටම පවසන්නේ නම්, ගෝලීය කොරෝනා රෝගීන් ගණන ඊයේ වන විට 120,452,744කි. ගෝලීය කොවිඩ් මරණ ගණන විසි හය ලක්ෂ හැට හය දහස් එකසිය තිහකි. කොරෝනා වැලඳී සුවය ලැබූ ගණන නව කෝටි හැට නව ලක්ෂ අනූ හතර දහස් එකසිය හතළිස් පහකි. මේ වන විටත් ලෝකයේ කොරෝනා රෝගය වැලඳී තවමත් සුවය නොලබා සිටින ප්‍රමාණය කෝටි දෙකකට මඳක් වැඩි වේ.

දෛනික මට්ටමෙන් බලන විට මේ මස 12 වැනිදා කොවිඩ් 490,219ක් අලුතෙන් එකතු විය. එදින දෛනික මරණ 9,481ක් වාර්තා වී තිබේ. ගෝලීය කොවිඩ් ආසාදනය වැඩිම රටවල් අතරින් තවමත් ඉදිරියෙන් ම සිටින්නේ ඇමෙරිකාව, බ්‍රසීලය, ඉන්දියාව, රුසියාව සහ එක්සත් රාජධානිය ආදී රටවල්ය. මෙහි විශේෂත්වය වන්නේ මෙතෙක් ලෝක කොවිඩ් රෝගීන් දැක්වෙන දර්ශකයේ දෙවැනි ස්ථානය දරන ඉන්දියාව පසු කර බ්‍රසීලය දෙවැනි ස්ථානය කරා ඉදිරියට ගමන් කිරීමයි.

ඇමෙරිකාවේ කොරෝනා ආසාදන කෝටි 3ක මට්ටමේ පවතින විට බ්‍රසීලයේ සහ ඉන්දියාවේ එක් කෝටිය බැගින් රෝගීන් වාර්තා කර ඇති අතර, මේ රටවල් දෙක අතර පරතරය ලක්ෂ එකකට මඳක් අඩු මට්ටමක පවතී. ඇමෙරිකාවේ කොරෝනා මරණ 547,234ක් ද, බ්‍රසීලයේ කොරෝනා මරණ 278,327ක් ද, ඉන්දියාවේ කොවිඩ් මරණ 158,762ක් ද වාර්තා වී තිබේ. කොවිඩ් රෝග මර්දනයට ඉදිරිපත් කර ඇති විවිධ එන්නත් රැසක්ම භාවිතයට ගෙන ඇති මෙකල එහි ප්‍රතිඵල පෙන්නුම් කිරීමට තව කලක් ගත වනු ඇත.

# මාලිම්බඩ ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ඒකකයෙන් කොරෝනා මර්දනයට පිළියම්

**වජිර පූජිත ගුණවර්ධන - තෙලිජ්ජවිල සමූහ**

මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කොරෝනා මර්දන වැඩපිළිවෙළ හා සමගාමීව ආශ්‍රිතයන්ගේ ප්‍රතිශක්තිය වැඩි කිරීමේ සාර්ථක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට මාලිම්බඩ ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ඒකකයට හැකිව ඇත. මේ ප්‍රදේශයේ කොරෝනා රෝගයෙන් එක් පුද්ගලයකු මිය ගිය අතර, මුළු රෝගීන් සංඛ්‍යාව අනූ හතකට සීමා කිරීමට මේ වැඩපිළිවෙළ ද හේතුවී ඇත.

හඳුනාගත් කොරෝනා රෝගීන් රෝහල් වෙත යොමු කිරීමත්, රෝගීන්ගේ ආශ්‍රිතයන් ස්වයං නිරෝධායනයට ලක් කිරීමත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩපිළිවෙළට අනුව අනිවාර්ය වේ. ඔවුන්ගේ ශරීර ප්‍රතිශක්තිකරණය වැඩි කිරීමට 'සුවධරණී' චූර්ණය ඔවුන්ට දීම මාලිම්බඩ ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ඒකකයෙන් සිදු කරයි.

මේ වැඩපිළිවෙළේ වැදගත්කම නිසාම මාලිම්බඩ ප්‍රාදේශීය සභා සභාපති සෝමසිරි වීරමන් මහතා ඇතුළු ප්‍රාදේශීය සභාවේ පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන් පසුගිය 09 වැනි දින පැවති මාසික සභා රැස්වීමේ පළමු යෝජනාව ලෙස සුවධරණී චූර්ණය නිපදවීමට අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීමට සභා අරමුදලෙන් මුදල් වෙන් කරදීම තීරණය කරන ලදි.

මෙම චූර්ණිකාව කොත්තමල්ලි, වෙනිවැල්ගැට, වියළි ඉඟුරු, හීන් අරත්ත අල ආදියෙහි මිශ්‍රණයකි. මේ පස්පංගුව තම නිවෙසේදීම සකස් කර ගැනීමට අවශ්‍ය දැනුම සහ පුහුණුව ද ජනතාවට දීම මාලිම්බඩ ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ඒකකයේ වෛද්‍යවරුන් විසින් සිදු කර ඇත.

මේ මහඟු කාර්යය මෙහෙය වන මාලිම්බඩ ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ඒකකයේ වෛද්‍යවරුන් වන්නේ ආර්. රණසිංහ, රංජිත් වීරවර්ණ, සමන් ගමගේ, සමන් අතපත්තු මහත්වරුන්ය.

# කොළඹ නගර සීමාවේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට කොවිඩ් එන්නත ගැනීමට පහසුකම්

**සුභාෂිණී සේනානායක සහ මැදකොළඹ සමූහ**

කොළඹ නගර සීමාවේ පදිංචි වයස අවුරුදු 60ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට කොවිඩ් එන්නත ගැනීමට පහසු වේලාවක් ස්වංක්‍රියව නොමිලේ වෙන් කර ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා ඇති බව කොළඹ නගර සභාවේ නාගරික කොමසාරිස් නීතිඥ රෝෂණී දිසානායක මහත්මිය පැවැසුවාය.

මේ පිළිබඳව වැඩි දුරටත් අදහස් දැක් වූ ඇය මෙසේ ද කීවාය.


'මේ සඳහා කොළඹ මහ නගර සභාවේ www.colombo.mc.gov.lk වෙබ් අඩවියෙන්, echanneling.com වෙබ් අඩවියෙන් හෝ echanneling ජංගම යෙදවුමෙන් වේලාවක් වෙන් කර ගත හැකියි. මේ සඳහා කිසිදු අතරමැදියකු අවශ්‍ය නෑ.'


උස්වත්ත කන්ෆැක්ෂනරි වර්ක්ස් ප්‍රයිවට් ලිමිටඩ්හි අනුග්‍රහයෙනි

# රුපියල් තිස්දහසක තෑගි

ටිපි ටිප් දිනමිණ

ප්‍රහේලිකා අංක - 38



තෑග රටාව

පළමුවන ත්‍යාගය රුපියල් 10,000 | දෙවන ත්‍යාගය රුපියල් 5000

තෙවැනි ත්‍යාගය රුපියල් 3000 | රුපියල් 1000 බැගින් සැනසිලි ත්‍යාග 11යි.

ජයග්‍රාහකයන් තෝරාගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ නම් සහ ප්‍රහේලිකාවේ නිවැරැදි විසඳුම් දිනමිණ පත්‍රයේ පළ වේ. ත්‍යාග මුදල් තෙමසක් ඇතුළත පිරිනැමේ.

නම: ---------------------------------

ලිපිනය: ---------------------------------

---------------------------------

දිනය: ------------ ------------ අත්සන:

**කොන්දේසි**

සතියට දෙවරක් පළවන මෙම ප්‍රහේලිකාව සඳහා මුදලින් රුපියල් තිස්දහසක් මාසිකව පිරිනැමේ. දිනමිණ පත්‍රයේ පළවන ප්‍රහේලිකා විසැඳුම් පුරවා එය 6 X 3 සාමාන්‍ය කවරවල පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. ලිපියේ ඉහළින් වම් කෙළවරේ දිනමිණ ටිපි ටිප් ප්‍රහේලිකා අංක 38 යනුවෙන් සඳහන් කර දිනමිණ ප්‍රහේලිකාව තැ.පෙ. 1134, කොළඹ යන ලිපිනයට 2021 මාර්තු මස 31 වැනිදා හෝ ඊට පෙර උස්වත්ත Tipi Tip හෝ බිස්කට් දවටන දෙකක් සහිතව එවිය යුතුය. ලියුම් කවරයේ ඔබේ ආපසු ලිපිනය ද ලියන්න. ඡායාපිටපත් ප්‍රතික්ෂේප කැරේ. ලේක්හවුස් ආයතනයේ සහ උස්වත්ත සමූහ ව්‍යාපාරයේ සේවක සේවිකාවන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවන්ට තරගයට ඉදිරිපත් විය නොහැකිය.

**උපකාරක පද**

**හරහට**

1. බලයෙන් පහ කෙරුණු මියන්මාර නායිකාව
6. රෝදය
8. නිද්‍රාව
10. පාවැසුම්
11. සංස්කෘතික භාෂාව
13. තාල වර්ගයට අයත් ගසකි
14. ඉබේ සෑදුණු ජලාශය
15. ෂාරුක් ඛාන් හා කාජල් රඟන ජනප්‍රිය හින්දි චිත්‍රපටයකි.
16. ස්වර
18. ධර්ම මාර්ගය
19. භාවකු ගැන සඳහන් ජාතක කතාව
20. මාලදිවයිනේ අගනුවර
21. රාශි චක්‍රයේ 11 වැනි රාශිය

**පහළට**

2. කොරෝනා වයිරසය මුලින්ම හමු වූ චීන නගරය
3. සාර
4. යහපත් චර්යාවන් සහිත
5. සවන පැරකුම්බා රජුගේ බිසව
7. මේ කෘමියා කෑ තැන දැඩි වේදනාකාරීය
8. ස්පර්ශ සංවේදයක්, වේදනාව හා උෂ්ණත්වය දැනීමත් නැතිවීම.
9. දහය
12. පුරාතන තම්බපණ්ණිය අද හඳුන්වන නම
16. ශෝභන / යහපත්
17. පළමු ලම්භකර්ණ වංශික රජු
19. චර්ම

● සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද (අනුරූ මාධ්‍ය සේවා)
072 3561975





# කෑගල්ල බන්ධනාගාරයේ රැඳවූවකු කොවිඩ් ආසාදනය වී මරුට

**බුද්ධිකා ඉඹුලාන**

නීති විරෝධී මත්පැන් ජාවාරම් සම්බන්ධයෙන් අධිකරණයෙන් මාස දෙකක සිර දඬුවම් නියම වී කෑගල්ල බන්ධනාගාරයේ රඳවා සිටි රැඳවූවකු කොවිඩ් ආසාදනය වීමෙන් මියගොස් ඇත.

බන්ධනාගාර කොමසාරිස් (පාලන හා පුනරුත්ථාපන) බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක චන්දන ඒකනායක මහතා පැවැසුවේ මේ රැඳවියා කොවිඩ් ආසාදිතයකු බවට තහවුරු වීමෙන් පසුව ඔහුව කන්දකාඩු ප්‍රතිකාර මධ්‍යස්ථානයට යොමු කර සිටියදී වැලිකන්ද රෝහලට ඇතුළත් කර බවත්, එහිදී රෝගය උත්සන්න වීමෙන් මොහු මියගොස් ඇති බවත්ය. මිය ගිය රැඳවියා කුරුණෑගල ප්‍රදේශයේ පදිංචි 51ක් හැවිරිදි අයෙකි. මේ මරණයත් සමඟම කොවිඩ් ආසාදනය නිසා මිය ගිය රැඳවූවන්ගේ සංඛ්‍යාව 12 දක්වා ඉහළ ගොස් තිබේ.

# බන්ධනාගාර කොවිඩ් පොකුර 5,167 දක්වා ඉහළට

**බුද්ධිකා ඉඹුලාන**

බන්ධනාගාර කොවිඩ් පොකුර ඊයේ (15) දහවල් වන විට 5167 දක්වා ඉහළ ගොස් තිබේ. මෙයින් 5007ක් රැඳවූවන්ය.

ඊයේ (15) දහවල් නව ආසාදිතයන් 15ක් ද, පෙරේදා (14) දහවල් නව ආසාදිතයන් 25ක් ද වාර්තා වී ඇත.

මේ පිළිබඳව වැඩි දුරටත් අදහස් දැක්වූ බන්ධනාගාර කොමසාරිස් (පාලන හා පුනරුත්ථාපන ) බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක චන්දන ඒකනායක මහතා මෙසේ පැවැසුවේය.

'නව ආසාදිතයන් සියල්ල අධිකරණයෙන් දඬුවම් නියම කර හෝ රිමාන්ඩ් භාරයට යොමු කරන නව රැඳවූවන්. කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව 5100 පසු කර තිබුණත් මේ වන විට පූර්ණ සුවය ලැබූ බන්ධනාගාර කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව 4,939ක්.

බන්ධනාගාරයේ කොවිඩ් මර්දන කටයුතු විධිමත්ව ක්‍රියාත්මක වෙනවා. මේ වන විට ප්‍රතිකාර ලබන රැඳවූවන් සංඛ්‍යාව 215 දක්වා අඩු වී තිබෙනවා.'

# ගලේවෙලින් 131ක් හඳුනාගැනේ

**මාතලේ දිස්ත්‍රික් සමූහ**

කොරෝනා ව්‍යාප්තියේ දෙවන රැල්ල ආරම්භයේ සිට මේ දක්වා ගලේවෙල සෞඛ්‍ය බල පෙදෙසේ කොරෝනා රෝගීන් 131ක් හඳුනාගෙන ඇති බවත්, එයින් පුද්ගලයන් දෙදෙනකු මිය ගොස් ඇති බවත් සෞඛ්‍ය නිලධාරීහු සඳහන් කරති.

මේ ආසාදිතයන්ගෙන් දෙදෙනකු වකුගඩු රෝගයෙන් පෙළෙන බව ද, මොවුන් අවශ්‍ය ප්‍රතිකාර සඳහා යොමු කර ඇති බව ද සඳහන් වේ. මේ ආසාදිතයන් සියලු දෙනාම අදාළ ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත යොමු කර ඇති අතර, මොවුන්ගෙන් බහුතරයක් මේ වන විට සුවය ලබා පිටව ගොස් ඇත.

# කොහුවල මෝටර් රියකින් හමු වූ පිලිස්සුණු මළසිරුර කළුබෝවිල ව්‍යාපාරිකයාගේ

## ඩීඑන්ඒ පරීක්ෂණවලින් අනන්‍යතාව තහවුරු කර ගනී



**සුභාෂිණී සේනානායක සහ රක්ෂණ ශ්‍රියන්ත**

කොහුවල ආසිරි මාවතේ දී මෝටර් රථයක තිබී පසුගියදා සොයා ගත් පිලිස්සුණු මළසිරුර කළුබෝවිල භාතිය මාවතේ නසාර් මොහොමඩ් (33) නමැති තරුණ ව්‍යාපාරිකයාගේ බවට ඩී.එන්.ඒ පරීක්ෂණයෙන් තහවුරු වී ඇතැයි පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවැසීය.

මෝටර් රථයේ පිලිස්සී මියගිය ව්‍යාපාරිකයාගේ සිරුරෙන් හා ඔහුගේ මවගෙන් සහ පියාගෙන් ගත් ඩී.එන්.ඒ. සම්පල ඔහුගේ බවට සැසඳී ඇති බවට අතිරේක රස පරීක්ෂක ඩී.එච්.එල්.ඩබ්ලිව්. ජයමාන්න මහතා තහවුරු කළ බව ද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා වඩ්දුරටත් කියා සිටියේය.

මෝටර් රථයක පිලිස්සුණු ව්‍යාපාරිකයාගේ මරණය සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන බවද ඒ මහතා වැඩිදුරටත් කියා සිටියේය.

# ඕමානයේ රැකියා දෙන බව කියා රැගෙන ගිය රූමත් තරුණ කතුන් ලිංගික ජාවාරමේ යොදවලා

## සැකකාර කත රිමාන්ඩ්

**අනුර ප්‍රේමලාල්**

ඕමානයේ විවිධ රැකියා දෙන බව කියා වයස අවුරුදු 20-40 අතර කාන්තාවන් එරටට ගෙනගොස් ලිංගික ජාවාරම්වල නිරත කළ මහියංගණය ප්‍රදේශයේ පදිංචි කාන්තාවක් අත්අඩංගුවට ගැනීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විශේෂ විමර්ශන අංශය හා වව්නියාව, පූවාස්කුලම් පොලීසිය සමත්විය. මේ කාන්තාව සම්බන්ධව පසුගිය පෙබරවාරි මාසයේදි මෙරට ජනමාධ්‍යවල පළ වූ ප්‍රවෘත්ති හා හිංසනයට ලක් වූ කාන්තාවන්ගෙන් ලද තොරතුරු මත මේ කාන්තාවගේ මිනිස් ජාවාරම් පිළිබඳ තොරතුරු හෙළි වී තිබේ. අදාළ කාන්තාවට එරෙහිව දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ පදිංචි කාන්තාවක් සිදු කළ පැමිණිල්ලකට අනුව, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විමර්ශන අංශය විසින් සැකකාර කාන්තාව අත්අඩංගුවට ගැනීමට දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් මධුෂිකා වාසල මහත්මියගෙන් අධිකරණ නියෝගයක් ගෙන තිබේ.

සැකකාර කාන්තාව හා තවත් පිරිසක් එක්ව මේ මිනිස් ජාවාරම කරගෙන ගොස් ඇති අතර තරුණ රූමත් කාන්තාවන්ට රැකියා දෙන බව කියා ඔවුන් ඕමානයට ගෙන ගොස් එහිදී එරට සුල්තාන්වරුන්ට අලෙවි කර ඇති බවට තොරතුරු ලැබී තිබේ. මෙලෙස කාන්තාවන් රැගෙන ගොස් ගණිකා ජාවාරමට ලබාදීම බරපතළ මිනිස් ජාවාරමක් වන අතර, එය විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ අංක 62/1 වගන්තියට අනුව වරදකි. මෙයට අමතරව මේ සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටද පැමිණිලි ලැබී ඇති අතර ඒ සම්බන්ධව එම කාන්තාව මාර්තු 18 වෙනිදා කොළඹ අංක (1) උසාවියට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කිරීමට නියමිතව තිබේ.

සැකකාර කාන්තාව පසුගිය පෙබරවාරි 25 වැනි දින ඕමානයේ සිට ශ්‍රී ලංකාවට පැමිණ ඇති අතර, දින 14ක නිරෝධායනයට ඇය වව්නියාව නිරෝධායන මධ්‍යස්ථානයට යොමු කොට තිබේ. අද එම නිරෝධායනය අවසන් වී ඉන් පිටතට පැමිණි මොහොතේ ඇය අත්අඩංගුවට ගෙන ඇත්තේ දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත්වරියගෙන් ලද නියෝගය මතය. සැකකාරිය, වව්නියාව වැඩබලන මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලබන මස දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියෝග කොට තිබේ.

සැකකාරිය අත්අඩංගුවට ගැනීමට, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ විමර්ශන නිලධාරි සරත් විමලවීර, වව්නියා පූවාසකුලම් පොලිස් ස්ථානයේ මෙහෙය වීම මත පොලිස් කොස්තාපල් ජයසිංහ හා කාන්තා පොලිස් කොස්තාපල් සෙව්වන්දි යන අය එක් විය.

## පාසල් දරුවන් ප්‍රවාහනයේදී සෞඛ්‍ය උපදෙස් පිළිපදිනවාදැයි පොලිසිය විමසිල්ලෙන්

### පොලිස් මාධ්‍ය ප්‍රකාශක

**සුභාෂිණී සේනානායක සහ රක්ෂණ ශ්‍රියන්ත**

පාසල් දරුවන් ප්‍රවාහනයේදී සෞඛ්‍ය උපදෙස් අනුගමනය කරනවාදැයි පොලීසිය නිරන්තරයෙන් විමසිල්ලෙන් පසු වන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා පවසයි.

පාසල් බස් රථ මෙන්ම පෞද්ගලික වෑන් රථ සම්බන්ධයෙන් සොයා බැලීම් සිදු කිරීමට වෙනම නිලධාරින් යොදවා ඇති බවත් ඒ මහතා කියා සිටියේය.

එමෙන්ම දුම්රිය, බස්රථ මෙන්ම පොදු ප්‍රවාහන සේවා සහ පෞද්ගලික වෑන් රථ භාවිතා කරන පාසල් දරුවන් නිසි සෞඛ්‍ය උපදෙස් පිළිපදිමින් ගමනාගමන කටයුතු සිදු කරන ලෙසත් තමාගේ ආරක්ෂාව සහතික වන සේ පාසල්වලම හැසිරෙන ලෙසත් ඒ මහතා පාසල් දරුවන්ගෙන් ඉල්ලා සිටියි.

එමෙන්ම පාසල් සිසුන් ප්‍රවාහනය කරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් සිසු සැරිය බස් රථ නිසි සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද යටතේ ධාවනයට යොදවා ඇතැයි ලංගම සභාපති නීතිඥ කිංස්ලි රණවක මහතා පැවැසීය.

## අද තැනින් තැන වැසි

**උපාලි කරුණාරත්න**

නැගෙනහිර, ඌව සහ උතුරු මැද පළාත්වලත් නුවරඑළිය සහ මාතලේ දිස්ත්‍රික්කවලත් අද (16) දිනයේ තැනින් තැන වැසි ඇති වේ. සබරගමුව, බස්නාහිර සහ වයඹ පළාත්වලත් ගාල්ල, මාතර සහ මහනුවර දිස්ත්‍රික්කවලත් සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. මේ ප්‍රදේශවල ඇතැම් ස්ථානවලට මි.මී 75ට වැඩි තරමක තද වැසි ඇති විය හැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අද දිනය දක්වා කාලගුණ අනාවැකිය නිකුත් කරමින් කියා සිටී. මධ්‍යම, සබරගමුව, ඌව, බස්නාහිර පළාත්වල උදෑසන කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් ඇතිවිය හැකිය. ගාල්ල සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා සහ පුත්තලම සිට මන්නාරම හරහා කන්කසන්තුරය දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැකිය.

# ඩුබායි සිට එවූ කෝටි ගණන් මුදල් අන්තවාදී සංවිධානයකට යවලා

## මත්ද්‍රව්‍ය ජාවාරමකට අසු වූ සැකකරුගෙන් සුලමුල එළියට

**සුභාෂිණී සේනානායක සහ රක්ෂණ ශ්‍රියන්ත**

මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකරුවකු අන්තවාදී සංවිධානයක් වෙත විශාල වශයෙන් මුදල් බැර කර ඇති බවට හෙළි වී ඇතැයි පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පවසයි.

මීට පෙර පැලියගොඩ පොලිසිය මගින් මත්ද්‍රව්‍ය වරදක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන දීර්ඝ ලෙස ප්‍රශ්න කිරීමේ දී ඔහු ඩුබායි රාජ්‍යයේ සිට එවන ලද මුදල් මේ අයුරින් ඉස්ලාම් අන්තවාදී සංවිධාන වෙත ලබාදී ඇති බවට තොරතුරු ලැබී ඇතැයි පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය.

මේ සැකකරු පැලියගොඩ පොලිසිය අත්අඩංගුවට ගෙන ඇති අතර සැකකරු සම්බන්ධයෙන් රැඳවුම් නියෝග ලබා ගෙන සිදු කළ ප්‍රශ්න කිරීමේ දී මේ බව හෙළි කරගෙන ඇති බවත් සිදු කළ විමසීම්වලදී අනාවරණය වී ඇති බව කියා සිටි ඒ මහතා සැකකරු පොලිස් ත්‍රස්ත මර්දන කොට්ඨාසය වෙත භාරදීමට නියමිත බවත් සැකකරු සම්බන්ධයෙන් පුළුල් විමර්ශනයක් අංශ කීපයකින් සිදු කරන බවත් කියා සිටියේය. සැකකරු පාණදුර ප්‍රදේශයේ පදිංචි (37) හැවිරිදි පුද්ගලයෙකි.



# මානව හිමිකම් කොමසාරිස් බැචලේට එරෙහිව ඉතාලියේ සිටින දේශප්‍රේමී ශ්‍රී ලාංකිකයෝ විරෝධතාවක

**මහින්ද අලුත්ගෙදර**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස්වරිය විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ජගත් මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කළ වාර්තාවට විරෝධය පළ කරමින් ඉතාලියේ වෙසෙන දේශප්‍රේමී ශ්‍රී ලංකිකයෝ විරෝධතා ව්‍යාපාරයක් සංවිධාන කර තිබේ.

එම විරෝධතා ව්‍යාපාරය සාමකාමී ලෙස මිලානෝ නගරයේ දී පවත්වා තිබෙන අතර මිලානෝ චෙන්ත්‍රාලේ ප්‍රධාන දුම්රියපොළ ඉදිරිපිට පැවති මේ විරෝධතාවට එරට වෙසෙන ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසක් සහභාගි වී ඇත.




ඉතාලියේ දැනට පවත්නා දැඩි කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ වුවද ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසක් මේ උද්ඝෝෂණයට සහභාගි වී තිබෙන අතර නිරෝධායන නීතිරීතිවලට අනුකූලව පැවැත්වූ මේ උද්ඝෝෂණයට පොලිස් ආරක්ෂාව ද ලබා දී තිබීම විශේෂත්වයකි.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ අන්තර් ක්‍රියාකාරී සංවාදයේ දී, මානව හිමිකම් මහකොමසාරිස් මිෂෙල් බැචලේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉදිරිපත් කළ වාර්තාවෙන් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කඩවීම, 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා ජනාධිපතිවරයාගේ බලතල පුළුල් කර ගැනීම, කොමිසන් සභාවල ස්වාධීනත්වය ගිලිහී යාම, යුද අපරාධ සම්බන්ධයෙන් චෝදනා ලත් පිරිස් රාජ්‍ය සේවයට එක්කර ගැනීම වැළැක්වීම ආදිය පිළිබඳ චෝදනා කරමින් වාර්තාවක් ඉදිරිපත් තර ඇත.

ඊට අමතරව එක්සත් රාජධානිය ඇතුළු රටවල් සමූහයක් තවත් යෝජනාවක් සම්මත කිරීමට සැලසුම් කර ඇති අතර කැනඩාව, එක්සත් රාජධානිය, ජර්මනිය, උතුරු මැසිඩෝනියාව, මොන්ටිනිග්‍රෝ හා මලාවි රටවල් විසින් අදාළ යෝජනාව ඉදිරිපත් කිරීමට නියමිතව තිබේ. එම රටවල් සමූහය, ශ්‍රී ලංකාව පිළිබඳ කෙටුම්පත් කෙරුණු යෝජනාවක් අද (16) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කිරීමට නියමිතයි.

මිෂෙල් බැෂලේගේ වාර්තාව පසුගියදා අන්තර්ක්‍රියාකාරී සංවාදයට ගැනුණු අතර නිකරගුවා, එරිත්‍රියා සහ උතුරු කොරියා ඇතුළු රටවල් 21ක් ශ්‍රී ලංකාවට සහාය පළ කරමින් එහිදී අදහස් ඉදිරිපත් කර ඇත. නිකරගුවා, එරිත්‍රියා සහ උතුරු කොරියාව ද මානව හිමිකම් කවුන්සිලයේ ඔවුන් පාදක කරගත් යෝජනාවලට මුහුණ දී සිටින අතර කියුබාව, වෙනිසුවෙලා, ඉන්දුනීසියාව, පාකිස්තානය මෙවර මෙන් අතීතයේ දී ද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දී ශ්‍රී ලංකාව සම්බන්ධ යෝජනාවලට එරෙහිව පැහැදිලි ස්ථාවරයක් ගත් රටවල් අතර සිටී.

# මියන්මාරයේ ශ්‍රී ලංකා තානාපති ඉල්ලා අස් වීමට යයි

**මහින්ද අලුත්ගෙදර**

මියන්මාරයේ ශ්‍රී ලංකා තානාපති වශයෙන් කටයුතු කරන මහාචාර්ය නලින් ද සිල්වා මහතා එම ධුරයෙන් ඉල්ලා අස්වීමට තීරණය කර තිබේ.

කෙසේ වුවද මේ ධීවර ප්‍රශ්නය නිම වනතුරු හා විදේශ ඇමැතිවරුන්ගේ බිම්ස්ටෙක් රැස්වීම පැවැත්වෙන තුරු තනතුරේ රැඳී සිටීමට බලාපොරොත්තු වන බවද සිය මුහුණු පොතේ සටහනක් තබමින් තානාපතිවරයා ප්‍රකාශ කරයි.

තම පෞද්ගලික ෆේස්බුක් ගිණුමේ 'වැඩ බැරි තානාපති' ලෙස සටහනක් තබමින් මහාචාර්ය නලින් ද සිල්වා මහතා සිය තීරණය පිළිබඳ කරුණු පැහැදිලි කර තිබෙන අතර ශ්‍රී ලාංකික ධීවරයන් 12 දෙනෙකු දැනට මියන්මාර අත්අඩංගුවේ සිටින බවද එම අත්අඩංගුවට ගැනීම පිළිබඳ මියන්මාර ශ්‍රී ලංකා තානාපති කාර්යාලට නිල දැනුම්දීමක් කර නොමැති බවද හෙතෙම පෙන්වා දෙයි.

නිරන්තර උත්සාහයෙන් පසු එක් දිනක් පොලිස් නිලධාරියකු මාර්ගයෙන් ධීවරයන් සමඟ කතා කිරීමටත් ඔවුන්ගේ සුවදුක් හා නීතිමය තත්ත්වය සාකච්ඡා කිරීමටත් හැකිවූ බව සඳහන් කරන මහාචාර්ය නලින් ද සිල්වා මහතා තමා අකාර්යක්ෂම, අසමත් තානාපතිවරයකු බව හැඟී යන බවත් නිල නොවන වශයෙන් කටයුතු කිරීමට මියන්මාරයේ තමා දන්නා අඳුරන අයකු නොමැති බවත් සඳහන් කර ඇත. ධීවරයන් නිදහස් කර ගැනීම සම්බන්ධයෙන් මියන්මාර රජයේ නිලධාරින් මට්ටමින් කටයුතු කරගෙන යන බවද නලින් ද සිල්වා මහතා කියා සිටී.

# දිවයින පුරා මෙහෙයුම්වලින් විවිධ වැරැදිවලට 3108ක් අත්අඩංගුවට

**සුභාෂිණී සේනානායක සහ රක්ෂණ ශ්‍රියන්ත**

දිවයින පුරා කළ විශේෂ මෙහෙයුමකදී විවිධ වැරැදි සම්බන්ධයෙන් පුද්ගලයන් 3108ක් අත්අඩංගුවට ගැනීමට හැකි වූ බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය පවසයි.

මේ මෙහෙයුමට පොලිස් නිලධාරීන් 16524ක් එක් වූ බවත් මෙහෙයුම සාර්ථකව කිරීමට හැකි වූ බවත් පොලිසිය කීය.

මේ විශේෂ මෙහෙයුමේදී වරෙන්තුකරුවන් 111 ක්, මත්ද්‍රව්‍ය වැරැදි සම්බන්ධයෙන් 464ක් සහ නීතිවිරෝධී මත්පැන් සම්බන්ධයෙන් 523ක් අත්අඩංගුවට ගත් බව පොලිසිය පැවැසීය. බීමත් රියැදුරන් 454ක්ද අත්අඩංගුවට ගත් බවද පොලිසිය මෙහිදී පැවසීය.

මෙහිදි රථවාහන වැරැදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයන් සංඛ්‍යාව 538ක් බවත් කියා සිටි පොලිස් මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය රටේ සිදු වන අපරාධ වැලැක්වීමේ අරමුණින් මේ මෙහෙයුම් සිදු කළ බවත් විටින් විට මෙවැනි මෙහෙයුම් ක්‍රියාත්මක කරන බවත් කියා සිටියේය.

## පැලියගොඩ

**පැලියගොඩ මත්ස්‍ය වෙළෙඳපොළ දෛනික මසුන් මිල**

| | කිලෝ ග්‍රෑම් එකක මිල |
|---|---|
| තෝරා (බිලි) | 900-920 |
| ඇටනගුල් පරව් | 580 |
| අංජිලා නයිලෝන් | 800 |
| බලයා ලොකු | 280-420 |
| බලයා කුඩා | 280-400 |
| කෙළවල්ලා ලොකු | 550 |
| කෙන්දා බොකු සහිත | 400-500 |
| තලපත් ලොකු | 680 |
| කොප්පරා | 750-800 |
| ඇටිස්සා ලොකු | 600 |
| අලගොඩුවා ලොකු | 360 |
| හුරුල්ලා | 450 |
| හාල්මැස්සා | 200 |
| දැල්ලා බිළී | 650 |
| ලින්නා ලොකු | 290-280 |
| මුහුදු කකුළුවා ලොකු | 650 |
| සූඩයා | 80-90 |
| පොතුබරි | 140 |
| කුම්බලා | 420-450 |
| සුරාපරව් | 350 |

**පැලියගොඩ එළවළු මිල**

| | (කිලෝවක තොග මිල) |
|---|---|
| ගෝවා | 80 |
| බෝංචි | 200 |
| තක්කාලි | 100 |
| ලීක්ස් | 80 |
| කැරට් | 150 |
| වම්බටු | 90 |
| පිපිඤ්ඤා | 40-50 |
| අමු මිරිස් | 140 |
| මාළු මිරිස් | 180 |
| බණ්ඩක්කා | 80 |
| තළන බටු | 50 |
| දෙහි | 70 අතර |
| වට්ටක්කා | 70 |
| පතෝල | 90 |
| බීට් | 80 |
| දේශීය අර්තාපල් | 110 |
| ලොකු ලූනු | 70 |

**පැලියගොඩ පලතුරු මිල**

| | (කිලෝවක තොග මිල) |
|---|---|
| අඹ අල්පොන්සෝ | 400-420 අතර |
| අඹ කර්තකොළම්බන් (ගෙඩි එකක්) | 100-140 අතර |
| කෝලිකුට්ටු | 140-160අතර |
| ඇඹුල් කෙසෙල් | 40-50-60අතර |
| දොඩම් | 140-150 |
| කොමඩු | 100-120 අතර |
| අන්නාසි | 80-90-100 අතර |
| කිලෝ පේර | 130-140 අතර |
| දොඩම් | 140-150 |

මිරිවැඩිවලට පෑගෙන විලසට — අඩිය
පාපිස්නට යොදා ඇත ජාතික — කොඩිය
ඕනැම දෙයක් කර තර කරගෙන — මඩිය
සමහරු සිතති රැක ගන්නට බඩ — ගෙඩිය

බුදු රුව පවා ඇතැමුන් බඩුවලට — යොදා
පිටරටවල් තිබේ ජීවන ගමන — හදා
මේ වැනි අගතිකම් නවතා ලොවම — මුදා
අප සතු අපේකම රැක ගත යුතුය — සදා

රටේමුල්ලේ මුදන්නායක

සැලසුම් කළ පරිදි කිසිවක් සිදු — නොවුණු
කළුවර යුගයක්ය තවමත් දික් — ගැසුණු
දුටු දුටු තැන නහය කට තරකොට — වැසුණු
කවදද දකින්නේ යළි සුන්දර — මුහුණු



ගප්මන් ගෝනා

The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2021 මාර්තු 16 අඟහරුවාදා

# බුර්කාව නැති නිදහස් ලෝකයක්!

ප්‍රසිද්ධ ස්ථානවල බුර්කාව පැළඳගෙන හැසිරීමත්, අන්තවාදය උගන්වන පාසල් පවත්වාගෙන යෑමත් තහනම් කිරීමට කටයුතු යොදන බව මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යවරයා කියා සිටී. ආචාර්ය සරත් වීරසේකර ඊට අදාළ කැබිනට් පත්‍රිකාවට අස්සන් කළ බව ද ඊයේ අප පත්‍රයේ ප්‍රධාන පුවතින් හෙළිදරව් කර තිබිණි. මෙබඳු තීන්දු තීරණ ගැනීම සඳහා ආණ්ඩුවට කොන්දක් තිබිය යුතුය. අමාත්‍යවරයාට ද කොන්දක් තිබිය යුතුය. ජනාධිපතිවරයා පෙන්වා දෙන අන්දමට ශ්‍රී ලංකාවේ සියලු ජාතීන්ට හා සියලු ආගමිකයන්ට පොදු නීතියක් පැවැතිය යුතුය. ලෝකයේ දියුණු රටවල් අනුගමනය කරන්නේ එම ප්‍රතිපත්තිය බව ද කිව යුතුය.

ශ්‍රී ලංකාවේ පවතින නීති පද්ධතිය ගතහොත් එය රෝම ලන්දේසි නීතියේ ද, ඉංග්‍රීසි නීතියේ ද, රජ කාලයේ පටන් මෙරට පැවති නීතියේ ද සංකලනයක් යැයි කිව හැකිය. උතුරට තේසවලාවේ නීතිය බල පවත්වයි. ඉස්ලාම් භක්තික ප්‍රජාවට තවත් නීතියක් බලපායි. සංස්කෘතියට, භාෂාවට, ජාතියට අනුව නීතිය ගළපා ගත හොත් පොදු නීතියක් ක්‍රියාත්මක කිරීම අපහසුය. එය යුක්තිසහගත පාලනයකට අවහිරයකි. එකවර සියල්ල වෙනස් කළ නොහැකි වුව ක්‍රමයෙන් කාලෝචිත නීති පද්ධතියක් සකස් කරගැනීම වඩාත් සුදුසු ක්‍රමවේදය වෙයි. ජනාධිපතිවරයා හා ආණ්ඩුව එම ආස්ථානය වෙත ගමන් කරමින් සිටී. එය වැදගත්ය.

ශ්‍රී ලංකාව තුළ බුර්කාව තහනම් කළ යුතු යැයි මතයක් පවතින්නේ දීර්ඝ කාලයක සිටය. එක අතෙකින් එය ජාතික ආරක්ෂාවට ගැටලුවෙකි. බුර්කාව භාවිත කරමින් අපරාධ සිදු වූ අවස්ථා ගණනාවක් ඉතිහාසය තුළ පවතී. තව අතෙකින් මෙය ඉස්ලාම් අදහන කාන්තාවගේ නිදහසට බාධාවකි. ඉස්ලාම් ආගමික න්‍යාය හා ඇදහීම් අනුව ගත හොත් අපට වැදගත් වන්නේ නබි නායකතුමාගේ උපදේශන හා කුරානයේ එන ඉගැන්වීම්ය. කුරානයේ කිසිදු තැනෙක ඉස්ලාම් අදහන කාන්තාවට බුර්කාව අනිවාර්ය කර නැත. නබි නායකතුමාගේ උපදේශනවල ද බුර්කාව අනිවාර්ය කර නැත. තත්ත්වය එසේ නම්; බුර්කාව තහනම් කිරීම ආගමික ගැටලුවකට හේතුවක් වන්නේ නැත.

ඉස්ලාම් සංස්කෘතියට දීර්ඝ ඉතිහාසයක් තිබේ. එම සංස්කෘතිය විසින් උගන්වනු ලබන ප්‍රධාන කාර්යය වන්නේ සහයෝගයෙන් ජීවත් වීමය. ස්ත්‍රියගේ අයිතිවාසිකම් ගැන නබි නායකතුමා නිරන්තරයෙන්ම ස්වකීය අවධානය යොමු කර තිබේ. ස්ත්‍රිය නොසලකා හරින ලද ඉස්ලාම් පුරුෂයාට නබි නායකතුමා දැඩි සේ අවවාද කර තිබේ. නබි නායකතුමාගේ ඉගැන්වීම්වලට අනුව ඉස්ලාම් අදහන කාන්තාවට නිදහස හා ස්වාධීනත්වය තිබිය යුතුය. පසුකලෙක ඉස්ලාම් සමාජයේ හෙජමොනිය අතට ගත් පුරුෂයෝ එම නිදහස හා ස්වාධීනත්වය අහෝසි කිරීමට පියවර ගත්හ. එහෙත් සැබෑ ඉස්ලාම් භක්තිකයා ඊට විරුද්ධය.

බුර්කාව පමණක් නොව, ආගමික අන්තවාදය උගන්වන හා ත්‍රස්තවාදයට පාර කපන ඉගැන්වීම් ද නැවැත්විය යුතු බව මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යවරයා කියා සිටී. එය වැදගත් ප්‍රකාශයකි. පාස්කු ප්‍රහාරය, පාස්කු ප්‍රහාරය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව නිරීක්ෂණය කරන විට එම ප්‍රකාශයේ වැදගත්කම තවදුරටත් තහවුරු වෙයි. පාස්කු ප්‍රහාරය සංවිධානගත වන්නේ ඉගැන්වීම් හා පුහුණු කිරීම් මතය. එම ඉගැන්වීම් හා පුහුණු කිරීම් රට තුළ රහසිගත ලෙස සිදු වී ඇත. යහපාලන ආණ්ඩුව යටතේ රටේ බුද්ධි අංශ හා ආරක්ෂක අංශ දුර්වල කර තිබූ බැවින් මේ තත්ත්වය හෙළිදරව් වූයේ නැත.

රටේ ජාතික අධ්‍යාපනය පැවතිය යුත්තේ එක ප්‍රතිපත්තියකට හා සැලසුමකට අනුවය. එය තවදුරටත් විස්තාරණය කළ හොත් රටක අනාගත අභිවෘද්ධියට අදාළ වෘත්තිකයා හා ශාස්ත්‍රඥයන් ජාතික අධ්‍යාපනය ඔස්සේ බිහි කළ යුතුය. එහෙත් දැන් පවතින ඇතැම් පාසල් ජාතික අරමුණුවලින් ඔබ්බට ගොස් වෙනත් අරමුණු සඳහා පෙළ ගැසී ඇත. මදුසා පාසල් මීට එක් නිදසුනක් ලෙස දැක්විය හැකිය. මදුසා පාසල් දෙදහස් ගණනක් රට තුළ පවතින අතර එයින් සමහරක් ලියාපදිංචි වී නැත. සමහරක් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති අනුගමනය කරන්නේ නැත. මෙය වහා වෙනස් කළ යුතුය.

එෆ්. රහුමාන් නම් ඉස්ලාම් භක්තික ශාස්ත්‍රඥයෙක් 1965 දී ඉස්ලාම් නමින් පොතක් ලියා ඇත. මේ පොත පරිච්ඡේද දාහතරකින් සමන්විත වන අතර ඉස්ලාම් ආගමේ අතීතය, වර්තමානය හා අනාගත හැඩගැස්ම ගැන විවරණයක් ඒ මගින් සිදුකර තිබේ. රහුමාන් මහතාගේ එක තර්කයක් වන්නේ ඉස්ලාම් සංස්කෘතිය විනාශ කරන බලවේග මේ සංස්කෘතිය තුළින්ම ගොඩනැගෙන බවය. පාස්කු ප්‍රහාරය දෙස බලන විට පෙනී යන්නේ රහුමාන් මහතාගේ විවරණය යථාර්ථයක් වී ඇති බවය. සැබෑ ඉස්ලාම් බැතිමතුන් මේ ගැන කම්පා විය යුතු නැත. වැරැදි නිවැරැදි කරගැනීමට කාලය තිබේ. බුර්කාව තහනම් කිරීම ද අන්තවාදී ඉගැන්වීම් සහිත අධ්‍යාපනයට තිත තැබීම ද සිදුවිය යුත්තකි.


නීතිය යනු සමාජයේ ඉතාම උස් පුද්ගලයාට ද ඉහළින් පවතින්නක් බව කියා ඇත. එය සැබෑවකි. නීතියට හෙවත් යුක්තියට සියල්ල අවනත විය යුතුය.

දිල්රුගෙ සීපද

| | |
|---|---|
| අදහන දෙවියෙකුට ජීවිත කර | බාර |
| යන්නේ ගමන් සේනාවක් මැද | මාර |
| අනතුරු ඉහළ යයි විලසින් | අවිචාර |
| යුද පිටියකට වැඩියෙන් දරුණුයි | පාර |

# පරිසරය රකිමින් රට නඟන මඟ

ස්වාභාවික පරිසරය තුළ ජීවත් වන ඇතැම් සතුන් සහ ශාක මේ වන විට වඳ වී යෑමේ තර්ජනයකට ලක් වී ඇත්තේ රට තුළ සිදු වන සංවර්ධන ක්‍රියාදාමයන් හේතුවෙන් බව පරිසරවේදීන්ගේ අදහස වී තිබේ. අධිවේගී මාර්ග තැනීම ආදි විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෑමේදී ස්වාභාවික වනාන්තරවලට හානි සිදු වීම වැළැක්විය නොහැකිය. එහෙත් රටක් එක තැන පල් විය නොහැකිය. සංවර්ධන ක්‍රියාදාමයන් තුළින් රට ඉදිරියට යා යුතු වේ. ස්වාභාවික පරිසරය හා සතුන් මෙන්ම ශාක ද ආරක්ෂා කර ගනිමින් සංවර්ධන ක්‍රියාදාමයන් කරා යන්නේ කෙසේදැයි විමසා බැලීම කාලීන අවශ්‍යතාවකි.



සංවර්ධන ක්‍රියාදාමයත් සංරක්ෂණ ක්‍රියාදාමයත් එකිනෙක සමගාමීව ගමන් කළ යුතු වේ. රටක සංවර්ධන ක්‍රියාවලිය සිදු කළ යුත්තේ එය එක ඒකකයක් ලෙස සලකා ගෙනය. මෙය දෙකක් ලෙස සලකමින් කිරීමට ගිය හොත් විවිධ ගැටලු හට ගනී. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාව තුළ සංවර්ධන ක්‍රියාදාමයක් කිසියම් ස්ථානයක කෙරෙන විට එම සංවර්ධන ක්‍රියාදාමය පිළිබඳව පමණක්ම සලකමින් එම ක්‍රියාවලිය සිදු කළ හොත් එම ක්‍රියාවලිය හේතුවෙන් අනිසි ප්‍රතිඵල බොහොමයක් ඇති වීමට ඉඩ තිබේ. එම අනිසි ප්‍රතිඵල විශාල ලෙස බලපානු ලබන්නේ ජෛව විවිධත්වයටය.

බොහෝ දුරට සලකා බැලීමේදී රට තුළ සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කිරීම සඳහා තෝරා ගැනෙනුයේ ද ජෛව විවිධත්වය සහිත ප්‍රදේශයන්ය. ඊට හේතු වී ඇත්තේ පෘථිවියේ ජීවත් වන මානව ගහන ඝනත්වය ශීඝ්‍රයෙන් වැඩි වී තිබීමය. මේ වන විට ලෝකයේ මානව ගහනයෙන් යුතු භූමි ප්‍රදේශ තුළ මානවයන් විවිධ ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි. උදාහරණයක් ලෙස ඇතැම් මිනිසුන් ඔවුන් ජීවත් වන භූමිය ගොවිතැන් කටයුතු සඳහා යොදා ගනු ලබයි. ඇතැම් මිනිසුන් ඔවුන්ගේ භූමිය මත්ස්‍ය කර්මාන්තය සඳහා යොදා ගෙන තිබේ. මේ ආකාරයෙන් කුකුළු කර්මාන්තය, ඌරු කොටු ආදි විවිධ ක්‍රියාකාරකම් සඳහා ඔවුන් බිම් ප්‍රදේශ වෙන් කර ගෙන තිබේ.

## තර්ජන ඇති වීම

මෙවැනි වෙන් කර ගත් ප්‍රදේශ ඔස්සේ කිසියම් සංවර්ධන ව්‍යාපෘතියක් සිදු කරන විට එම ප්‍රදේශවලට තර්ජන ඇති වීම ස්වාභාවිකය. මෙවැනි තර්ජන ජෛව විවිධත්වයට මෙන්ම මානවයන්ට ද ඇති විය හැකිය. මෙම තර්ජන ශාක සහ සතුන්ට ඇති වුව හොත් එම ශාක සහ සතුනට උද්ඝෝෂණය කොට එම තර්ජන නවතාලිය නොහැකිය. එම නිසා ඇතැම් සතුන් එම සංවර්ධන කටයුතු කෙරෙන ස්ථානවලින් වෙනත් ප්‍රදේශයකට පර්යටනය වේ. එලෙස වෙනත් ස්ථානයකට සංක්‍රමණය වීමට නොහැකි සත්ත්වයින් තවදුරටත් එම ස්ථානයන්හි රැඳී සිට අවසානයේ නෂ්ට වී යෑම සිදු වේ. මෙලෙස වඳ වී යෑම හේතුවෙන් ශ්‍රී ලංකාවට ආවේණික ජීවී විශේෂ රටට අහිමි වීම සිදු විය හැකිය. මෙසේ වීමට හේතු වී ඇත්තේ ඇතැම් සංවර්ධන ව්‍යාපෘති සිදු කරනු ලබන ස්ථාන ඔවුනට පමණක් ආවේණික ස්ථාන වන බැවිනි.

මෙම තත්ත්වයන් යටතේ සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති තුළින් මිනිසුන්ට හානියක් වුව හොත් ඒ පිළිබඳව කෑ ගසා හෝ උද්ඝෝෂණ කරමින් ඊට විරුද්ධත්වය ප්‍රකාශ කළ හැකිය. එවැනි තත්ත්වයන් යටතේ මිනිසුන්ට සිදු වෙන අලාභයට වන්දි ගෙවීම හෝ එම ජනතාව වෙනත් ස්ථානයකට නැවත පදිංචි කරවීමට සහ ඔවුන්ට අවශ්‍ය පහසුකම් සලසා දෙමින් ඔවුන් එම සංවර්ධන ව්‍යාපෘති සිදු කෙරෙන භූමි තුළින් ඉවත් කර එම සංවර්ධන ව්‍යාපෘති සාර්ථක කර ගත හැකිය.

## සංවර්ධනයේ ගමන් මඟ

ශ්‍රී ලංකාව තුළ මෑත ඉතිහාසය තුළ සිදු කරන ලද විශාලම සංවර්ධන ව්‍යාපෘතිය කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපෘතියයි. මෙම ව්‍යාපෘතිය තුළ අක්කර සිය දහස් ගණනක ජීවීන්ගේ වාසස්ථාන අහිමි විය. මෙහිදී ඇතැම් ජීවීන්ගේ වාසස්ථාන විනාශ වීම තුළ ශාක සහ සතුන් විශාල ප්‍රමාණයක් නෂ්ට විය. ඇසට පෙනෙන ජීවීන් මෙන්ම ඇසට නොපෙනෙන ජීවීන් ද ඒ අතර විය.

එහෙත් රටක් සංවර්ධනය කරා ගෙන යෑමට නම් සංවර්ධන ව්‍යාපෘති සිදු විය යුතුය. රටකට ආයෝජකයන් ගෙන්වා ගැනීමට නම් රටේ යටිතල පහසුකම් සංවර්ධනය කළ යුතු වේ. එනම් රට තුළ පහසුවෙන් ගමන් කළ හැකි අධිවේගී මාර්ග සකස් විය යුතුය. මේ නිසා රට තුළ සිදු කෙරෙන සංවර්ධන ව්‍යාපෘති සඳහා ආයෝජකයන් ගෙන්වා ගැනීමට යටිතල පහසුකම් දියුණු කිරීම අනිවාර්යය. යටිතල පහසුකම් දියුණු කිරීම උදෙසා කරනු ලබන සංවර්ධන ක්‍රියාදාමයේදි ඇතැම් අවස්ථාවල රටට අහිමි වන ජීවී සම්පත නැතහොත් ජෛව විවිධත්වය රැක ගැනීමට ද ක්‍රියාත්මක විය යුතුය. ඒ පිළිබඳව නොතකා සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳව පමණක් සිතා කටයුතු කළ හොත් අවසානයේදී සිදු වන්නේ මිනිසුන්ට පෘථිවිය මත ජීවත් වීම සඳහා වන ප්‍රවණතාවය නොහොත් හැකියාව මිනිසුන් විසින්ම අහිමි කර ගැනීමය.



ආචාර්ය
සුරතිස්ස දිසානායක
පරිසර විද්‍යා හා සත්ත්ව
විද්‍යා අධ්‍යයන අංශය
කොළඹ විශ්වවිද්‍යාලය

ලෝකයේ සෑම රටකටම බලපානු ලබන ගෝලීය උණුසුම මීට කදිම උදාහරණයකි. ගෝලීය උණුසුම ඇති වීමට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ මිනිසුන්ගේ සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රතිඵලයන්ය.

ගෝලීය උණුසුම හේතුවෙන් ලෝකයේ බොහෝ දූපත් ලෙස පවතින රටවල් සාගර ජල මට්ටම ඉහළ යෑම නිසා එනම් උත්තර ධ්‍රැවයේ අයිස් කඳු දිය වී යෑම තුළ එම දූපත් වැසී යෑමේ තර්ජනයට ලක් වී තිබේ. එම වැසී යෑම තුළ ජෛව විවිධත්වය ශීඝ්‍රයෙන් ශූන්‍ය වීමක් සිදු වේ. මේ නිසා එම දූපත්වාසීන්ට වාසස්ථාන අහිමි වේ. රටක සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාවට නංවාලීමට සිදු වන්නේ මෙවැනි සිදුවීම් රාශියක් මධ්‍යයේය.

## විවිධ ක්‍රමවේද

ජෛව විවිධත්වය ද රකිමින් සංවර්ධනය කිරීම පිළිබඳව සලකා බැලීමේදි වර්තමානයේ මේ සඳහා විවිධ ක්‍රමවේදයන් සකස් කර ගැනීමේ හැකියාව පවතී. එම ක්‍රමවේදයන් තුළ ප්‍රධාන වශයෙන්ම සංවර්ධන ක්‍රියාදාමයක් ආරම්භ කිරීමට පෙර මේ සඳහා නිසි අවසරයක් ලබා ගැනීම කළ හැකිය. ඒ සඳහා අවශ්‍ය කරන්නා වූ නීති රීති මාලාවන් සකස් කොට තිබේ. අදාළ සංවර්ධන භූමිය අයත් වන්නේ වනජීවී දෙපාර්තමේන්තුවට ද යන්න සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ද යන්න මෙන්ම මධ්‍යම පරිසර අධිකාරියට ද යන්න හෝ එසේ නොමැති නම් වෙනත් සංරක්ෂණ මධ්‍යස්ථානයකට ද යන්න අනුව මෙම නීති රීති වෙනස් වේ. ඇතැම් නීති රීති ආයතනයෙන් ආයතනයට වෙනස් වන බැවිනි.

කෙසේ වෙතත් සංවර්ධන ව්‍යාපෘතියක් සිදු කරන විට ප්‍රධාන වශයෙන් කළ යුත්තේ පාරිසරික තත්ත්ව ඇගයීම් වාර්තාවක් ලබා දීමය. පාරිසරික තත්ත්ව ඇගයීම් වාර්තාවක් යනු මෙම ක්ෂේත්‍රයේ නිපුණයන් විසින් අදාළ සංවර්ධන ව්‍යාපෘතිය සිදු කරනු ලබන ස්ථානය නිසි පරීක්ෂාවට ලක් කොට එම ස්ථානය තුළ පවතින ජෛව විවිධත්ව මට්ටම් හඳුනාගෙන එනම් තර්ජනයට ලක්වුණු විශේෂ සහ අන්තරායට ලක් වුණු විශේෂ සිටී දැයි සොයා බැලීම සහ එම විශේෂවල ආවේණිකත්වය කුමක් ද වැනි කරුණු අධ්‍යයනය කිරීමය. මීට අමතරව එම ප්‍රදේශවල ජීවත් වන මානවයන්ගේ සමාජ තත්ත්වය (sociology) පිළිබඳ අධ්‍යයනය කළ යුතුය. මෙම සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් එම ප්‍රදේශවල ජීවත් වන මානවයන් අගතියට පත් නොවිය යුතුය. සංවර්ධන ව්‍යාපෘති තුළින් මානවයන්ට සුගතියක් ලැබිය යුතුය. බොහෝ සංවර්ධන ව්‍යාපෘති තුළින් අදාළ ප්‍රදේශයන්හි ජනතාවට රැකී රක්ෂා ලැබෙන බව සත්‍යයකි. එහෙත් රැකී රක්ෂා ලැබීම තුළ ඔවුන්ගේ නිජබිම ඔවුනට අහිමි වී යෑමේ අවදානමක් ද තිබේ. මෙම ගැටලුවලට පිළියම් සෙවිය යුතු වේ.

## භූගත ජලය

සංවර්ධන ක්‍රියාදාමයක් ක්‍රියාත්මක කළ යුත්තේ භූගත ජලය පිළිබඳ මනා අවබෝධයකින් යුතුවය. පානය සඳහා යොදා ගනු ලබන භූගත ජලය මෙම වැඩපිළිවෙළේදි අපවිත්‍ර වනවාදැයි හොඳින් සොයා බැලිය යුතුය. උදාහරණයක් ලෙස එම භූමිය තුළ ගොඩනඟනු ලබන ගොඩනැගිල්ලේ හෝ හෝටලයේ අපද්‍රව්‍ය බැහැර කරනු ලබන්නේ කිනම් ස්ථානයකට ද ඒ තුළ නිසි කළමනාකරණයක් තිබේ ද යන්න කෙරෙහි අවධානය යොමු කිරීම වටී. මෙවැනි අත්‍යවශ්‍ය කාරණා සම්බන්ධව ක්ෂේත්‍රයේ නිපුණයන් විසින් දෙන තත්ත්ව වාර්තා සටහනෙහි පැහැදිලිවම සඳහන් කළ යුතුය. එමෙන්ම මෙම තත්ත්ව වාර්තාව විද්වත් කමිටුවකට බාර දීමෙන් පසු එවිට එම විද්වත් කමිටුව එම වාර්තාව පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගෙන එහි තිබෙන කරුණුවලට එකඟ විය හැකි ද එකඟ විය නොහැකි ද යන කාරණාව මත එම කමිටුවේ වාර්තාව ලබා දේ. එහිදී එම ව්‍යාපෘතිය සංශෝධන රහිතව කළ හැකි ද එසේ නොමැති නම් මෙම ව්‍යාපෘතිය කළ යුතුම නම් සංශෝධන සහිතව කළ හැකිද යන්න පිළිබඳව දැනුම් දෙනු ලබයි. නැතහොත් තවත් තත්ත්ව වාර්තාවක් අවශ්‍ය ද යන්න ඔවුන් විසින් පැහැදිලි කරනු ලබයි.

මේ සඳහා පෙන්වා දිය හැකි ආසන්නතම උදාහරණයක් ලෙස මත්තල ගුවන්තොටුපළ පෙන්වා දිය හැකිය. මෙම ගුවන් තොටුපළ ගොඩනැඟීම සඳහා මුලින්ම තෝරා ගත් ස්ථානය පිළිබඳව ලබා ගත් තත්ත්ව වාර්තාව මෙම විද්වත් කමිටුව මඟින් ප්‍රතික්ෂේප කෙරිණි. මේ නිසා උඩ මත්තල පිහිටි ස්ථානයකට නව ගුවන් තොටුපළ ගෙන යෑමට සිදු විය. උඩ මත්තල ප්‍රදේශය සඳහා ද දුන් පළමු ජෛව විවිධත්ව වාර්තාව ප්‍රතික්ෂේප වූ අතර දෙවැනි තත්ත්ව වාර්තාවක් නැවත කැඳවීමට සිදු විණි. මෙම දෙවැනි තත්ත්ව වාර්තාවට අනුව මත්තල ගුවන්තොටුපළෙහි පළමු අදියර නිම කෙරිණි. දෙවැනි අදියරේදී තවත් කිලෝමීටර 1.2ක පමණ පර්යන්තයක් ඉදි කිරීමට අවශ්‍ය වූ බැවින් එම ප්‍රදේශයේ ජෛව විවිධත්වය සහ එම ප්‍රදේශයේ ජීවත් වන මානවයන්ගේ නිවාස, මෙන්ම මෙහි වෙසෙන වන අලි ආදි ගැටලු රාශියක් හේතුවෙන් නැවතත් තත්ත්ව වාර්තාවක් ලබා ගෙන තිබේ.

මෙම නීති රීතිවලට අනුකූලව සංවර්ධන ව්‍යාපෘති සිදු කෙරෙන අතර ඇතැම් අවස්ථාවන්හිදී වන අලි නිතර ගමන් ගන්නා මංමාවත් (jungle corridors) හමු වේ නම් එම මංමාවත් මඟහැර සංවර්ධන ක්‍රියාදාමය සිදු කිරීම වඩාත් සුදුසුය. වර්තමානයේදී ශ්‍රී ලංකාවේ මෙවැනි ක්‍රමවේදයන් හඳුනාගෙන තිබීම සතුටට කරුණකි. මේ ආකාරයෙන් විවිධ ක්‍රියාකාරකම් කිරීමේ හැකියාව සංවර්ධන ව්‍යාපෘති තුළින් හඳුනාගෙන තිබේ. මේ නිසා සංවර්ධනය සහ සංරක්ෂණය දෙකක් නොව එකක් ලෙස සලකා කටයුතු කළ යුතු වේ.

## හරිත භූමි

සංවර්ධන ක්‍රියාවලියත් සමඟ සංරක්ෂණ ක්‍රියාවලිය ද සමගාමීව කළ යුතුය. එවැනි ක්‍රියා පිළිවෙත් ලෙස සංවර්ධනය වන භූමි භාගයන් හරිත භූමි ලෙස හෝ සංවර්ධනය වන නගර හරිත නගර ලෙස හෝ සංවර්ධන ක්‍රියාදාමයත් සමඟ ඉදි කරනු ලබන ගොඩනැඟිලි හරිත ගොඩනැඟිලි ලෙස සංවර්ධන ක්‍රියාදාමයට යොදා ගත හැකිය. මෙම සංකල්පය සිංගප්පූරුවේ ඉතා සාර්ථක අන්දමින් ක්‍රියාවට නංවා ඇත. එහි ජාතික විශ්වවිද්‍යාලය මෙම සංකල්පයට අනුව ගොඩනගා ඇත. ගොඩනැඟිලි නිර්මාණයේදී පවා ශක්ති අර්බුදයට (Energy Crisis) පිළියම් සහිතව ඒවා නිර්මාණය කිරීමෙන් අනාගතයේදී මුහුණ දීමට සිදු වන ශක්ති අර්බුදයට සාර්ථකව මුහුණ දීමට හැකිය. එහිදී 5R ක්‍රියා පිළිවෙත හෝ අවම වශයෙන් 3R පිළිවෙත ක්‍රියාවට නංවා ඇත. එම ගොඩනැඟිලි, පරිසර හිතකාමී උපකරණ සහිත නැවත ප්‍රතිචක්‍රීකරණය කළ හැකි පරිසර හිතකාමී ගොඩනැඟිලි ද්‍රව්‍යයන්ය. පිරිසුදු වාතාශ්‍රය ලැබීමට සැලැස්වීමෙන් එහි වෙසෙන්නන්ට වායු සමීකරණ භාවිතය අවම කරවීම, නැවත චක්‍රීකරණය කළ හැකි ශක්තීන් භාවිතය, කාර්යක්ෂම ජල පාරිභෝජනය, අදාළ භූමි ප්‍රදේශය ඵලදායී භාවිතය හා ආර්ථික වටිනාකමක් ලබා ගත හැකි වන පරිදි (cost effective) යොදා ගනු ලබන පරිසර හිතකාමී තාක්ෂණය සහිතව නිර්මාණය කරන්නට පෙලඹී ඇත. එමෙන්ම එම ගොඩනැඟිලි තුළ ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන් (CFC Free) නැති HVAC (Heating Ventiliation and Air Conditioning) උපකරණ ගොඩනැඟිලි තුළ භාවිතයට යොදා ඇත. එමෙන්ම ජලය ගලා යන කානු පද්ධතීන් Bioswale ලෙස (ජෛවීය පෙරීම හා ගලා යෑම) සැකසීමෙන් අපජලය ද ඵලදායී ලෙස පරිසරයට එකතු කළ හැකිය. Bioscruber මඟින් කර්මාන්ත ශාලා මඟින් පිටවන වායූන් පෙරා වාතයට නිදහස් කිරීමෙන් වායු දූෂණය අඩු කර ගත හැකිය.

ශ්‍රී ලංකාවේ සිදු වන සංවර්ධන ක්‍රියාදාමයන් multiple resource use concept (විවිධ සම්පත් ප්‍රයෝජනයට ගෙන ඒවා එකට භාවිත කොට කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සංකල්පය) ආකාරයට කරනු ලබන්නේ නම් වඩාත් පලදායී වේ.

**චතුමී පිටිපන**



# ඩිජිටල් ගනුදෙනු ගැන හරියටම දැන ගන්න



## ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ධර්ම ශ්‍රී කුමාරතුංග

කොවිඩ් 19 වයිරසය ලෝකය පුරා පැතිරෙද්දී ඉන් මිදීමට ජනතාව විවිධ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද භාවිත කරයි. වයිරසය පැතිර යෑමේ ප්‍රධාන මාධ්‍යයන්හි දොර වසා දැමීමට සෞඛ්‍ය අංශ කටයුතු කරනු ලැබුවේ රෝගය පැතිර යෑමේ අවදානම හැකි තාක් අවම කිරීමේ අරමුණිනි. මේ අතර හැකි සෑම විටම මුදල් නෝට්ටු පාලනයෙන් වැළකී සිටීමට ජනතාව පියවර ගනු ලැබුවේ මුදල් මතුපිට වයිරසය පැවතිය හැකි යැයි විද්‍යාත්මක මත පළ වීමත් සමඟය. එහෙයින් ජනතාව ශීඝ්‍ර වශයෙන් ඩිජිටල් ගනුදෙනු කරා යොමු විය. ලෝකයේ තත්ත්වය එසේ වන විට ශ්‍රී ලංකාවේ තත්ත්වය ද වෙනසක් නොවිණි. අද වන විට බොහෝ ජනතාව තමාගේ මූල්‍ය කටයුතු වෙනුවෙන් ඩිජිටල් ක්‍රමවේදයන් බහුල වශයෙන් යොදා ගනී. අද අපේ කතා බහ ඩිජිටල් මුදල් ගනුදෙනු පිළිබඳය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ධර්ම ශ්‍රී කුමාරතුංග මහතා සමඟ දිනමිණ කරන ලද සාකච්ඡාවකි.

**● ගිය අවුරුද්දේ (2020) ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති පෙර දැක්ම ඉදිරිපත් කරමින් එම අවුරුද්ද 'ඩිජිටල් ගනුදෙනු වසර' ලෙස නම් කළා. එහි ඇරඹුම පිළිබඳව ඔබගේ මතකය කෙබඳු ද?**

ඇත්තටම 2020 වසරේ මුදල් හා මූල්‍ය ප්‍රතිපත්ති පෙරදැක්ම ඉදිරිපත් කිරීමට පෙර අප ඊට නව යෝජනා සහ අනාගත සැලසුම් සම්පාදනය කරමින් සිටියා. ඒ අනුව 2019 මැද භාගයේ පටන් අපි අලුතින් සිතන්න පටන් ගත්තා. එහි ප්‍රතිඵලයක් ලෙස වසරේ තුන්වැනි කාර්තුව වන විට අලුත් අදහසක් ලෙස අප ජාතික LANKA QR කේත ක්‍රමය ඔස්සේ ඩිජිටල් ගනුදෙනු කිරීමේ පහසුකම වැඩි කිරීමට යෝජනා කළා. එය ටිකක් පුංචියට පටන් ගත් යෝජනාවක්.

**● 'ඩිජිටල් ගනුදෙනු වසරක්' ලෙස ගිය වසර (2020) නම් කිරීමට ප්‍රථම පුංචියට පටන් ගත් ක්‍රියාවක් බව මෙය ඔබ හඳුන්වනවා. ඇත්තටම ඒ පිළිබඳව දැනගැනීමට අප කැමතියි.**

අද කාලයේ ජනතාවට මීට වසරකට පෙර ඩිජිටල් ගනුදෙනු කිරීම ගැන එතරම් අත්දැකීමක් තිබුණේ නැහැ. අපේ රටේ ඒ දවස්වල ඩිජිටල් බැංකුකරණයට රටම සූදානම් වෙමින් තිබුණේ. අපේ රටේ බැංකු හා මූල්‍ය ආයතනවල ශාඛා රට පුරා 3000ක් පමණ පිහිටා තිබෙනවා. මේවායේ ස්වයංක්‍රීය ටෙලර් මැෂින් (ATM), ස්වයංක්‍රීය තැන්පතු මැෂින් (CDM) ඊට අමතරව වෙනත් බිල්පත් ගෙවීමේ පහසුව සහිත මැෂින් (KIOSK) තිබුණා. නමුත් ජනතාව මේවායින් ලබා ගන්නා සේවා ප්‍රමාණවත් වුණේ නැහැ. බොහෝ දුරට ATM මැෂින් හරහා මුදල් ගැනීම් පමණයි වැඩි වශයෙන් ජනතාව සිදු කළේ.

නමුත් ඊට එහා ගිය සේවාවක් මේවා තුළින් ලබාගැනීමට ජනතාව පෙළඹවීමක් අප විසින් කළ යුතු යැයි කල්පනා කළා. ඒ අනුව මුලින්ම ඩිජිටල් ගනුදෙනු ප්‍රවර්ධනය කරන්න දිනයක් නම් කොට ඒ අනුව ක්‍රියා කිරීමට අප සිතුවා. පසුව එම අදහස ඩිජිටල් ගනුදෙනු සතියක්, ඩිජිටල් ගනුදෙනු මාසයක් ලෙස වැඩිදියුණු කිරීමට කල්පනා කළා. කෙසේ නමුත් අවසානයේ ගිය අවුරුද්දේ මුදල් හා මූල්‍ය ප්‍රතිපත්ති පෙරදැක්ම එළිදක්වන විට වසර '2020 ඩිජිටල් ගනුදෙනු වසර' ලෙස නම් කරමින් කටයුතු කළා.

**● ශ්‍රී ලංකාවේ ඩිජිටල් ගනුදෙනු වසර ලෙස නම් කරමින් 2020 වැඩකටයුතු සිදුකළා. නමුත් ඊට පෙර ලෝකයේ මේ පිළිබඳව කුමනාකාරයේ ක්‍රියාදාමයක් ද සිදු වී තිබෙන්නේ?**

ඉතා හොඳ ප්‍රශ්නයක්. ලෝකයේ QR කේත ක්‍රමය හරහා ගනුදෙනු සිදු කොට ජනතාවටත්, ව්‍යාපාරික ප්‍රජාවටත් පහසුකම් සැපයීමට හැකියාව තිබේ දැයි මුලින්ම කතා වුණේ ජපානයේ. ඒ 1990 වසරේ. ඔවුන් QR යන්නෙන් අදහස් කළේ ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම (Quick Response) මෙය සිදුකිරීමට යම් බැංකු හා මූල්‍ය ආයතනයකට, වෙනත් පුද්ගලයකුට හෝ ව්‍යාපාරයකට බද්ධ කර ගැනීමට ක්‍රමවේදයක් තිබිය යුතුයි. සකස් කළ යුතුයි. එය සියලුදෙනා පිළිගත යුතුයි. මෙන්න මේ කථිකාව තුළ ඉදිරියට ආ අපි මුලින්ම වසර 2017දී කතාබහට ලක් කළා. එම කථිකාව වඩාත් වේගවත් කොට 2018 ඔක්තෝබර් 09 වැනි දින අප මුලින් කී අන්දමට මේ පිළිබඳව මූලික පියවරයන් ගැනීම ආරම්භ කළා. ස්මාර්ට් ජංගම දුරකථන පාදක කරගෙන විද්‍යුත් මුදල් (Mobile Phone Based E-Money Systems) හරහා QR කේත ක්‍රමයක් භාවිතා කිරීමට හැකියාව සොයා බැලුවා. එසේ ගලා ආ වැඩපිළිවෙළ වඩා වේගවත්ව, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට හැකිවූයේ 2019 අවසන් කාර්තුවේදියි.

**● අපේ රටේ ණය පත් (ක්‍රෙඩිට් කාඩ්) සහ හරපත් (ඩෙබිට් කාඩ්) කොපමණ ප්‍රමාණයක් ගනුදෙනුකරුවන් අතර තිබෙනව ද?**

ඇත්තටම මේ වන විට ඩෙබිට් කාඩ් මිලියන 23ක් ක්‍රෙඩිට් කාඩ් මිලියන 1.9ක් වැනි ප්‍රමාණයක් තිබෙන බවට වාර්තා වෙනවා. මේ අතරින් බොහෝ පහසුකම් ගනුදෙනුකරුවන්ට සපයා ගැනීමට හැකියාව තිබෙනවා. නමුත් ඒ පිළිබඳව පවතින උනන්දුව මදි බවක් පවතිනවා. එය පියවීම තමයි ජාතික LANKA QR කේත ක්‍රමය හඳුන්වාදීමටත් මුල් වුණේ.

**● අපේ රටේ ස්ථාවර දුරකථන සහ ජංගම දුරකථන භාවිතය එන්න එන්නම ඉහළ ගොස් තිබෙනවා. විශේෂයෙන් ජංගම දුරකථන අතරින් නවීන ස්මාර්ට් දුරකථන භාවිතයත් වැඩි වී තිබෙනවා. මෙය ජාතික LANKA QR කේත ක්‍රමය වැඩි වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට හේතුවක් කර ගත හැකියි නේ ද?**

අනිවාර්යයෙන්ම ඔව්. අපේ රටේ සාමාන්‍ය දුරකථන ප්‍රතිශතය ජනගහනයෙන් එක් පුද්ගලයකුට ගත් විට 133%ක් තරම් වෙනවා. ජංගම දුරකථන අතරින් 30 - 35%ක් ස්මාර්ට් දුරකථන තිබුණෙ. නමුත් මේ වන විට එම ප්‍රමාණය 45 -49% දක්වා වැඩි වී තිබෙනවා. එයත් අපගේ ඩිජිටල් ගනුදෙනු භාවිතය වැඩි කිරීමට විශාල උත්තේජයක්, ශක්තියක් වී තිබෙනවා.

**● LANKA QR ජාතික කේත ක්‍රමය භාවිතයට ගනිමින් ගනුදෙනු සිදු කිරීමට මෙරට බැංකු හා මූල්‍ය පද්ධතිය සූදානම් කිරීමට ඔබ දෙපාර්තමේන්තුව විශාල වෙහෙසක් ගෙන තිබෙනවා. ඒ වගේම මහ බැංකුව මෙම පණිවිඩය ජනතාව වෙත සමීප කිරීමට කටයුතු කරනවා. එහි යම් ප්‍රගතියක් සිදුවී තිබෙනවා.**

ඇත්ත වශයෙන්ම කිව්වොත් අප මෙම LANKA QR ජාතික කේත ක්‍රමය හඳුන්වා දුන් අවදියට වඩා අද වන විට වෙළෙඳපොළේ ඩිජිටල් ගනුදෙනු සිදු වූ ප්‍රමාණය විශාල වශයෙන් වැඩි වී තිබෙන බව සංඛ්‍යා ලේඛන දත්ත පෙන්නුම් කරනවා. අපේ රටේ ගෙවීම් පියවීම් සම්බන්ධයෙන් නිල වශයෙන් කටයුතු කරන LANKA CLEAR සමාගමේ වාර්තාවලත් මේ බව සඳහන් වෙනවා.

**● LANKA QR ජාතික කේත ක්‍රමය ඔස්සේ ගනුදෙනු කිරීමට ගිණුමක් ආරම්භ කිරීමට ලැබී තිබෙන ඉඩකඩ, ඒ සඳහා තිබෙන අවස්ථා ප්‍රමාණවත් ද?**

ඔව්. මේ සඳහා දැනට හොඳ ඉඩකඩක් ලැබී තිබෙනවා. බැංකු හා මූල්‍ය ආයතන 19ක් ඒ වගේම බැංකු නොවන ආයතන 3ක් LANKA QR ජාතික කේත ක්‍රමය යටතේ ගනුදෙනු කිරීමට සූදානම්. ඒ සඳහා අවශ්‍ය පහසුකම් නවීන තාක්ෂණය හා බද්ධ කර ලබා දීමට එම ආයතන කටයුතු කර තිබෙනවා. එය හොඳ ප්‍රවණතාවක්. මෙම ක්‍රමවේදය භාවිත කිරීමට, ගිණුමක් පවත්වාගෙන යෑමට අමතර මුදලක් වැය වන්නේ නැහැ.

**● ජංගම ත්‍රිරෝද රථයකින් ගමන් කරන විට LANKA QR ජාතික කේත ක්‍රමය ඔස්සේ මුදල් ගෙවීමට හැකියාව තිබෙනවා. ඒ බව යම් තරමක ජනතාවක් දැන සිටිනවා. එය තවත් ව්‍යාප්ත කළ යුතුයි නේ ද?**

අනිවාර්යයෙන් ඔව්. අපේ බලාපොරොත්තුවත් ජංගම ත්‍රිරෝද රථවලින් පමණක් නොව ඕනෑම සුළු පරිමාණ ගනුදෙනුවක් පවා ඩිජිටල් ක්‍රමයට සිදුකරන තැනට රට ඉදිරියට ගෙන යෑමයි. ත්‍රිරෝද රථවලට මීටරය හඳුන්වා දුන් මුල් අවදියේදී මගී ජනතාව ත්‍රීවීලරය නතර කොට මීටරය තිබේදැයි විමසා මීටරය සවිකොට නැති නම් එයට ගොඩ නොවී සිටියා. මීටරය සවි කොට ඇති ත්‍රිරෝද රථවලින් ගමන් කිරීමට පෙළඹුණා. අපේ බලාපොරොත්තුවත් ඉදිරියේදී LANKA QR ජාතික කේත ක්‍රමය ඔස්සේ ගනුදෙනු කිරීමට සූදානම් අයගෙන් පමණක් එම සේවා ලබාගන්නා තැනට රටේ මහජනතාවගේ මානසිකත්වය, සිතුවිලි ගොඩනැගීමටයි.

**● නවීන තාක්ෂණය භාවිත කොට වඩාත් ඉහළ සේවයක් ලබා ගැනීමට සියලු දේ සිදු කිරීම හොඳයි. නමුත් තාක්ෂණය පවතින දෝෂ හෝ දුර්වලතා හේතු කොටගෙන යමෙකුට යම් අගතියක් සිදු වීමට ඉඩ තිබෙනවා නේ ද?**

එවැනි ප්‍රශ්නයක් අහපු එක හොඳයි. ඇත්තටම නවීන තාක්ෂණයෙන් සිදු වන ගනුදෙනු ඇතුළු ඕනෑම කටයුත්තකදී දැඩි සුරක්ෂිතතාවයක්, විශ්වාසයක් ජනතාවගේ සිත් තුළ තිබිය යුතුයි. එවැනි විශ්වාසයක් ගොඩනැගෙන ආකාරයට තාක්ෂණ අංශය දියුණු කිරීම, එම අංශයේ වංචා, දූෂණ ඇති වීමට පවතින ඉඩකඩ අවම කිරීම අපගේ යුතුකම හා වගකීම.

**● අපේ රටේ ගෙවීම් හා පියවීම් පද්ධතිවල සුරක්ෂිතතාවය කාර්යක්ෂමතාවය පිළිබඳව ඔබට සෑහීමකට පත් විය හැකි ද?**

ඔව් අපේ රටේ ගෙවීම් පියවීම් පද්ධතිවල සුරක්ෂිතතාවය කාර්යක්ෂමභාවය, තරගකාරීත්වය සහ ස්ථායිතාවය ඇති කිරීම මුදල් නීති පනතේ 62 (අ) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී තිබෙනවා. එම වගකීම ඉටුකරන අප දෙපාර්තමේන්තුවයි. මෙහිදී පුළුල් වශයෙන් ශ්‍රී ලංකාවේ ගෙවීම් හා පියවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය ඒ වගේම මුලින්ම කිව්වාක් මෙන් තරගකාරීත්වය ස්ථායිභාවය ඇති කිරීමට අප කටයුතු කරනවා. ගෙවීම් හා පියවීම් පද්ධතිය නියාමනය හා ආවේක්ෂණය කිරීමට සහ ජාතික ගෙවීම් පද්ධති ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත මඟින් මහ බැංකුවට පැවරී ඇති ව්‍යවස්ථාපිත බලය ක්‍රියාත්මක කරන්නේත් අප දෙපාර්තමේන්තුව මඟිනුයි. එපමණක් නොවේ තත්කාලීන දල පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් සිදු කිරීම, මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සැලසීම, ස්විෆ්ට් (SWIFT) සන්නිවේදන කටයුතු කළමනාකරණය ආසියානු නිෂ්කාශන සංගමයේ ACU රටවල් අතර ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම ගෙවීම් පද්ධති යටිතල පහසුකම් සැලසීම ආදී කටයුතු ඉතාමත්ම විධිමත්ව ඉටුකරන මහ බැංකුවේ ක්‍රමවේදය නිසා අපේ රටේ ගෙවීම් පියවීම් පද්ධතිවල සුරක්ෂිතතාවය ඉතා ඉහළ බව පැවසිය හැකියි.



**● මේ වන විට ජාතික LANKA QR කේත ක්‍රමයට කොපමණ මූල්‍ය ආයතන ප්‍රමාණයක් පැමිණ තිබෙනවා ද?**

අපේ රටේ බැංකු සහ මූල්‍ය ආයතන 19ක්, බැංකු නොවන මූල්‍ය ආයතන 3ක්, මේ සඳහා ගනුදෙනු කළ හැකි තාක්ෂණය අනුව නව අන්තර්ජාල ඇප් (APP) නිෂ්පාදනය කරන ආයතන 15ක් මේ වැඩපිළිවෙළ සමඟ ඒකාබද්ධ වී තිබෙනවා. ව්‍යාපාරික ආයතන ලක්ෂ 1 1/2කට වැඩි ප්‍රමාණයක් මේ ක්‍රමය යටතේ ගනුදෙනුවලට පිවිස සිටිනවා. එය ආරම්භයට වඩා වේගයෙන් වැඩිවීමක් වර්තමානයේදී දක්නට ලැබෙනවා.

**● LANKA QR ක්‍රමවේදය යටතේ ගනුදෙනු සිදු කිරීමේදී ව්‍යාපාරිකයින්ගේ 1 - 2%ක වට්ටම් මුදලක් (MERCHANT DISCOUNT RATE) (MDR) අය කරනවද?**

ඇත්තටම ශ්‍රී ලංකා මහ බැංකුවේ අප ව්‍යාපාරිකයන්ගෙන් අය කළ එම මුදල පසුගිය වසරේදී 0.5%කට අඩු කළා. එම මුදල මේ වසරේ මැද වනතුරුත් එලෙසම අඩු කර කටයුතු කරන ලෙස දැනුම් දී තිබෙනවා. අපි එලෙස තීන්දු ගත්තේ වැඩි ඩිස්කවුන්ට් ප්‍රමාණයක් ගෙවීමට සිදු වුවහොත් ව්‍යාපාරිකයින් තම ව්‍යාපාරික ආයතනය තුළ ගනුදෙනුවලට නව ක්‍රමවේදය භාවිතා නොකරයි යන සිතුවිල්ල මතයි. ඔවුන්ට නව ක්‍රමවේදය භාවිතා කිරීම තුළ වාසි සැලසීම කළ යුතුයි. එවිට ඔවුන් එය ජනතාවට වැඩි වැඩියෙන් හඳුන්වා දීමට පියවර ගන්නවා. ඒ අනුව අපි ඉදිරියේදී තවදුරටත් මෙම ප්‍රතිශත අඩු කළ යුතුයි යන සිතුවිල්ලේ තමයි සිටින්නේ. ඊට අමතරව තවත් දෙයක් අප සිදුකරනවා.

**● එය කුමක්ද?**

යම් ව්‍යාපාරික ආයතනයක් LANKA QR කේත ක්‍රමය භාවිත කොට රජයේ ආයතනයක් සමඟ ගනුදෙනුවක් සිදු කළ විට ව්‍යාපාරික ආයතනයේ 0.5%ක වට්ටම අය කරගන්නේ නැහැ. එසේ කරනුයේ හැකි තරම් මේ ක්‍රමවේදය ඔස්සේ රජයේ ආයතනවල ගනුදෙනු සිදු කිරීමට ඉඩ ලබාදීමේ අරමුණින්.

**● මෙම ක්‍රමවේදය හරහා ගනුදෙනු සිදු කිරීමට අලුතින් අන්තර්ජාල ගනුදෙනු ක්‍රම විධි (APP) හඳුන්වා දිය යුතුයි. එවැනි ඇප්වල සුරක්ෂිතතාවය පිළිබඳ වග කියන්නේ කවුද?**

ශ්‍රී ලංකා මහ බැංකුවේ අපි APP ක්‍රමවේදයට අනුව ගනුදෙනු කළ හැකි නව APP නිර්මාණකරුවන්ට මඟපෙන්වීම් 26ක් ලබා දී තිබෙනවා. එම මඟපෙන්වීම්වලට අනුගතව ඔවුන් එම නව නිර්මාණ කළ යුතුයි. එසේ කළ නිර්මාණය පිළිබඳව කිසිදු දෝෂයක් නැති බවට තුන්වැනි පාර්ශ්වය ස්වාධීන විගණනයක් හරහා සනාථ කරගත යුතුයි. ඊටත් අමතරව LANKA CLEAR ආයතනයේ අනුමැතිය ලියාපදිංචිය ඒ සඳහා හිමිවිය යුතුයි. මෙම කරුණු තුන සපුරා ගන්නා ඇප්වලට පමණක් නව ක්‍රමවේදය ඔස්සේ ගනුදෙනු සිදු කිරීමට ඉඩ කඩ සලසා දී තිබෙනවා. ඒ නිසා කිසිවකුත් ඒ ගැන අනියත බියක් ඇති කර ගත යුතු වන්නේ නැහැ.

**● කොවිඩ් 19 ගෝලීය වසංගතය හමුවේ කාසි හා නෝට්ටු භාවිතය තුළින් පවා කොවිඩ් වයිරසය පැතිර යා හැකි බව සෞඛ්‍ය බලධාරීන් පෙන්වා දී තිබෙනවා. මේ නිසා වයිරසයෙන් ආරක්ෂා වීමට පවා අපට LANKA QR ජාතික කේත ක්‍රමය ඔස්සේ ගනුදෙනු සිදු කිරීමෙන් හැකියාව ලැබෙනවා නේ ද?**

*අනිවාර්යයෙන්ම ඔව්. මෙම ක්‍රමවේදය භාවිත කිරීම තුළ ගනුදෙනුකරුවන්ටත්, ව්‍යාපාරිකයින්ටත් විශාල වශයෙන් තමන්ගේ කාලය හා ශ්‍රමය ඉතිරි වෙනවා. ගනුදෙනු වේගවත් වෙනවා. එපමණක් නොවෙයි බැංකු නොයා බැංකු කටයුතු බැංකු සේවා ලබා ගැනීමට ඉඩ ලැබී තිබෙන නිසා අන්තර්ජාලය ඔස්සේ සියලු ගෙවීම් පියවීම් සිදු කිරීමට ඉඩ ලැබීම විශාල සහනයක්. එය සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයක් වගේම වයිරසයෙන් ගැලවී සිටීමට මඟක් වීමත් සතුටට කරුණක්.

**● අපේ රටට වාර්ෂිකව මුදල් නෝට්ටු නිෂ්පාදනය කිරීමට වැය වන මුදල යම් තරමකින් හෝ ඉතිරි කර ගැනීමට මුදල් රහිත ගනුදෙනු ක්‍රමවේදය හරහා සිදුවීම වාසියක් නේ ද?**

ඔව්. ඇත්තටම අපේ රටේ 2019දී මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම සඳහා රුපියල් කෝටි 320ක මුදලක් වැය වුණා. ඊට අමතරව මෙම මුදල් තොග ප්‍රවාහනය කිරීමට, ගබඩා කිරීමට, ආරක්ෂා කිරීමට, බෙදාහැරීමට, පළුදු වූ නෝට්ටු විනාශ කිරීමට තවත් මුදලක් වැය වෙනවා. මේ නිසා හැකි තරම් කාසි හා නෝට්ටු භාවිතයෙන් තොර ගනුදෙනු ක්‍රමවේදයක් රටට හඳුන්වා දීම තුළ ජාතික ආර්ථිකයට විශාල සේවයක් සැලසෙන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහසයි. ඒ අනුව තමයි මේ ක්‍රමවේදය ආරම්භ කිරීමට පවා අප කල්පනා කළේ.

**● ශ්‍රී ලාංකික පුරවැසියන් ඊට පවතින සූදානම පිළිබඳ ඔබගේ අදහස කුමක් ද?**

ඉතාම සතුටෙන් ප්‍රකාශ කරන්න පුළුවන් අපේ රටේ ජනතාව වේගයෙන් ඩිජිටල් ගනුදෙනු කරා ප්‍රවේශය ලබාගෙන තිබෙනවා. අපේ රටේ ජනගහනයෙන් 83%ක් පමණ තාමත් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන්නේ. මෙම පිරිස් වලට නව ලොව තාක්ෂණය සමඟ ගනුදෙනු කිරීමට ඇති පහසුකම් වැඩි දියුණු කළ යුතුයි. ඒ සඳහා අපේ රටේ බැංකු හා මූල්‍ය පද්ධතියේ සූදානම් කිරීම, යටිතල පහසුකම් දියුණු කිරීම කළ යුතුයි. රජයත් ඊට මුල පුරා තිබෙනවා. මූල්‍ය ආයතනත් දැනට ඒ සඳහා කටයුතු කර තිබෙනවා. එය සතුටට කරුණක්. නමුත් අපි වැඩිදුරටත් මෙම ගනුදෙනු සිදු කිරීමේ වාසිය ගනුදෙනුකාර භවතුන්ට පැහැදිලි කළ යුතුයි. ඒ සඳහා දෙපාර්තමේන්තුවේ අපි විවිධ වැඩමුළු සම්මන්ත්‍රණ පවා සිදු කරමින් සිටිනවා. ඉදිරියට එය වේගවත් කළ යුතුයි.

**ජයසිරි මුණසිංහ**




# රිය අනතුරුවලට තිත තබමු

අප උදෑසන රැකියාවට යන්නට මඟට බසින්නේ, නොඑසේ නම් නිවෙසට අවැසි කළමනා රැගෙන එන්නට පිට වී යන්නේ, අසනීප වූ පවුලේ සාමාජිකයාට ප්‍රතිකාර පතා වෛද්‍යවරයා ළඟට යන්නට පිටවන්නේ කාගේ හෝ කර මතින් සදාකාලික නින්දක් සමඟ යළිත් නිවෙසට එන්නට සිතාගෙන නොවේ. එහෙත් දිනෙන් දින ඉහළ යන රිය අනතුරු හේතුවෙන් ජීවිතය කොයි මොහොතේ නැති වේ දැයි සිතා ගත නොහැකි තරමට අවිනිශ්චිත තත්ත්වයකට පත් වී තිබේ.

මහමග සිදුවන අනතුරුවලින් මිය යන පිරිස සංඛ්‍යා ලේඛනවලට එකතු වෙමින් දිනෙන් දින ඒ සංඛ්‍යා ලේඛන ඉහළ යද්දී එයට වඩා බරපතළ සමාජ අර්බුද රැසකට ඒ සංඛ්‍යා ලේඛනවල දත්තයක් බවට පත් වෙන පුද්ගලයාගේ සමීපතමයන් සහ පවුලේ උදවිය මුහුණ දෙයි. ඇතැම් විට ඒ මිය යන්නේ මුළු පවුලම ජීවත් කළ එකම සවිමත් අත්වැල වන්නට ඉඩ ඇත. තවත් විටෙක ඒ ලෝකයක් තරම් ආදරය කළ දරුවා විය හැකිය. කවුරුන් මිය ගිය ද එය සංඛ්‍යාලේඛනවලට එක් දත්තයක් පමණක් වන විට එය දරා ගන්නා පුද්ගලයන්ට එයින් එල්ල වන පීඩනය සුළු කොට තැකිය හැක්කක් නොවේ.

තිස් වසරක යුද්ධයට වඩා වැඩි ප්‍රමාණයක් මහමග මිය යන බව අදටත් රහසක් නොවේ. 2018 වසරේදී තුන් දහසකට අධික ප්‍රමාණයක් මහමග අනතුරුවලින් මිය ගොස් ඇති අතර 2019 වසරේ දී ද එය තුන් දහසකට ආසන්නව පවතී. කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මහමග ගමන් කිරීම අවම වී තිබෙන තත්ත්වයක් මත 2020 වසරේ දී ද 2000 කට අධික පිරිසක් මහමඟදී ජීවිතක්ෂයට පත්වීම කෙතරම් කනගාටුදායක ද?

රියක සුක්කානම අතට ගත් විට අත්තනෝමතික ලෙස ක්‍රියා කරන්නට කිසිදු රියැදුරකුට හැකියාවක් නැත. සෑම රියදුරකුම තම ජීවිතය සහ පදිකයන්ගේ සහ තමා රැගෙන යන පිරිසක් වේ නම් ඔවුන්ගේත් ජීවිතවලට වගකිව යුතු බව නීති පොතට එහා ගිය මානුෂීය වගකීමක් ලෙස සිත්හි ධාරණය කර ගත යුතුය.

මාර්ග අනතුරු වැඩි වීමට එක් හේතුවක් ලෙස රියැදුරන් දැඩිව මානසික පීඩනයට ලක්වීම ද සඳහන් කළ යුතුය. එහි එක් පැතිකඩක් පිළිබඳව බලධාරීන් ද අවධානය යොමු කළ යුතුය. අධික රථ වාහන තදබදයක් සහිත නාගරික මාර්ගවල පැය ගණන් සිය රථය රඳවාගෙන සිටින රියැදුරන් මාර්ග තදබදයෙන් මිදුණු වහා හැකි ඉක්මනින් තම ගමනාන්තය වෙත ගමන් කරන්නට වේග සීමා නොතකමින් රිය ධාවනය කරයි. චිත්තවේග පාලනය කර ගැනීමට නොහැකි තරමට මානසිකව පීඩාවට පත්වී සිටින පුද්ගලයන් තමා අතින් සිදුවන අනතුර පිළිබඳව නිවැරදි අවබෝධයකින් සිටිනවා ද යන්න සැක සහිතය.

පැය විසි හතරක් තුළ දහ දොළොස් දෙනෙක් මරණයට පත් කරන්නට තරම් මහා මාර්ගය සැහැසි බව දැන දැනත් පවුලේ පුද්ගලයින් මහමඟට බැස ගිය විට ඔවුන් යුද්ධයකට ගිය ලෙසින් නිවෙස්වල ජීවත් වන අය බියෙන් පසු විය යුතුය. එය කෙතරම් ශෝචනීය තත්ත්වයක් ද?

ජීවිතය කෙතරම් කාර්යබහුල වුවත් සිදු කළ යුතු දෑ අනන්ත අප්‍රමාණ තිබුණත් එක මොහොතක පමාව ඒ සියල්ල සදහටම නතර කරන දමන බව රියැදුරන් පමණක් නොව මාර්ගයකට අවතීර්ණ වන සෑම සියලු දෙනාම තරයේ සිතා ගත යුතුය. ඇතැම් විට වරද රථ වාහන පදවන රියදුරාගේ වන අතර තවත් විටෙක රථයක ගැටෙන පදිකයාගේ වරදක් පවතී. සියලු ප්‍රශ්න පසෙක තබා මහා මාර්ගයේදී තමන් ගමන් කරන දිසාවෙහි මරුවා සැඟවී සිටිය හැකි බව සිහි තබාගෙන නිවැරදි සිහියෙන් ගමන් කරන්නට හැකි නම් අනතුරු මඟහරවා ගන්නට එය පිටුවහලක් වනු ඇත.

අධික වෙහෙසක් දැනෙන අවස්ථාවල මඳ විවේකයක් ලබා ගනිමින් නැවතත් රිය ධාවනය වෙත යොමු වන්නට රියැදුරන්ට හැකියාව තිබෙන්නේ නම් ඔවුන් අතින් සිදු වන අනතුරු ප්‍රමාණය අවම කර ගත හැකිය.

රියදුරු බලපත්‍රයක් ලබා දීමේදී රිය ධාවනය කිරීම සඳහා පුද්ගලයා කායික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. නමුත් රිය ධාවනය කරන මොහොතක කායික සහ මානසික යෝග්‍යතාවය බිඳී ගොස් තිබෙන්නට ද හැකිය. යුතුකම් හා වගකීම් මතින් ඉල්ලා සිටින බාහිර ඉල්ලීම් සපුරාලන අතරම ශරීරය විසින් ඉල්ලා සිටින දේ ද ලබා දෙන්නට රියැදුරකුට හැකියාව තිබිය යුතුය. ඕනෑම යන්ත්‍ර සූත්‍රයකට ද විවේකයක් අවශ්‍යය. එසේ නම් නින්ද සහ විවේකය ශරීරයට අත්‍යවශ්‍යම නොවේ ද? මේ දෙකම අඩුවෙන් ලබන තැනැත්තා අතින් අනතුරක් සිදු වන්නට ඇති ඉඩකඩ ඉහළය.

මෝටර් රථ විධිවිධාන පනතේ 169 වැනි වගන්තියෙහි ලියැවී ඇත්තේ පැය 24 ක කාල පරාසයක් තුළ රියැදුරකුට පැය 10 ක අඛණ්ඩ විවේකයක් ලබා දිය යුතු බවය. ඉන් අදහස් වන්නේ රියැදුරකුට සේවය කළ හැකි උපරිම පැය ගණන පැය දාහතරක් බවය. නමුත් මේ සීමාවන් උල්ලංඝනය කරමින් තරගකාරීව කාල කළමනාකරණයකින් තොරව රිය ධාවනයෙහි යෙදීම අනතුරු තවත් ඉහළ නංවයි. එම විධිවිධානවලට පටහැනිව ක්‍රියා කරන රියැදුරන්ගේ සේවය අත්හිට වන්නට සහ ඔහු සේවයෙහි යොදවන්නාට විරුද්ධව නීතිමය පියවර ගන්නට හැකියාව තිබේ.

නීතිය කුමක් වුවත් මිනිසුන්ගේ මානසික සමබරතාවය සහ ආකල්ප යහපත් වූ විට බොහෝ දුර්භාග්‍ය සම්පන්න ඉරණම්වලින් ගැලවෙන්නට හැකියාව තිබේ. රිය ධාවනය කරන සෑම පුද්ගලයකුම සෑම මොහොතකම තමා අතෙහි ඇත්තේ තවත් කෙනෙකු හෝ තමාවම නසන්නට හැකි ආයුධයක් බව සිහි තබා ගන්නට හැකි නම් මහමඟදී සිදුවන අනතුරු වළක්වා ගන්නට වෙනත් යමක් අවශ්‍ය නොවේ.

මිනිසුන් මහමඟට බසින්නේ මහමඟදී සිය ජීවිතයේ අවසන් හුස්ම පොද වා තලයට මුසු කරන්නට නොවේ. රියැදුරකු රථයක් අතට ගන්නේ තමාගේ ජීවිතයෙහි නැවතීමේ තිත තබන්නට එම රිය ධාවනය හේතුවක් කරගන්නට ද නොවේ.

**දිල්රූ ජයසේකර**

# කලාකරුවන්ට පිදෙන 'ප්‍රේක්ෂා' රක්ෂණ හිමිකම් ඔප්පු ප්‍රදානය අගමැති ප්‍රධානත්වයෙන් අද

ශ්‍රී ලාංකේය නාට්‍ය ක්ෂේත්‍රයේ නියැළි කලාකරුවන් වෙත ප්‍රේක්ෂා හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණය - 2021 හිමිකම් ඔප්පු ප්‍රදානය අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ දී අද (16) පස්වරුවේ සිදු කෙරේ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය යථාර්ථයක් බවට පත්කරමින් ටවර් හෝල් රඟහල පදනම භාරකාර මණ්ඩලයේ පූර්ණ අනුමැතිය සහ ආශිර්වාදයෙන් මේ හදිසි අනතුරු හා වෛද්‍ය රක්ෂණය පිරිනමයි.

# සජබ ආණ්ඩුවක් සාදා 2025 සංවත්සරය සමරනවා

## සජිත් ප්‍රේමදාස

**පහන් විජේසේකර**

සමගි ජන බලවේගය 2025 වසරේ දී සංවත්සරය සමරන්නේ සමගි ජන බලවේගයෙන් පත් වූ ජනාධිපතිවරයකු හා ආණ්ඩුවක් සමග බව එහි නායක සහ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පැවසීය.

2015 වසරේ දී මෙන් පොදු අපේක්ෂකයකු යොදා ඉල්ලා ගෙන කෑමට මෙවර සූදානමක් නැති බවත්, පොදු අපේක්ෂකයකු නොව පොදු ජනතාව දිනවන අපේක්ෂකයකු ඉදිරිපත් කිරීමට අවශ්‍ය බවත් විපක්ෂ නායකවරයා සඳහන් කළේ ය.

විපක්ෂ නායකවරයා මේ බව සඳහන් කළේ 'අභියෝග ජයගන්න එකට සිටගමු' මැයෙන් සමගි ජන බලවේගයේ පළමුවැනි සංවත්සර උත්සවය ඊයේ (15) කොළඹ හයිඩ් පිටියේ දී පැවති අවස්ථාවේ දීය.

සුචරිතය ගොඩනගන විට රණසිංහ ප්‍රේමදාස මහතාට එල්ල වූ ගල්මුල් එකතු කර සුචරිතය ශක්තිමත් කිරීමට කටයුතු කළා සේම සමගි ජන බලවේගයට එල්ල වන විවේචන, ගල්මුල් ප්‍රහාර සියල්ලක්ම ප්‍රගතිය පෙන්නුම් කිරීමට ඉවහල් කර ගන්නා බව ද විපක්ෂ නායකවරයා ප්‍රකාශ කළේ ය.

ඒ තුළින් එළැඹෙන ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් කරන පොදු ජන අපේක්ෂකයා වටා ජනතාව ඒකරාශී කරන වැඩසටහන ශක්තිමත් කරන බව ද ඔහු වැඩිදුරටත් කියා සිටියේ ය.

මේ වනවිට ජනතාව දැඩි ආර්ථික මෙන්ම සමාජ පීඩනයක සිර වී සිටින බැවින් ජන දුක නිවාලන ජාතික ව්‍යායාමය දියත් කිරීම සඳහා පාරට බැසීමට සමගි ජන බලවේගය සමඟ එක්වන්නැයි ඔහු ජනතාවට ආරාධනාවක් ද කළේ ය.

සමගි ජන බලවේගයේ ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා, ජාතික සංවිධායක තිස්ස අත්තනායක, ජ්‍යෙෂ්ඨ උප සභාපති කබීර් හෂීම් යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු සමගි ජන බලවේගය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පළාත් පාලන නියෝජිතයෝ, වෘත්තීය සමිති නායකයෝ සහ පාක්ෂිකයෝ විශාල පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

# බංග්ලාදේශ නිදහස් සැමරුමට අගමැතිට ආරාධනා

**මහින්ද අලුත්ගෙදර**

බංග්ලාදේශයේ ජාතික නිදහස් සැමරුම සහ එරට නිර්මාතෘවරයාගේ 100 වැනි ජන්ම සංවත්සර උළෙලට විශේෂ ආරාධිතයකු ලෙස සහභාගි වන්නැයි ශ්‍රී ලංකා අගමැති මහින්ද රාජපක්ෂ මහතාට නිල වශයෙන් ආරාධනා කර තිබේ.

එම ආරාධනය පිළිගත් ශ්‍රී ලංකා අගමැතිවරයා දෙදින රාජ්‍ය චාරිකාවක් සඳහා එළඹෙන 19 දා බංග්ලාදේශය බලා පිටත්ව යාමට නියමිතව තිබෙන අතර ඊට අමතරව එම සංචාරයේ දී ශ්‍රී ලංකා අගමැතිවරයා එරට රජයේ ඉහළ පෙළේ නියෝජිතයන් සහ විදෙස් රාජ්‍ය නායකයන් කිහිපදෙනකු හමුවීමට නියමිත බවද අගමැති මාධ්‍ය අංශය පවසයි.

බංග්ලාදේශ ජාතික නිදහස් සැමරුම සහ නිර්මාතෘවරයාගේ 100 වැනි ජන්ම සංවත්සර උලෙළට සහභාගි වන ලෝක නායකයන් අතර කීර්තිමත් රාජ්‍ය නායකයකු වන අගමැති මහින්ද රාජපක්ෂ මහතාට විශේෂ පිළිගැනීමක් ලබාදීමට බංග්ලාදේශ රජය සූදානමින් සිටින බවද ඒ මහතාගේ පැමිණීම අතිශය වැදගත් බවද බංග්ලාදේශ රජය ප්‍රකාශ කර තිබේ.

කලාපීය සාමය සහ සහයෝගීතාවය වෙනුවෙන් සුවිශේෂී කාර්ය භාරයක් සිදුකර තිබෙන අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ බංග්ලාදේශ රාජ්‍ය චාරිකාව අතරතුර එරට රජයේ ඉහළ පෙළේ නියෝජිතයන් සමඟ ද්විපාර්ශ්වීය වශයෙන් සාකච්ඡා පැවැත්වීමට නියමිතව තිබෙන අතර ඊට අමතරව බංග්ලාදේශය නිදහස ලබා වසර 50 ක් සැමරීම නිමිත්තෙන් ඩකා අගනුවර පැවැත්වෙන රාජ්‍ය උත්සව කිහිපයකට හා සැමරුම් උත්සවයට සහභාගී වීමට ද නියමිත බව අගමැති මාධ්‍ය අංශය සඳහන් කරයි.

ශ්‍රී ලංකා අගමැති මහින්ද රාජපක්ෂ මහතාට අමතරව ඉන්දියාවේ, නේපාලයේ, භූතානයේ සහ මාලදිවයිනේ රාජ්‍ය නායකයන් ද මේ සැමරුම් උත්සවවලට එක්වන සම්භාවනීය විදේශීය අමුත්තන් අතර සිටින බව බංග්ලාදේශ රජය ප්‍රකාශ කරයි.

1971 වසරේ දී විමුක්ති යුද්ධයෙන් පසු බංග්ලාදේශය පාකිස්තාන පාලනයෙන් නිදහස් වීමේ පනස්වැනි සැමරුම මේ මස 17 වැනිදා සිට 27 වැනිදා දක්වා පැවැත්වීමට නියමිතව තිබෙන අතර ඊට සහභාගි වීම සඳහා මාලදිවයින් ජනාධිපති ඉබ්‍රාහිම් මොහොමඩ් තෙදින සංචාරයකට මේ 17 වැනි දින බංග්ලාදේශයට පැමිණෙන අතර අගමැති මහින්ද රාජපක්ෂ මහතා මාර්තු 19 වැනි දින දෙදින රාජ්‍ය සංචාරයක් සඳහා ඩකා අගනුවරට සම්ප්‍රාප්ත වීමට නියමිතයි.

නේපාල ජනාධිපති බිදියා දේවි භන්ඩාරි දෙදින සංචාරයක් සඳහා ලබන 22 වැනිදා ද, භූතාන අගමැති ලෝටේ ෂෙරින්ග් 24 වැනිදා ද, ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි මහතා ලබන 26 දින දෙදින සංචාරයක් සඳහා ද පැමිණෙන බව වාර්තා වෙයි.

එම සැමරුම් උත්සව කාලසටහනට අනුව ශ්‍රී ලංකා අගමැතිවරයා ඇතුළු රාජ්‍ය නායකයන්, 1971 විමුක්ති යුද්ධයේ නිදහස් දිවි පිදූවන්ට උපහාර දැක්වීම, විශේෂ හමුදා පෙළපාළි නැරඹීම, රාජ්‍ය භෝජන සංග්‍රහවලට සහභාගී වීම සහ බංගබන්දු කෞතුකාගාරය නැරඹීම සඳහා ලෝක නායකයන් අගනුවර මායිමේ පිහිටි ජාතික ස්මාරකය නැරඹීමට ද එක්වනු ඇත.

01 පිටුවෙන් ...

## සහල් ආනයනය ...

ඊට අදාළ කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා තමන් ඉදිරිපත් වන බවත් කොවිඩ් නිසා පීඩාවට පත්ව සිටින ජනතාවට සාධාරණ මිලට සහල් සපයන්න මෙම පියවර ගන්නා බවත් ඒ මහතා පැවසීය.

## අප්‍රේල් 21ට පෙර ...

එබැවින් අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ද පාස්කු කොමිසමේ නිර්දේශයන් අප්‍රේල් 21ට පෙර ඉටු කරන ලෙස කර ඇති ඉල්ලීම යථාර්ථයක් කිරීම අසීරු නොවන බවත් පාස්කු ප්‍රහාරයේ සම්පූර්ණ සත්‍ය අනාවරණය කර වැරදිකරුවන් නීතිය හමුවට ගෙන ඒමට රජය ඇප කැප වී කටයුතු කරන බවත් ඇමැතිවරයා කියා සිටියේය.

ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කළේ ඊයේ (15) බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පැවැත්වූ විශේෂ මාධ්‍ය හමුවේදීය.

පාස්කු කොමිසම් වාර්තාවේ නිර්දේශ අනුව නිර්දේශ කර ඇති එක් එක් ආයතන දින වකවානු සහිතව ආරම්භ කිරීමට පියවර ගන්නා ලෙස ජනාධිපතිවරයා රාජ්‍ය ආයතන සහ නිලධාරීන්ට නියෝග කර ඇති බවද ඇමැතිවරයා කියා සිටියේය.

පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සැකකරුවන් ශ්‍රී ලංකාව තුළදී 99 දෙනකු අත්අඩංගුවට ගෙන ඇති අතර පුද්ගලයන් 54 දෙනකු විදේශ රටවලට පලාගොස් ඇති බවත් ඉන් 50 දෙනකු මේ වන විට අත්අඩංගුවට ගෙන මෙරටට ගෙන විත් ඇති අතර තවත් 04 දෙනකු විදේශයන් හී අත්අඩංගුවට ගැනීමට සිටින බව ද පැවසීය.

පාස්කු ප්‍රහාරය පිළිබඳ කොමිසන් සභාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට දැඩි අධිෂ්ඨානයක් සහ වුවමනාවක් ඇති බවද ඇමැතිවරයා වැඩිදුරටත් කියා සිටියේය.

# ලලිත් වීරතුංග - අනූෂ පැල්පිට සිල් රෙදි නඩුවෙන් නිදහස්

## තීන්දුව කියවා දී නඩුව අවසන් කරයි

**රෝෂන් තුෂාර**

රුපියල් මිලියන 600ක සිල්රෙදි බෙදා දෙමින් මුදල් සාපරාධි සාවද්‍ය පරිහරණය කිරීම ඇතුළු අධි චෝදනා යටතේ වරදකරුවන්වී සිරදඬුවම් නියම වූ හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග සහ විදුලි සංදේශ නියාමන කොමිසමේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් අනූෂ පැල්පිට යන මහත්වරුන් අභියාචනාධිකරණය මගින් නිදොස් කොට නිදහස් කිරීමේ තීන්දුව ඒ මහත්වරුන් ඉදිරියේ කියවා දීම සිදු කළ කොළඹ මහාධිකරණ විනිසුරු දමිත් තොටවත්ත මහතා නඩුවේ සියලු කටයුතු අවසන් කරන බව ඊයේ (15) නියෝග කළේය.

මහාධිකරණයේ ඇප කොන්දේසි ප්‍රකාරව තැන්පත් කර ඇති දඩ මුදල් අනෙකුත් ඇප යළි මුදාහරින ලෙසට ද නියෝග කළේය.

අනූෂ පැල්පිට හා ලලිත් වීරතුංග මහත්වරුන්ගේ විදේශ ගමන් බලපත්‍ර මහාධිකරණය බාරයේ ඇත්නම් එවා යළි ඒ මහතුන් වෙත බාර දෙන ලෙසත්, ගුවන්ගමන් තහනම් නියෝග ඉවත් කිරීමේ නිවේදන ආගමන විගමන පාලකවරයාට හා අදාළ අංශ වෙත යොමු කරන ලෙසත් මහාධිකරණ විනිසුරුවරයා නියෝග කළේය.

සිල්රෙදි බෙදාදෙමින් සාමාජ සත්කාරයක් කර ඇති විත්තිකරුවන්ට රාජ්‍ය සේවය පිළිබඳ මනා පරිචයක් ඇති බවත්, විදුලි සංදේශ පනත හෝ පොදු දේපළ පනත කිසි ලෙසකින් උල්ලංඝනය කැර ඇති බවට සාක්ෂි නොමැති බවත් පවසමින් අභියාචනාධිකරණය මගින් නිදොස් කොට නිදහස් කරන ලද ලලිත් වීරතුංග සහ අනූෂ පැල්පිට යන මහත්වරුන් මහාධිකරණය හමුවේ පෙනී සිටීමෙන් අනතුරුව නිදොස් කොට නිදහස් කිරීමේ තීන්දුව කියවා දී මෙම නියෝග නිකුත් කළේය.

ලලිත් වීරතුංග මහතා හා අනූෂ පැල්පිට යන මහත්වරුන් නඩු කටයුතුවලින් නිදහස් කර ඇති බවට රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂවරයාට දැනුම් දීමට පියවර ගන්නා ලෙසත් නියෝග කළේය.

ලලිත් වීරතුංග හා අනූෂ පැල්පිට මහත්වරුන්ට එරෙහි මෙම නඩුව පසුගිය රජය සමයේදී පවරා තිබූ අතර 2014 ඔක්තෝබර් හා 2015 ජනවාරි මාසය යන කාලය අතර තුරදී රුපියල් මිලියන 600ක සිල්රෙදි බෙදා දීම ඇතුළු චෝදන තුනක් යටතේ නීතිපතිවරායා නඩු පැවරීය. එම නඩුව ප්‍රකාරව කොළඹ මහාධිකරණය 2017 සැප්තැම්බර් තීන්දුව ප්‍රකාශයට පත්කරමින් විත්තිකරුවන් චෝදනාවලට වරදකරුවන් කරමින් දඬුවම් පැමිණවීය.

මහාධිකරණ තීන්දුවට එරෙහිව අභියාචන පෙත්සමක් ඉදිරිපත් කළ අතර අභියාචනය සලකා බැලූ අභියාචනාධිකරණය විත්තිකරුවන් නිදොස්කොට නිදහස් කරමින් පසුගිය නොවැම්බර් මාසයේදී තීන්දුව ප්‍රකාශයට පත් කළේය. අභියාචනාධිකරණය උපදෙස් දුන් එම තීන්දුව ඊයේ මහාධිකරණය හමුවේ කියවාදෙමින් මෙම නියෝග නිකුත් කළේය.

සමාජ සත්කාරයක් කිරීම සඳහා එවකට සිටි ජනාධිපතිවරයාගේ උපදෙස් මත කටයුතු කළ විත්තිකාර අභියාචකයන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පනතට හෝ පොදු දේපළ පනතට පටහැණිව කටයුතු කර නැත. එසේ කර ඇති බවට මහාධිකරණ විනිසුරුවරයා කරුණු වරදවා වටහා ගනිමින් නිගමනයකට එළැඹී ඇත. විත්තිකරුවන් වංකව කටයුතු කර ඇති බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්කි ඉදිරිපත් කර නැත. විදුලි සංදේශ නියාමන කොමිසමේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් ලෙස විත්තිකාර අභියාචකයන් දෙදෙනා එම කොමිෂන් සභා පනත සම්බන්ධයෙන් හොඳින්ම දැනුම්වත්ව සිටි අතර ඔවුන් ඊට පටහැනිව කිසිවක් කර නැති බව හොඳින්ම පැහැදිලි බව සඳහන් කරමින් අභියාචනාධිකරණය තීන්දුව ප්‍රකාශ කැර තිබිණි. නීතිඥ කාංචන රත්වත්තේ, නීතිඥ ජනක රණතුංග මහත්වරු ඊයේ මහාධිකරණය හමුවේ පෙනී සිටියහ.

# පාස්කු කොමිසමේ අවසන් වාර්තාව අසම්පූර්ණයි

## කොළඹ අගරදගුරු මැල්කම් කාදිනල් රන්ජිත් හිමිපාණෝ

**පාස්කු කොමිසමේ අවසන් වාර්තාව අසම්පූර්ණ වාර්තාවක් බැවින් ඒ පිළිබඳ කිසිසේත්ම සෑහීමකට පත්විය නොහැකි බව කොළඹ අගරදගුරු මැල්කම් කාදිනල් රන්ජිත් හිමිපාණෝ පැවසූහ.**

**කොළඹ අගරදගුරු නිල නිවසේදී ඊයේ (15) මාධ්‍ය වෙත විශේෂ ප්‍රකාශයක් සිදුකරමින් අගරදගුරු හිමිපාණෝ මේ බව කීහ.**

**කොමිසමේ සාමාජිකයන් විසින් යම් යම් කරුණු අනාවරණය කරගෙන තිබුණ ද ප්‍රහාරයට ආධාර අනුබල දුන් දේශීය හෝ විදේශීය සංවිධාන තිබෙනවා ද යන්න පිළිබඳ මෙන්ම ප්‍රහාරයේ මහමොළකරුවන්, තිරය පිටුපස සිට ආධාර අනුබල දුන් අයවලුන් සහ දේශපාලන බලය යෙදවූවන් පිළිබඳ කිසිදු විමර්ශනයක් සිදුවී නොමැති බව ද අගරදගුරු හිමිපාණෝ කියා සිටියහ.**

**දේශපාලකයන් සහ විවිධ පාර්ශ්ව යම් යම් මත පළකළ ද ප්‍රහාර මාලාවෙන් ජීවිත අහිමිවූවන් සහ සදාකාලික ආබාධිත වූවන් සියැසින් දුටුවේ තමන් බවත් ඔවුන්ට කඩිනමින් සාධාරණය ඉටුවිය යුතු බවත් අගරදගුරු හිමිපාණෝ තවදුරටත් කීහ.**

# සම්පන්දන් දෙමළ ජනයාගේ එකම නියෝජිතයා ලෙස මානව හිමිකම් කමිටුව පිළිගන්නේ නෑ

## ස්විට්සර්ලන්ත අධි නීතිඥ එස්. සුදාකරන්

**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**

දෙමළ ජාතික සන්ධානයට හා එහි නායක ආර්.සම්පන්ධන් මන්ත්‍රීවරයාට ජිනීවා මානව හිමිකම් මණ්ඩලයට සහභාගී වීම සඳහාත් ඊට යෝජනා ඉදිරිපත් කිරීමටත් අයිතියක් ඇති නමුත් ඔහු දෙමළ ජනයාගේ එකම නියෝජිතයා ලෙස මානව හිමිකම් කමිටුව නොපිළිගන්නා බව ස්විට්සර්ලන්තයේ සිටින මානව හිමිකම් ක්‍රියාධරයකු වන එස්.සුදාකරන් අධි නීතිඥවරයා 15 දා පැවසීය.

යාපනයේ ජනමාධ්‍ය වෙත ස්විට්සර්ලන්තයේ සිට අදහස් දැක්වූ ඔහු කියා සිටියේ දෙමළ දේශපාලන චරිත වලට යම් භූමිකාවක් ඇති නමුත් ඔවුන් ඉදිරිපත් කරණු ලබන සියලු දේ මානව හිමිකම් මණ්ඩලය විසින් නොපිළිගන්නා බවයි.

සම්පන්ධන් මන්ත්‍රීවරයා ජිනීවා මනාව හිමිකම් මණ්ඩලයේදී සමස්ත දෙමළ ජනතාවගේ පූර්ණ වගකීම බාරගෙන කටයුතු කරන ආකාරයක් පෙනී යන නමුත් ජිනීවා මානව හිමිකම් මණ්ඩලයට ඔහු තවත් එක් දෙමළ දේශපාලන චරිතයක් පමණික් බවද ප්‍රකාශ කළේය.

ජිනීවා මානව හිමිකම් මණ්ඩලය විසින් මීට වසර හතරකට ඉහතදී ශ්‍රී ලංකාවට ඉටුකිරීම සඳහා යෝජනා කොට ඇති යෝජනා වලින් බොහොමයක් ඒ ඒ රජයන් විසින් ඉටු කොට ඇති බව පැවසූ එම මානව හිමිකම් ක්‍රියාධරයා ප්‍රශ්නය වී ඇත්තේ දෙමළ දේශපාලනඥයන් ඒවා පිළිගැනීමට ඇති අකැමැත්ත බවයි.

# 2016-2019 කාලයේ රිය අනතුරුවලින් 14,317ක් මිය ගිහින්

## මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

**සුභාෂිණී සේනානායක**

පසුගිය 2016-2019ක වසර පහක කාලය තුළ රිය අනතුරු හේතුවෙන් 14317ක් මියගොස් ඇති බව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පවසයි.

එම වසර පහක කාලය තුළ මාරක රිය අනතුරු 13525ක් සිදුව ඇති අතර වසර පහක කාලය තුළ රිය අනතුරු 166535ක් සිදුව ඇති බවද මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පවසයි.

2016 වසරේ රිය අනතුරු 39200ක් සිදුව ඇති අතර ඉන් 2838ක් මාරක රිය අනතුරු වන අතර ඉන් 3020ක් මියගොස් ඇති බවද මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පවසයි.

2017දී රිය අනතුරු 37599ක් සිදුව ඇති අතර මාරක අනතුරු 2965ක් ද ඉන් 3154ක් ජීවත්ක්ෂයට පත්ව ඇති බවත් 2018 වසරේ සිදුව ඇති සමස්ත රිය අනතුරු 30476ක් අතරින් මාරක අනතුරු 2688ක්ද ඉන් 2851ක්ද සිදුව ඇති බවද මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව කියා සිටියි.

2019 වසරේ සිදුව ඇති රිය අනතුරුවලින් 23415න් මාරක අනතුරු 2040ක් සිදුව ඇති අතර ඉන් 2141ක් මිය ගොස් ඇත.

01 පිටුවෙන් ...

## එජාපයේ දෙවැනි ...

මේ වැඩසටහන සඳහා පසුගිය 09 දා පැවති පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතියද හිමිව තිබේ.

පළමු වැඩසටහන යටතේ දිවයින පුරා දිස්ත්‍රික් මට්ටමින් ගොස් ජනතාව දැනුම්වත් කර පක්ෂය හැර ගිය පිරිස් සහ අළුතින් සාමාජිකයන් බඳවා ගැනීම සිදු කෙරිණි.

පක්ෂයේ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන සහ මහ ලේකම් පාලිත රංගේ බණ්ඩාර මහත්වරුන් ඇතුළු පිරිස රට වටා ගොස් ප්‍රතිසංවිධාන කටයුතු සිදු කළ අතර මේ පිළිබඳව පක්ෂයේ නායක හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රශංසාව කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී පළ කර තිබේ.

## වාහන එකලස් ...

කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතාගේ මගපෙන්වීම යටතේ කර්මාන්ත අමාත්‍යාංශය විසින් සකස් කරන ලද මෙරට වාහන එකලස් කිරීමේ සහ වාහන අමතර උපාංග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත පිළිබඳ සම්මත මෙහෙයුම් පටිපාටිය (SOS) මෙහිදී එළි දැක්විණි.

වාහන නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රය පමණක් නොව මෙරට කර්මාන්ත ක්ෂේත්‍රයේ විප්ලවීය පරිවර්තනයකට ඉඩ කඩ සලසා දෙන මෙම අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව සැකසූ සම්මත මෙහෙයුම් පටිපාටිය එළිදැක්වීමෙන් අනතුරුව විදේශවලට ගලායන රුපියල් බිලියන 1820ක මුදලක් වාර්ෂිකව රට තුළ ඉතිරි කර ගත හැකිය.

මෙහි අරමුණ මෝටර රථ එකලස් කිරීම හා මෝටර් රථ අමතර කොටස් නිපදවීම තුළින් දේශීය හා අන්තර්ජාතික මෝටර් රථ වෙළෙඳපොළ ජය ගැනීමයි.

වාහන එකලස් කිරීම හා අමතර කොටස් මෙහෙයුම් පටිපාටියේ කර්මාන්ත අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය එළිදැක්වූයේ අග්‍රාමාත්‍යවරයාගේ සුරතිනි.

පසුව සම්මත මෙහෙයුම් පටිපාටියේ ප්‍රකාශනය අග්‍රාමාත්‍යවරයාට කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතා විසින් පිළිගන්වනු ලැබිණි. මේ අවස්ථාවට කර්මාන්ත ඇමැති විමල් වීරවංශ, ප්‍රවාහන අමාත්‍ය ගාමිණී ලොකුගේ, රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම, කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් අනුෂ පැල්පිට මහතා ඇතුළු උසස් නිලධාරීහු සහ සම්භාවනීය අමුත්තෝ රැසක් එක්ව සිටියහ.

## සමෘද්ධිලාභීන් ව්‍යවසායකයන් ...

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ඉදිරි සංවර්ධන වැඩසටහන් පිළිබඳ මුදල් අමාත්‍යාංශයේ රන්දොර ශ්‍රවණාගාරයේ දී ඊයේ(15) පැවති විශේෂ සාකච්ඡාවට එක්වෙමින් අගමැතිවරයා මේ බව පෙන්වා දුන්නේය.

රාජ්‍ය ඇමැති ෂෙහාන් සේමසිංහ මහතා මෙම විශේෂ හමුවේ අරමුණ සහ ඉදිරි සංවර්ධන වැඩසටහන් පිළිබඳ පැහැදිලි කළ අතර සමෘද්ධි සහනාධාර ලබන එහෙත් මේ වනවිට සහනාධාර අවශ්‍ය නොවන පිරිස් ඉවත් කිරීම සඳහා මෙතෙක් ක්‍රමවත් වැඩපිළිවෙළක් නොමැති බැවින් එවැනි සමෘද්ධිලාභීන් සිය කැමැත්තෙන් ඉවත්ව යෑමේ දී සියයට 4ක සහන පොලී අනුපාතය යටතේ රුපියල් ලක්ෂ 5ක ණයක් ලබාදීම ඉදිරියටත් ක්‍රියාත්මක කිරීමට මෙහි දී තීරණය විය.

දිවයින පුරා පවුල් 1,762,655ක් සමෘද්ධි සහනාධාරය ලබන අතර ඒ වෙනුවෙන් රජය වාර්ෂිකව රුපියල් මිලියන 53,000ක් වැය කරයි. මෙයට අමතරව සමෘද්ධි කාන්තා ව්‍යවසායකයන් 25,000ක් සවිබල ගැන්වීමේ වැඩසටහන ග්‍රාම සේවා වසම් 14,000 තුළ ක්‍රියාත්මක වේ. මේ අතර නිෂ්පාදන ගම්මාන 500ක් වසර අවසන් වනවිට රට පුරා ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන යටතේ ගම්මාන 50ක කටයුතු මේ වනවිට ආරම්භ කර ඇත.

අබාධිත පිරිස් හඳුනාගනිමින් ඔවුන් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම හා තැලිසීමියා රෝගයෙන් පෙළෙන ජනතාවට යම් සහනයක් ලබා දෙන්නැයි අගමැතිවරයා මෙහිදී අමාත්‍යාංශ නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

ජනාධිපති කාර්ය සාධක බළකාය මගින් සියලු අමාත්‍යාංශ හා ඒකාබද්ධව සමෘද්ධිලාභීන් සහ පොරොත්තු ලේඛනවල සිටින අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීමට අවශ්‍ය කටයුතු විධිමත් කිරීම පිළිබඳ ද මෙහිදී අවධානය යොමු විය.

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ, මුදල් හා ප්‍රාග්ධන වෙළඳපොල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල්, අගමැති කාර්ය මණ්ඩල ප්‍රධානී යෝෂිත රාජපක්ෂ, භාණ්ඩාගාර ලේකම් එස්.ආර් ආටිගල, අගමැති අතිරේක ලේකම් චමින්ද කුලරත්න, රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් නීල් බණ්ඩාර හපුහින්න, අගමැති සම්බන්ධීකරණ අධ්‍යක්ෂ කසුන් මාදුවගේ, සම්බන්ධීකරණ ලේකම් දුමීර ධර්මවර්ධන මහත්වරු හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ ආර්.පී.බී තිලකසිරි මහතා ඇතුළු නිලධාරීන් පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

# ඔබේ පිහිට අවැසි මොහොතක්

මොළයේ නහරයක් පිපිරීම හේතුවෙන් අසාධ්‍ය තත්ත්වයේ පසු වන මල්වාන ප්‍රදේශයේ පදිංචි 49 හැවිරිදි ඩබ්ලිව්. පී. එන්. එස්. පෙරේරා මහතා රෝහල්ගතව ප්‍රතිකාර ලබමින් සිටී.

ඔහුට සිදු කිරීමට අවශ්‍ය සැත්කමට රුපියල් ලක්ෂ 30ක් වැය වන බැවින් එම මුදල සොයා ගැනීමට මහජනතාවගේ උදව් උපකාර පතයි. අදාළ ශල්‍ය කර්මයට මුදලින් උපකාර කිරීමට කැමති පරිත්‍යාගශීලි ඕනෑම අයකුට නවගමුව මහජන බැංකු ශාඛාවේ විස්මිත සංකල්ප පෙරේරා නමින් ගිණුම් අංක 196200190032195 දරණ ගිණුමට මුදල් බැර කළ හැකි බව ඔහුගේ පවුලේ ඥාතීහු සඳහන් කරති.

# සියලු පාසල් අප්‍රේල් 19 දා ආරම්භ කරනවා

## අධ්‍යාපන ඇමැති

**රක්ෂණ ශ්‍රියන්ත**

දිවයිනේ සියලුම පාසල් අප්‍රේල් 19 දා ආරම්භ කරන බව අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා පැවසීය.

බස්නාහිර පළාතේ සියලු පාසල් ඊයේ(15) විවෘත කිරීමට නොහැකිවූයේ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශ අනුව බව පැවසූ ඇමැතිවරයා බස්නාහිර පළාතේ 05, 11 සහ 13 ශ්‍රේණිවල අධ්‍යයන කටයුතු සහ දිවයිනේ අනෙකුත් පළාත්වල සියලු ශ්‍රේණි සඳහා ද ඊයේ (15) පාසල් යළි විවෘත කළ බව කියා සිටියේය.

ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කළේ ඊයේ (15) බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පැවැත්වූ විශේෂ මාධ්‍ය හමුවේදීය.

කෙසේ වෙතත් බස්නාහිර පළාතේ අනෙකුත් ශ්‍රේණි සඳහා පාසල් ආරම්භ වන්නේ අප්‍රේල් මස 19 වනදායි.

ඒ අනුව අවුරුදු නිවාඩුවෙන් පසු දිවයිනේ සියලුම පාසල් සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව අප්‍රේල් මස 19 වෙනි දින විවෘත කිරීමට තීරණය කර ඇති බව ඇමැතිවරයා වැඩිදුරටත් කියා සිටියේය.

# එජා මානව හිමිකම් කවුන්සිලයේදී ශ්‍රී ලංකාවට අසාධාරණයක් කරන්නේ නැහැ

## ඉන්දියාව සහතික වෙයි

**මහින්ද අලුත්ගෙදර**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ දී ශ්‍රී ලංකාවට කිසිඳු අසාධාරණයක් සිදුනොකරන බවට ඉන්දියාව සහතික වෙයි.

කෙසේ වුවද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට එක්සත් රාජධානිය ප්‍රමුඛ රටවල් කිහිපයක් විසින් ගෙන ඒමට නියමිත යෝජනාවට එරෙහිව ඡන්දය ප්‍රකාශ කරන්නේ ද යන්න සම්බන්ධයෙන් ඉන්දියාව මෙතෙක් ප්‍රකාශ කර නොමැති බව වාර්තා වෙයි.

කෙසේ වුවද අදාළ යෝජනාව සම්බන්ධයෙන් වූ අදහස් දක්වන කාල සීමාවේ දී ඉන්දියාව කිසිඳු අදහස් දැක්වීමක් සිදුකර නොමැති අතර 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන ලෙසට ඉන්දියාව ශ්‍රී ලංකාවෙන් ඉල්ලීමක් කර තිබේ.

මේ අතර මිෂෙල් බැචලේ ගේ වාර්තාව පසුගිය දා අන්තර්ක්‍රියාකාරී සංවාදයට ගැනුණු අතර පාකිස්තානය, රුසියාව, චීනය, කියුබාව, නිකරගුවා, එරිත්‍රියා සහ උතුරු කොරියා ඇතුළු රටවල් 21ක් ශ්‍රී ලංකාවට සහාය පළ කරමින් අදහස් ඉදිරිපත් කළේය.

# ජාතික යෞවන නාට්‍ය උලෙළ අද ටවර් රඟහලේදී

**නුවන් හෙට්ටිආරච්චි**

ජාතික තරුණ සේවා සභාව සහ යෞවන සමාජ සම්මේලනය විසින් සංවිධාන කරන 41 වන ජාතික යෞවන නාට්‍ය උලෙළ අද (16) මරදාන ටවර් රඟහලේ දී පැවැත්වේ.

පස්වරු 6.30ට ආරම්භ වන නාට්‍ය උලෙළ එළඹෙන 26 දක්වා සෑම දිනකම පැවැත්වෙන අතර ප්‍රවේශ පත්‍ර නොමැතිව නාට්‍ය නැරඹීමට හැකියාව පවතී.

ඒ අනුව අද (16) දින වේදිකාගත වන්නේ පරණ පෙම්වතා, එහෙනම් සීසර් වැටෙන්න ඇඳටම, ටෝටල් තියටර් සහ two hunder twenty five ය.

01 පිටුවෙන් ...

## ජාතික ලේඛනාගාරයට ...

දෛනිකව දිරාපත්වීම හේතුවෙන් කඩදාසි හා ශ්‍රව්‍ය දෘශ්‍ය අධිලේඛනවල වටිනා තොරතුරු සදහටම අහිමිවීමේ අවදානමක් ඇති හෙයින් මෙම තොරතුරු ඩිජිටල්කරණය වෙත හුවමාරු කිරීමට ඩිජිටල් කෝෂ්ඨාගාරය ස්ථාපිත කිරීමට අමාත්‍යාංශය සූදානම් වේ.

වර්ෂ 1640 සිට නිර්මාණය වූ අධිලේඛන, දහනව වන ශතවර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත්කරන ලද පුවත්පත් ඇතුළු සියලුම ප්‍රකාශනවල නීතිමය තැන්පතුව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට ඇත.

දෛනිකව කඩදාසි සහ ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන මෙම තැන්පතුවට එකතු වෙමින් පවතින අතර දික් කිලෝමීටර 22කට අධික ලේඛන ප්‍රමාණයක් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ එකතුව සතුවේ.

ඩිජිටල් සංරක්ෂණය පිළිබඳ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව ඩිජිටල් තොරතුරුවල අනන්‍යතාව, අඛණ්ඩතාව සහ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා ටෙරාබයිට් 500ක ධාරිතාවකින් යුක්ත ඩිජිටල් කෝෂ්ඨාගාරයක් මෙම ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ ස්ථාපිත කෙරේ.

2021 සහ 2022 වර්ෂවල ව්‍යාපෘතියේ පළමු අදියර සඳහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, මෘදුකාංග, කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය, උපදේශන සේවා සහ අවිනිශ්චිත වියදම් සඳහා වන බදු ඇතුළත්ව රුපියල් මිලියන 93කුත් 2023 සිට 2025 දක්වා සේවා හා නඩත්තු කාලසීමාව සඳහා රුපියල් මිලියන 27කුත් වෙන් කිරීමට නියමිතය.

## මහජන චීන ...

ඒ අනුව මහජන චීන බැංකුව ශ්‍රී ලංකාව සමඟ යුවාන් බිලියන 10ක අන්තර් මුදල් ඒකක හුවමාරුවක් (Currency Swap) අනුමත කර තිබෙන අතර මෙම වැඩපිළිවෙළ සාදරයෙන් පිළිගත් චීනයේ ශ්‍රී ලංකා තානාපති ආචාර්ය පාලිත කොහොන මහතා එය ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ විශ්වසනීයභාවය පිළිබඳ ප්‍රකාශනයක් බව ද පෙන්වා දී තබේ.

එමගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය තවදුරටත් ශක්තිමත් කරමින් අනාගත ආයෝජකයන් දිරිගැන්වනු ලබන බව පෙන්වා දී තිබෙන ශ්‍රී ලංකා තානාපතිවරයා මේ පිළිබඳ විධිමත් කටයුතු දුරස්ථ ලෙස අවසන් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ මහ බැංකුව සහ මහජන චීන බැංකුව විසින් දරන ලද උත්සාහය අගය කර තිබෙන බවද පෙන්වා දී ඇතැයි විදේශ කටයුතු අමාත්‍යාංශය පවසයි.

මේ අතර කොවිඩ් 19 වසංගතය හේතුවෙන් පවතින තත්ත්වය සැලකිල්ලට ගැනීමේ දී මෙය ශ්‍රී ලංකාව ලැබූ විශාල ජයග්‍රහණයක් බවද එම මුදල ශ්‍රී ලංකාවට අවශ්‍ය ඕනෑම මොහොතක ලබාගැනීමේ හැකියාව පවතින අතර මහජන චීන බැංකුව හරහා එම මුදල ශ්‍රී ලංකාවට හිමිවන බවද මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල් මහතා පෙන්වාදෙයි.

මේ මුදල සඳහා අනුමැතිය ලබාදීමේ වැදගත්කම ශ්‍රී ලංකාවට අවශ්‍ය ඕනෑම අවස්ථාවක ලබාගැනීමේ හැකියාව තිබෙන බව පෙන්වාදෙන ඇමැතිවරයා විපක්ෂය කුමන චෝදනා එල්ල කළද වගකිව යුතු ආණ්ඩුවක් වශයෙන් වත්මන් ආණ්ඩුව ජනතාවගේ යහපත සහ රටේ අනාගතය වෙනුවෙන් සෑම ක්‍රියාමාර්ගයක්ම ගැනීමට කිසිවිටෙකත් පසුබට නොවන බවද පෙන්වා දෙයි.

## අපට කවුරුවත් රකින්න අවශ්‍ය නෑ:

# පාස්කු දින ප්‍රහාරයට වග කිව යුතු අයට ඉක්මනින් දඬුවම් දීම ජනපති නියෝගයයි

## පොදුජන පෙරමුණු පක්ෂ මාධ්‍ය හමුවේදී ඇමැති ජී එල්. කියයි

**රක්ෂණා ශ්‍රියන්ත**

මේ වන විට පාස්කු කොමිෂන් සභාවේ කාර්ය භාරය ඉටු කර ඇති බවත් එතැනින් එහාට ගොස් උසාවිය හමුවට වග කිව යුතු පුද්ගලයන් ගෙනයෑම හා මෙවැනි ඛේදවාචකයක් අපේ රටේ කවදාවත් සිදු නොවන ආකාරයට වග බලා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට ජනාධිපතිවරයා නියෝග කර ඇති බව අධ්‍යාපන ඇමැති, මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා පැවසිය.

ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කළේ ඊයේ (15) බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පැවැත්වූ විශේෂ මාධ්‍ය හමුවේදීය.

එහිදී වැඩිදුරටත් අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා මෙසේද කීය.

පාස්කු ප්‍රහාරය පිළිබඳ කොමිසන් සභා වාර්තාවේ අඩංගු නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අපේ රජයට දැඩි අධිෂ්ඨානයක් තිබෙනවා. ඒක ඉතා පැහැදිලි තීරණයක්. අපි පිළිගන්නවා ඒ වාර්තාවේ ඉතා ප්‍රයෝජනවත් කරුණු රාශියක් අන්තර්ගත වෙලා තිබෙනවා. එතැනින් එහා කටයුතු කිරීම අපේ අභිප්‍රායයි.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා මේ සම්බන්ධයෙන් පැහැදිලි නියෝග රජයේ එක් එක් ආයතනයට දී තිබෙනවා. දින වකවානු සහිතව නිශ්චිත වශයෙන් එක් එක් ආයතනය ඒ වාර්තාවේ අඩංගු නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත යුතු පියවර කවරේද?, කොයි විදියටද?, කොයි කාල සීමාවක් තුළද?. මේ සියල්ලක්ම සම්බන්ධයෙන් ජනාධිපතිතුමා ඉතාමත් පැහැදිලි නියෝග රජයේ විවිධ දෙපාර්තමේන්තු ආයතන අමාත්‍යංශවලට දී තිබෙනවා. ඒවා දැන් ක්‍රියාත්මක කරමින් පවතිනවා. ඒ නිසා අපට බලාපොරොත්තු වෙන්න පුළුවන් අප්‍රේල් 21දාට පෙර සෑහෙන ප්‍රගතියක් මේ සම්බන්ධයෙන් ලැබෙයි කියා. කාටත් බලාගන්න පුළුවන් වෙන විදියට ඒ ප්‍රතිඵල ලැබෙයි කියා. ජනාධිපතිවරයා දී ඇති පැහැදිලි නියෝග අනුව අපි සාධාරණය අපේක්ෂා කරනවා .

උදාහරණ වශයෙන් පොලිස්පතිට සහ සී.අයි.ඩී යට එතුමා උපදෙස් දී තිබෙනවා. දැනටම ශ්‍රී ලංකාවේ සැක කටයුතු පුද්ගලයන් 99ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. පිටරට හිටපු පුද්ගලයන් 35ක් අත්අඩංගුවට ගැනීමට, ඇතැම් අය ලංකාවට ගෙන්නගෙන ඒ වැඩ කටයුතු දැනටම කෙරී තිබෙනවා. විමර්ශන 36ක් දැනට සම්පූර්ණ වී තිබෙනවා. ප්‍රමාදයක් නැතිව ඒ සම්බන්ධ සියලු ලිපිගොනු අදාළ තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුවට වහාම යවන්න කියා . ඒ සඳහා නඩු පැවරීමේ කටයුතු නීතිපති දෙපාර්තමේන්තුවට කරන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා.

ඒ වාර්තාවේ පරිච්ඡේදයෙන් පරිච්ඡේදය සිද්ධි ආශ්‍රිතව පුද්ගලයන්ගේ නම් සඳහන් වී තිබෙනවා. ඒ විදියට නිශ්චිත තොරතුරු ඊට පෙර රජයට තිබුණේ නැහැ. වනාතවිල්ලුව අවි ආයුධ හමුවීම පතරොම් සම්බන්ධයෙන් නම් කීපයක් සඳහන් වෙලා තිබෙනවා. දැන් ඒ පිළිබඳ විශ්ලේෂණ විමර්ශන වහාම පවත්වන්න ඒක පොලිසියට භාර කටයුත්තක්. ඒ විමර්ශනවල ප්‍රතිඵල වහාම නීතිපති දෙපාර්තමේන්තුවට දැනුම් දෙන්නයි කියා.

ඒ වගේම මේ බෝම්බ පිපිරීමෙන් තුවාල ලත් අය තුන්දෙනෙක් ඉන්නවා අත්අඩංගුවේ. ඒ අය දන්න සියලුම කරුණු විස්තර සහිත ප්‍රශ්න කිරීමකින් දැනගෙන ඒ තොරතුරු පදනම් කරගෙන අවශ්‍ය පියවර ගන්න කියා පැහැදිලි නියෝග නිකුත් කෙරී තිබෙනවා.

ඒ වගේම ඒ වාර්තාවේ තිබෙනවා පෙටෝ කියන තුර්කි ආයතනයක්. ඒ කියන්නේ තුර්කියේ රජයට තුර්කියේ ජනාධිපතිවරයාට විරුද්ධව බොහොම කලහකාරී ක්‍රියාවන් තුර්කිය තුළ ගත්ත ආයතනයක්. ඒ ආයතනයෙන් යම් යම් මූල්‍ය සම්පත් ලංකාවට ලැබී තිබෙනවා. ඒ වැඩපිළිවෙළට සම්බන්ධ සහ ඒ ආයතනය සමග ගනුදෙනු කළා කියලා කොමිසන් සභාව කියන පුද්ගලයන් කීප දෙනෙකුගේ නම් සඳහන් වී තිබෙනවා. ඒ පිළිබඳ වහාම විස්තර සහිත විමර්ශන පැවැත්වීමටත් නියෝග දී තිබෙනවා.

කඩු හා කිනිසි 1440ක් පිටරටින් මේ රටට ගෙන්වා තිබීම සම්බන්ධයෙන් 35ක් දැනටම අත්අඩංගුවට ගෙන තිබෙනවා. 7 දෙනෙකුට විරුද්ධව දැනටම නඩු පවරා තිබෙනවා. සෙසු අය සම්බන්ධයෙනුත් වහාම නඩු පැවරීම ආරම්භ කරන්න කියා රජය නියෝග දී තිබෙනවා. මේ සම්බන්ධයෙන් අගරදගුරු හිමිපාණන් අධිකරණයට ගිහින් තිබෙනවා. අධිකරණයෙන් නියෝගයක් ඉල්ලා සිටිමින් මේ කඩු හා කිනිසි ගෙන්වා තිබීම පිළිබඳ වහාම විමර්ශන කරන්න කියා පොලිසියට නියෝගයක් දෙන්න කියා ඉල්ලා කාදිනල් හිමිපාණන් අභියාචන අධිකරණයට ගිහින් තිබෙනවා. අපි කෙලින්ම රජය ජනාධිපති නියෝගයක් දී තිබෙනවා .වහාම මේක කරන්න කියා. ඒ නිසා උසාවියේ නියෝගය ලැබෙනතුරු අපි ඉන්නේ නැහැ. කාදිනල් හිමිපාණන් උසාවියට ගිහින් තිබෙනවා .හැබැයි රජය පැහැදිලිව පොලිසියට නියෝග දී තිබෙනවා .මේ සම්බන්ධයෙන් උත්සුක වෙලා මේ ගැන සත්‍යය සොයාගෙන ඒ අනුව අදාළ පුද්ගලයන්ට විරුද්ධව දැඩි ක්‍රියාමාර්ග ගන්නා ලෙස නීතියේ රාමුව තුළ ගන්නයි කියා.



මද්‍රාසා කියන ආයතන දැනට 1565ක් විතර රටේ නොයෙක් නොයෙක් තැන්වල තිබෙනවා. මේවා පිළිබඳ දැඩි ක්‍රියාමාර්ග, මේවායේ මොනවද උගන්වන්නේ, විෂය මාලා මොනවාද, කවුද උගන්වන්නේ. මේ සම්බන්ධයෙන් යහපාලන රජය කිසිවක් සෙවීමට හෝ පාලනය කිරීමට කිසිම උත්සාහයක් දැරුවේ නැහැ. යහපාලනය කාලයේ පිටරටින් 600ක් විතර පුද්ගලයන් ආවා මේවායේ උගන්වන්න. ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක ලේකම්වරයා ලෙස හිටපු කාලේ මේකට ඉඩ දුන්නේ නැහැ. ඉතාමත් සමීප සම්බන්ධයක් තිබුණා බුද්ධි අංශය සහ ආගමන විගමන නිලධාරීන් අතර. මේ ආයතනවලට කවුරු හරි ඇවිත් උගන්වන්න වීසා බලපත්‍රයක් ඉල්ලනවානම් ඒ පුද්ගලයාගේ ඉතිහාසය විස්තර සහිතව හොයලා බැලුවා. ඒ සියල්ලක්ම අහෝසි කළා යහපාලන රජය. වීසා දුන්නා ගුවන්තොටුපළේදී. ඒ පුද්ගලයන් ආවාම කිසිම ප්‍රශ්නයක් අහනේනේ නැතිව මුකුත්ම විමර්ශනයක් කරන්නේ නැතිව ක්ෂණිකව ගුවන්තොටුපොළේම වීසා දුන්නා. ඒවායින් තමයි මේක මේ විදියට ව්‍යාප්ත වුණේ.

මම දැක්කා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හිටපු ඇමැතිවරයෙක් කියා තිබෙනවා. මේවායේ මෙහෙම පාලනය කිරීම නීති විරෝධියි කියා. කිසිවක් නීති විරෝධි නැහැ. රටේ වෛරය වපුරනවානම් රටේ එකමුතුකමට සාමයට තර්ජනයක් වන විදියට මේ මද්‍රාසා කියන ආයතන මේ විදියට පවත්වාගෙන යනවානම් ඒ සම්බන්ධයෙන් මැදිහත්වීමට රජයට අයිතියක් තිබෙනවා පමණක් නොවෙයි අනිවාර්යයෙන් ඒක රජයේ යුතුකමක් වෙනවා. ඒ සම්බන්ධයෙන් වහාම කටයුතු කරන්න කියා රජය නියෝග දී තිබෙනවා.

මාවනැල්ලේ බුදු පිළිම විනාශ කරපු අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් හරි විමර්ශනයක් කළානම්, කවුද මේක පිටුපස ඉන්නේ, කවුද මේකට අනුබල දුන්නේ, ඒ විමර්ශනය සාධාරණ ලෙස අවංකව එදා කළා නම් මම කියනවා මගේ අදහස අනුව මේ ඛේදවාචකය සිදුවන්නේ නැහැ කියා. මනුෂ්‍ය ජීවිත 271ක් මේ විදියට නැතිවන්නේ නැහැ කියා. කිසිම විමර්ශනයක් කළේ නැහැ. ඒ සියල්ලක්ම වසන් කිරීමට තමයි එදා පැවැති රජයට වුවමනා වුණේ.

බුර්කා තහනම් කිරීම සම්බන්ධයෙන් මම දැක්කා. විරුද්ධ පක්ෂය ප්‍රකාශයක් සිදුකර තිබෙනවා. ඒ බුර්කා තහනම් කිරීම නීති විරෝධියි කියා. ප්‍රධාන බටහිර යුරෝපීය රටක් වන ප්‍රංශය බුර්කා තහනම් කර තිබෙනවා. ප්‍රසිද්ධ තැන්වල බුර්කා පාවිච්චි කරන්න බැහැ. පාස්කු කොමිසන් වාර්තාවේ නිර්දේශයක් තිබෙනවා බුර්කා තහනම් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ අලුත් නීතියක් සම්පාදනය කරන්නයි කියා. ඒ වැඩකටයුතු අපි කරගෙන යනවා. අඛණ්ඩව මේ වැඩපිළිවෙළ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ නියෝගයෙන් අඛණ්ඩව ඉදිරියට කෙරීගෙන යනවා. අපි ඒ අදාළ රජයේ ආයතනවලට කියා තිබෙනවා ප්‍රතිඵල ඉක්මනට පෙන්වන්න. මේ සම්බන්ධයෙන් උදාසීන තත්ත්වයක් අපි කිසිසේත් පිළිගන්නේ නැහැ. අපිට අවශ්‍යයි වගකිවයුතු පුද්ගලයන්ට දඬුවම් පැමිණවීමට ඉතාමත් ඉක්මනින්ම.

ඒක කොමිසන් සභාවට කරන්න බැහැ. කොමිසන් සභාව උසාවියක් නොවෙයි. ඒ අයගේ කාර්ය භාරය ඒ අය ඉටු කර තිබෙනවා. එතැනින් එහාට ගිහිල්ලා උසාවිය හමුවට වගකිවයුතු පුද්ගලයන් ගෙනයාම හා මේ විදියේ ඛේදවාචකයක් අපේ රටේ කවදාවත් සිදු නොවන විදියට වගබලා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම තමයි ජනාධිපතිවරයාගේ නියෝගය වෙලා තිබෙන්නේ. ජනාධිපතිතුමා බොහොම පැහැදිලිව පොලිස්පතිට සහ පොලිසියට ඒ නියෝගය දී තිබෙනවා.

නීතිපති හා එතුමාගේ කාර්ය මණ්ඩලයටත් අත්‍යවශ්‍ය වැඩපිළිවෙළක් මේ සම්බන්ධයෙන් ගත යුතු වෙනවා. දැන් සම්පූර්ණ වාර්තාව නීතිපතිට යවා තිබෙනවා. සියලුම වෙළුම් අපිට හංගන්න දෙයක් නැහැ සම්පූර්ණ විනිවිද භාවයෙන් ඒ සියල්ලක්ම නීතිපතිට යවා තිබෙනවා. හැබැයි අපේ රටේ පමණක් නොවෙයි ඕනෑම රටක විශේෂයෙන්ම රටේ ආරක්ෂාවට සම්බන්ධ සංවේදී කරුණු ප්‍රසිද්ධ කරන්නේ නැහැ. කිසිම රටක් ඒක කරන්නේ නැහැ. ජාතික ආරක්ෂාවට මනුෂ්‍ය ජීවිතවලට ලොකු තර්ජනයක් වෙනවා. හැබැයි නීතිපතිට ඒ සියලුම කරුණු අනාවරණය කර තිබෙනවා.

කොමිසන් සභාවේ සඳහන් වී ඇති කරුණු අනුව පැහැදිලි වෙනවා. මේක අපේ රටට පමණක් සීමා වෙච්ච දෙයක් නෙමෙයි. එයින් ඔබ්බට ගිහින් තිබෙන කරුණක්. ඒ නිසා දැන් නීතිපති දෙපාර්තමේන්තුවට යුහුසුළු වෙන්න වෙනවා පිටරටවල සිටින මේකට සම්බන්ධයි කියා සිතන පුද්ගලයන් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට. ශ්‍රී ලාංකිකයන් 54ක් රටවල් පහක සිටියදී අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඒ 54න් 50ක් දැනටම ලංකාවට ගෙනැත් තිබෙනවා. අනිත් හතර දෙනා ඉතාමත් ඉක්මනින් අපේ රටට ගෙන්වා ගැනීමට වැඩපිළිවෙළක් අපේ රජය යොදාගෙන යනවා. ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන උදර්පන නීතිය, විදේශයක සිටින අපේ රටේ අපරාධයක් කරයි කියා හේතු සහිත පුද්ගලයන් මේ රටට ගෙන්වා ගැනීමේ වැඩපිළිවෙළක් අපි දැනටම ක්‍රියාත්මක කර තිබෙනවා. 2020 ඔක්තෝම්බර් මාසයේ කටාර් රාජ්‍යයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයන් කොමිසන් සභාවේ වාර්තාවේ තිබෙන විදියට ඒගොල්ලන් දැන් ඕස්ට්‍රේලියාවට ගිහින් තිබෙනවා. ඒ සමහර අය ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවෙයි. ඒ පුද්ගලයන් සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු රජයට අපි තොරතුරු සහිතව ඉල්ලීමක් කරනවා. ඕස්ට්‍රේලියාවේ ඒ සම්බන්ධයෙන් පූර්ණ විමර්ශන කර අපේ රජයට දැනුම් දෙන්නයි කියා.

ඒ වාර්තාවේ නිර්දේශවලට අනුකූලව අන්තවාදී සංවිධාන ජමාත් ඒ ඉස්ලාමී කියන සංවිධානය ගැන කරුණු සඳහන් වෙලා තිබෙනවා. ඒකෙ ප්‍රධාන චරිතයක් වන හජීම් අක්බාර් කියන පුද්ගලයා අත්අඩංගුවට ගැනීමට කටයුතු කර තිබෙනවා. අන්තවාදය මේ රටේ පැතිරවීම ඒ තුළින් රටේ සාමයට තර්ජනයක් එල්ල කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම ප්‍රමුඛ අවශ්‍යතාවක් වෙනවා.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති උපදෙස් දී තිබෙනවා රජයේ විධායක ශාඛාවට කොමිසන් සභාව නිර්දේශ කරන කරුණු වහාම ක්‍රියාත්මක කිරීමට විධිමත් ක්‍රමානුකූල වැඩපිළිවෙළක් සකස් කර ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කියා. උදාහරණයක් වශයෙන් මේකෙ සඳහන් වෙනවා නීතිපති දෙපාර්තමේන්තුවේ වෙනම ඒකකයක් පිහිටුවන්න කියා ත්‍රස්ත්‍රවාදයට සම්බන්ධ කටයුතු සම්බන්ධව අවශ්‍ය පියවර ගැනීමට. විශේෂ ඒකකයක් ස්ථාපිත කිරීමෙන් ඒ වැඩකටයුතු ඉක්මනින් කිරීම පහසුයි කියන නිර්දේශය අනිවාර්යයෙන් ක්‍රියාත්මක විය යුතුයි.

ඒ වගේම පාර්ලිමේන්තුවටත් යම් යම් නිර්දේශ කර තිබෙනවා. කොමිසන් සභාව කියනවා දැන් රටේ පවතින නීති ප්‍රමාණවත් නැහැ කියා. හිඩැස් තිබෙනවා අඩු පාඩු තිබෙනවා කියා. ඒවා පිරවීම සඳහා පාර්ලිමේන්තුව කටයුතු කළ යුතුයි කියා. විස්තර සහිතව සඳහන් වෙනවා මෙන්න මේ මේ පනත් සංශෝධනය කරන්න ඕනෑ එහෙම නැතිනම් අභිනව පනත් පාර්ලිමේන්තුව ඉදිරියට ගේන්න ඕනෑ කියා. ත්‍රස්තවාදයට විරුද්ධ පනත් ශක්තිමත් කිරීම, විදේශ විනිමය පනත සංශෝධනය කිරීම, උදර්පන පනත සංශෝධනය කිරීම, මූල්‍ය ගනුදෙනු අනිවාර්යයෙන් වාර්තා කිරීම පිළිබඳ අලුත් නීතියක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියා ඒ වාර්තාවේ සඳහන් වී තිබෙනවා. මේ සියල්ලක්ම අපි කරනවා. ඒ නිර්දේශ පිළි අරගෙන ඒවා ක්‍රියාත්මක කිරීම තමයි අපේ රජයේ ප්‍රතිපත්තිය වී තිබෙන්නේ.

මුදල් විශුද්ධි කිරීම සම්බන්ධයෙන් අලුත් නීති අවශ්‍යයි. දැන් තිබෙන නීති යල් පැනපු නීති. ඒවායෙන් බලාපොරොත්තු වෙන අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටු වන්නේ නැහැ. ඉතා වැදගත් දෙයක් තමයි ඒ වාර්තාවේ තිබෙනවා ජාතික බුද්ධි තොරතුරු ආයතනයක් පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත කරන්න කියා තොරතුරු ලබා ගැනීමට. මේ වගේ දේවල් දුරදිග යන්න ඉස්සෙල්ලා ඒ පිළිබඳ සත්‍යය සොයාගෙන අවශ්‍ය කටයුතු කිරීමට මේ පියවර අවශ්‍ය වෙනවා. ජාතික බුද්ධි තොරතුරු ආයතනයක් පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත කරන්න කියලා.

අද පාර්ලිමේන්තු සම්ප්‍රදායේ තිබෙන පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යොජනා අනුව නොයෙක් සංවිධාන ස්ථාපිත කෙරෙනවා. ඒක පාලනය කරන්න කියා ඒකට යම් යම් සීමා තිබිය යුතුයි කියා. එවැනි සංවිධාන රටේ ආරක්ෂාවට අහිතකර විදියට බලපානවානම් ඒකට ඉඩ තියන්න එපා කියලා. ඒකත් ඒ වාර්තාවේ අන්තර්ගත පැහැදිලි නිර්දේශයක්.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා මේ සියල්ලක්ම ගැඹුරින් අධ්‍යයනය කර තිබෙනවා. එතුමා පැහැදිලි නිර්දේශ දී තිබෙනවා රජයේ සියලුම අදාල ආයතනවලට. ඒ වැඩකටයුතු දැන් කෙරීගෙන යනවා. එම නිසා බොහොම ඉක්මනින් අපි බලාපොරොත්තු වෙනවා කාදිනල් හිමිපාණන් කියා තිබෙනවා අප්‍රේල් 21 කට පෙර යම් කිසි ප්‍රතිඵලයක් අපේක්ෂා කරනවා කියා ඒ තුළින් විශ්වාසය ගොඩනැගෙන, ඒ අපේක්ෂාව යථාර්ථයක් බවට පත් කිරීම කිසිසේත් අසීරු වන්නේ නැහැ. ජනාධිපතිගේ නියෝග අනුව දැනටම ආරම්භ කර ඉදිරියට ගෙන යන වැඩපිළිවෙළක්. ඒ නිසා අපි කියනවා කාවත් රකින්න දේශපාලන හේතු නිසා කාවවත් අමාරුවේ දාන්න අපිට කිසිම වුවමනාවක් නැහැ. මේ පිළිබඳ කාටවත් සුදු හුණු ගාන්නේ නැතිව සම්පූර්ණ සත්‍යය අනාවරණය කර ඒ අනුව නීතිය ඉදිරියේ අධිකරණය හමුවේ සියලුම පියවර ගැනීමට අපේ රජය ඇප කැපවී ඇති බව සඳහන් කරනවා.

### කොමිෂන් සභාව උසාවියක් නොවෙයි

### ජනපති ගෝඨාභයට භාර ගන්න වුණේ මහ දවාලේ මහමඟ වෙඩි තියලා මිනී මරන රටක්

#### පාර්ලිමේන්තු මන්ත්‍රී අධිනීතිඥ සාගර කාරියවසම්

**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී අධිනීතිඥ සාගර කාරියවසම් මහතා -**

අපි මේ රට භාර ගන්නා කොට මේ රට එම්.සී.සී ගිවිසුමක් ගහලා රටේ හරි මැද්දෙන් දෙකට බෙදලා මේ රටේ ඉඩම් ටික මංකොල්ල කන්න පිඹුරුපත් සකස් කර තිබු රටක් තමයි අපට භාර ගන්න සිදු වුණේ. හැම තැනම කුඩු විකුණපු ආසියාවේ මර්මස්ථානය බවට ශ්‍රී ලංකාව පත් කර තිබුණු තත්ත්වයක තමයි මේ රට භාර ගත්තේ. පාතාලය ඉතා සක්‍රියව කටයුතු කරමින් මහාදවාලේ මහමග වෙඩි තියලා මිනී මරණ රටක් තමයි ගෝඨාභය රාජපක්ෂ මහතාට භාරගන්න වුණේ. මේ රටේ අන්තවාදය නැවත හිස ඔසවලා පන්සල්වලට ගිහිල්ල පෝයට සිල් ගන්න බැරි වෙච්ච ඒවගේම ඉරිදාට කතෝලිකයන්ට පල්ලි යන්න බැරි වෙච්ච සමහර සතිවල මුස්ලිම් ජාතිකයන්ටත් පල්ලි යන්න බැරි වෙච්ච විකාර තත්ත්වයේ රටක් තමයි අපිට භාරගන්න සිදු වුණේ.

රණවිරුවන් සිරගත කර මහා සංඝරත්නය විශාල ප්‍රමාණයක් සිරගත් කර මේ රටේ කවදාවත් නොවිච්ච ආකාරයේ මර්දනයක් කර මේ රටට එරෙහිවූ යෝජනා සම්මුතියක් එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගෙනිහිල්ලා රට විසින්ම ඉදිරිපත් කරපු වකවානුවක තමයි ගෝඨාභය රාජපක්ෂ මහතා මේ රට භාරගත්තේ.

අපි මේ වන විට එම්.සී.සී ගිවිසුමට තිබුණු තර්ජනය රජයක් හැටියට අවසන් කර තිබෙනවා. මේ රටේ තිබුණු කුඩු උවදුර ඉතා සාර්ථක ලෙස මැඩ පවත්වා තිබෙනවා. මේ රටේ තිබුණු පාතාලය සම්පූර්ණයෙන්ම මේ වන විට පාලනයට ලක් කර තිබෙනවා. ඒ වගේම මේ රජය පත් වුණාට පස්සේ නිරපරාදේ සිරගත කර තිබු රණවිරුවන් සියල්ල නිදහස් කරලා, මහා සංඝ රත්නයට එරෙහිව පන්සල් වලට එරෙහිව ගෙන ගිය ඒ මහා ව්‍යාපාරය මහා කුමන්ත්‍රණය නතර කර තිබෙනවා. මේ රටේ උතුරද, නැගෙනහිරද, දකුණද , බස්නාහිරද නැතිව මේ රටේ ඕන පුරවැසියෙකුට ඕන තැනක නිදහසේ කොන්ද කෙලින් තියන් ගමන් කරන්න පුළුවන් රටක් නිර්මාණය කර තිබෙනවා. මේ රටේ නැගගෙන ආ විශාල අන්තවාදය පාලනයට ලක් කර එය අවසන් කරන්න අවශ්‍ය කටයුතු කරමින් තිබෙනවා.

පාස්කු දා ප්‍රහාරය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර ඒ අවශ්‍ය සියලු කටයුතු කරමින් තිබෙනවා. අපි රජයක් හැටියට විරුද්ධවාදීන්ට එරෙහිව හොර පොලීසි හදා බොරු නඩු පටලවලා නීතිය අතට අරන් කටයුතු කරන්නේ නැතිව ඉතාම නීතිගරුක යුක්ති ගරුක රජයක් හැටියට කටයුතු කරමින් සිටිනවා. මේ ජනතාව අපෙන් බලාපොරොත්තු වෙච්ච සෑම දෙයක්ම ඉතාම සාර්ථකව නීත්‍යානුකූලව සිදුකරමින් පවතින වකවානුවක තමයි මේ සියලු දේ බලාගෙන ඉන්න බැරිව මේ වන විට අපිට කනගාටුදායකයි විපක්ෂය සමහර කණ්ඩායම් විවිධ බොරු චෝදනා නගනවා.

එක චෝදනාවක් තමයි මේ පරිසර විනාශය ගැන කරන චෝදනාව. මෙය සම්පූර්ණයෙන් අසත්‍ය චෝදනාවක්. පරිසරය විනාශ වෙමින් තිබුණු පරිසරය සම්පූර්ණයෙන් නතර කර පරිසරය රැකීමට මේ රජය කටයුතු කරමින් තිබෙනවා. මේ වන විට මේ රටේ සියලු ගංගා සහ වනාන්තර ආරක්ෂා කිරීමේ විශේෂ වැඩපිළිවෙළක් මේ රජය ආරම්භ කරමින් තිබෙනවා. මේ පරිසර විනාශය ගැන කතා කරන කණ්ඩායම් බොරු අසත්‍ය සමාජය තුළ පතුරවනවා මිසක් කිසිදු පදනම් ඇතිව නෙමෙයි මේ කාරණා කියන්නේ.

ඊයේ පෙරේදා සීනි වංචාවක් සම්බන්ධයෙන් කිසිම පදනමක් නැති සම්පූර්ණ අසත්‍ය චෝදනාවක් මේ රජයට විරුද්ධව සීනි සම්බන්ධයෙන් නැගුවා. ලෝක වෙළෙඳ පොළේ සීනි මිල වැඩිවෙමින් පවතින බව දැනීගිය නිසා ජනතාවට සහනයක් දෙන්න රජය තීරණය කළා එවකට තිබූ රුපියල් පනහක් වූ බද්ද සත විසිපහ දක්වා අඩු කරන්න. මෙය ඉතාම සද්භාවයෙන් මේ රටේ ජනතාවට අදාළ ප්‍රතිලාභ ලබාදීමට කළ බදු අඩු කිරීමක්. ඒ බදු අඩුකිරීමෙන් ඒ අවස්ථාවේදී ලංකාවට සීනි ගෙනාපු ව්‍යාපාරිකයන්ට යම් කිසි ලාභයක් අත්වුණා. නමුත් ඒක ඒ අවස්ථාවේ ව්‍යාපාරිකයන්ට විතරක් නෙමෙයි අදට ලංකාවට සීනි ගෙන්වන ව්‍යාපාරිකයන්ටත් අත්වෙනවා. මේ වගේ ගනුදෙනුවකදී යම් කිසි පුද්ගලයකුට වාසියක් වෙන්න නම් පසුගිය යහපාලන කාලයේ කළා වගේ බදු අඩු කර ටික දවසක් තියලා නැවත බදු වැඩි කිරීමක් කරන්න ඕනෑ. එහෙම තමයි යහපාලන රජය කළේ. ඔවුන් දිගින් දිගටම කළේ බදු අඩු කරනවා තමන්ගේ හිතවත් කට්ටියට ඒ දේවල් ගෙන්වන්න ඉඩ දෙනවා. අඩු බද්දකට ඊළඟට සතියකින් දෙකකින් නැවත බදු වැඩිකිරීමක් කරනවා. ඒත් අපේ රජය කිසිදු ආකාරයකින් එසේ කටයුතු කර නැහැ. මේ සත විසි පහට අඩු කරපු සීනි බද්ද අදටත් තියෙන්නේ සත විසි පහටම තමයි කිසිදු ආකාරයකින් ඒ බද්ධ වැඩි කර නැහැ. ඒක නිසා කවුරු හරි කෙනෙක් කියනවානම් මේ සීනිවල බදු අඩු කිරීම මත මේ රජය යම් කිසි පුද්ගලයෙකුට උදව් කළා කියා ඒ උදව් කර තිබෙන්නේ මේ රටේ ජනතාවට මිසක් කිසියම් ව්‍යාපාරිකයකුට නොවෙයි.

ඡායාරූප- තුෂාර ප්‍රනාන්දු

---

# බස්නාහිර පාසල්හි ආරම්භ වූ ශ්‍රේණිවල සිසුන්ගේ පැමිණීම ඉහළයි

## බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

**සිතාරා සේනානි**

බස්නාහිර පළාතේ පාසල්වල ඊයේ (15) ආරම්භ වූ ශ්‍රේණිවල සිසුන්ගේ පැමිණීම සියයට 79ක් වැනි ඉහළ අගයක පැවති බව බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ශ්‍රීලාල් නෝනිස් මහතා පැවසීය.

මේ ප්‍රමාණය පළමු දිනයේ පාසල්වලට පැමිණෙතැයි අපේක්ෂා කළ ප්‍රමාණයටත් වඩා ඉහළ අගයක් බවද ඒ මහතා කීය.

එසේම, මෙදින බස්නාහිර පළාතේ ගුරුවරුන්ගේ පැමිණීම සියයට 97ක් වූ බවද ඒ මහතා සඳහන් කළේය.

බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ශ්‍රීලාල් නෝනිස් මහතා මේ බව පැවසුවේ දිනමිණ ඒ සම්බන්ධයෙන් කළ විමසුමකදීය.

බස්නාහිර පළාතේ පාසල්වල 5, 11 සහ 13 ශ්‍රේණිවල අධ්‍යයන කටයුතු ඊයේ ආරම්භ වූ අතර, එම පළාතේ අනෙකුත් ශ්‍රේණි ආරම්භ වීමට නියමිතව ඇත්තේ අප්‍රේල් 19 වැනිදා ය.

---

# අලෙවි මණ්ඩලය වී කිලෝ ලක්ෂ 100ක් මිලට ගෙන අවසන්

## වී අලෙවි මණ්ඩලයේ සභාපති

**නුවන් හෙට්ටිආරච්චි**

වී අලෙවි මණ්ඩලය වී කිලෝ ලක්ෂ 100ක් මිලදී ගෙන අවසන් බව වී අලෙවි මණ්ඩලයේ සභාපති ජටාල් මාන්නප්පෙරුම මහතා ඊයේ (15) දිනමිණට පැවසීය.

රුපියල් 56.50ක මිලකට එම වී මිල දී ගත් බවත් එම මිල පැවති පාලන මිලට ඉහළ මිලක් බවත් ඒ මහතා කීය. පුද්ගලික අංශයද එම මිලට වී මිල දී ගන්නා බවත් ගොවියාට ඉතිහාසයේ ලැබුණු හොඳම මිල මෙය වන බවත් මාන්නප්පෙරුම මහතා පැවසීය.





# තරුණ ජීවිත නිසි මග ගෙනියන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව





දරුවෝ කියන්නේ රටේ ජීවනාලිය. ඒ වගේම තමයි තරුණයින් කියන්නේ රටේ කොඳු නාරටිය. අපි හැම නිතරම කතාකරන්නේ රටේ දරුවන්ට හොඳම දේ ලබා දීම වෙනුවෙනුයි. හැබැයි රටේ තරුණයා යම් අවස්ථාවකදි අපි හැමෝටම සුළු සුළු වශයෙන් මගහැරුණා. මේ මගහැරීම්වල ප්‍රතිඵලයක් විදිහට එක එක කාලවලදි විවිධ කලකෝලහාල පවා ඇතිවුණා. අපි රටේ දරුවන්ට හොඳම දේ හැම වෙලාවෙදිම ලබා දෙනවා වගේම රටේ තරුණයාත් ඒ විදිහට රැක බලා ගන්නවා නම් ඒක රටට සිදුකරන ලොකු මෙහෙවරක්. අපි කවුරු කොහොම කිව්වත් රටේ වැඩිහිටි පරම්පරාවේ සෑම දෙනාටම රටේ තරුණයා ගැන ලොකු වගකීමක් තියෙනවා. ඒ වගකීම රාජ්‍ය වගේම පුද්ගලික ආයතන විවිධ මට්ටම්වලින් දරමින් ඉන්නවා. මේ වගකීම ගත්තු රජයේ පාර්ශවයේ සුවිශේෂීම ආයතනයක් තමයි ශ්‍රී ලංකා යුද්ධ හමුදාව. මේ වෙද්දි රටේ රැකියා නියුක්තිකයින්ගෙන් ලක්ෂ දෙකකට ආසන්න ප්‍රමාණයක් ශ්‍රීලංකා යුද්ධ හමුදාවට අයත්. හැබැයි ලංකාවේ අනිත් රැකියා නියුක්තිකයින් එක්ක සන්සන්දනය කරලා බලද්දි යුද්ධ හමුදාවේ සේවය නිරත වෙලා ඉන්න පිරිස සුවිශේෂීයි. මොකද ඒ තමයි රටේ ඉන්න පුහුණුවලත් විනයගරුක විශාලතම ශ්‍රම බලකාය තමයි ශ්‍රී ලංකා යුද්ධ හමුදාව.

ගංවතුරකදි, නායයාමකදි, එහෙමත් නැත්නම් මොකක්ම හරි ආපදාවකදි යුද්ධ හමුදාව පෙරට එන්න ඒ ඔවුන් සතු පුහුණුව සහ විනය නිසයි. හොඳම උදාහරණය කොවිඩ්. නිරෝධායන මධ්‍යස්ථාන හදන තැන ඉඳන්ම කොවිඩ් පැතිරීම පාලනය කරන්න ගත්ත හැම ක්‍රියාමාර්ගයකදිම පෙරමුණ ගත්තේ යුද්ධ හමුදාව. ඒ විතරක් නෙවෙයි මේ වෙනකොට ජාතිය ගොඩනැඟීමේ ව්‍යාපෘති රැසක්ම ක්‍රියාත්මක කරන්නේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව. දැන් බලන්න ගම සමඟ පිළිසඳර වැඩසටහනේදි ජනාධිපතිතුමා යුද්ධ හමුදාවට කොයිතරම් ව්‍යාපෘති භාර දෙනවාද? කොළඹ තුරඟ තරඟ පිටිය, ආකේඩ් ඉන්ඩිපෙන්ඩන්ට් පරිශ්‍රය, දියක උයන, නෙළුම් පොකුණ, නෙළුම් කුලුන ආදී ඉදිකිරීම් රැසකට ශ්‍රම දායකත්වය ලබාදෙන්නට තරම් නිපුණත්වයකින් පිරි ශ්‍රම බළකායක් යුද්ධ හමුදාව සතුය. මේ පුහුණු විනය ගරුක ශ්‍රම බළකාය නිර්මාණය කිරීම පහසු වැඩක් නම් නෙවේ.

දිවයින පුරා විසිරුණ යුද්ධ හමුදා කඳවුරුවලට සම්මුඛ සාකච්ඡාවලට පැමිණෙන තරුණ තරුණියන් මූලික පරීක්ෂණවලින් පස්සේ තෝරාගන්නා තරුණ තරුණියන් ඒ ඒ පුහුණු මධ්‍යස්ථානවල ධාරිතාවය අනුව වෙන් කරනවා. එහෙම වෙන්කරන තරුණ තරුණියෝ තමා මේ පුහුණු පාසැල්වලට එන්නේ. මේ අය විවිධ අධ්‍යාපනික මට්ටම්වල අය. මොකද යුද්ධ හමුදාවට සාමාන්‍ය සෙබළුන් බඳවා ගැනීමේ අවම අධ්‍යාපන සුදුසුකම වෙන්නේ අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍යපෙළ විභාගයට පෙනී සිටීම විතරයි. මේ විදිහෙ විවිධ සමාජ මට්ටම්වල, විවිධ අධ්‍යාපන මට්ටම්වල, විවිධ ජාති ආගම්වල පිරිස් එක ඉලක්කයකට යොමු කරන එකත් එක්තරා යුද්ධයක් තමා ඉතින්. යුද්ධ හමුදාවට අලුතින් බඳවාගන්න තරුණ පිරිස් පුහුණ කරන පුහුණු පාසැල් අතරින් පුත්තලම ආධුනික පුහුණු පාසැලේදි මේ ආධුනින පුහුණුව සිද්ධ වෙන්නේ කොහොමද කියලා බලාගන්න අවස්ථාවක් අපිට ලැබුණා.

මේ අයගේ සියලු වැඩ සටහන් සිද්ධ වෙන්නේ කාලසටහනට අනුව. ඒ කාලසටහනේ විදිහට නම් දවසේ වැඩ පටන් ගන්න තියෙන්නේ උදේ හයයි කාලට. සාමාන්‍යයෙන් ශාරීරික අභ්‍යාස, ලොග් ව්‍යායාම (දැව කඳන් යොදාගනිමින් සිදුකරන ව්‍යායාම) , ටී 56 අවි ප්‍රායෝගික පරීක්ෂණ, ගිනි අවි සමඟ කරන ව්‍යායාම වගේම යුද බාධක තරණය කිරීමත් උදේම මේ අයට කරන්න වෙනවා. ඊට පස්සේ තමයි උදේ ආහාරය ලබා ගන්නේ. ඊට පස්සේ දවස පුරා පරීක්ෂණ පෙළපාලි, මුර ආරෝහණය සහ අවරෝහණය, ආවරණ භාවිතය, මාර්ග සරඹ, ගමනේදි අවි සරඹ, අවිය සහිතව සහ රහිතව යුද බිමේ ගමන් කිරීම වගේ විශාල වපසරියක පැතිරුණු විෂය නිර්දේශයක් යටතේ න්‍යායාත්මක වගේම ප්‍රායෝගික පුහුණුව නොඅඩුව හිමිවෙනවා.

ඒ විතරක් නෙවෙයි මේ අයට සමාජමය දැනුම ලබාදෙමින් නවීන ලෝකය සමඟ යාවත්කාලීන කරන වැඩපිළිවෙළක් මේ වෙනකොට ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා මේ පිළිබඳ සුවිශේෂී අවධානයක් යොමු කරන්න කියලා පුහුණු පාසැල් සේනාවිධායකවරුන්ට දැනුම් දීලා තියෙනවලු. මොකද යුද්ධයක් ක්‍රියාත්මක නොවෙන අවස්ථාවක යුද්ධ හමුදාවට තමන්ගේ ප්‍රාථමික රාජකාරි අතරතුර ද්විතීය රාජකාරිවලත් නිරත වෙන්න තියෙන නිසා යුද්ධ හමුදාවට ආධුනික සොල්දාදුවන් විදිහට එකතුවෙන සියලුම දෙනා සමාජීය දැනුමෙන් සහ තාක්ෂණික දැනුමෙන් යාවත්කාලීන කිරීම දැඩි අවශ්‍යතාවයක් කියන දේ යුද්ධ හමුදාධිපතිතුමන් ප්‍රකාශ කරලා තියෙනවා. වර්තමාන යුද්ධ හමුදාධිපතිතුමා මේ ආධුනික පුහුණු මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනයට, පුහුණු ආධාර ඉහළනැංවීමට වගේම උපදේශකයින්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම ගැනත් සුවිශේෂී අවධානයක් යොමු කරලා කටයුතු කරන නිසා පුහුණුවෙන් පස්සේ විසිර යන ආධුනික සොල්දාදුවා ඉතා ඉහළ දැනුමක් සහ ගුණාත්මකභාවයක් සහිත අයෙක් බවට නිරායාසයෙන්ම පත්වෙනවා. ආධුනික සෙබළෙක් මාස හයක මූලික පුහුණුව ලබාදීලා විසිරයාම දක්වා යුද්ධ හමුදාවෙන් විශාල මුදලක් වියදම් කරනවා. ඒ විදිහට වියදම් කරන්නේ උසස් වෘත්තීමයභාවයකින් යුතු සොල්දාදුවෙන් නිර්මාණය කිරීම වෙනුවෙන්මයි.

මේ වෙද්දි රටට බලපාලා තියෙන කොවිඩ් උවදුර නිසා විශාල තරුණ පිරිසකට තමන් කරපු රැකියාව අහිමි වෙලා තියෙනවා. ඒ විදිහට රැකියාව අහිමිවුණු විශාල පිරිසක් මේ වෙනකොට යුද්ධ හමුදාවට බැඳිලා තියෙනවා ආධුනිකයින් විදිහට. ඒ පිරිස අතර ප්‍රසිද්ධ හෝටල්වල සේවය කළ සූපවේදීන්, විවිධ ආයතනවල පරිගනක ක්‍රියාකරුවන් ඇතුළු වෘත්තිකයින් විශාල පිරිසක් ඉන්නවා. ඔවුන් කියන්නේ තමන් මීට කලින් රැකියා කළත් මීට වඩා වේතනයක් ලබා ගත්තත් යුද්ධ හමුදාවේ පුහුණුව ඒ හැමදේටම වඩා වැදගත් කියලයි. මොකද තමන්ට තිබුණු නිදහස මේ පුහුණුව නිසා සීමා උණත් ලැබෙන වෘත්තීයමයභාවය ඊට වඩා වැදගත් කියලා ඔවුන්ට මේ පුහුණුව නිසා දැනෙනවා කියන දේ තමයි ඔවුන් අපි සමඟ කිව්වේ.

මේ විදිහට පුහුණුවෙලා යුද්ධ හමුදා සක්‍රිය සේවයට එක්වෙන ආධුනික සෙබළකුට ඉන්දියාව, පකිස්ථානය සහ බංගලාදේශයේ පැවැත්වෙන කනිෂ්ඨ නායකත්ව පාඨමාලාවට, ඉන්දියාවේ පැවැත්වෙන ප්‍රති ත්‍රස්තවාදී ක්‍රම පාඨමාලාව, පැරෂුට් පාඨමාලාව, ක්ෂේත්‍ර බුද්ධි පාඨමාලාව, සංඥා ක්‍රියාකරු පාඨමාලාව, ආරක්ෂක පරිපාලන පාඨමාලාව, ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාව, බළඇණි ආධාරක අවි පාඨමාලාවත, කාලතුවක්කු උපදේශක පාඨමාලාව, ඉන්දියාවේ සහ පකිස්ථානයේ පැවැත්වෙන බෝම්බ නිෂ්ක්‍රීය පාඨමාලාව, ඇමරිකා එක්සත් ජනපදයේ පාබල උසස් පාඨමාලාව, එංගලන්තයේ පැවැත්වෙන සරඹ උපදේශක පාඨමාලාව වගේ විශේෂ පාඨමාලා හදාරන්නත් දේශීය වශයෙන් ක්‍රියාත්මක කරන එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් පාඨමාලාව, පැරෂූට් පාඨමාලාව ඇතුළු පාඨමාලා විශාල ප්‍රමාණයකට සහභාගි වෙන්නත් අවස්ථාව ලැබෙනවා. ඒ වගේම එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි සඳහා මාලි, සුඩාන්, ලෙබනන් වැනි රටවල සේවය කරන්නත් අවස්ථාව ලැබෙනවා.

යුද්ධ හමුදාවට එක්වන සියලුම දෙනා විශ්‍රාම වැටුපකට හිමිකම් කියනවා. ඒවගේම වාර්ෂික වැටුප් වර්ධක, නොමිලේ වෛද්‍ය පහසුකම් (බිරිඳ, දරුවන් සහ දෙමාපියන්ද ඇතුළත්ව) නිල ඇඳුම් හා ආහාරපාන, ණය පහසුකම්, සුබසාධක දිමනා සහ පහසුකම්, විවාහක නිවාස පහසුකම්, නිදහස් රාජකාරී නිවාඩු ගමන් බලපත්‍ර ආදී සුබසාධක වරප්‍රසාද සහ පහසුකම් රැසකුත් හිමිවෙනවා. මේ තත්වයත් එක්ක රටේ තරුණයෝ යුද්ධ හමුදාවට බැඳෙන්න විශාල උනන්දුවකින් කටයුතු කරන බව පෙනෙන්න තියෙනවා.

ඒ තමයි වෘත්තීමයභාවයෙන් සන්නද්ධ වෙලා රට ගොඩනැඟිමේ මෙහෙවරට දායක වෙන්න මේ වෙද්දි යුද්ධ හමුදාවට බැඳිලා පුහුණුව ලබන ජවසම්පන්න තාරුණ්‍යයේ ඇත්ත කතාව. අපේ රටේ ඉන්න ජවසම්පන්න තරුණයින්ට තවමත් අවස්ථාව තියෙනවා යුද්ධ හමුදාව එක්ක එකතු වෙලා අභිමානවත් සේවයක් රට වෙනුවෙන් කරන්න. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ඔබ සියලු දෙනා සාදරයෙන් පිළිගන්න සූදානම්.

**දිලංක ගුණතිලක**





















# සංචාරක කලාපවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට පියවර

## ප්‍රතිපාදන වෙන් කරන බව සංචාරක ඇමැති කියයි

**මහින්ද අලුත්ගෙදර**

සංචාරක කලාපවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට රජය තීරණය කරයි.

මාර්ග,පාලම්, තොරතුරු මධ්‍යස්ථාන, වැසිකිළි කැසිකිළි ඉදිකිරීමට මේ යටතේ අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කෙරෙන බව සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

දිවයින පුරා පිහිටි ප්‍රධාන සංචාරක කලාපවල මෙන්ම නව සංචාරක ආකර්ෂණීය ස්ථාන ලෙස හඳුනාගෙන ඇති ප්‍රදේශවල මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බව පවසන ඇමැතිවරයා මේ වසරේ එම සංවර්ධන කටයුතු ඇති කිරීමට නියමිත බවද පෙන්වා දෙයි.

ගම්පහ, අස්ගිරිය හෙනරත්ගොඩ උද්භිද උද්‍යානයේ නව ප්‍රවේශ පාලම ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමේ අවස්ථාවට එක්වෙමින් ඇමැතිවරයා මේ බව සඳහන් කළේය.

ගම්පහ-ජා-ඇල ප්‍රධාන මාර්ගයේ සිට ගම්පහ මල්වත්තට පැමිණීමට අත්තනගලු ඔය හරහා මේ නව ප්‍රවේශ පාලම ඉදිකෙරෙන අතර ඒ සඳහා පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ ග්‍රාමීය භූමි ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 45ක මුදලක් වෙන් කර තිබේ. ජාතික උද්භිද උද්‍යානයේ ඒ සඳහා වැය කෙරෙන මුදල රුපියල් මිලියන 16කි. දිග මීටර් 30කින් යුතු මේ නව පාලම දින 210 කින් අවසන් කිරීමට නියමිත අතර බැසිල් රාජපක්ෂ මහතා මෙරට ආර්ථික සංවර්ධන ඇමැතිවරයා ලෙස කටයුතු කළ කාලයේ දී මේ පාලම ඉදිකිරීමට සැලසුම් කළද පසුගිය කාලයේ එය ක්‍රියාත්මක නොවිණි.

ඇමැති ප්‍රසන්න රණතුංග මහතා මෙහිදී වැඩිදුරටත් සඳහන් කළේ මාර්ග කිලෝමීටර් ලක්ෂය, පාලම් 5000 හා පළාත් පාලන අමාත්‍යාංශයේ ග්‍රාමීය පාලම් ව්‍යාපෘති යටතේ සංචාරක කලාපවල යටිතල පහසුකම් සංවර්ධනය කරන බවයි. ඊට අමතරව වනජීවී, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු සමඟ ද සාකච්ඡා කර වනජීවී කලාප ආශ්‍රිතව ඇති සංචාරක කලාප සංවර්ධනයටත්, හඳුනාගත් සංචාරක මධ්‍යස්ථාන සංවර්ධනයටත් අවශ්‍ය පියවර ගෙන ඇතැයි ද ඇමැතිවරයා මෙහි දී කීය.

ගම්පහ උද්භිද උද්‍යානය දෙස් විදෙස් සංචාරක ආකර්ෂණීය ස්ථානයක් ලෙස සංවර්ධනය කරන බවත් උද්භිද උද්‍යානයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමටත් කටයුතු යොදා ඇතැයි ද ඇමැතිවරයා මෙහි දී කීය. පාස්කු ඉරිදා ප්‍රහාරය හා කොවිඩ් වසංගතය හේතුවෙන් සංචාරක ක්ෂේත්‍රයේ නියුතුවූවන්ට දී තිබෙන සහන මාස 06ක් දක්වා දීර්ඝ කිරීමට රජය තීරණය කළ බවත් දැනටමත් ඊට අදාළ චක්‍රලේඛ නිකුත් වී ඇති බවත් පැවසූ ඇමැතිවරයා සංචාරක කර්මාන්තය ඉක්මණින් යථා තත්ත්වයට පත්වනු ඇතැයි විශ්වාසය පළ කළේය.

කොවිඩ් වසංගතය ආරම්භ වීමට පෙර තිබූ තත්ත්වයටත් වඩා සංචාරක කර්මාන්තය දියුණු කිරීම රජයේ අපේක්ෂාව බවද ඇමැතිවරයා අවධාරණය කළේය.

රාජ්‍ය ඇමැති රොෂාන් රණසිංහ, උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ආචාර්ය ෂෙලෝමි ක්‍රිෂ්ණරාජා මහත්ම මහත්මීහු ද මේ අවස්ථාවට එක්ව සිටියහ.

# ගම සමඟ පිළිසඳරේ ගැටලු සොයන්න පහුවදාම ඌරවත්තට ඇවිත්



නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රේණුක පෙරේරා මහතා සහ රාජ්‍ය ඇමැති මොහාන් පී.ද.සිල්වා මහත්වරු ඇතුළු පිරිස නිවාස හිමියන් සමග සාකච්ඡා කරමින්.

**අම්බලන්ගොඩ සමූහ- ආර්.ඤාණදාස**

රත්ගම මැතිවරණ කොට්ඨාසයේ ගලගොඩ කනිටු විද්‍යාලයේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගිය 13 වැනි දින පැවැත්වූ " ගම සමඟ පිළිසඳර" වැඩසටහනට නිවාස හැට හතරකින් සමන්විත ඌරවත්ත ධීවර නිවාස සංකීර්ණයේ පවතින අඩුපාඩු පිළිබඳ එම නිවාස සංකීර්ණයේ පදිංචි ඒ.ඩබ්ලිව්.නිලූකා මහත්මිය විසින් ජනාධිපතිට ඉදිරිපත් කළ ගැටලු පිළිබඳ සොයා බලා ඒවාට විසඳුම් ලබා දීමට ඊට පසුදිනම (15) පෙරවරු 10.30ට නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රේණුක පෙරේරා මහතා ඇතුළු අධිකාරියේ නිලධාරීන් පිරිසක් සහ රජ්‍ය ඇමැති නීතිඥ මොහාන් පී.ද.සිල්වා, රත්ගම ප්‍රාදේශීය සභාවේ සභාපති ටී.නිමල්, දකුණු පළාත් සභාවේ හිටපු මන්ත්‍රී ආරියවංශ සම්මු, රත්ගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී ඇම්.ගාමිණී මහත්වරු පිරිසක් ධීවර නිවාස සංකර්ණය වෙත පැමිණියහ.

සභාපතිවරයා ඇතුළු නිලධාරීන් ධීවර සංකීර්ණයේ නිවාස ඇතුළට ගොස් ඒවායේ පවතින අඩුපාඩු සියැසින් දැක බලා ගත්හ. ඉන්පසුව නිවාස හිමියන් සමග කතා බහක යෙදුණු රේණුක පෙරේරා සභාපතිවරයා මෙසේ පැවසීය. මේ නිවාස සංකීර්ණයේ පවතින අඩුපාඩු පිළිබඳ ගම සමඟ පිළිසඳරේදී ඉදිරිපත් කළ ගැටලු පිළිබඳ වහා සොයා බලා ඒවාට විසඳුම් ලබාදෙන්නැයි ජනාධිපතිතුමා මට නියෝග කළා. ඒ අනුවයි මම අපේ නිලධාරීන් පිරිසක් සමග මේ ස්ථානයට පැමිණියේ. මෙහි තිබෙන අඩු පාඩු සම්පූර්ණ කිරීමට වැයවන මුදල් පිළිබඳ ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස මම අපේ ප්‍රධාන ඉංජිනේරු මහතාට මේ අවස්ථාවේදීම උපදෙස් දුන්නා. ඉතා කඩිනමින් අපි මෙහි පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු යොදනවා. ඒ සමගම මෙහි පදිංචිව සිටින නිවාස හිමියන්ට මේවායේ ඔප්පු ලබාදීමට රාජ්‍ය ඇමැති මොහාන් පී.ද.සිල්වා මහතාත් ප්‍රාදේශීය ලේකම්වරියටත් කටයුතු කරාවි.මේ කටයුතුවලදී මේ නිවාස හිමියන්ගේ සහයෝගය අපට අවශ්‍යයි. ඒ සහයෝගය අපට ලබාදේවි කියා මම විශ්වාස කරනවා.

ගම සමඟ පිළිසඳරේදී මේ නිවාස සංකීර්ණයේ ගැටලු ගැන ජනාධිපතිට කරුණු ඉදිරිපත් කළ ඒ.ඩබ්ලිව්.නිලූකා මහත්මිය එහිදී මෙසේ පැවසුවාය. මේ නිවාස අපට දුන්නේ එවකට ධීවර ඇමැතිවරයාව සිටි වත්මන් අගමැති මහින්ද රාජපක්ෂ මහතායි. 2004 පැවති සුනාමියෙන් මේ නිවාස සංකීර්ණයට බරපතළ හානි සිදු වුණා. පසුව එක වතාවක් මේ නිවාස අලුත්වැඩියා කළා. ඉන් පසුව කිසිවක් කළේ නැහැ. අපේ ගැටලු විසඳීමට ජනාධිපතිතුමා මේ තරම් ඉක්මනින් කටයුතු කරාවි කියා මම හිතුවේ නැහැ. ඒ ගැන කඩිනමින් පියවර ගැනීම ගැන ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

# සුන්දර ගෘහ නිර්මාණ ශිල්පයෙන් අනූන ඇලවුණු ගොඩනැගිල්ලේ පළමු අදියර විවෘත වෙයි





මෙරට ඉදිකිරීම් ක්ෂේත්‍රයට අලුත් අත්දැකීමක් සහිත නව නිර්මාණයක් සේ එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ සහ එවකට ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ කාලයේ දී 2012 වසරේ දී ඉදිකෙරුණු කොළඹ, කොම්පඤ්ඤාවීදියේ පිහිටි ඇල්ටෙයාර් (Altair) බහුමහල් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියේ පළමු අදියර පසුගියදා නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය ඇමැති ආචාර්ය නාලක ගොඩහේවා මහතාගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරිණි.

යහපාලන ආණ්ඩුව කාලයේ දී මේ සංවර්ධන ව්‍යාපෘතිය අතරමග නතර කෙරුණු අතර ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහ නාගරික සංවර්ධන හා නිවාස ඇමැති ලෙස අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ මැදිහත්වීම මත මේ ඇල්ටෙයාර් ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු කඩිනම් කෙරිණි.

ශ්‍රී ලංකාවේ ව්‍යාපෘතියකට ආයෝජකයකු විසින් සම්පූර්ණ ආයෝජන මුදල එකවර ගෙවන ලද ව්‍යාපෘතියක් වන නේවාසික හා වාණිජ වෙළෙඳ සංකීර්ණයක් වන ඇල්ටෙයාර් ගොඩනැගිල්ල වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක ලේකම්ව සිටි කාලයේ වැඩ ආරම්භ කරන ලද ව්‍යාපෘතියකි.

අතරමග ඉදිකිරීම් නැවතී තිබූ මේ ව්‍යාපෘතිය 2020 මැයි මාසයේ දී ජනාධිපතිගේ අවධානයට ලක් විය.

කොළඹ නගරයේ ඉදිවන ඉතාමත්ම සුන්දර ගෘහ නිර්මාණ ශිල්පයෙන් අනූන ගොඩනැගිල්ලක් මෙසේ විවෘත කළ බව නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය ඇමැති ආචාර්ය නාලක ගොඩහේවා මහතා මේ අවස්ථාවට එක්වෙමින් සඳහන් කළේය.

කොළඹ පුරපතිනී රෝසි සේනානායක, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වරලත් නගර නිර්මාණ ශිල්පී ප්‍රසාද් රණවීර, ඇල්ටෙයාර් නිවාස හිමියන්ගේ සංගමයේ සභාපති මලික් ප්‍රනාන්දු, ආචාර්ය නිර්මාල් සිල්වා,විශේෂ නියෝජිත මන් මෝහන් හදි, ඉන්ඩෝ- ඩිස් ඩිවලොප්මන්ට් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ප්‍රදීප් මොරායස් සහ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ වෙළෙඳ හා ආයෝජන උපදේශක ආචාර්ය රාකේෂ් පාණ්ඩේ මහත්වරු ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ.





පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා යාන්ඔය මැටි නිධිය පරීක්ෂාවට එක් වූ අයුරු.

# යාන් ඔය මැටි නිධියෙන් උළු කර්මාන්ත පුරයක් සැකසීමට පරිසර අමාත්‍යාංශයෙන් සැලසුම්

**අමිල ප්‍රභාත් වනසිංහ- අනුරාධපුර අතිරේක**

යාන් ඔය දැවැන්ත මැටි නිධිය උපයෝගි කර ගනිමින් උළු කර්මාන්ත පුරයක් සැකසීමට පරිසර අමාත්‍යංශය සැලසුම් කර ඇත.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් හඳුනාගෙන ඇති පරිදි විශාල මැටි නිධි දෙකක් යාන්ඔය හා අම්පාර ප්‍රදේශවල පිහිටා තිබෙන බව අනාවරණය වී ඇත.

අප රටේ උළු කර්මාන්තයට අවශ්‍ය මැටි හිඟකම නිසා දේශීය උළු කර්මාන්තය බරපතළ අර්බුදයකට මුහුණ පා සිටින බව උළු කර්මාන්තකරුවන් හා පැවැති සාකච්ඡාවක දී පරිසර ඇමැති මහින්ද අමරවීර මහතාට ඔවුන් පෙන්වා දී තිබිණි.

එම නිසා යාන් ඔය මැටි නිධිය පිළිබඳව කරුණු සොයා බැලීමට පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා ප්‍රමුඛ කණ්ඩායමක් පසුගියදා (13) යාන් ඔය මැටි නිධිය පිළිබඳ සොයාබැලීමට එහි ගියහ.

2021 වසර අවසානයට පෙර පරිසර අමාත්‍යංශය විසින් රජයේ ගොඩනැගිලිවලට ඇස්බැස්ටස් භාවිතය සීමා කිරීමේ අරමුණින් මූලික පියවර කීපයක් ක්‍රියාත්මක කිරීමට නියමිතය. ඒ අනුව ආරම්භක පියවරක් වශයෙන් අලුතින් ඉදි කරන පෙර පාසල් ගොඩනැගිලි හා පාසල් ගොඩනැගිලිවලට ඇස්බැස්ටස් යොදා ගැනීම තහනම් කිරීමට තීරණය කර තිබේ.

එම නිසා ඒ වෙනුවට විකල්පයක් ලෙස උළු නිෂ්පාදනය ඉහළ දැමීමට කටයුතු කළ යුතු බැවින් ඒ සඳහා දේශීය උළු කර්මාන්තය කෙරෙහි බලපා තිබෙන මැටි හිඟයට පිළියමක් ලෙස යාන්ඔය හා අම්පාර මැටි නිධිවලින් අවශ්‍ය මැටි ලබාදීමට පරිසර අමාත්‍යංශය කටයුතු යොදා තිබේ. මේ මැටි නිධි දෙකේ ඇති මැටි ප්‍රමාණය වසර 200කට තරම් ප්‍රමාණවත් බව ද හෙළිදරව් වී තිබේ.

යාන් ඔය ඉදි කිරීමේ දී කපා ඉවත දමන ලද මැටි ටොන් සිය ගණනක් මේ වනවිට එහි තැන් තැන්වල ගොඩ ගසා තිබේ. එම නිසා යාන් ඔය ආශ්‍රිතව උළු නිෂ්පාදන කර්මාන්ත පුරයක් ස්ථාපිත කිරීමට පරිසර අමාත්‍යංශය සැලසුම් කර ඇතැයි පරිසර ඇමැතිවරයා මෙහිදී සඳහන් කළේය.

එම නිසා රටට අවශ්‍ය සියලුම උළු ඉදිරි කාලයේ යාන්ඔය හා අම්පාර මැටි නිධි ආශ්‍රිතව නිෂ්පාදනය කිරීමට වැඩපිළිවෙළක් සකස් කරන බවත්, උළු කර්මාන්තපුරයක් පිහිටුවීමට අපේ රටේ උළු කර්මාන්තකරුවන් සමඟ සාකච්ඡා කර ඔවුන්ට අවශය මූල්‍ය හා තාක්ෂණික සියලුම පහසුකම් රජය මගින් ලබා දෙන බවත් ඇමැතිවරයා කීය.

එමෙන්ම සාම්ප්‍රදායික වළං කර්මාන්තයේ යෙදී සිටින ගම්මානයක් වන හොරොව්පොතාන කුරුළුගම ගම්වැසියන් මුහුණ දී සිටින මැටි ගැටලුව විසඳීම සඳහා ද ඇමැතිවරයා පියවර ගත්තේය. ඒ අනුව ඔවුන්ට මැටි කපා ගැනීමට සුදුසු රජයේ ඉඩමක් ලබාදීමටත්, මැටි ප්‍රවාහනයට කිසිදු බාධාවකින් තොරව ඉඩ ලබා දෙන ලෙස පොලිසියටත් උපදෙස් දුන්නේය. එමෙන්ම මැටි පිළිස්සීමට දර ලබා ගැනීමේ දී ග්‍රාම නිලධාරියාගේ අධීක්ෂණය යටතේ එම කටයුතු සිදු කරන ලෙස ද ඇමැතිවරයා උපදෙස් දුන්නේය. කුරුළුගම මැටි කර්මාන්තයේ යෙදී සිටින පුද්ගලයන්ට මැටි ඇඹරීමට අවශ්‍ය යන්ත්‍රයක් තමන් මිල දී ගෙන ලබා දෙන බව ද ඇමැතිවරයා සඳහන් කළේය.

හිටපු ඇමැති තිස්ස කරලියද්ද, භූ විද්‍යා සමීක්ෂණ කාර්යාංශයේ සභාපති අනුර වල්පොල, හා පරිසර අමාත්‍යංශයේ නිලධාරිහු පිරිසක් ද මේ අවස්ථාවට සහභාගි වූහ.

# දැයට එළිය වැඩසටහනින් සියලු පවුල්වලට විදුලිය දීමේ ආරම්භක වැඩසටහන 19දා හාලිඇලදී

## විදුලි බල මණ්ඩලයේ සභාපති විජිත හේරත්

දැයට එළිය වැඩසටහන යටතේ ලංකාවේ සියලුම පවුල්වලට විදුලිය ලබාදීමේ ආරම්භක වැඩසටහන විදුලි බල ඇමැති ඩලස් අලහප්පෙරුම මහතාගේ ප්‍රධානත්වයෙන් හාලි ඇල ප්‍රාදේශීය සභාවේදී මේ මස 19වැනි දින සිදු කිරීමට නියමිතයැයි විදුලි බල මණ්ඩලයේ සභාපති විජිත හේරත් මහතා පවසයි.

විදුලි බල මණ්ඩලයේ සභාපති විජිත හේරත් මහතා වැඩිදුරටත් මෙසේද කීය.

දැයට එළිය වැඩසටහන යටතේ ලංකාවේ පදිංචි සෑම පවුලකටම විදුලිය ලබා දෙනවා. ලංකාවටම 100% ක් විදුලිය ලබාදීමේ අරමුණින් රජය මේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනවා. දැයට එළිය ආරම්භක වැඩ සටහන මේ මස 19 වැනිදින හාලිඇල ප්‍රාදේශීය සභාවේදී විදුලි බල ඇමැති ඩලස් අලහප්පෙරුම මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු වන අතර, ජාතික වැඩසටහන ලංකාව පුරා ඇති ප්‍රාදේශීය සභා 240 මුල් කරගෙන ලබන මේ මස 20 වැනිදින ලංකාව පුරාම පැවැත්වීමට තීරණය කර තිබෙනවා.

මෙහිදී පැන නැඟුණු ප්‍රශ්නය තමයි සමෘද්ධි සහ සමෘද්ධි පවුල් පොරොත්තු ලේඛනවල සිටින අයට ගෙදර ඇතුළ වයරින් කර ගැනීම සහ විදුලිය ලබාගැනීම.

මේ වෙනුවෙන් රජය රුපියල් මිලියන 750ක් වෙන්කර තිබෙන අතර, ගෙදර ඇතුළ වයරින් කර ගැනීම සඳහා සමෘද්ධි අරමුදලෙන් රුපියල් විසිදාහක ණය මුදලක් ලබා දීමටද තීරණය කර තිබෙනවා.

පොදු ජන ඉංජිනේරු බළකාය සම්බන්ධීකරණයෙන් විදුලි බල මණ්ඩලය ,සමෘද්ධි අමාත්‍යාංශය,ප්‍රාදේශීය සභා සභාපති ,උප සභාපතිවරුන් ඇතුළු මන්ත්‍රීවරුන්ගේ සහ අදාළ ප්‍රදේශවල ප්‍රතිලාභීන්ගේ සහභාගිත්වයෙන් ලංකාව පුරාම ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සියලු කටයුතු සූදානම් කර තිබෙනවායැයිද හෙතෙම වැඩිදුරටත් පැවසීය.

# ඇඟලුම් ක්ෂේත්‍රයේ ඵලදායීතාව ඉහළ නැංවීමට රජයේ පූර්ණ අනුග්‍රහය



## ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ

**මහින්ද අලුත්ගෙදර**

ඇඟලුම් ක්ෂේත්‍රය වර්තමානයේ මුහුණ දී තිබෙන අභියෝග හඳුනාගෙන ඇති රජය එහි ඵලදායීතාව සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා පූර්ණ අනුග්‍රහය දීමට සූදානම් බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රකාශ කරයි.

ඒ සඳහා සැලසුම්ගත වැඩපිළිවෙළක් ඔස්සේ ක්‍රියා කරන බවද ඒ මහතා පවසයි.

ඒකාබද්ධ ඇඟලුම් සංගම් සංසදයේ නියෝජිතයන් සමඟ ජනාධිපති කාර්යාලයේ දී ඊයේ (15) පැවති සාකච්ඡාවේ දී ජනාධිපතිවරයා මේ බව සඳහන් කළේය.

ශ්‍රී ලංකාවේ, අපනයනය ඉලක්ක කරගත් කර්මාන්ත අතරින් ඇඟලුම් ක්ෂේත්‍රය ප්‍රමුඛස්ථානයක් ගන්නා අතර ශ්‍රී ලංකාව ඉතා උසස් තත්ත්වයේ ඇඟලුම් සඳහා ලෝක පූජිත සන්නාමයක් බවට පත්කිරීමේ හැකියාව ද ලැබී තිබේ. දේශීය ඇඟලුම් ක්ෂේත්‍රයේ නව පිබිදීමක් ඇති කිරීමෙන් විශාල විදේශ විනිමයක් උපයාගත හැකි බවද ජනාධිපතිවරයා පෙන්වා දුන්නේය.

ඉලක්ක සපුරා ගැනීමට රජය විශේෂ උනන්දුවකින් ක්‍රියා කරන අතර, මේ වර්ෂයේ අපේක්ෂිත ඉලක්කය ඩොලර් බිලියන 5.1 කි. ඉලක්ක සපුරාලීමට කැපවීමෙන් කටයුතු කරන බවට ව්‍යාපාරිකයෝ ජනාධිපතිවරයා හමුවේ සහතික වූහ.

සෞඛ්‍ය නිර්දේශ නිසා ක්ෂේත්‍රයේ ඉදිරි ගමනට එල්ල වී ඇති අභියෝග පිළිබඳව ද ව්‍යාපාරිකයෝ පැහැදිලි කළ අතර රටේ පොදු සෞඛ්‍යයේ තත්ත්වයට බලපෑමක් නොවන අයුරින් ඇඟලුම් ක්ෂේත්‍රයට අදාළ යම් යම් සෞඛ්‍ය නිර්දේශ ලිහිල් කිරීමට ඇති හැකියාව සොයා බැලීමට යෝජනා කෙරිණි. ක්ෂේත්‍රයේ මානව සම්පත් හිඟය පිළිබඳව ද අවධානය යොමු වූ අතර ගුණාත්මක හා සුරක්ෂිත රැකියා අවස්ථා උදාකිරීම තුළින් ක්ෂේත්‍රයට තරුණ තරුණියන් ආකර්ෂණය කරගත හැකි බව ගෝඨාභය රාජපක්ෂ මහතා පෙන්වා දුන්නේය.

ආයෝජකයන්ගේ වීසා කාලසීමාව දීර්ඝ කිරීම හා වීසා ලබාදීමේ දී ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම පිළිබඳව ද සාකච්ඡා විය.

ඇමැතිවරුන් වන දිනේෂ් ගුණවර්ධන, නිමල් සිරිපාල ද සිල්වා, පවිත්‍රා වන්නිආරච්චි, රාජ්‍ය ඇමැතිවරුන් වන සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, චන්න ජයසුමන, ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර, මහබැංකු අධිපති මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති සංජය මොහොට්ටාල මහත්ම මහත්මීහු සහ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරු හා රාජ්‍ය නිලධාරීහු, ඒකාබද්ධ ඇඟලුම් සංගම් සංසදයේ සභාපති අශ්රොෆ් ඕමාර් මහතා ඇතුළු සාමාජිකයෝ මෙම සාකච්ඡාවට එක්ව සිටි-

# බැංකු ණය නොගෙවූ ව්‍යවසායකයන්ගේ දේපොළ පවරා ගැනීම වෙනුවට සහන කාලයක්

## අගමැතිගේ අවධානය

**උපාලි කරුණාරත්න**

බැංකු ණය නොගෙවූ ව්‍යවසායකයන්ගේ දේපොළ පවරා ගැනීම වෙනුවට සහන කාලයක් ලබාදීමට අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ අවධානය යොමු වෙයි.

පාස්කු දින ප්‍රහාරය සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බැංකු ණය ගෙවා ගැනීමට නොහැකි වූ ව්‍යවසායකයින්ගේ දේපොල අත්පත් කර ගැනීම වෙනුවට සහන කාලයක් ලබාදීම පිළිබඳව අවධානය යොමුකරන්නැයි අගමැතිවරයා පෙරේදා(15) බැංකු ප්‍රධානීන්ට දැනුම් දුන්නේය.

අගමැතිවරයා මෙම උපදෙස් දී ඇත්තේ බැංකු ණය ගෙවා ගැනීමට නොහැකි වූ ව්‍යවසායකයින්ගේ දේපොළ අත්පත්කර ගැනීම තාවකාලිකව අත්හිටුවීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ පැවැති සාකච්ඡාවකට එක්වෙමිණි.

ඒ අනුව ව්‍යවසායකයන්ගේ මූල්‍ය ගැටලුවලට සහන ලබාදීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව සහ අදාළ බැංකු සමග එක්ව අවසන් තීන්දුවකට එළැඹෙන්නැයි අගමැති මහින්ද රාජපක්ෂ මහතා උපදෙස් දුන්නේය.

දීර්ඝ කාලයක් තිස්සේ මෙවැනි ගැටලු පවතින නිසා කිසිදු පාර්ශවයකට අවාසියක් සිදු නොවන ආකාරයට ඒවා විසඳීම වැදගත් බව පෙන්වා දුන් අගමැතිවරයා බැංකු ණය ගෙවා ගැනීමට නොහැකි ඕනෑම පාර්ශවයක් සහ බැංකු පාර්ශවයන්ට අතර මැදිව දෙපැත්තටම සාධාරණයක් සිදුවන ආකාරයේ ගැටලු විසඳාදෙන රජයේ මැදිහත් වීමක් අවශ්‍ය බව කීය.

ඒ වෙනුවෙන් නෛතික බලයක් සහිත රජයේ ආයතනයක් හෝ බලධාරියෙකු සේවයේ පිහිටුවීම පිළිබඳව අවධානය යොමු කරන්නැයිද අගමැතිවරයා පැවැසීය. ඒ ඔස්සේ ලීසිං ඇතුළු එක් එක් ක්ෂේත්‍රයන්ට අදාළව ණය හිමියන්ට සහන සැලසීමේ හැකියාව පවතින බව අගමැතිවරයා කියා සිටියේය.

මෙම අවස්ථාව සඳහා කර්මාන්ත ඇමැති විමල් වීරවංශ, රාජ්‍ය ඇමැතිවරුන් වන අජිත් නිවාඩ් කබ්රාල්, ෂෙහාන් සේමසිංහ, අග්‍රාමාත්‍ය කාර්ය මණ්ඩල ප්‍රධානී යෝෂිත රාජපක්ෂ, මුදල් අමාත්‍යාංශයේ ලේකම් එස්. ආර් ආටිගල, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති ටී. එම්. ජේ. වයි.පී ප්‍රනාන්දු, මහජන බැංකුවේ සභාපති සුජීව රාජපක්ෂ, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සභාපතිනී කේෂිලා ජයවර්ධන, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සභාපති මහින්ද සාලිය, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වී.ඒ.ඒ.එන් ද සිල්වා, කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති උපසේන දිසානායක, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සභාපති අනුෂ්ක ගුණසිංහ, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ගීතා විමලවීර මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

# ආගමික අන්තවාදීන් පුනරුත්ථාපනයට සූදානම්

**සුභාෂිණී සේනානායක සහ මහින්ද අලුත්ගෙදර**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගන්නා ආගමික අන්තවාදී ක්‍රියාකාරකම්වල නිරත පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහා වන වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට සූදානම් බව පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් මේජර් ජනරාල් දර්ශන හෙට්ටිආරච්චි මහතා පවසයි.

මේ සඳහා වව්නියාව පුන්තෝට්ටම්හි පිහිටි පුනරුත්ථාපන මධ්‍යස්ථානය ඒ සඳහා සූදානම් කර ඇති බව ඒ මහතා කියා සිටියේය.

අධිකරණ නියෝග මත පුනරුත්ථාපනය සඳහා යොමු වන මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සාර්ථක ලෙස පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන සාර්ථක ලෙස ක්‍රියාත්මක වන බව කියා සිටි දර්ශන හෙට්ටිආරච්චි මහතා ඒ අනුව මේ වැඩසටහන ද සාර්ථක ලෙස සිදු කිරීමට කටයුතු කරන බවද ඒ මහතා කියා සිටියේය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගන්නා ආගමික අන්තවාදී ක්‍රියාකාරකම්වල නිරත පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහා නව රෙගුලාසි සහිත ගැසට් පත්‍රයක් පසුගියදා නිකුත් කරනු ලැබූ අතර මෙම නියෝගවලට අනුව දැඩි අන්තවාදී ආගමික මතවාද දැරීම සම්බන්ධයෙන් ආරක්ෂක අංශ වෙත භාරවන හෝ අත්අඩංගුවට ගන්නා පුද්ගලයන් වසරකට නොඅඩු කාලයක් මධ්‍යස්ථානයක් තුළ පුනරුත්ථාපනය කිරීමට හැකියාව ඇති බව එම ගැසට් පත්‍රයේ සඳහන්ව ඇත.

# උමා ඔය ජල කාන්දුවෙන් විපතට පත් තව පවුල් 602ක් වන්දි ලැයිස්තුවේ

**ධනුෂ්ක ගොඩකුඹුර**

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන උමගේ ඇති වූ ජල කාන්දුව නිසා විවිධ මට්ටමේ හානිවලට ලක් වූ නිවාස 8,738න් තවත් වන්දි ගෙවීමට ඉතිරිව ඇත්තේ නිවාස 602කට පමණක් බව රජයේ ආරංචි මාර්ගයක් දිනමිණට හෙළි කළේය.

වසර ගණනාවක් තිස්සේ ප්‍රමාදවෙමින් පවතින මේ වන්දි ගෙවීමේ කටයුතු මේ වසර තුළ අවසන් කිරීමට රජය තීන්දු කර ඇති අතර ඒ සඳහා වන යෝජනාවක් වාරිමාර්ග ඇමැති චමල් රාජපක්ෂ මහතා අමාත්‍ය මණ්ඩලයට යොමු කර ඇති බවත් එම ආරංචි මාර්ගය ප්‍රකාශ කළේය.

විකල්ප ඉඩම් ලබාගැනීමට සුදුසුකම් ලබාඇති පවුල් සඳහා ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දික්අරාව වත්තෙන් හෙක්ටයාර් 4ක බිම්කොටසක් අත්පත් කරගෙන මේ වන විටත් මූලික යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙමින් පවතියි.

ඉතිරි පවුල්වලට බිම්කොටස් ලබාදීම සඳහා බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මල්වත්ත වැවිලි සමාගමට අයත් අක්කර 10ක බිම්කොටසක් රජයට පවරාගෙන මූලික කටයුතු සිදුකෙරෙමින් පවතින අතර මේ වසර අවසානයට පෙර විශේෂ වැඩපිළිවෙළක් යටතේ හෝ ඉඩම් ලබාදීම කඩිනමින් කළ යුතු බව ඇමැතිවරයා කැබිනට් මණ්ඩලයට යෝජනා කර තිබේ.

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන උමගේ කැණීම් අතරතුර අනපේක්ෂිත ලෙස උමගට විශාල වශයෙන් ජලය කාන්දු වීම හේතුවෙන් මතුපිට භූමියේ අස්ථාවර වීම නිසා 2014 දෙසැම්බර් මස සිට 2017 අප්‍රේල් මාසය දක්වා කාලය තුළ නිවාස 8,738කට විවිධ මට්ටමේ හානි සිදුව තිබේ. ඒ අතුරින් නිවාස 8,136කට මේ වන විටත් වන්දි ගෙවා ඇති අතර වන්දි ගෙවීමට ඉතිරිව තිබෙන නිවාස 602 අතරින් පූර්ණ වශයෙන් හානිසිදුවූ නිවාස ඇත්තේ 390ක් පමණක් බවත් පැවසේ.

## සිසුන් දහසකට පශ්චාද් උපාධි පාඨමාලා

# ශිෂ්‍යත්ව පිරිනැමීමට පාකිස්තානය එකඟ වෙයි

**ධනුෂ්ක ගොඩකුඹුර**

ශ්‍රී ලාංකේය සිසුන් දහසකට වසර පහක කාලයක් තුළ ප්‍රථම සහ පශ්චාද් උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමට පාකිස්තානය එකඟතාව පළ කර තිබේ.

පූර්ණ ශිෂ්‍යත්ව 800ක් සහ පාඨමාලා ගාස්තු නිදහස් අර්ධ ශිෂ්‍යත්ව 200ක් මේ යටතේ පිරිනැමීමට එකඟතාව පළ කර ඇති බව රජයේ ආරංචි මාර්ගයක් ප්‍රකාශ කළේය.

පාකිස්තාන ඉස්ලාමීය ජනරජයේ උසස් අධ්‍යාපන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය අතර අත්සන් තැබීමට යෝජිත අවබෝධතා ගිවිසුම මඟින් මේ ශිෂ්‍යත්ව පිරිනැමීමට යෝජනා කර තිබේ.

මේ ශිෂ්‍යත්වවලට අමතරව මෙකී අවබෝධතා ගිවිසුම මඟින් නිශ්චිත කාලසීමාවක් සඳහා පර්යේෂණ, සම්මන්ත්‍රණ සහ වෙනත් අධ්‍යයන කටයුතු සඳහා ශ්‍රී ලංකා පාකිස්තාන පීඨ සාමාජිකයන් 50 දෙනකුට හුවමාරු අවස්ථාද හිමි වන බව එම ආරංචි මාර්ග හෙළි කළේය.

මේ සම්බන්ධයෙන් වන අවබෝධතා ගිවිසුම අත්සන් තැබීම සඳහා අනුමැතිය ඉල්ලා අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත් එම ආරංචි මාර්ගය වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

## පාසල් ආරම්භයත් සමඟ පාසල් කොවිඩ් පොකුරක්

# ඇති වීමට ඉඩ දෙන්න බෑ

## රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සහකාර ලේකම්

**සන්ධ්‍යා කරුණාරත්න**

පාසල් ආරම්භයත් සමඟ පාසල් කොවිඩ් පොකුරක් බිහි වීමේ අවදානමක් පවතින නිසා ඒ කෙරෙහි වසංගත රෝග විද්‍යා අංශය වැඩි වශයෙන් අවධානය යොමු කළ යුතු බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සහකාර ලේකම් වෛද්‍ය සමන්ත ආනන්ද මහතා පැවසුවේය.

පාසල් දරුවන් අතරින් අහඹු ලෙස පී.සී.ආර්. පරීක්ෂණ සිදු කිරීම, සෞඛ්‍ය බලධාරීන් නිරන්තරයෙන් පාසල් වෙත ගොස් කොවිඩ් අවදානම සම්බන්ධයෙන් සොයා බැලීම යනාදී කරුණු අනුගමනය කිරීමෙන් මෙම අවදානම මඳක් මග හරවා ගත හැකි බව ද ඒ මහතා ප්‍රකාශ කළේය.

පාසල් දරුවන් අතුරින් එක් දරුවකුට හෝ කොවිඩ් වයිරසය වැළඳී තිබුණහොත් එය මහා ව්‍යසනයක් දක්වා ව්‍යාප්ත විය හැකි බවත් මේ දරුවන් වැඩිපුර නිවෙසේ වැඩිහිටි ආච්චි, සීයා සමඟ සම්බන්ධතා පැවැත්වීම නිසා වැඩිහිටියන් පහසුවෙන් වයිරසයට ගොදුරු වීමේ අවදානමක් පවතින අතර එමඟින් කොවිඩ් මරණ වැඩි වීමේ අවදානමක් පවතින බවත් ඒ මහතා කියා සිටියේය.

කොවිඩ් රෝගීන් වාර්තා වීම මේ වන විට කිසියම් පාලනයකට ලක්ව ඇති බවත් එම තත්ත්වය ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා අලුත් කොවිඩ් පොකුරු බිහි වීම පාලනය කෙරෙහි වැඩි වගකීමක් වසංගත රෝග විද්‍යා අංශයට පැවරෙන බවත් ඔහු කීය.

පාසල් දරුවන්ට කොතරම් කොවිඩ් මර්දන සෞඛ්‍ය උපදෙස් අනුගමනය කරන ලෙස උපදෙස් ලබා දුන්න ද, ඔවුන් එම උපදෙස් පිළිපදින්නේ ද නැද්ද සම්බන්ධයෙන් අවධානය යොමු කර පාසල් අධීක්ෂණයකට ලක් කිරීම සෞඛ්‍ය බලධාරීන් විසින් සිදු කිරීම අනිවාර්ය සාධකයක් බව ද හෙතෙම පැවසීය.

# කොළඹ නිවාස 50ක් ගින්නෙන් අළු වෙයි

## විපත බැලීමට ආ මනෝට ගම්මුන්ගේ විරෝධය



**රක්ෂණ ශ්‍රියන්ත**

කොළඹ ෆර්ගියුසන් පාර, හජීමා වත්තේ නිවාස 50ක් පමණ ඊයේ (15) උදෑසන 2.40ට පමණ ඇති වූ ගින්නකින් පිලිස්සී විනාශ වී තිබේ. මෙම ගිනි ගෙන ඇති නිවාස බහුතරය අනවසර නිවාස බවත් ඒවා ලෑලි සහ තහඩුවලින් නිමවා තිබූ බවත් ඉන් වැඩි ප්‍රමාණයක් සම්පූර්ණයෙන් අළු වී ඇති බවත් පොලිසිය පැවසීය.

ග්‍රෑන්ඩ් පාස් ගිනි නිවීමේ ඒකකය සහ ග්‍රෑන්ඩ්පාස් පොලිසිය ප්‍රදේශ වාසීන්ගේ සහය ඇතිව ගින්න සම්පූර්ණයෙන් මැඩ පවත්වා ඇත.

සිද්ධිය සම්බන්ධයෙන් කිසිවකු තුවාල ලබා නොමැති අතර ගින්න කෙසේ හට ගෙන ඇතිද යන්න පිළිබඳ මේ වන විට පරීක්ෂණ පවත්වයි. මේ පිළිබඳ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හරහා රජයේ රස පරීක්ෂකවරයා වෙත දැනුම්දී ඇති අතර ඉදිරි විමර්ශන පැවැත්වීමට නියමිතය.

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරයි.

## අවම වැටුප රුපියල් 1000 ගැසට් නිවේදනය

# බල රහිත කරන ලෙස ඉල්ලා

## වතු සමාගම් 20කගෙන් රිට් පෙත්සමක්

**නෙල්කා මැදගෙදර**

තේ සහ රබර් වතු කම්කරුවන්ට ගෙවිය යුතු දෛනික අවම වැටුප රුපියල් 1000 ක් බවට නියම කරමින් නිකුත් කර ඇති ගැසට් නිවේදනය බල රහිත කරන රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා වතු සමාගම් 20ක් විසින් අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ගොනු කර තිබේ.

මෙලෙස වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීම නිසා වතු කර්මාන්තය අර්බුදයකට ලක් වන බව පවසමින් මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත.

ආගරපතන වැවිලි සමාගම, ඇල්පිටිය වැවිලි සමාගම ඇතුළු වතු සමාගම් විස්සක් මෙහි පෙත්සම් කරුවන් වේ.

කම්කරු අ නිමල් සිරිපාල ද සිල්වා, කම්කරු කොමසාරිස් ජනරාල් ප්‍රභාත් ' චන්ද්‍රකීර්ති, තේ කර්මාන්තය පිළිබද පඩි පාලක සභාවේ සභාපතිවරයා ඇතුළු 18 දෙනෙක් වගඋත්තරකරුවන් ලෙස නම් කරනු ලැබ සිටිති.

නීතිඥ සනත් විජේවර්ධන මහතා මාර්ගයෙන් මෙම පෙත්සම ගොනු කර ඇත.

පෙත්සම්කාර සමාගම් තේ වගාවේ සහ රබර් නියුතු මහපරිමාණ සමාගම්වේ.එම සමාගම් වල තේ වතුවල දහස් සංඛ්‍යාත කම්කරුවන් සේවයේ යෙදීසිටින බව පෙත්සමෙහි සදහන් වේ.

තේ සහ රබර් වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1000 ක් විය යුතු බවට නියමයක් කරමින් රජය ගැසට් පත්‍රයක් පසුගිය දා නිකුත් කලේය.

මෙලෙස තේ සහ රබර් වතු කම්කරුවන්ගේ දෛනික අවම වැටුප රුපියල් 1000 ක් බවට පත් කිරීමට පඩි පාලක සභාව අනුමත කිරීම අය වැය වාර්තාවටද ඇතුළත් කර ඇත.

මෙය නීතිවිරෝධී තීන්දුවක් වන අතර මෙලෙස හදිසියේ වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීම වතු කර්මාන්තය අර්බුදයකට ලක් වීමට හේතු වන බව පෙත්සම් කරුවන් කියයි.

තවද පෙත්සම්කාර වතු සමාගම් රජයට විශාල වශයෙන් බදු ප්‍රමාණයක් රජයට ගෙවිය යුතු බවත් මෙම වැටුප් වැඩි කිරීම තුළින් සමාගම් අපහසුතාවයට පත් විය හැකිබව ද පෙත්සමෙහි සදහන් වේ. .

එබැවින් මෙම පෙත්සමේ වගඋත්තරකරුවන්ට නොතීසි නිකුත් කරන ලෙසද , තේ කර්මාන්තයේ නියැලෙන කම්කරුවන්ට දෛනික අවම වැටපු රුපියල් 1000ක් බවට ප්‍රකාශයට පත් කරමින් නිකුත් කර ඇති ගැසට් නිවේදනය අවලංගු කරන රිට් ආඥාවක් නිකුත් කරන ලෙසද පෙත්සම්කරුවන් සිය පෙත්සමෙන් ඉල්ලා ඇත.

# ව්‍යාජ ඔප්පු නඩුවෙන් වාස් ගුණවර්ධන හා ඔහුගේ බිරිය නිදහස්

**රෝෂන් තුෂාර**

රුපියල් කෝටිගණනක් වටිනා පන්නිපිටියේ ඉඩමක් ව්‍යජ ඔප්පුවක් සකසා පවරාගත්තේ යැයි සදහන් කරමින් කූට ලේඛණ සෑදිම ඇතුළු චෝදනා දෙකක් යටතේ හිටපු නියෝජ්‍ය පොලිස්පති වාස් ගුණවර්ධන හා ඔහුගේ බිරියට එරෙහිව නීතිපතිවරයා පැවරූ නඩුව කොළඹ මහාධිකරණය ඊයේ (15) ප්‍රතික්ෂේප කළේය.

විත්තිකරුවන්ගේ මූලික විරෝධතාවයක් මත නඩුව ප්‍රතික්ෂේප කළ මහාධිකරණ විනිසුරු ආදිත්‍ය පටබැදිගේ මහතා විත්තිකරුවන් නිදොස් කොට නිදහස් කළේය. 1996 ලියා තැබුවේ යැයි කියන ඔප්පුවක් සම්බන්ධයෙන් කූට ලේඛණ සැකසීමේ වරදට නීතිපතිවරයා වසර විස්සක් ප්‍රමාද වී අධි චෝදනා ගොනු කර ඇති බවත්, දණ්ඩ නීති සංග්‍රහය ප්‍රකාරව වසර විස්සක් ප්‍රමාද වි නඩු පැවරීමට ප්‍රතිපාදන නොමැති බැවින් විත්තිකරුවන්ට චෝදනා කියවා දි බාරදීමට පෙර විරෝධතා මතු කරන බවත් විත්තිකරුවන් වෙනුවෙන් පෙනී සිට නීතිඥ ජාලිය සමරසිංහ මහතා ගොනු කළ විරෝධතා සළකා බැලිමෙන් අනතුරුව මහාධිකරණ විනිසුරුවරයා මේ නියෝගය කළේය.

## දවසේ රාහු කාලය

සවස 03.20 සිට 04.51 දක්වා / අලුයම 03.17 සිට 04.47 දක්වා වා

## දින තත්ත්වය

මීන රවි 02 භාග මැදින් පුර තියවක තිථිය ලත් කුජ දින ඉර උදාව 06.17 ට ඉර බැසීම 06.22 ට රේවතී නැකත අලුයම 04.45 න් ගෙවී අස්විද නැකත ලබයි. මැදින් පුර තියවක තිථිය රාත්‍රී 09.20 න් ගෙවී පුර ජලවක තිථිය ලබයි. බ්‍රහ්ම යෝගය උදේ 08.15 න් ගෙවී මහේන්ද්‍ර යෝගය ලබයි. තෛතිල කරණය උදේ 07.54 න් ගෙවී ගරජ කරණය ලබා එය රාත්‍රී 09.02 න් ගෙවී වණිජ කරණය උදාව පවතී.

විෂ කලාව - ගෙල / අමෘත කලාව - කෙණ්ඩ

මරු සිටින දිසාව - බටහිර / යෝගිනී සිටින දිසාව - ගිනිකොන / සුබ දිශාව නැගෙනහිර



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යෙතිෂවේදී අජිත් ධර්මසිරි

## දවසේ කාල හෝරාව ගෙවී යන අයුරු

**උදේ**

06.17 සිට 07.17 දක්වා - කුජ හෝරාව
07.17 සිට 08.17 දක්වා - රවි හෝරාව
08.17 සිට 09.17 දක්වා - සිකුරු හෝරාව
09.17 සිට 10.17 දක්වා - බුධ හෝරාව
10.17 සිට 11.17 දක්වා - සඳු හෝරාව
11.17 සිට 12.17 දක්වා - සෙනසුරු හෝරාව

**සවස**

12.17 සිට 01.17 දක්වා - ගුරු හෝරාව
01.17 සිට 02.17 දක්වා - කුජ හෝරාව
02.17 සිට 03.17 දක්වා - රවි හෝරාව
03.17 සිට 04.17 දක්වා - සිකුරු හෝරාව
04.17 සිට 05.17 දක්වා - බුධ හෝරාව
05.17 සිට 06.17 දක්වා - සඳු හෝරාව

**රාත්‍රී**

06.17 සිට 07.17 දක්වා - සෙනසුරු හෝරාව
07.17 සිට 08.17 දක්වා - ගුරු හෝරාව
08.17 සිට 09.17 දක්වා - කුජ හෝරාව
09.17 සිට 10.17 දක්වා - රවි හෝරාව
10.17 සිට 11.17 දක්වා - සිකුරු හෝරාව
11.17 සිට 12.17 දක්වා - බුධ හෝරාව

**අලුයම**

12.17 සිට 01.17 දක්වා - සඳු හෝරාව
01.17 සිට 02.17 දක්වා - සෙනසුරු හෝරාව
02.17 සිට 03.17 දක්වා - ගුරු හෝරාව
03.17 සිට 04.17 දක්වා - කුජ හෝරාව
04.17 සිට 05.17 දක්වා - රවි හෝරාව
05.17 සිට 06.17 දක්වා - සිකුරු හෝරාව

**බබාට නමක්**

මෙදින අලුයම 04.45 දක්වා රේවතී නැකත යෙදී පවතින නිසා දෙ.දො.ච.චි. අක්ෂරත් ඉන්පසුව අස්විද නැකත යෙදෙන නිසා චු.චෙ.චො.ල. අක්ෂරත් දිනට හිමි ක, ඛ, ග, ඝ අක්ෂරත් යොදා නම් තැබීම සුබයි.






## දවසේ ලග්න පලාපල

**මේෂ ලග්නය - රූපාලංකාරයට වැඩි කැප වීමක්**

මේෂ ලග්නයට අනුව අද ඔබට චන්ද්‍රයා ලග්නගත වීම ඉතා සුබයි. සිතේ සතුට සමාදානය අදහස් සපල වීම මෙන්ම විවාහ දිවියේ සොඳුරුබර බව මතු කෙරේ. කලාකාමී අදහස් ඇති අයගේ නිර්මාණ සාර්ථක වේ. ඔබ රූපාලංකාරය වෙනුවෙන් වැඩි කැපවීමක් හා වියදමක් දරන දිනකි. දණහිසට අපලයි පරිස්සම් වන්න.

**වෘෂභ ලග්නය - හදිසි ධන ලාභ**

වෘෂභ ලග්නයට අනුව සැරිසරණ අද දින සිය ආදායම් තත්ත්වය යහපත් වේ. හදිසි ධන ලාභ පෙන්වයි. තිබෙන ධනය කිසියම් ආයෝජනයකට යොමු කෙරේ. සිය ශාරීරික උපද්‍රව අනුව උගුරේ අමාරු පෙන්වයි. ගෘහ ජීවිතය කාර්යබහුල කෙරේ. ආගමික කටයුතු කෙරේ. යොමු වීම වැදගත්ය. කිසියම් නැති බැරි පුද්ගලයකු වෙනුවෙන් ආහාර ඇඳුම් පැලඳුම් පරිත්‍යාග කිරීම සුදුසු වනු ඇත.

**මිථුන ලග්නය - විවිධ මාර්ග ඔස්සේ ධනය**

මිථුන ලග්නයට අනුව අද දින ඔබට චන්ද්‍රයා 11 හි සැරිසරණ නිසා ආදායම් අතින් සුබවෙයි. එක් මගකින් නොව මාර්ග කීපයකින් ධනය ලැබෙන නිසා බොහෝ ජීවන කටයුතු රැසක් ඉටු කර ගැනීමට හැකි වේ. තුනටියට අපලයි. පරිස්සම් වන්න. කිසියම් උවදුරක් වෙනුවෙන් හෝ දූ දරුවකු වෙනුවෙන් මුදලක් වැය කිරීමට සිදු වනු ඇත.

**කටක ලග්නය - රැකියාවේ උසස්වීම්**

කටක ලග්නයට අනුව අද ඔබට රැකියාවේ උසස්වීම් රැකියා ස්ථානගත ප්‍රධානීන්ගේ ප්‍රසාදය හා සැලකිය යුතු වාසනාවන්ත තත්ත්වයක් මතු කර පෙන්වයි. විවාහ ස්ථානගතව නම් මඳක් බාධක සහිතයි. ඊට හේතුව ඔබ ඔබේ රාජකාරි කටයුතුවල පමණක් නියැළී සිටීම නිසා ගෘහ ජීවිතයේ කටයුතු මඳකින් පැහැර හැරෙන තත්ත්වයක් උද්ගත වන නිසාය. .

**සිංහ ලග්නය - දේපළ හිමිකම්**

සිංහ ලග්නයට අනුව අද ඔබට පෙර පිං මහිමය මතු කර දෙනු ඇත. ඒ අනුව කිසියම් දේපළක් සඳහා හිමිකම් කීමටද නීතිමය ගැටලුවලින් නිදහස් වීමට ද ඔබට අවකාශ ලැබේ. තමාගේ පිටරට බලාපොරොත්තුවක් සපල වනු ඇත. ඊට අමතරව පියාට අපල උපද්‍රව හා යම් හදිසි අනතුරු තත්ත්වයක් මත පියාට අපහසුතා ඇනෙන දිනයකි. පරිස්සම් වීම සුබයි.

**කන්‍යා ලග්නය - උදරය ආශ්‍රිත ආසාදන**

කන්‍යා ලග්නයට අනුව අද ඔබට ඉතා සුපරීක්ෂාකාරී විය යුතු වන්නේ නව ධනයකට සිදු විය හැකි පාඩුවක් සම්බන්ධයෙන් සතුරු උවදුරක් වංචනිකයකුගේ ක්‍රියාවකට හසුවීමක් පෙන්වයි. රවි 10 හි වීම නිසා විශේෂයෙන් යුග දිවි ගැටලුවලට විසඳුම් ලැබේ. උදරය ආශ්‍රිත ආසාදන පෙන්වයි. සැර උෂ්ණ හා ඇසිඩ් ගතිය බහුල ආහාරවලින් වැළකී සිටීම වැදගත් වේ. තම ආදායම් මාර්ගයේ අවහිරතාවක් වුව ද විය හැකිය.

**තුලා ලග්නය - ව්‍යාපාරික දියුණුව**

තුලා ලග්නයට අනුව අද දින ඔබට ඉතා සුබ දිනයකි. චන්ද්‍රයා 07 හි ගැවසෙන අද දින යුග දිවි සතුට අවිවාහක අයගේ ආදර සබඳතා වැඩි දියුණු වනු ඇත. කිසියම් හදිසි හමුවීමක් නිසා තමාට තම අනාගත ආර්ථික දියුණුවක් ඉටු කර ගැනීමට හා නව ව්‍යාපාරික කටයුත්තකට අත ගැසීමට හේතු වේ. කලා කටයුතු මෙන්ම සෞන්දර්යය පිළිබඳ ප්‍රගුණ කිරීමට අවශ්‍ය විවේකය තමාට අද දින ලැබේ.

**වෘශ්චික ලග්නය - අපහසුව තිබූ කටයුතු ලිහිල් වේ**

ධනු ලග්නයට අනුව මවු පාර්ශ්වය පිය පාර්ශ්ව පිළිබඳ සතුටුදායක වෙයි. දරු ඵල අපේක්ෂා කරන අයට වාසනාවන්ත දරුඵලද වෘත්තීමය ජීවිතයේ නව පියවරක් ඉදිරියට තැබීම ද සිදුවේ. ආදායම් අතින් මෙන්ම වාහන ඉඩම් නිවාස ප්‍රතිලාභ ද සහිතයි. බොහෝ දෙනාගේ සහයෝගය හා ඉදිරි ගමනට අත්උදව් දීම සිදු වනු ඇත.

**ධනු ලග්නය - වාසනාවන්ත දරු සම්පත්**

ධනු ලග්නයට අනුව තමාට එල්ලවී තිබූ නරක නාමයකින් මිදීමට ඔබට හැකිවන දිනයකි. මහ පොළොව සමග සබැඳි. කටයුතු කෙරෙහි යහපත්කම් මතු කෙරේ. වැව්ලි කර්මාන්තය, පතල් කර්මාන්තය වැනි සංගම්වලින් ජයග්‍රහණය ආර්ථික යහපත්කම් ද උදා වේ. තම උරහිස ආශ්‍රිත උවදුරු සිදු වීමට පුළුවන. දූ දරුවන්ගේ කටයුතු කෙරේ වැඩි කැපවීමක් කරන්නට සිදුවේ. වෙහෙසෙන තරමට ප්‍රතිලාභ ද සහිතයි. උනන්දු වන්න.

**මකර ලග්නය -දේපළ උරුමකම්**

කුම්භ ලග්නයට අනුව අද දින ඔබගේ කේන්ද්‍රයේ රවි 02 ට චන්ද්‍රයා 03 ට පැමිණීම නිසා තම පුතකු වෙනුවෙන් වැඩි කැපවීමක් හා වියදමක් දැරීමට සිදුවේ. එහෙත් එය අත්‍යවශ්‍යයෙන්ම අනාගත අභිවෘද්ධිය සඳහා වෙයි. තම ඉඩමක සතරකොන මායිම් ගසා වෙන්කර ගැනීමට හා එහි නිවෙසක් සෑදීමට අවශ්‍ය බිම් සකස් කර ගැනීමක් වැනි කටයුත්තක් වෙනුවෙන් ඔබගේ කාලය මිඩංගු කරන දිනයකි.

**කුම්භ ලග්නය - දරුවකුගේ කටයුත්තකට කැප වේ**

කුම්භ ලග්නයට අනුව අද දින ඔබට ආර්ථික අතින් උසස් විය හැකි දිනයකි. ඒ නිසාම තමා කලක් සැලසුම් කර සිටි කටයුත්තක් ආරම්භ කිරීමට හැකි වේ. තමාගේ යහපත පිණිස බොහෝ අය තමාට අතහිත දෙනු ඇත. චිත්‍ර සංගීත වැනි කලාකාමී කටයුතු කෙරෙහි යහපත උදා වේ. තමාට මෙතෙක් අහිමි වී තිබූ නිවෙසට ප්‍රතිලාභ හිමි වේ. ඒ වෙනුවෙන් වෙහෙසී ක්‍රියා කිරීමට සිදු වුව ද අවසානයේ යහපත උදා වේ.

**මීන ලග්නය - පියාගේ උරුමයක්**

මීන ලග්නයට අනුව අද දින ඔබගේ කේන්ද්‍රයේ ග්‍රහ තත්ත්වයට අනුව සුබයි. නව ආර්ථික සංකල්පනාවකට අනුව කටයුතු සූදානම් වේ. පියාගේ උරුමයක් තමා වෙත පැවරේ. ඒ අතර ආදායම් උපයමින් සිටින ව්‍යාපාරයක්ද වෙයි. ඔබට සිදු විය හැකි අපලකාරී තත්ත්වයක් නිසා ද කාලය මිඩංගු කිරීමට සිදු වේ. තම උගුර ආශ්‍රිත සෙම් රෝග බහුල වීම නිසා ඒ සඳහා මුදලත් ශ්‍රමයත් කැප කිරීමට සිදු වේ. ආහාරපානාදියෙන් හදිසි ආසාත්මිකතා මතු විය හැකිය.

# අලුත් අවුරුද්දට අපි හදන අපේ තෑගි 20දා සිට ශිල්ප සභා ප්‍රදර්ශනාගාරවලින්

පාරම්පරිකව පැවත එන්නා වූ චාරිත්‍ර වාරිත්‍ර මෙන්ම භාවිතා වූ යම් සම්ප්‍රදායන් වර්තමාන සමාජයේ අවශ්‍යතාවන් හා ගලපමින් සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සැමරීම අප කාගේත් අභිප්‍රායයි.

සිංහල හා හින්දු අලුත් අවුරුද්දට තෑගි දීමත් තෑගි ලබා ගැනීමත් අප කාගේත් සතුටට කාරණයයි. මේ තෑගි ලබාදීම අරමුණු කර ගනිමින් ජාතික ශිල්ප සභාව "අලුත් අවුරුද්දට අපි හදන අපේ තෑගි" නමින් දේශීය අමුද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් අත්කම් නිර්මාණ රාශියක් මෙවර සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් හඳුන්වා දීමට කටයුතු යොදා ඇත.

ජාතික ශිල්ප සභාව විසින් වෙළෙඳපොළ සඳහා හඳුන්වා දෙන මේ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සඳහා වූ විශේෂ නිර්මාණ මේ මස 20 වැනි දින සිට ඔබට ජාතික ශිල්ප සභාවේ දිවයින පුරා පිහිටි ප්‍රදර්ශනාගාරවලදී ලබා ගත හැකිය. කොළඹ කොටුව අලෙවි පොළ (DUTCH රෝහල් පරිශ්‍රය) සහ ගාල්ල කොටුව සිප්නාරා, මොලගොඩ, සීගිරි, වාරියපොල ගලගෙදර (ආර්ථික මධ්‍යස්ථානය) යන අලෙවිසල්වලදී සාධාරණ මිල ගණන්වලට ගුණාත්මක හස්ත කර්මාන්ත නිෂ්පාදන මිලදී ගැනීමට පාරිභෝගිකයන්ට අවස්ථාව උදා වනු ඇත. මේ සඳහා වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟ පෙන්වනු ලැබීය.

**දිල්රූ ජයසේකර**

# ශ්‍රී ලංකාවේ ධජය සහිත කාන්තා නාන ඇඳුම් දැන්වීමකුත් amazon වෙබ් අඩවියේ

**ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සංගමය**

**පහන් විජේසේකර**

ශ්‍රී ලංකාවේ ධජය පාපිස්සක් ලෙස දැක්වෙන වෙළෙඳ දැන්වීම ඉවත් කිරීමට එම දැන්වීම පළ කළ චීන සමාගම කටයුතු කළ බවට චීන තානාපති කාර්යාලය නිවේදනයක් නිකුත් කර තිබියදී, මෙරට ධජය ඇතුළත් කාන්තා නාන ඇඳුම් සහ වෙනත් ඇඳුම් සම්බන්ධයෙන් වන වෙළෙඳ දැන්වීම් කීපයක් amazon වෙබ් අඩවියෙහි තිබෙන බව ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සංගමය ප්‍රකාශ කරයි.

ශ්‍රී ලංකා ධජය අවභාවිතා කරමින් විවිධ වූ භාණ්ඩ නොදුරු අනාගතයේදී amazon වෙබ් අඩවියට ලැයිස්තු ගත විය හැකි බව ද එම සංගමය පෙන්වා දෙයි.

එබැවින් amazon සමාගම වෙත ශ්‍රී ලංකා රජය රාජ්‍යතාන්ත්‍රික මැදිහත්වීමක් සිදුකළයුතු බව එම සංගමය වැඩිදුරටත් අවධාරණය කර සිටී.


# ලංසු සඳහා ආරාධනයයි

**කර්මාන්ත අමාත්‍යාංශය**

## ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

**පුල්මුඩේ, ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් වෙත වසර දෙකක අමතර කොටස් සමග ගෝමේද කුඩු කිරීම (Zircon Powdering) සඳහා මෙ. ටොන්. 10 Shift Jet Mill Plant සැලසුම් නිර්මාණය කිරීම, සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කොට පෙන්වීම**

**ලංසු අංකය : LMSL/SUP/DPC/02/2020**

01. පුල්මුඩේ, ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් වෙත ගෝමේද කුඩු කිරීම සඳහා වසර දෙකක අමතර කොටස් සමග මෙ. ටොන් 10 Shift Jet Mill Plant සැලසුම් නිර්මාණය, සැපයීම, ස්ථාපනය හා ක්‍රියාත්මක කොට පෙන්වීම සඳහා රාජගිරිය, සරණ මාවතේ අංක 341/21 හි ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් වෙුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අයිතම අංකය | භාණ්ඩ විස්තරය | අවශ්‍ය ලංසු ඇපකරය (රු.) |
|---|---|---|
| 01 | Design, Supply, Installation and Commissioning of 10MT/ Shift Jet Mill Plant for Zircon Powdering with Two years Spare Parts to LMSL at Pulmoddai. | 120,000.00 |

02. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙවනු ලැබේ.

03. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු රාජගිරිය, සරණ මාවත, අංක 341/21 හි පිහිටි ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්හි සැපයුම් කළමනාකරු වෙතින් ලබාගත හැකි අතර, **2021.03.16** වෙනි දින සිට **2021.04.05** වෙනි දින දක්වා ඕනෑම රාජකාරී දිනයකදී 09.00 පැය සහ 15.00 පැය අතර, එම ලිපිනයේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය. සම්බන්ධ විය හැකි **අංක** 011-2882025/ 2883951/ 2883952

04. ආපසු ගෙවනු නොලබන රුපියල් පන් දහසක (රු. 5,000/=) ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව **2021.03.16** වෙනි දින සිට **2021.04.05** වෙනි දින දක්වා **09.00 පැය හා 15.00 පැය** අතර, රාජගිරිය, සරණ මාවතේ ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්හි සැපයුම් කළමනාකරුගේ කාර්යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් ලබාගත හැකිය.

05. පිටපත් දෙකකින් යුත් මුද්‍රා තබන ලද ලංසු, **2021.04.06** වෙනි දින **14.30 පැයට** පෙර ලැබෙන පරිදි **"සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් බාරේ, 341/21, සරණ මාවත, රාජගිරිය"** යන ලිපිනයට ගෙනැවිත් භාරදීමට හෝ මේ සඳහා තබා ඇති පෙට්ටියේ බහාලීමට හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ.

06. **2021.04.06** වෙනි දින සිට **2021.06.21** වෙනි දින දක්වා හෝ දීර්ඝ කරනු ලබන දිනය දක්වා ලංසු වලංගු විය යුතුය.

07. සියලුම ලංසු සමග ඉහත සඳහන් ආකාරයේ ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් නමින් වූ ලංසු ඇපකරයක් අමුණා එවිය යුතු අතර, එම ඇපකරය **2021.04.06** වෙනි දින සිට **2021.06.21** වෙනි දින දක්වා හෝ ඕනෑම දීර්ඝ කරනු ලබන කාලය දක්වා වලංගු විය යුතුය.

08. පූර්ව ලංසු රැස්වීමක් (පුල්මුඩේ) ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් යන්ත්‍රාගාරයේ 2021.03.27 වෙනි දින පෙ.ව. 10.30 ට පැවැත්වේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්,**
**341/21, සරණ මාවත, රාජගිරිය.**

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)**

# දැන්වීමයි

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2020.08.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2187/27 අනුව හඳුනාගත් ඉදිකිරීම් වැඩ අනුමැතිය සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන් ලියාපදිංචි කිරීමට අයදුම්පත් කැඳවීම**

ඉදිකිරීම් ක්‍රියාවලිය තුළ මුහුණදෙන ප්‍රමාදයන් අඩු කිරීම පිණිස අනුමැතීන් ලබාදීමේ ක්‍රියාවලියක් සඳහා වන වැඩරාමුවක් සංවර්ධනය කිරීමේ කර්තව්‍ය ICTAD හි නෛතික අනුප්‍රාප්තිකයා වන ඉදිකිරීම් කර්මාන්තයේ නියාමන අධිකාරිය වශයෙන් ඇති ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පවරා ඇත. **2020.08.09** දිනැති **2187/27** අතිවිශේෂ ගැසට් දැන්වීම අනුව, එය 4 වන වගන්තියේ විශේෂ ප්‍රමුඛතා අංක 02 ලෙස සඳහන්ව ඇත.

2;ඉදිකිරීම් කර්මාන්තය තුළ අනුමැතිය ලබාගැනීමේ අනවශ්‍ය ප්‍රමාදයන් වැළැක්වීමට එක් විශේෂිත මධ්‍යස්ථානයකින් හෝ අන්තර්ජාලය හරහා සියලු අනුමැතීන් ලබාගැනීමට අවශ්‍ය පහසුකම් නිර්මාණය කිරීම.

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ පැවරී ඇති බලය අනුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, ඉංජිනේරු විද්‍යාව, ගෘහනිර්මාණ ශිල්පය, ප්‍රමාණ සමීක්ෂණය සහ පාරිසරික හා පොදු සෞඛ්‍ය ඉංජිනේරු විද්‍යාව යන විෂය ක්ෂේත්‍ර හැර එහෙත් ඒවාට සම්බන්ධ විෂය ක්ෂේත්‍ර තුළ සිටින, "හඳුනාගත් ඉදිකිරීම් වැඩ" හා සම්බන්ධ වීමට අදහස් කරන, අධ්‍යයන හෝ වෘත්තීය ආයතන හෝ පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත ඉදිකිරීම් කර්මාන්තයට අදාළව ලියාපදිංචිව ඇති මණ්ඩල වෙතින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 26 (1)(ඉ) වගන්තිය යටතේ සුදුසුකම් ලත් පුද්ගලයන් ලෙස ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් ලබාගැනීමට අදහස් කරයි.

එමෙන්ම, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත අනුව,
"හඳුනාගත් ඉදිකිරීම් වැඩ" යනු-

අ) රුපියල් මිලියන දහය හෝ අමාත්‍යවරයා විසින් කලින් කළ නියම කරනු ලැබිය හැකි ඊට වඩා යම් වැඩි වටිනාමකින් යුක්ත වන්නා වූ සියලු ගොඩනැගිලි, නිර්මිතයන් හෝ මහජනයාගේ පාවිච්චිය සඳහා වන යම් ගොඩනැගිල්ලක් හෝ නිර්මිතයක් හෝ බිම් සැකසුමක්:
සහ

(ආ) පාරිසරික, භූවිද්‍යාත්මක සහ සංස්කෘතික උරුම නියාමන ආයතනවල අනුමැතිය අවශ්‍යවන්නා වූ සියලු ගොඩනැගිලි, නිර්මිත හෝ බිම් සැකසීම්

යම් පෞද්ගලික අයිතිකරුවකුගේ පුද්ගලික පාවිච්චිය සඳහා ඉදිකරන ලද යම් පෞද්ගලික නේවාසික ගොඩනැගිල්ලක් "හඳුනාගත් ඉදිකිරීම් වැඩ" යන යෙදුමේ අර්ථ නිරූපනයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

ඔබගේ අයදුම්පත්‍රය මෙම දැන්විම පල වී දින 30 ක් ඇතුළත **සභාපති, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය** වෙත ලැබිය යුතු ය. මෙම දැන්වීම පල වී එක් සතියක් ඇතුළත, **සභාපති, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, 123, "සව්සිරිපාය", විජේරාම මාවත, කොළඹ 07** වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය වෙනත් තොරතුරු ලබාගත හැකිය.

**සභාපති**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**
**ෆැක්ස් : 0112-685163**
**2021.03.12**

**ඊමේල්: cidaqpreg@gmail.com**

# ගෘහ සේවිකාවන්ට මූලික ගෙවීමක් ලෙස විදේශයන්ගෙන් ඒජන්සිකරුවන්ට ලක්ෂ 10ක්

## ● ඇමැති නිමල් සිරිපාල ද සිල්වා



අප රටේ ලැබෙන බැංකු පොලියට වඩා වැඩි පොලියක් එම රටවලදී සිය තැන්පත්වලට ලැබෙන නිසා බොහෝ විදේශගත ශ්‍රමිකයන් තමන්ගේ මුදල් එම රටවල බැංකුවල තැන්පත් කිරීමට පෙළඹී තිබෙනවා.

**අනුර ප්‍රේමලාල්**

මැදපෙරදිග සමහර රටවල්වලට යන අපේ ගෘහ සේවිකාවන්ට මූලික ගෙවීමක් ලෙස ඒජන්සිකරුවන්ට විදේශ රටවලින් රුපියල් ලක්ෂ 10ක් දෙන බවත්, එම සම්පූර්ණ මුදල විදේශ විනිමය ලෙස නිත්‍යානුකූලව මෙරට බැංකු ඔස්සේ ලංකාවට පැමිණෙන්නේ දැයි මූල්‍යමය තාක්ෂණික විගණනයක් කර සොයා බලන ලෙසත් කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා මහ බැංකු නිලධාරීන්ගෙන් විශේෂ ඉල්ලීමක් කළේය

විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍ය පියංකර ජයරත්න, මහ බංකු අධිපති මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්, කම්කරු අමාත්‍යාංශයේ ලේකම් මාපා පතිරණ, විදේශ රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් එස්. අරුනෙයිනාහයම්, විදේශ සේවා නියුක්ති කාර්යංශය සභාපති කමල් රත්වත්තේ, විදේශ රැකියා ඒජන්සි කරුවන්ගේ සංගමය සභාපති බුද්ධි ප්‍රදීප් මහත්වරුන් ඇතුළු විදේශ ප්‍රේෂණ පිළිබඳ කාර්ය සාධක බළකායේ නිලධාරීහු මේ සාකච්ඡාවට එක් වූහ.

ඇමැතිවරයා මේ ඉල්ලීම සිදු කළේ ඉකුත්දා (02) ශ්‍රී ලංකා මහ බැංකු ශ්‍රවණාගාරයේ පැවති විශේෂ සාකච්ඡාවකදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වු ඇමැතිවරයා මෙසේ ද කීය.

'එක් ගෘහ සේවිකාවක් සැපයීම වෙනුවෙන් අතරමැදියන්ට මැදපෙරදිග හාම්පුතුන් දෙන රුපියල් ලක්ෂ දහයෙන් 50%ක් එම ගෘහ සේවිකාවගේ නමින් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ තැන්පත් කළ යුතු බවට නීති සකස් කළ යුතුයි. විදේශගත ශ්‍රමිකයන්ගෙන් අප රටට ලැබෙන විදේශ විනිමය තවදුරටත් වැඩි කරගැනීමට ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග හඳුනාගැනීම මේ සාකච්ඡාවේ අරමුණයි.

අප රටට විදේශ විනිමය ලැබෙන ප්‍රධාන මාර්ගය වී ඇත්තේ විදෙස්ගත ශ්‍රමිකයන්ගේ ඉපැයීම්. අද වන විට ඔවුන්ගෙන් අපේ රටට වසරකට ඩොලර් බිලියන 7ක් ප්‍රේෂණය වෙනවා. එය ඩොලර් බිලියන 10 දක්වා වැඩි කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ආරම්භ කළ යුතුයි. එහිදී දැනට විදේශ ගත වන ශ්‍රමිකයන් සහ ගෘහ සේවිකාවන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමට අතිරේකව විවිධ ක්ෂේත්‍රවල නිපුණතා සහිත ශ්‍රමිකයන් විදේශ රැකියා සඳහා යැවීමෙන් අප රටට ලැබෙන විදේශ විනිමය තවදුරටත් වැඩි කර ගත හැකියි. එසේම මව්රටට පැමිණෙන විදේශගතව සිටි ශ්‍රමිකයන් නැවත එම රැකියා සඳහා යෑමට දිරි ගැන්වීම ද කළ යුතුයි.

# පරිසර පනත සංශෝධනය කරනවා

## ඇමැති මහින්ද අමරවීර



**අසේල කුරුළුවංශ**

පරිසර හානි සිදු කරන පුද්ගලයන්ට එරෙහිව ක්‍රියාත්මක වීමට ඇති නීති තවත් ශක්තිමත් කිරීමට පරිසර පනත මේ වසරේදී සංශෝධනය කරන බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පවසයි.

ඇමැතිවරයා මේ බව පැවැසුවේ මධ්‍යම පළාත් පරිසර අධිකාරියේ මහනුවර කාර්යාලයේදී පසුගියදා (13) පැවති මාධ්‍ය හමුවකදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'අයථා අන්දමින් ගල්, වැලි, පස් ඉවත් කිරීම් බහුලව සිදු කෙරෙනවා. ඒවා වැළැක්වීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශයේ පනත ද සංශෝධනය කිරීමට අවශ්‍යයි. මේ පනත් සංශෝධනයෙන් අපේක්ෂා කරන්නේ පරිසරයට හානි කරන පුද්ගලයන්ට එරෙහිව ක්‍රියාත්මක වීමට ඇති නීතිරීති දැඩි කිරීම සහ නියම කරන දඩ මුදල් ප්‍රමාණය ඉහළ නැංවීමයි.

මෙරට ඉඩම්වල අයිතිය ඇති ආයතන 10ක් පමණ රටේ තිබෙනවා. මහවැලිය, වන ජීවී හා වන සංරක්ෂණ, එල්.ආර්.සී.ජනවසම, දුම්රිය දෙපාර්තුමේන්තුව ඊට උදාහරණ කිහිපයක්. මේ කුමන ඉඩමක පරිසරයට හානියක් සිදුවුවත් චෝදනා හා විවේචන එල්ලවන්නේ කිසිදු ඉඩම් අයිතියක් නැති පරිසර අමාත්‍යාංශයට. මේ සියලු ඉඩම් එකම අමාත්‍යාංශයක් යටතේ තිබෙන්නේ නම් ගැටලු අවම වෙනවා.

මහනුවර නගරයේ වායු දූෂණය බරපතළ ලෙස ඉහළ ගොස් තිබෙනවා. එය පාලනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගන්නවා. මහනුවර නගර සීමා බල ප්‍රදේශයේ පාසල් විශාල සංඛ්‍යාවක් පිහිටා තිබෙන නිසා වායු දූෂණයේ ප්‍රධාන ගොදුරක් බවට පාසල් ළමයින් පත්ව සිටිනවා. මවුපියන් දැනුම්වත් කර නිසි ක්‍රමවේදයක් යටතේ නගරයෙන් පාසල් බැහැර කිරීමට ඇති හැකියාව සොයා

# රක්ෂිතවල වගා කරන්න ඉඩ දෙන්නේ නෑ

## ● රාජ්‍ය ඇමැති ජනක වක්කුඹුර



'මීමුරේ ගියේ ගොවි ජනතාවගේ ප්‍රශ්න විසඳන්න. නකල්ස් රක්ෂිතයේ වගා කරන්න අවස්ථාව දෙන්න ආණ්ඩුව කිසිදු අවශ්‍යතාවක් නෑ.' යැයි රාජ්‍ය ඇමැති ජනක වක්කුඹුර මහතා පැවැසීය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය.'නකල්ස් රක්ෂිත එළි කරමින් වගා කරනවා කියලා අසත්‍ය පුවත් මේ දවස්වල සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරය කරනවා.

ජනාධිපතිවරයා මගෙන් ඉල්ලීම් කළේ මීමුරේ ගොවි ජනතාව මුහුණපා ඇති ගැටලුවලට නිසි ක්‍රමවේදයක් සකස් කරන්න කියලා. ගම්මිරිස් වගාවේ එලදාව අඩුවීමත්, ඒවාට ස්ථාවර මිලක් නොමැතිවීමත් නිසා මේ අය රක්ෂිතයේ ඇති එනසාල් කඩන්න යනවා. එයට අප නිසි විසඳුමක් දීමට වැඩපිළිවෙළක් සකස් කරන්න තමයි ඒ අය හමු වෙලා කතා කළේ. මම ඒ අයට පොරොන්දු වුණා, ඒ අයගේ ආර්ථිකය ශක්තිමත් කරන්න කටයුතු කරනවා කියලා. එහි කහ සහ බුලත් වගා කරන්න කටයුතු කරනවා.

# කොළඹ හා තදාසන්න ප්‍රදේශවල රථවාහන තදබදය අවම කිරීමට පිළියම්

## ● ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු



**ක්‍රිසන්ති විතාරණ**

කොළඹ හා තදාසන්න ප්‍රදේශවල රථවාහන තදබදයට පිළියම් ලෙස ගුවන් පාලම්, උමං පදික මාරු, ගුවන් පදික මාරු, අතුරු මාර්ග ආදිය ඉදි කිරීමට 2021 වසරේ අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇති බව ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පැවැසීය.

ඇමැතිවරයා මේ අදහස් පළ කළේ 2021 වසරේ මාර්ග සංවර්ධන අධිකාරියෙන් ක්‍රියාත්මක කිරීමට නියමිත යෝජනා ව්‍යාපෘති පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරියේ හා මහාමාර්ග අමාත්‍යාංශයේ නිලධාරීන් අතර පසුගිය 12 වැනිදා පැවති රැස්වීමේදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'කොළඹ පවතින රථවාහන තදබදය අවම කිරීමට හඳුනාගත් ස්ථානවල ගුවන් පාලම් ඉදිකිරීමට මේ වන විට මූලික සැලසුම් සකස් කර තිබෙනවා. ඒ අනුව කොහුවල ප්‍රදේශයේ , බාලදක්ෂ මාවතේ , උත්තරානන්ද මාවතේ සහ විනිසුරු අක්බාර් මාවතේ ගුවන් පාලම් ඉදිකිරීමට යෝජිතයි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුත්තෙට්ටුගල, යාංගල්මෝදර, අලව්ව සහ මහව නගරවල ගුවන් පාලම් ඉදිකිරීමටත් මහනුවර දිස්ත්‍රික්කයේ ගැටඹේ ප්‍රදේශයේ ගුවන් පාලම ඉදිකිරීමටත් මේ වන විට තීරණය කර තිබෙනවා. කොළඹ සහ බොහෝ නගරවල අධික රථවාහන තදබදයට බලපාන හේතුව ක්‍රමවත් පදික මාරු නොමැති වීමයි. රථවාහන තදබදය අවම කිරීමත්, රථවාහන අනතුරු ප්‍රමාණය අඩු කර පදිකයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමත් අරමුණු කරගෙන උමං පදික මාරු සහ ගුවන් පදික මාරු ඉදිකිරීමට සැලසුම් කර තිබෙනවා. ඒ අනුව රාජගිරිය ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව අසල, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIT) අසළ, රාජගිරිය ජනාධිපති විදුහල අසල, කොට්ටාව, රත්නපුර, මොරටුව වේල්ස් කුමර විදුහල සහ වේල්ස් කුමරි විදුහල අසල, බොරැල්ල කාසල් රෝහල අසල ගුවන් පදික මාරු ඉදිකිරීමට කටයුතු කරනවා.

# රජය උතුරේ ඉඩම් බලහත්කාරයෙන් ගන්නේ නෑ

## ● මන්ත්‍රී ආචාර්ය සුරේන් රාගවන්



**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

උතුරේ ඉඩම් කිසිවක් බලහත්කාරයෙන් ගැනීමට රජය කටයුතු නොකරන බවත්, යාපනය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා කාර්යාලයේ තිබූ සියලු ලිපි ලේඛන අනුරාධපුරය වෙත රැගෙන යනු ලැබුවේ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ණ සහයෝගය අවශ්‍ය නිසා බවත් උතුරු පළාත් හිටපු ආණ්ඩුකාර, මන්ත්‍රී ආචාර්ය සුරේන් රාගවන් මහතා පසුගියදා (13) පැවැසීය. මන්ත්‍රීවරයා මේ බව පැවැසුවේ වවුනියාව කන්දසාමි කෝවිලේ පැවති පූජාවකින් පසුව මාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමිනි.

# ධනයට යට වූ මේ සමාජ ක්‍රමය වෙනස් නොකළොත් රට ගොඩගන්න බෑ

## පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක



**චන්දිමා කරුණාරත්න**

අද මේ රටේ දූෂිත, පාදඩ දේශපාලනයක් ක්‍රියාත්මකවීම හරහා නරුම ගජ මිතුරු ධනවාදයක් ක්‍රියාත්මක වෙමින් තිබෙන බවත්, ධනයට සම්පූර්ණයෙන්ම යට වූ මේ අශීලාචාර ක්‍රමය වෙනස් කර ගැනීමට නොහැකි වුවහොත් රට නැවත ගොඩගැනීමට නොහැකි වන බවත් හිටපු ඇමැති, පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක මහතා පැවැසීය.

මන්ත්‍රීවරයා මේ බව පැවැසුවේ ආණ්ඩුවේ ගජ මිතුරන් හරහා රටේ ක්‍රියාත්මක කරවන දැවැන්ත මූල්‍ය වංචා සහ දූෂණ සම්බන්ධයෙන් අදහස් පළ කරමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මන්ත්‍රීවරයා මෙසේ ද කීය.

'සියලුම ජනතාවට කෝවිඩ් වසංගතයෙන් බේරීමට ඇස්ට්‍රා සෙනිකා එන්නත මිලදී ගැනීමට වැය කළ හැකිව තිබූ මුදලක්, තනි ව්‍යාපාරිකයකුට සීනි වංචාවෙන් කොල්ලකෑමට දී තිබෙනවා. තවත් එවැනිම ආකාරයේ දැවැන්ත මූල්‍ය වංචාවක් සීනි වංචාව කළ ගජ මිතුරාටම පොල්තෙල් ගෙන්වීම හරහා දී තිබෙනවා. සීනි සහ පොල්තෙල් වැනි දැවැන්ත මූල්‍ය වංචාවන් සිදු කළ පුද්ගලයන් සහ ඊට සම්බන්ධ ආණ්ඩුවේ සහ විපක්ෂයේ සියලු පිරිසගේ පැටිකිරිය ඉදිරියේදී හෙළිදරව් කරනවා.


මේ ආණ්ඩුව බලයට ගෙන ඒමට කටයුතු කළ ජාවාරම්කාර ව්‍යාපාරිකයකුට දෙන්නකුට මේ රටේ ජනතාවගේ කහට කෝප්පයෙන් රුපියල් කෝටි 1,600ක් කොල්ලකන්න දීම ගැන තමයි සීනි වංචාවෙන් කියැවෙන්නේ.

පාර්ලිමේන්තුවේ මුදල් කාරක සභාවට මුදල් අමාත්‍යාංශයෙන්ම ඉදිරිපත් කළ වාර්තාවෙන් බොහොම පැහැදිලිව මේ සීනි වංචාව හෙළිදරව් කර තිබෙනවා. මුදල් අමාත්‍යාංශය නම් කියන්නේ ඒ අය වරදක් කළේ නෑ, ඒ අය සීනිවලට තිබු රුපියල් 50ක බද්ද සත 25ට අඩු කිරීමෙන් පාරිභෝගිකයාට සහනයක් දෙන්න සහ පාරිභෝගිකයාට රුපියල් 85ට සීනි දෙන්න තමයි බලාපොරොත්තු වුණේ කියලා. ඒ වගේම ඒ බලාපොරොත්තුව කඩ කළේ වෙළෙඳ අමාත්‍යාංශය සහ සතොස ආයතනය කියලා තමයි කියන්නේ.

මේ වංචාවේ පැති දෙකක් තිබෙනවා. එකක් තමයි රුපියල් 70කට පමණ ලෝක වෙළෙඳපොළෙන් ගන්න පුළුවන් සීනි කිලෝව රුපියල් 85ක් 90ක් වගේ ගාණක් දාලා තමයි ලංකාවට ගෙනත් තිබෙන්නේ.

# දමිළ ජනතාවට බලයක් ලැබෙන්නේ නම් ඔවුනගේ ජීවිත මීට වඩා යහපත් වෙනවා

## ● දෙමළ ජනතා සන්ධානයේ නායක සී. වී. විග්නේෂ්වරන්



**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

දැනට හිඟන ජීවිතයක් ගත කරන මේ රටේ දෙමළ ජනතාව වෙනුවෙන් ස්වයං නිර්ණ අයිතිය ඔස්සේ යම් පාලන බලයක් ලැබෙන්නේ නම්, උතුරු නැගෙනහිර දෙමළ ජනතාවට මීට වඩා සුඛිත මුදිත ජීවිතයක් ගත කිරීමට හැකි වන බව දෙමළ ජනතා සන්ධානයේ නායක සී. වී. විග්නේෂ්වරන් මන්ත්‍රීවරයා ඊයේ (15) යාපනයේ දී පැවැසීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මන්ත්‍රීවරයා මෙසේ ද කීය.


'පාර්ලිමේන්තුවෙන් දෙමළ මන්ත්‍රීවරුන්ට මන්ත්‍රී තනතුරු ලැබුණත්, පළාත් සභා ක්‍රමය යටතේ දැනට ඇති බලතල ලැබුණත් ඒ කිසිවකින්වත් දෙමළ ජනතාවගේ අභිවෘද්ධියට බලයක් ලැබෙන්නේ නෑ.

උතුරු නැගෙනහිර දෙමළ ජනතාවට ඔවුන්ගේ අයිතිවාසිකම් සුරැකෙන ආකාරයට ස්වයං නිර්ණය අයිතිය ඔස්සේ බලයක් ලැබෙන්නේ නම්, ඔවුන්ගේ ජීවිත මීට වඩා සුඛිත මුදිත වෙනවා.

උතුරු නැගෙනහිර ජනතාවට ස්වයං පාලනයක් ඉල්ලා සිටින විට දෙමළ දේශපාලනඥයන් මේ රට බෙදීමට උත්සාහ කරන බවට සිංහල බෞද්ධ බලවේග විශාල ප්‍රචාරයක් ගෙන යනවා. එම ප්‍රචාරය නිසා දෙමළ ජනතාව ඉල්ලා සිටින කිසිදු අන්දමක දේශපාලන විසඳුමක් ඔවුන්ට ලැබෙන්නේ නෑ.

# විපක්ෂ නායකයා අද ගම්වලට ගොස් කිඹුල් කඳුළු හෙලනවා

## ● මන්ත්‍රී අජිත් රාජපක්ෂ



**ලුණම සමූහ - සනත් ගමගේ**

පාස්කු දා ප්‍රහාරයේ වගකීම භාර ගන්නවා කියා විපක්ෂ නායකවරයා අද ගම්වලට පැමිණ කිඹුල් කඳුළු හෙලන බව හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් රාජපක්ෂ මහතා කීය. මන්ත්‍රීවරයා මේ බව සඳහන් කළේ පසුගියදා හුංගම, හාතගල ප්‍රදේශයේදී පාක්ෂිකයන් සමඟ පැවති සාකච්ඡාවකදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මන්ත්‍රීවරයා මෙසේ ද කීය.'අපේ රජය බලයට ඒමට කිසි විටෙක පාස්කු දා ප්‍රහාරය දේශපාලන වේදිකාවේ විකිණීමට ලක් කළේ නෑ. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා යුක්තිය සාධාරණය ඉටු කරන නායකයෙක්. බිහිසුණු ත්‍රස්තවාදයෙන් මේ රට මුදාගන්නට ඉදිරිපත් වූ නායකයා කිසි විටෙක ත්‍රස්තවාදීන්ට අනුබල දෙන්නේ නෑ. පාස්කු කොමිසම ජනාධිපතිවරයා පත් කළ කොමිසමක් නොවෙයි. එය හිටපු රජය පත් කළේ. අපේ රජය එයට කිසිදු බලපෑමක් කළේ නෑ. වාර්තාව එළිදක්වා තිබෙනවා. අඩුපාඩුකම් තිබෙනවාද කියා සොයා බලන්න කමිටුවක් පත් කර තිබෙනවා. නීතියට කිසි විටෙක අත තබන්නේ නෑ.

# සීනි බද්ද අඩු කිරීම ජාතික ආර්ථිකය ඔළුවෙන් හිටවන තීන්දුවක්

## ● ජවිපෙ ලේකම් විජිත හේරත්



**නදී මාණික්කගේ**

සීනි බද්ද ශත 25 දක්වා අඩු කිරීම ආණ්ඩුව කියන ලද ජාතික ආර්ථිකය ඔළුවෙන් හිටවන තීන්දුවක් බවත්, ආණ්ඩුව කුමන කාරණයක් පැවැසුවත් එම වංචාව වසාගත නොහැකි බවත් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් මහතා පෙරේදා (14) බත්තරමුල්ල ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදී පැවැසුවේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ලේකම්වරයා මෙසේ ද කීය.

'මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා චක්‍ර ලේඛයක් නිකුත් කර තිබෙන බව සන්ඩේ ටයිම්ස් පුවත්පත වාර්තා කර තිබෙනවා. ඒ අනුව ව්‍යාපෘති සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරුන්ට තීරණ ගත හැකි නමුත් අවසන් තීරකයා භාණ්ඩාගාර ලේකම්වරයා කියලා. සාමාන්‍ය ක්‍රමවේදය වන්නේ යම් ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් තීරණය ගන්නේ අමාත්‍යාංශ ලේකම්වරයා. කැබිනට් මණ්ඩලයෙන් එය සම්මත කළ යුතුයි. නමුත් නව ක්‍රමවේදයට අනුව කැබිනට් මණ්ඩලය සහ ඇමැතිවරුන් මඟහැර ව්‍යාපෘති සම්බන්ධයෙන් සියලු තීරණ ගන්නේ භාණ්ඩාගාර ලේකම්වරයා. මෙයින් බලාපොරොත්තු වන්නේ යම් කණ්ඩායමකගේ අවශ්‍යතා අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කරවා ගැනීමයි. පසුගිය කාලයේ අප දැක්කා, ජනාධිපති බලතල අනුව කැබිනට් මණ්ඩලය නොසලකා කටයුතු කළ අවස්ථා. මේ උත්සාහ කරන්නේ එය නිල වශයෙන් කර ගැනීමටයි. මෙවැනි කටයුතුවලින් ආණ්ඩුව පාලනය කරන සීමිත කණ්ඩායමකට සියලු තීරණ ගැනීම නීත්‍යානුකූල කරගන්න උත්සාහ කරනවා. මේ වන විටත් සිදු වන ඇතැම් කටයුතු කැබිනට් මණ්ඩලය හෝ ඇමැතිවරුන් දන්නෙත් නෑ. පාර්ලිමේන්තුව දන්නෙත් නෑ. මෙය ඉතාම බරපතළ කාරණයක්. මෙය ඉදිරියේදී අයහපත් ප්‍රතිඵල ගෙනත් දිය හැකි තීරණයක් වෙනවා.


සීනි වංචාව පිටුපස ජාවාරම්කාර ව්‍යාපාරිකයෙක් සිටියා. එම ව්‍යාපාරිකයාට අවස්ථාව දුන්නේ සෘජුවම ආණ්ඩුවේ මැදිහත්වීමකින්. පසුගියදා පාර්ලිමේන්තුවේ මුදල් කාරක සභාවට මුදල් අමාත්‍යාංශය විසින් වාර්තාවක් දුන්නා. එම වාර්තාව අනුව පැහැදිලිව මුදල් අමාත්‍යාංශය කියනවා, එම සීනු ගනුදෙනුවෙන් රුපියල් බිලියන 15.9ක් අලාභ වුණා කියලා. එය අපේ රටේ ජනතාවගෙන් 150,000කට කොවිඩ් එන්නත දිය හැකි මුදලක්. මේ ගනුදෙනුව ගැන තමන්ගේ බේරිල්ලට ආණ්ඩුව විවිධ කතා කියනවා. නමුත් සිදුවීම දෙස බලද්දී ඕනෑම පුද්ගලයකුට වංචාවක් සිදුවී ඇති බව පැහැදිලිව පෙනෙනවා.

පසුගිය කාලයේ භාණ්ඩ විශාල ප්‍රමාණයකට ආනයන සීමා පැනෙව්වා. බදු ඉහළ දැම්මා. කරවල, හාල්මැස්සෝ, උම්බලකඩ වගේම ගොඩනැඟිලි ද්‍රව්‍ය පවා ආනයනය නතර කර තිබෙනවා. වාහන සහ වාහන අමතර කොටස් ආනයනය මෙන්ම විදෙස් මුදල් රටින් බැහැර කිරීමත් තාවකාලිකව නතර කර තිබෙනවා. එසේ තිබියදී සීනි පමණක් ආනයනයට ආණ්ඩුව අනුග්‍රහය දැක්වීම පිළිබඳ සැකයක් තිබෙනවා. ලංකාවේ සීනි හිඟයක් තිබුණේ නෑ. ජනතාවගෙන් විශාල ඉල්ලුමක් ආවෙත් නෑ. අවශ්‍ය තරම් සීනි තොග අපේ ගබඩාවල තිබුණා. සීනි සඳහා තිබුණු බදු රුපියල් 50 සිට ශත 25 දක්වා අඩු කරන මොහොතේ විල්මා ආයතනය සතුව පමණක් සීනි මෙට්‍රික් ටොන් 8237ක් තිබු බව වාර්තාවල සඳහන් වෙනවා. තවත් එක් ආයතනයක මෙට්‍රික් ටොන් 1109ක් සීනි තොග තිබුණා. සීනිවලට රුපියල් 50 බද්ද ගහන වෙලාවේ ආණ්ඩුව කිවුවේ දේශීය නිෂ්පාදනය දිරිගැන්වීමට මේ බද්ද පනවන බවයි. නමුත් හිටිහැටියේ සීනි බද්ද ශත 25 දක්වා අඩු කරන්නේ ඇයි? ඒක ආණ්ඩුව කියූ ජාතික ආර්ථිකය ඔළුවෙන් හිටවන තීන්දුවක්. ඒ නිසා ආණ්ඩුව කුමක් කීවත් එම වංචාව වහන්න හැකියාවක් නෑ.

පසුගිය අවුරුද්ද පුරාවටම සීනි ආනයනය කිරීමේදී ගොඩබාන මිල රුපියල් 90ට වඩා වැඩි වෙලා නෑ. මුදල් අමාත්‍යාංශ වාර්තාවට අනුව 2021 පෙබරවාරි මාසයේ ගොඩබාන මිල රපියල් 87.50ක් වෙනවා. රුපියල් 50ක බද්දක් ගැහුවොත් මිල වෙන්නේ රුපියල් 137.50යි. නමුත් මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා කියන්නේ රුපියල් 50 බද්ද ඉවත් නොකළා නම් අද වෙළෙඳපොළේ සීනි කිලෝවක මිල රුපියල් 175ක් දක්වා ඉහළ යන බවයි. ඒක පට්ටපල් බොරුවක්. 100%ක් බදු ගැහුවොත් තමයි මිල 175ක් වෙන්නේ.

මුදල් අමාත්‍යාංශය සඳහන් කරන රුපියල් බිලියන 15.9ට වඩා මේ ගනුදෙනුවේදී පාඩුවක් සිදුවී තිබෙනවා. විල්මා ආයතනය ආනයනය කරන සීනි සතොස ආයතනය මිලදී ගෙන තිබුණේ රුපියල්120, 122, 127 වැනි මිල ගණන්වලට. නමුත් සතොස විකිණිය යුතුව තිබුණේ සීනි කිලෝව රු.85ට. එම පාඩුව ගණන් හදලා නෑ. එය ජනතාවට සිදු වු පාඩුවක්. එතැන අයථා ගනුදෙනුවක් නොතිබුණා නම් සතොස සභාපතිවරයා ඉවත් කරන්නේ ඇයි? ඔහු සතොසෙන් ඉවත් කර ජනාධිපතිවරයා ළඟට ගන්නේ ඇයි? පාරිභෝගික සේවා අධිකාරියෙන් රුපියල් 85ට සීනි විකිණිය යුතු බවට ගැසට් කර තිබියදී එකසිය විසි ගණන්වලට සතොසට සීනි ගන්නේ දැනුම්වත්වමයි. එනිසා එතැන අක්‍රමිකතාවක් තිබෙන බව පැහැදිලියි. ආණ්ඩුවට හිතවත් කල්ලියක් තමයි මේ ගනුදෙනුව පිටිපස්සේ ඉන්නේ. මහබැංකු බැඳුම්කර ගනුදෙනුවේදී සිදු වුණේ මෙවැනිම වංචාවක්. මහ බැංකුවේ අධිපති අර්ජුන මහේන්ද්‍රන් බැඳුම්කරවල පොලී ප්‍රතිශත වෙනස් කරන්න තීරණය කරනවා. බෑනට කියනවා, බැඳුම්කර වැඩිපුර ගන්න කියලා. මාමයි බෑනයි එකතු වෙලා ඒ ගනුදෙනුව කළා. එසේ නම් කෙනකුට තර්ක කරන්න පුළුවන් මහ බැංකුවට පුළුවන් පොලී ප්‍රතිශත වෙනස් කරන්න පුළුවන් කියලා. පාර්ලිමේන්තුවේ කෝප් කමිටුවේ මේ වංචාව පිළිබඳ විවාදයේදී ෆුට්නෝට් කල්ලිය කිවුවේ මහබැංකු බැඳුම්කර සිද්ධියේදී අලාභයක් සිදු වූ බව වාර්තා කරන්න එපා කියලා. අවාසියක් සිදු වු බව වාර්තාවේ ලියන්න කියලා ෆුට්නෝට් කල්ලිය කිවුවා. දැන් සීනි බදු වංචාව කළ අය කියන්නේත් මේක පාඩුවක් නොවෙයි කියලා. බදු වෙනස් කළ නිසා අවාසියක් සිදු වූ බව පිළිගන්නවා. මේ දෙකේම වුණේ වංචාවක්.'

# දිනමිණ දසත
දස අත ම එක තැන




මිහින්තලේ මන්ත්‍රී බොරලු ලොරියකින් රුපියල් 300ක කප්පමක් අරන්
පිටුව 17



යහන්ගලට පුරාවිද්‍යාවෙන් කුඩම්මාගේ සැලකිලි
පිටුව 18

කනපුස්වැල්
පිටුව 18



# සීගිරියේ ඉඩම් කොල්ලය රටට හෙළි කළ බණ්ඩා මාමාට මැර ප්‍රහාරයක්



සීගිරිය විශේෂ



බණ්ඩා මාමා

දඹුල්ල වැවල වැව, සීගිරිය අලකොළවැව, ප්‍රදේශවල රජයේ ඉඩම් අත්පත් කර ගැනීමේ ජාවාරම් පිළිබඳ මාධ්‍යට තොරතුරු දුන්නැයි චෝදනා කරමින් 13 වැනි දින පස්වරුවේ ගොවියකුට බරපතළ ලෙස පහරදී ඇතැයි දඹුල්ල පොලිසිය ප්‍රකාශ කළේය.

මෙසේ පහරකෑමට ලක්ව ඇත්තේ දඹුල්ල වැවල වැව, අලකොළවැව ප්‍රදේශයේ පදිංචි ඒ. ජී. දිසානායක නොහොත් ප්‍රදේශයේ බොහෝ දෙනා හඳුනනා බණ්ඩා මාමා නමැති අයකු මේ වන විට දඹුල්ල මූලික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටී. පසුගියදා රජයේ ඉඩම් සහ වනජීවී දෙපාර්තමේන්තුවේ මෙන්ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් අත්පත් කරගෙන ඒවා පිටස්තර පුද්ගලයන්ට අලෙවි කිරීමේ ක්‍රියාවලිය සිදු වෙන බව ජනමාධ්‍ය මඟින් දිගින් දිගටම හෙළිදරව් කරන ලදි.

එම අවස්ථාවන්හිදී මාධ්‍යවේදීන්ට වන සංරක්ෂණ නිලධාරීන්ට පොලිසියට වනජීවී නිලධාරීන්ට තොරතුරු දීම සිදු කළ බවට චෝදනා කරමින් තමන්ට මහින්ද නමැති ප්‍රදේශයේ රජයේ ඉඩම් අල්ලාගෙන සිටිනා පුද්ගලයකු පහරදී පිහියකින් අනින්නට තැත් කළ බව පහර කෑමට ලක් වූ පුද්ගලයා පොලිසියට ප්‍රකාශ කොට තිබේ. 'තොරතුරු දුන් කංචනට කියා පත්තරෙන් ඕනෑම දෙයක් කරපන්' යයි තර්ජනය කරමින් තමා ඝාතනය කරනා බවට ඔහු තර්ජනය කළේ යැයි ද රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබනා දිසානායක මහතා අප සමඟ පැවසීය.

තමන් වනජීවී නිලධාරීන්ට සහ මාධ්‍යට සම්පූර්ණ සත්‍ය කතාවක් හෙළිදරව් කළ බවත් මේ වන විටත් රජයේ ඉඩම් අත්පත් කරගෙන විවිධ කණ්ඩායම් සිටිනා බව ඒ මහතා රෝහලේ සිටම ප්‍රකාශ කළේය.මේ සිද්ධිය සම්බන්ධයෙන් දඹුල්ල මූලස්ථාන පොලිස් පරීක්ෂක එස්. පී. එදිරිසිංහ මහතාගෙන් කළ විමසීමකදී කියා සිටියේ පහරදීම සම්බන්ධයෙන් සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් කණ්ඩායමක් වැවල වැව ප්‍රදේශයට පිටත් කර හැරි බවය. එහෙත් එම පුද්ගලයා මාතලේ රෝහලේ ප්‍රතිකාර ලබනා බවට තොරතුරු ලැබී ඇතැයි ද මේ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වහාම ඔවුන් අත්අඩංගුවට ගෙන දඹුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනා බව සඳහන් කළේය.

සම්පත් ප්‍රියනන්දන - බළන්ගොඩ විශේෂ

# මනමාලයාගේ කෑම රස නැතැයි මනමාලි චීදාම ගේම ඉල්ලලා

## දෙකට මැදි වුණු 4කට තුවාල

බළන්ගොඩ කිරිමැටිතැන්න ප්‍රදේශයේ නිවෙසක පැවති මංගල උත්සවයකින් අනතුරුව මනමාලිගේ පාර්ශ්වයෙන් මනමාලයාගේ නිවෙසට පැමිණි පිරිසක් අතර ඇති වූ ගැටුමකින් පෙරේදා (14) හතරදෙනකු තුවාල ලබා බළන්ගොඩ මූලික රෝහලට ඇතුළත් කර ඇතැයි පොලිසිය ප්‍රකාශ කළේය.

මනමාලිය කොළඹ ප්‍රදේශයේ පදිංචිකාරියක වන අතර මනමාලයා බළන්ගොඩ ප්‍රදේශයේ පදිංචි අයෙකි. සිද්ධියට කලින් දින එම විවාහ උත්සවය පවත්වා ඇති අතර පෙරේදා (14) කොළඹ ප්‍රදේශයේ පදිංචි මනමාලියගේ ඥාතීන් බළන්ගොඩ ප්‍රදේශයේ ඇති මනමාලයාගේ නිවෙසට පැමිණි තිබේ. කොළඹ ප්‍රදේශයේ සිට පැමිණි මනමාලිගේ පාර්ශ්වයට මනමලයාගේ නිවෙසේ ප්‍රියසම්භාෂණයක් සූදානම් කර තිබී ඇති අතර එහි කෑම බිමවල අඩු පාඩුවක් තිබුනා යැයි මනමාලිගේ පාර්ශ්වයෙන් චෝදනා කර තිබේ.

එහිදී දෙපාර්ශ්වය අතර ඇති වූ බහින්බස් වීමක් දුරදිග යෑමෙන් ගැටුමක් ඇති වී ඇති අතර එහිදී හතර දෙනෙකු තුවාල ලබා මෙලෙස රෝහල්ගත කර ඇතැයි පොලිසිය ප්‍රකාශ කළේය.

සිද්ධිය සම්බන්ධයෙන් බළන්ගොඩ පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක බී. එම්. ආර්. කේ. බී. බාලසූරිය මහතාගේ උපදෙස් පරිදි උප පොලිස් පරීක්ෂක ඒ. බී. ප්‍රේමසිරි, සැරයන් විමලසිරි (34438) ඇතුළු නිලධාරීහු පරීක්ෂණ පවත්වති.

කපිල සෝමරත්න - පාණදුර සමූහ

# ට්‍රාන්ස්ෆෝමර් බැටරි ගැලවූ 4ක් දැලේ

කළුතර දිසාවේ පෞද්ගලික දුරකතන සේවා ආයතනවලට අයත් ට්‍රාන්ස්ෆෝමර් බැටරි සොරකම් කළ සේවකයන් සිව්දෙනකු උතුරු කළුතර පොලිසිය මඟින් සෙනසුරාදා සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ.

ඔවුන්ගෙන් ප්‍රශ්න කිරීමෙන් අනතුරුව ඔවුන් සොරකම් කර අඩු මිලට අලෙවි කර තිබූ රුපියල් ලක්ෂ දෙකක් පමණ වටිනා බැටරි අටක් පොලිසිය මඟින් සොයාගෙන ඇත. ඔවුන් මේ බැටරි සොරකම් කර ඇත්තේ කළුතර දොඩම්ගොඩ මොරගහහේන සහ බණ්ඩාරගම උප පොළවලින් බව පොලිස් පරීක්ෂණවලදී හෙළි වී තිබේ.

එස්. දීයගහගේ - දකුණු පළාත් සංචාරක

# කතුන්ගේ ඇඳන් යට රිංගන අනංගයෙක් දෙවටේ

අවිවාහක කාන්තාවන් සිටිනා නිවෙස්වලට රිංගා ඇඳ යට සැඟව සිට එම කාන්තාවන්ට ලිංගික අතවර කළ පුද්ගලයකු අත්අඩංගුවට ගැනීමට වරාය පොලිසිය සමත් වී තිබේ. මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ දෙවට සියඹලාගහවත්ත ප්‍රදේශයේ පදිංචි 27 හැවිරිදි පුද්ගලයෙකි.

සැකකරු එම ප්‍රදේශයේම පදිංචි 42 හැවිරිදි අවිවාහක කාන්තාවකගේ නිවෙසට රිංගා ඇඳ යට සැඟව සිට ඇයට ලිංගික අතවර කිරීමට සූදානම් වූ අවස්ථාවේ ඇය කෑගසා නිවෙසින් පිටතට පැමිණි විට සැකකරු පලාගොස් ඇත. අනතුරුව එම කාන්තාව අසල්වැසියන්ද සමඟ පැමිණ පොලිසියට පැමිණිලි කර තිබේ.

පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී ඇත්තේ සැකකරු මීට පෙරද කාන්තාවන්ගේ ඇඳන් යට සැඟව සිට අධිකරණයෙන් දඬුවම් ලබා සිටිනා අයකු බවටය.

වරාය පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක දුමින්ද කුමාර මහතාගේ උපදෙස් පරිදි පොලිස් පරීක්ෂක රොහාන් ආලෝක, උප පොලිස් පරීක්ෂක ජානක යන මහත්වරුන් ඇතුළු නිලධාරීහු වැටලීමට එක් වූහ.

එස්. දීයගහගේ - දකුණු පළාත් සංචාරක

# කන පැළෑ සිසුන් තිදෙනාට ඇප

ගාල්ල මහින්ද විදුහලේ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි සිසුවකුට කන පැළෙන්නට පහරදී තුවාල සිදු කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රිමාන්ඩ් බන්ධනාගාරගත කර සිටි එම පාසලේම සිසුන් දෙදෙනා සහ අධිකරණයට ඉදිරිපත් වූ තවත් සිසුවකු ඇතුළු සිසුන් තිදෙනා එක් අයකුට රුපියල් ලක්ෂ දෙක බැගින් වූ ශරීර ඇපයක් මත මුදාහැරීමට ගාල්ල අතිරේක මහෙස්ත්‍රාත් පවිත්‍රා සංජීවනී පතිරණ මහත්මිය ඊයේ (15) නියෝග කළාය. සැකකාර සිසුන්ට ඇප නියම කළ අතිරේක මහෙස්ත්‍රාත්වරිය ඔවුන්ගේ මව්පියන්ට ද දැඩි ලෙස අවවාද කර තිබේ. මේ පිළිබඳ වැඩිදුර නඩු විභාගය ජුනි මස 16 වැනි දිනට කල්තබන ලදි.

අනුරාධ ප්‍රියදර්ශන - කරන්දෙණිය සමූහ

# ඉඳුරුව මුහුදේ නාන්න ගිය තරුණයෙක් බේරෙයි

## අයෙක් අතුරුදන්

ඉඳුරුව ගල්කන්ද විද්‍යාලය අසල මුහුදේ දිය නෑමට ගිය පිරිසකින් දෙදෙනකු පෙරේදා (14) සවස මුහුදට ගසාගෙන ගොස් තිබේ. ඉන් එක් අයකු බේරාගෙන බලපිටිය මූලික රෝහලට ඇතුළත් කර ඇති අතර අනෙක් පුද්ගලයා අතුරුදන් වී ඇත. නාවික හමුදාවෙන් අතුරුදන් වූ අය සොයා මෙහෙයුම් සිදු කරමින් පවතී. මෙසේ මුහුදේ ගිලී අතුරුදන් වී ඇත්තේ කිරිබත්ගොඩ ඇන්සල් ආයතනයේ සේවය කළ විසිතුන් හැවිරිදි තිසර මනුජය මැදගෙදර නමැති අවිවාහක තරුණයකු වන අතර ඔහු අංක 25, ශ්‍රී රණවිරු ගම්මානය, උඩගම, උලපනේ පදිංචි අයෙකි. කොස්ගොඩ පොලිසිය මේ පිළිබඳ පරීක්ෂණ පවත්වයි.



ගාල්ල දිසා සමූහ

# ගාල්ල බන්ධනාගාරයේ රැඳවූවන් ළඟ දුරකතන 30ක්

ගාල්ල නව බන්ධනාගාර අධිකාරි ධුරයට මොහාන්දාස් නිමල් ශාන්ත මහතා පත්වීමත් සමඟ බන්ධනාගාරය තුළ නිරන්තර සෝදිසි මෙහෙයුම් කිරීම්වල ප්‍රතිඵලයක් වශයෙන් පසුගිය කාලය තුළදී රැඳවූවන් සතුව තිබූ ජංගම දුරකතන 30ක් පමණ සොයා ගැනීමට හැකි වූ බව ගාල්ල බන්ධනාගාර අධිකාරි කාර්යාලය ප්‍රකාශ කළේය.

ඊ. සී. ප්‍රනාන්දු - මුන්නේශ්වරම සමූහ

# මුහුදු කූඩැල්ලන් කිලෝ 1350ක් තෝරාඩිය කලපුවේ



නීති විරෝධී ලෙසින් ඉන්දියාවේ සිට මුහුදු මාර්ගයෙන් ගෙන එන ලද බවට සැක කෙරෙනා වේළන ලද මුහුදු කූඩැල්ලන් තොගයක් පටවගෙන එමින් තිබූ ධීවර යාත්‍රාවක් ඊයේ (15) උදේ කල්පිටිය තෝරාඩිය ප්‍රදේශයේ කලපුවේදී අත්අඩංගුවට ගත් බව කල්පිටිය පොලිසිය ප්‍රකාශ කළේය.

කල්පිටිය පොලිස් විශේෂ කාර්යාංශයේ කොස්තාපල් බණ්ඩාර (61578) මහතා වෙත ලැබී තිබූ තොරතුරක් අනුව කල්පිටිය පොලිසියේ උප පොලිස් පරීක්ෂක ලයනල් මහතා ඇතුළු නිලධාරීන් තෝරාඩිය කලපු ඉවුරේ නැංගුරම්ලා තිබූ සැකකටයුතු බෝට්ටුවක් පරීක්ෂා කළ අවස්ථාවේදී පොලිතින් පෝර උර 35ක දමා තිබූ මේ වේළන ලද මුහුදු කූඩැල්ලන් තොගය සොයාගෙන තිබේ. රුපියල් ලක්ෂ තිහකට වැඩි වටිනාකමක් සහිත මේ මුහුදු කූඩැල්ලන් කිලෝ 1352කුත් ග්‍රෑම් 290ක් තිබී ඇත.

මේ සමගම මුහුදු කූඩැල්ලන් ප්‍රවාහනය කරනා ලද බෝට්ටුව හා එහි එංජිමත් බෝට්ටුවේ සිටි අයත් අත්අඩංගුවට ගෙන තිබේ. සැකකරු කල්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

ධීවර හා ජලජ ආඥා පනත යටතේ වලංගු බලපත්‍රයක් නැතිව මුහුදු කූඩැල්ලන් නෙළා ගැනීම, ප්‍රවාහනය කිරීම, අලෙවි කිරීම සපුරා තහනම් කාර්යක් වේ. කල්පිටිය පොලිසිය වැඩිදුරටත් පරීක්ෂණ සිදු කරයි.

ඡායාරූපය

සමීර අබේසිංහ - නුගේගොඩ සමූහ

# යතුරුපැදිත් සොරා ගෙන රන් මාලත් කොල්ලකන සෙබළකු අල්ලයි



බස්නාහිර පළාතේ විවිධ ප්‍රදේශයන් තුළ මහමඟ නවතා ඇති යතුරුපැදි සොරකම් කර එම යතුරුපැදි උපයෝගි කර ගනිමින් රන් මාල කොල්ලකෑම් සිදු කළ හිටපු යුද හමුදා සෙබළෙක් බොරලැස්ගමුව පොලිස් වසමේ පැපිලියාන ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු යතුරුපැදියක් සොරකම් කර එම යතුරුපැදියෙන් ගල්කිස්ස නගරයේ ගමන්ගත් කාන්තාවකගේ රන් මාලයක් කොල්ලකා පලාවිත් එම මාලය උකස් තබා ගත් රුපියල් 39,000ක මුදල වේරහැර බෝධිරාජපුර ප්‍රදේශයේ පුද්ගලයකුට දී මත්කුඩු මිලට ගැනීමට සැරිසරමින් සිටියදී යතුරුපැදිය සොරකම් කර පැයක් ගත වන්නට මත්තෙන් බොරලැස්ගමුව පොලිසියේ නිලධාරීන් විසින් සැකකරු හා සොරකම් කරනා ලද බයිසිකලය පෙරේදා (14) අත්අඩංගුවට ගත් බව බොරලැස්ගමුව පොලිසිය ප්‍රකාශ කළේය.

සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්, බස්නාහිර පළාත දකුණ බාර නියෝජ්‍ය පොලිස්පති කපිල කඩුපිටිය, නුගේගොඩ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නුවන් අසංක, නුගේගොඩ කොට්ඨාස කලාප අංක 01 භාර පොලිස් අධිකාරි කේ. එස්. රූපසිංහ යන මහත්වරුන්ගේ සෘජු අධීක්ෂණය මත බොරලැස්ගමුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක කේ. ජී. විජේරත්න මහතාගේ උපදෙස් මත අපරාධ අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ජනිත මධුශංක මහතාගේ මෙහෙයවීමෙන් පොලිස් සැරයන්වරුන් වන (36763) සමන්, (40010) වනසිංහ, පොලිස් කොස්තාපල්වරුන් වන (51857) විපුල, (68832) අමරසිංහ, (72795) ලක්මාල්, (92527) ප්‍රසාද්, (93482) දිල්රුවන් යන නිලධාරීහු වැටලීම සිදු කළහ.

ක්‍රීඩා SPORTS

# ගුවන් හමුදාපති කුසලාන රග්බි කල් දමයි
# රග්බි ආයතනයෙන් නව තරගාවලියක්

ෆවුස් මොහොමඩ්

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70 වැනි සංවත්සරයට සමගාමීව ශ්‍රී ලංකා රග්බි ආයතනය සමඟ එක්ව පැවැත්වීමට කටයුතු යොදා තිබූ ගුවන් හමුදාපති කුසලාන අන්තර් සමාජ සත් සාමාජික රග්බි තරගාවලිය කල් දැමූ බව නිවේදනයක් නිකුත් කරමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව දැනුම් දෙයි. මේ මස 20 සහ 21 දෙදින එම තරගාවලියේ පළමු අදියරත්, 26 සහ 27 දෙදින දෙවැනි අදියරත් පැවැත්වීමට මීට පෙර සැලසුම් කර තිබිණි.

මෙරට පළමු පෙළ රග්බි ක්‍රීඩා සමාජ 8ක් එක් කරමින් තරගාවලිය පැවැත්වීමට තීරණය වුවත් පසුව විවිධ හේතු මත මහනුවර ක්‍රීඩා සමාජය, සීආර් ඇන්ඩ් එෆ්සී ක්‍රීඩා සමාජය සහ සීඑච් ඇන්ඩ් එෆ්සී ක්‍රීඩා සමාජය තරගාවලියට සහභාගි නොවන තහවුරු කර තිබිණි. ඒ අනුව ඉතිරි ක්‍රීඩා සමාජවලින් කණ්ඩායම් 2 බැගින් තරගාවලියට සහභාගි වීමට එකගතාව පළ විය. එහෙත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලැබූ කොවිඩ් ව්‍යාප්තිය වැළැක්වීමේ නිර්නායකයන්ට අනුගත වීමට ඇති ප්‍රායෝගික දුෂ්කරතා මත මේ තරගාවලියට සහභාගි වීම අවිනිශ්චිත බව කණ්ඩායම් කිහිපයක් දන්වා තිබූ බව ද එම නිවේදනයේ සඳහන් වේ.

තරගාවලිය කල් දමනු ලැබුවේ තාවකාලිකව බවත්, දැනට රට තුළ පවතින කොවිඩ් වසංගත තත්ත්වය සැලකිය යුතු මට්ටමකට පාලනය වීමෙන් පසු යළි පැවත්වීමට කටයුතු කරන බවත් මේ පිළිබඳ 'දිනමිණ' කළ විමසුමකදී ගුවන් හමුදා රග්බි කමිටු සභාපති එයාර් වයිස් මාෂල් ජානක අමරසිංහ මහතා ප්‍රකාශ කළේය.

කොවිඩ් වසංගතයේ බලපෑම් හේතුවෙන් වසරකට ආසන්න කාලයක් පසුබෑමකට ලක් වී තිබූ මෙරට රග්බි ක්‍රීඩාව නැවත පණ ගැන්වීමේ අරමුණින් යුතුව මේ තරගාවලිය සංවිධාන කර තිබූ අතර, ඊට ඩයලොග් ආසියාටා සමාගමේ අනුග්‍රාහකත්වය ලැබී තිබිණි.

ජෛව බුබුළු ආරක්ෂක ක්‍රමවේදයට අනුව තරගාවලියට සහභාගි වන ක්‍රීඩකයන් ඇතුළු සියලු පාර්ශ්ව පීසීආර් පරීක්ෂණවලට මුහුණදීමට නියමිතව තිබූ අතර, රත්මලාන ගුවන් හමුදා ක්‍රීඩාංගණයේදී තරගාවලිය පැවැත්වීමට කටයුතු යොදා තිබිණි.

තරගාවලිය කල් දැමීමේ තීරණයට එළැඹෙන මොහොත වන විට ක්‍රීඩා සමාජ මට්ටමින් එම ක්‍රීඩකයන් නිරෝධායනය වෙමින් සිටි බවත් ජානක අමරසිංහ මහතා පැවසීය.

එසේ වුවත් මාස දෙකකට වැඩි කාලයක් පුරා දැඩි කැපවීමකින් යුතුව පුහුණුවීම් සිදු කරමින් සිටින ක්‍රීඩකයන්ට සිදුවන අපහසුතාවත්, කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ වුවත් ඩයලොග් ආසියාටා සමාගම රග්බි ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් අනුග්‍රාහකත්වය දීමට ඉදිරිපත් වීමත් සැලකිල්ලට ගනිමින් අන්තර් සමාජ සත් සාමාජික රග්බි තරගාවලිය පැවැත්වීමට කටයුතු යොදන බව මේ පිළිබඳ අදහස් දක්වමින් ශ්‍රී ලංකා රග්බි ආයතනයේ සභාපති රිස්ලි ඉල්යාස් මහතා ප්‍රකාශ කළේය.

තරගාවලිය කල් දැමීම සම්බන්ධව රග්බි ආයතනය කිසිදු එකගතාවකට පැමිණ නොමැති බව සඳහන් කළ ඉල්යාස් මහතා, තරගාවලිය පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීමේදී ගුවන් හමුදාවට අවසන් මොහොත දක්වා එම කටයුතු නිමා කරගැනීමට නොහැකි වීම මත තරගාවලිය කල් දැමීමට තීරණය කර ඇතැයි චෝදනා කළේය.

ප්‍රමුඛතම ක්‍රීඩා සමාජ ත්‍රිත්වයක් තරගාවලියට සහභාගි නොවන බව තහවුරු කරනු ලැබුවේ මීට මාස තුනකට පමණ පෙර බව කියා සිටි රග්බි සභාපතිවරයා සෙසු ක්‍රීඩා සමාජ 5ක ක්‍රීඩකයන් 75කට ආසන්න ප්‍රමාණයක් දැඩි කැපවීමකින් යුතුව පුහුණුවීම්වල නිරත වූ බව කියා සිටියේය. රග්බි ක්‍රීඩාව ඉදිරියට රැගෙන යෑම සඳහා මේ තරගාවලිය පැවැත්වීම අත්‍යවශ්‍ය සාධකයක් බව පෙන්වා දුන් ඒ මහතා ඉදිරියේදී අනුග්‍රාහක ඩයලොග් ආසියාටා සමාගම සමඟ සාකච්ඡා කර නව තරගාවලියක් පැවැත්වීමට පියවර ගන්නා බව පැවසීය.

ඒ සඳහා සම අනුග්‍රාහකයකු ලෙස කටයුතු කිරීමට රුපියල් මිලියනයක අනුග්‍රාහකත්වයක් දීමට 'ඩරාස්' අන්තර්ජාල අලෙවි ආයතනය කැමැත්ත පළ කර ඇතැයි ද ඒ මහතා කීවේය.



## කෝලිගෙන් නායකත්වයේ ඉනිමක්

නායකත්වයේ ඉනිමක් ක්‍රීඩා කළ විරාත් කෝලි කෝඩුකාර ඉෂාන් කිෂාන් සමග එක්ව සංචාරක එංගලන්ත පිලට එරෙහිව පැවති දෙවැනි විස්සයි20 තරගයෙන් කඩුලු 7ක ජයක් කරා ඉන්දීය පිල රැගෙන යෑමට සමත් විය.

පෙරේදා රාත්‍රී අහමදාබාද් නුවර පැවති මේ තරගයේ ජයග්‍රහණයත් සමඟ තරග 5කින් සමන්විත විස්සයි20 තරගාවලිය 1-1කින් සම කර ගැනීමට ද ඉන්දීය පිලට හැකි විය.

කාසියේ වාසිය දිනා පළමුව පන්දුවට පහර දීම එංගලන්ත පිලට දුන් ඉන්දීය පිල කඩුලු 6ක් දවාලමින් ප්‍රතිවාදී පිල ලකුණු 164කට සීමා කර ගැනීමට සමත් වූ අතර, ඕවර 17.5කදී කඩුලු 3ක් පමණක් වැය කරමින් නියමිත ඉලක්කය සපුරා ගත්තේය.

සෑම් කරන් යැවූ පළමු ඕවරයේදීම ලෝකේෂ් රාහුල් ලකුණු නොලබා දැවී ගියේ ඉන්දීය ඉනිමට ලකුණු එක්වීමටත් පෙරය. එහෙත් සිය මංගල තරගයට ක්‍රීඩා කරන කිෂාන් සමඟ එක් වූ නායක කෝලි විශිෂ්ට ඉනිමක් ක්‍රීඩා කරමින් සිය කණ්ඩායමේ ලකුණු සංඛ්‍යාව 94 දක්වා ඉහළ දැමුවේය. පන්දු 32කට මුහුණ දුන් 22 හැවිරිදි වමත් පිතිකරු කිෂාන් ලකුණු 56ක් රැස් කළේ හතරේ පහර 5ක් සහ හයේ පහර 4ක් සමගිනි.

ඉන්දීය පිල ජයග්‍රහණය දක්වා රැගෙන ගිය නායක කෝලි නොදැවී ලකුණු 73ක් රැස් කිරීමට සමත් විය. ඔහුගේ ඉනිමට පන්දු 49ක් වැය වූ අතර, හතරේ පහර 5ක් සහ හයේ පහර 3ක් එක් විය.

# කායවර්ධන සම්මේලනයේ
# බෝඩි ලැලි සංගම් 11කට ඡන්ද අයිතිය අහිමි කරයි

ප්‍රින්ස් ගුණසේකර

ශ්‍රී ලංකා කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා සම්මේලනය යටතේ ලියාපදිංචි බෝඩි ලැලි සංගම් 11කට ඉදිරි නිලවරණයේදී ඡන්ද අයිතිය අහිමි කරයි. විනිසුරු සංගම් දෙකක් ලියාපදිංචි වී තිබූ අතර එයින් එක් සංගමයක් අහෝසි කිරීමටත්, කොළඹ දිස්ත්‍රික්කය නමින් තිබූ සංගම් දෙකෙන් එකක් අහෝසි කිරීමටත් කායවර්ධන නිලවරණය වෙනුවෙන් පත්කොට ඇති නිලවරණ කමිටුව තීරණය කොට ඇත.

මේ අනුව ඉදිරි කායවර්ධන නිලවරණයේදී ඡන්ද අයිතිය ක්‍රීඩා සංගම් 9කට පමණක් ලබාදීමට නිලවරණ කමිටුව තීන්දු කොට ඇතැයි ක්‍රීඩා අමාත්‍යාංශ ආරංචි මාර්ග පවසයි. එම එක් සංගමයකට ඡන්ද 3 බැගින් හිමිව ඇත. ශ්‍රී ලංකා කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා සම්මේලනයේ නිලවරණය මැයි මස 12 වැනිදා ක්‍රීඩා අමාත්‍යාංශ ඩන්කන් වයිට් ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට නියමිතය. එය ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරාල් නීතිඥ අමල් එදිරිසූරිය මහතාගේ අධීක්ෂණය යටතේ නිලවරණ කමිටුව විසින් මෙහෙයවනු ඇත.


කායවර්ධන නිලවරණය වෙනුවෙන් පත්කොට ඇති නිලවරණ කමිටුවේ සභාපති ලෙස හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි සමරවීර මහතා කටයුතු කරන අතර, ජේ. ආර්.ඩී. සී. රත්නමුදලි මහතා හා අයි. එම්. රණසිංහ මහතා සාමාජිකයන් ලෙස කටයුතු කරති. මෙම ත්‍රී පුද්ගල කමිටුව මාසයකට වැඩි කාලයක් කායවර්ධන නිලවරණයට අදාළ ඡන්ද හිමි නාමලේඛනය සකස් කිරීමට විශාල වෙහෙසක් දැරූ අතර ප්‍රශ්නකාරී සංගම් කිහිපයක් ම කැඳවා සාකච්ඡා වට කිහිපයක් පවත්වා තීරණවලට එළැඹියේය.

ශ්‍රී ලංකා කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා සම්මේලනය යටතේ ලියාපදිංචිවී සිටි ඇතැම් සංගම් නිසි පරිදි ක්‍රියාත්මක වී තරගාවලි නොපවත්වා ඇති අතර, සාමාජික මුදල් ගෙවීම් හා සාමාජිකත්වය නිසි පරිදි පවත්වා නොමැති බවට තහවුරුවී ඇත. විනිසුරු සංගම් දෙකක් ලියාපදිංචි වී තිබූ අතර, එසේ එකම නමකින් එවැනි සංගම් දෙකක් තිබිය නොහැකි බැවින් දෙපාර්ශවය ගෙන්වා සාකච්ඡා කොට එක් සංගමයක් අහෝසි කිරීම සිදු කර ඇත.

කොළඹ දිස්ත්‍රික්කය නමින් තිබූ සංගම් දෙකෙන් එකක් අහෝසි කිරීමේ තීරණය එම සංගම් දෙක සාකච්ඡා කොට නිලවරණ කමිටුවට දැනුම් දෙන බව පවසා පිටත්ව ගොස් ඇති අතර, ඔවුන්ගේ තීරණය ඊයේ වන විටත් ලැබී නොමැත. එහෙයින් සුදුසු පරිදි එක් සංගමයක ඡන්ද අයිතිය අහෝසි කිරීමට නිලවරණ කමිටුව සූදානමින් සිටින බව පැවැසේ.

ශ්‍රී ලංකා කායවර්ධන සම්මේලනයේ කලක පටන් පාර්ශ්ව කිහිපයක් අතර තිබූ මතභේද හේතුවෙන් අතුරු කමිටුවක් පත් කළද එම කමිටුව ඉල්ලා අස්වීමේ ලිපි ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්වරයා වෙත භාර දීමෙන් සියලු බලතල ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරාල් වෙත පැවැරුණි.

ශ්‍රී ලංකා කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා සම්මේලනය තුල සිදුව ඇති මූල්‍ය අක්‍රමිකතා හා නිලධාරීන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන සහතික පත් පිළිබඳ පැමිණිලි රැසක් ක්‍රීඩා අමාත්‍යාංශයට ලැබී තිබූ හෙයින් කායවර්ධන අතුරු කමිටුවක් පත් කිරීමට කටයුතු යෙදුණි. ශ්‍රී ලංකා කායවර්ධන හා ශාරීරික යෝග්‍යතා සම්මේලනය නීත්‍යානුකූල නොවන ලෙස පවත්වාගෙන යෑමෙන් ක්‍රීඩාව පරිහානියට පත්වන බවට සම්මේලනයේ විධායක සභිකයන් පසුගිය කාලයේ මත පළ කිරීමත් සමග අතුරු කමිටුවක් නිර්මාණය වූ අතර, මේ වසරේදී ශ්‍රී ලංකාවේ පැවැත්වීමට යෝජිත ලෝක කායවර්ධන ශූරතාවලිය පැවැත්වීමේ අභියෝගයක් ද නිර්මාණය වී ඇත. එමෙන්ම සම්මේලනයේ අර්බුද හේතුවෙන් දේශීය කායවර්ධන තරගාවලි බොහොමයක් පවත්වා ගැනීමටද නොහැකිවී තිබේ.



## ඇෆ්ගන් ක්‍රීඩකයෝ තරගමාලාව සම කරති

සිම්බාබ්වේ පිල සමඟ පැවති දෙවැනි හා අවසන් ටෙස්ට් තරගය කඩුලු 6කින් ජය ගත් ඇෆ්ගනිස්තාන ක්‍රීඩකයෝ 1-1කින් තරගමාලාව සම කර ගැනීමට සමත් වූහ.

අබුඩාබි නුවර පැවති මේ තරගයේ කාසියේ වාසිය දිනා පළමුව පන්දුවට පහර දුන් ඇෆ්ගනිස්තාන පිල සිය පළමු ඉනිමේදී කඩුලු 4කට ලකුණු 545ක් රැස් කොට ඉනිම අත් හිටවූ අතර, සිම්බාබ්වේ පිලට සිය පළමු ඉනිම සඳහා රැස් කිරීමට හැකි වූයේ ලකුණු 287ක් පමණි.ඒ අනුව ඉනිමක පරාජයෙන් බේරීමේ සටනට පිවිසි සිම්බාබ්වේ පිලේ දෙවැනි ඉනිම ලකුණු 365කට සීමා කළ ඇෆ්ගනිස්තාන පිල ජයග්‍රාහී ලකුණු 108ක ඉලක්කය කඩුලු 4ක් පමණක් දැවී යෑමෙන් පසු අත් කර ගත්තේය.

සිම්බාබ්වේ දෙවැනි ඉනිම සුනු විසුනු කළ ඇෆ්ගන් දගපන්දු යවන ක්‍රීඩක රෂීඩ් ඛාන් ලකුණු 137කට කඩුලු 7ක් දවාලීමට සමත් විය. එය ඔහුගේ ටෙස්ට් තරග දිවියේ හොඳම පන්දු යැවීම ලෙස වාර්තාපොතට එක් විය.

# ශ්‍රී ලංකා පිල තුන්වැනි එක්දින තරගයත් පරාදයි
## වනිඳු හසරංගගේ ඉනිම අපතේ යයි

එක්දින තරග දිවියේ සිවුවැනි ශතකය වාර්තා කළ ඩැරන් බ්‍රාවෝ ඇන්ටිගුවා හි ශ්‍රීමත් විවියන් රිචඩ්ස් ක්‍රීඩාංගණයේ පෙරේදා රාත්‍රී පැවති තුන්වැනි එක්දින තරගයෙන් ශ්‍රී ලංකාවට එරෙහිව කඩුලු 5ක ජයග්‍රහණයක් කරා කොදෙව් පිල රැගෙන ගියේය. ඒ සමගම තරග 3කින් සමන්විත එක්දින තරගාවලිය 3-0කින් ජය ගැනීමට කොදෙව් පිල සමත් විය. අවසන් වරට දෙපිල අතර පසුගිය වසරේ ශ්‍රී ලංකාවේදී පැවති එක්දින තරගාවලියත් කොදෙව් පිල ජයගත්තේ තරග 3-0කිනි.

කාසියේ වාසිය දිනූ කොදෙව් පිලේ ඇරියුමෙන් පළමුව පන්දුවට පහරදුන් ශ්‍රී ලංකා පිල නියමිත ඕවර 50 අවසානයේ කඩුලු 6ක් දැවී රැස් කළ ලකුණු 274 හඹා ගිය කොදෙව් පිල තරගය ජය ගත්තේ ඕවර 48.3කදීය. ඒ වන විට කඩුලු 5ක් බිඳ වැටී තිබිණි.

දෙවැනි තරගයේදී කොදෙව් පිලට දැඩි සටනක් දුන් ශ්‍රී ලංකා පිල මේ තරගයේදී කොදෙව් පිලේ අත්දැකීම් බහුල ශක්තිමත් පිතිහරඹ පෙළ ගැස්ම මෙල්ල කිරීමට අසමත් විය.

කොදෙව් පිලේ පළමු කඩුලු දෙකම ලකුණු 39ක් ඇතුළත බිඳ දැමුවත් ෂායි හෝප් සහ ඩැරන් බ්‍රාවෝ එක්ව තුන්වැනි කඩුල්ලට ලකුණු 109ක සම්බන්ධතාවක් ගොඩ නැගීම වළකාලීමට කිසිදු පන්දු යවන්නෙක් සමත් නොවීය.

පළමු තරගයේදී ලකුණු 110ක් ද, දෙවැනි තරගයේදී ලකුණු 84ක් ද රැස් කළ ෂායි හෝප් මේ තරගයේදී රැස් කළ ලකුණු සංඛ්‍යාව 64කි. ඔහුගේ දැවී යෑමෙන් පසු නායක කීරන් පොලාර්ඩ් සමග එක්ව පස්වැනි කඩුල්ලට ලකුණු 80ක් එක් කිරීමට සමත්වූ බ්‍රාවෝ පන්දු 132කින් ලකුණු 102ක් රැස් කළේය. පොලාර්ඩ් නොදැවී ලැබූ ලකුණු සංඛ්‍යාව 53කි.

ශ්‍රී ලංකා ඉනිමේ 32 වැනි ඕවරය නිමා වන විට කඩුලු 6ක්ම ලකුණු 151ක් ඇතුළත බිඳ වැටී තිබූ අතර, අෂේන් බණ්ඩාර සහ වනිඳු හසරංග එක්ව 7 වැනි කඩුල්ලට ලකුණු 123ක නොබිඳුනු සම්බන්ධතාවක් ගොඩ නැගීම කැපී පෙනේ.

ශ්‍රී ලංකා ඉනිම කදිමට පිළිසකර කළ මේ යොවුන් පිතිකරුවන් දෙදෙනා පිතිහරඹයේ නිරත වූයේ ප්‍රවීණ පිතිකරුවන්ට කදිම ආදර්ශයක් ගෙන දෙමිනි. අෂේන් බණ්ඩාර නොදැවී ලකුණු 55ක් රැස් කළ අතර, වනිඳු හසරංග නොදැවී රැස් කළ ලකුණු සංඛ්‍යාව 80කි. එහෙත් කොදෙව් පිලේ ජයග්‍රහණය වළකාලීමට එය ප්‍රමාණවත් නොවීය.

තරගයේ වීරයා සම්මානය ඩැරන් බ්‍රාවෝට හිමි වූ අතර, ෂායි හෝප් තරගාවලියේ වීරයා සම්මානය දිනා ගත්තේය.

දෙපිල අතර තරග 2කින් සමන්විත ටෙස්ට් තරගමාලාව ලබන 21 වැනිදා මේ ක්‍රීඩාංගණයේදීම ආරම්භ වේ.

**ශ්‍රී ලංකා පිල** - 274/6 (ඕවර 50) වනිඳු හසරංග නොදැවී 80, අෂේන් බණ්ඩාර නොදැවී 55, ධනුෂ්ක ගුණතිලක 36, දිමුත් කරුණාරත්න 31 (අකීල් හොසේන් 33/3)

**කොදෙව් පිල** - 276/5 (ඕවර 48.3) ඩැරන් බ්‍රාවෝ 102, ෂායි හෝප් 64, කීරන් පොලාර්ඩ් නොදැවී 53 (සුරංග ලක්මාල් 56/2)





## පැරණි කොල්ලෝ දිගටම වැඩ පෙන්වති

ශ්‍රී ලංකා හිටපු ක්‍රිකට් නායක ටී. එම්. ඩිල්ෂාන්ගේ තුන් ඉරියව් දක්ෂතා හේතුවෙන් කෙවින් පීටර්සන් ප්‍රමුඛ එංගලන්ත ලෙජන්ඩ්ස් කණ්ඩායම කඩුලු 6කින් පරාජය කිරීමට ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් පිල සමත් වෙයි. මෙම අනගි ජයග්‍රහණයත් සමග සචින් තෙන්ඩුල්කාර්ගේ නායකත්වයෙන් යුත් ඉන්දීය ලෙජන්ඩ්ස් කණ්ඩායම අභිබවා ලකුණු සටහනේ පෙරමුණ ගැනීමට ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් කණ්ඩායම සමත් වුණි.

ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් කණ්ඩායමට ලකුණු සටහනේ පෙරමුණ ගැනීමට නම් එංගලන්ත පිල ඕවර් 7.4කදී පරාජය කළ යුතු වූ අතර, ඩිල්ෂාන් ප්‍රමුඛ ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් කණ්ඩායම ඕවර් 7.3කදී අවශ්‍ය ඉලක්කය පසු කර යමින් ලකුණු සටහනේ පෙරමුණට පැමිණියේය.

ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් කණ්ඩායම කාසියේ වාසිය දිනා මුලින් පන්දුවට පහරදීමට එංගලන්ත ලෙජන්ඩ්ස් කණ්ඩායමට ආරාධනා කළ අතර, එහිදී ඔවුන් ලකුණු 78කට සීමා කිරීමට ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් කණ්ඩායම සමත් වූ අතර, ටී. එම්. ඩිල්ෂාන් ඕවර් 4කදී නිලකුණු ඕවරයක් සමග ලකුණු 6කට කඩුලු 4ක් දවා දස්කම් දැක්වීය. එමෙන්ම සුපිරි පිතිහරඹයක නිරත වූ ටී. එම්. ඩිල්ෂාන් පන්දු 26කදී හයේ පහරක් සහ හතරේ පහර 11ක් සමග නොදැවී ලකුණු 61ක් රැස් කොට තරගයේ වීරයා සම්මානය දිනා ගත්තේය. ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් කණ්ඩායම මූලික වටයේදී තරග 6කට ක්‍රීඩා කළ අතර, ඉන්දියන් ලෙජන්ඩ්ස් කණ්ඩායම සමග පැවති තරගය පමණක් පරාජය විය. තරගාවලියේ අවසන් පූර්ව වටය මේ 17 වන දින රාජ්පූර් හිදී ආරම්භවන අතර, දෙවැනි අවසන් පූර්ව තරගය මාර්තු 19 වනදා පැවැත්වේ. අවසන් මහා තරගය මුම්බායි හි පටිල් ක්‍රීඩාංගණයේදී විදුලි ආලෝක ධාරා මැද ලබන 21වැනි ඉරිදා පැවැත්වේ.

එංගලන්ත ලෙජන්ඩ්ස් - ඕවර 20 කදී 78/9 යි. ක්‍රිස් ට්‍රෙම්ලට් 22, ජිම් ට්‍රෝටන් 18 (ටී. එම්. ඩිල්ෂාන් 6/4, රංගන හේරත් 17/2)

ශ්‍රී ලංකා ලෙජන්ඩ්ස් - ඕවර 7.3 කදී 81/4 යි. ටී. එම්. ඩිල්ෂාන් නොදැවී 61 , උපුල් තරංග 6, චාමර සිල්වා 8 (මොන්ටි පැනසර් 4/26)

දසත
දස අත ම එක තැන

බී.එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

# මිහින්තලේ මන්ත්‍රී බොරළු ලොරියකින් රුපියල් 300ක කප්පමක් අරන්

## ● ව්‍යාපාරිකයෝ කියති





පරිසර විනාශයන් පිළිබඳව කිඹුල් කඳුළු සලමින් රජයේ නිලධාරීන්ට රජයේ අමාත්‍යවරුන්ට මඩ ගසනා මිහින්තලය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයකු පසුගිය වසර 10 -15ක් මුළුල්ලේ බොරළු කපමින් මිහින්තලය පළුගස්වැව ප්‍රදේශය වනසා දැමූ ආකාරය ඔහුට අමතක වී ඇති බව දැනට එම ප්‍රදේශයේ බොරුළු කැණීමේ නිරත ව්‍යාපාරිකයෝ පිරිසක් පෙන්වා දුන්හ.

මිහින්තලය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය භූ විද්‍යා හා පතල් සමීක්ෂණ කාර්යංශය නිසි අවසරය යටතේ බලපත්‍ර ලබාගෙන බොරළු කැණීම් සිදු කරන ව්‍යාපාරිකයන්ගෙන් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා එක් බොරළු ලොරියකට රුපියල් තුන් සීයක කප්පමක් ඉල්ලනා බවත් එම මුදල ලබාදීමට ව්‍යාපාරිකයන් අකමැති වීම නිසා එකවරම ඔහු පරිසර හිතකාමියකු බවට පත්වී ඇති බව ඔවුහු පෙන්වා දුන්හ.

ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වූ ව්‍යාපාරිකයන් පිරිස කියා සිටියේ මෙවැනි අදහසකි,

'ඔය මන්ත්‍රීවරයා පසුගිය වසර 10 -15ක කාලයක්ම පළුගස්වැව රජයේ අවශේෂ කැලෑ සම්පූර්ණයෙන් විනාශ කරමින් බොරළු කපලා තවත් පරිසරය විනාශයෙන් විනාශයට පත් කරන්න බොරු පන්සලක් ඇටෙව්වා. නමුත් මිහින්තලය නායක ස්වාමින් වහන්සේ අවසර නොදීම නිසා ඒක යටගියා. ගෙදර ආසන්නයෙන් බොරළු කපලා ඒ පැත්ත අගාධයක් කරලා අක්කර 15ක් විනාශ කරපු කෙනා බොරළු කපලා පරිසර විනාශ වෙලා කියලා දැන් පරිසරය ගැන කිඹුල් කඳුළු හලනවා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු දෙන්නෙකුත් අල්ලගෙන බොරළු කපන්න ඉඩම් දෙනවා කියලා දැන් රජයේ නිලධාරීන්ට ඇමතිවරුන්ට මඩ ගහනවා. බොරුළු කපන්න ඉඩම් දෙන්නේ ප්‍රාදේශීය ලේකම්වරයා භූ විද්‍යා පතල් ඒකකය ඇතුළු ආයතන හයක් එක්ව. ඒ කාලයේ එයාට හොරට බොරළු කපන්න දුන්නේ ඇමැති කෙනෙක් වෙන්න ඇති.

මහ පරිමාණ පරිසර විනාශයක් සිදු වෙන බව පවසන පළුගස්වැව ප්‍රදේශයේ "දිනමිණ" සිදු කළ සංචාරයකදී පරිසර හානි පිළිබඳව කිඹුල් කඳුළු හෙළනා මන්ත්‍රීවරයා විසින් පසුගිය සමයේ සිදු කර තිබෙනා දරුණු පරිසර හානියක් කරමින් අක්කර 15කට අධික භූමියක බලපත්‍ර සහිතව හා නොමැතිව මහපරිමාන බොරුළු කැපීමක් සිදුකර තිබෙනා අයුරු දැකගන්නට හැකිවිණි.

මේ සම්බන්ධයෙන් මිහින්තලය ප්‍රාදේශීය මහ ලේකම් සිරිමෙවන් ධර්මසේන මහතාගෙන් දුරකතනයෙන් කළ විමසීමකදී ඒ මහතා මෙසේ පැවසුවේය. මම විතරක් නෙමෙයිනේ බොරළු කපන්න අවසර දෙන්නේ රජයේ ආයතන හයක් එක්ක ඒක කරන්නේ. පරිසර හානිය සිදු වුණේ කොයි කාලේද කියලා බලාගන්න පුළුවන් නිධියට ගියාම. මම මේ ප්‍රශ්නය දිසාපතිවරයටත් දන්වලා තාවකාලිකව බොරුළු කැපීම නැවත්තුවා. රජයේ කටයුතුවලට තමයි වැඩිම බොරළු කැපීමක් සිදු කරන්නේ. නිසි අවසරය අරගෙන තමයි ඒ පිරිස බොරළු කපන්නේ යනුවෙන් ඒ මහතා පැවසුවේය.

සී.එම්. ආරියපාල - තඹුත්තේගම

## මාස් කන්නයේ වී මිලදී ගැනේ

තඹුත්තේගම වී අලෙවි මණ්ඩලයට පසුගියදා එම ප්‍රදේශයේ ගොවීන්ගේ 2021 මාස් කන්නයේ වී මිලදී ගැනීම ආරම්භ කෙරිණි. මේ වන විට වී කිලෝ 50,000ක් පමණ මිලදී ගෙන තිබේ.

වියළි සම්බා වී කිලෝව රුපියල් 56.50කටද නාඩු වී කිලෝවද රුපියල් 56.50කටද තෙත සම්බා වී කිලෝව රුපියල් 48කටද නාඩු තෙත වී කිලෝව රුපියල් 46කටද මිලදී ගන්නා බව එහි ප්‍රාදේශීය කළමනාකරු ආර්.එම්.පී.එච්. බණ්ඩාර මහතා පැවසීය.

බී.එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

## අනතුරු දෙකකින් දෙදෙනෙක් මරුට

යතුරුපැදිවල ගමන් කරමින් සිටියදී හදිසියේ ඇදවැටීමෙන් සිදුවූ අනතුරු දෙකකින් දෙදරු මවක හා අවිවාහක තරුණයකු බරපතළ තුවාල ලබා වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහලට ඇතුළත් කිරීමෙන් පසුව පෙරේදා (14) ජීවිතක්ෂයට පත්වී තිබේ.

හොරොව්පොතාන මැදවච්චිය මාර්ගයේ මුක්කරවැව ප්‍රදේශයේදී හා හොරොව්පොතාන මුස්ලිම් වලහාවිද්දවැව ගුරුගල්හින්න මාර්ගයේ සිදුවූ මාරක රිය අනතුරුවලින් දෙදරු මව හා තරුණයා ජීවිතක්ෂයට පත්ව තිබේ.

මුක්කරවැව ප්‍රදේශයේ ජීවිතක්ෂයට පත්වී ඇති කාන්තාව ත්‍රිකුණාමලය කින්යා ප්‍රදේශයේ පදිංචිකරියක වූ අබ්දුල් මනාජි ජෙස්මි 41 නමැත්තිය වන අතර අනෙකා හොරොව්පොතාන මුස්ලිම් වලහාවිද්දවැව ගුරුගල්හින්න මාර්ගයේ සිදුවූ අනතුරකින් නබඩවැව පරංගියාවාඩිය ලිපිනයේ පදිංචිව සිටි 20 හැවිරදි දිල්නුවන් සංජීව රාජපක්ෂ නමැති අවිවාහක තරුණයෙකි.

සබරගමුව සමූහ





## ගඟුල්දෙණිය ලෙන් විහාරස්ථානය විනාශමුඛයේ



විහාරාධිකාරී ධම්මානන්ද හිමි

මහනුවර යුගයට අයත් පිළිම වහන්සේලා හා බිතුසිතුවම්වලින් යුත් කෑගල්ල හෙට්ටිමුල්ල ගඟුල්දෙණිය පුරාණ රජමහ ලෙන් විහාරස්ථානය කලක සිට විනාශයට පත්වෙමින් තිබෙන බවත් කඩිනමින් ඊට පිළියම් නොකළහොත් මතු පරපුරට එම අසිරිය දැක ගැනීමට පවා නොලැබෙණු ඇතැයි ප්‍රදේශවාසීහු පවසති.

ඈත අතීතයේ වසර ගණනාවකට ඉහතදී මුළු ප්‍රදේශයම ජලයෙන් පිරී තිබීම හේතුවෙන් පසුව ගඟුල්දෙණිය යන නාමය ලැබී ඇතැයි පවසන කලා භූෂණ පුරා විද්‍යා උපදේශක බුද්ධ ධර්ම ඩිප්ලෝමාධාරී ශාස්ත්‍ර විශාරද එම්.ඩී.එම්.එස්. යටවර මහතා පැවසුවේ,

"මෙම විහාරස්ථානයේ පෞරාණික බෝධීන් වහන්සේ නමක් වැඩ සිටිනවා. මහනුවර යුගයේ ඉදි කළ සුවිශේෂී ලෙන් විහාරස්ථානයක් හැටියටත් හඳුන්වන්න පුළුවන්."

වර්තමාන විහාරාධිපතීත්වය ගින්නලියේ රතනසාර හිමියන් දරණ අතර උන් වහන්සේ පවසා සිටියේ භික්ෂූන් වහන්සේලා වරින්වර වැඩ සිට අතරම තවත් කලක කිසිවෙකුත් නොසිට තිබේ. එම කාලයේ මෙම ලෙන් විහාරස්ථානය සම්පූර්ණයෙන්ම අභාවයට ගොස් ඇති බව විහාරාධිපති හිමියෝ පැවසීය.

විනාශයට පත් චිත්‍ර තරමක්දුරට පුරා විද්‍යා දෙපාර්තමේන්තුව මගින් කලකට ඉහතදී සංරක්ෂණය කර දීම නිසා මේ තත්ත්වයෙන් රඳා පවත්වා ගෙන යෑමට හැකි බව උන්වහන්සේ පැවසූහ. මේ පිළිබඳ අදහස් දක්වමින් විහාරාධිපතිහිමියන් කියා සිටියේ මෙවන් අදහසකි,

"මේ වන තෙක් විහාරස්ථානයේ සියලුම දේ දායකයන්ගේ හා පරිත්‍යාගශීලින්ගේ ආධාර උපකාර ඇතිව තමයි මේ තත්ත්වයට ගෙනල්ලා තියෙන්නේ. පරිත්‍යාගශීලින් දානපතීන් ඕනෑ තරම් මේ රටේ ඇති. ඒ අයට පුළුවන් මේ ස්ථානයට පැමිණිලා සොයා බලා උදව්වක් උපකාරයක් කරන්න යැයි ස්වාමින් වහන්සේ වැඩිදුරටත් පැවසූහ. වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා 070 246 8140 විස්තර ලබා ගත හැකිය."

ඒ.ටී.එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

## දිවුල්ගස් වැවේ පිටවාන කැඩී යෑමෙන් මහ විනාශයක්



සහකාර ගොවිජන සේවා සංවර්ධන කොමසාරිස්වරිය



එල්.ඒ.එච්. චන්ද්‍රසේන



ඉන්දික ප්‍රියදර්ශන පරණවිතාන

කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අග්බෝපුර "දිවුල්ගස් වැවේ" පිටවානේ කොටසක් පසුගියදා වර්ෂාවට කැඩීයෑම නිසා සිය වගා කටයුතු කරගෙන යෑමට ජලය රැඳවීම සඳහා වැලි ගෝනි ගැසීමට සිදුව ඇතැයි ගොවීහු පැවසූහ.

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ දිවුල්ගස්වැව සංවිධානයේ සාමාජිකයකු වන **එල්.ඒ.එච්. චන්ද්‍රසේන මහතා,**

'වැවේ බේසම හරියට හදලා තිබුණේ නැහැ. ඒ නිසා වැස්සට හැරිලා හැරිලා පිටවාන ළඟින් කඩලා ගියා. කොන්ත්‍රාත්කාරයෝ වැව හදන්න ඇවිල්ලා ටොපියයි කොලයයි අපිට දීලා ගියා වගේ වැඩක් වුණේ. දැන් ඉතින් වැලිගෝනී ගහලා යල කන්නය වගාවට වැවේ වතුර ටික රඳවගෙන කරන්නේ. මහා කන්නයේ වැස්සත් එක්ක වැලිගෝනි ටික මහවැලි ගඟට යනවා.

දිවුල්ගස් වැවේ ගැටලුව සම්බන්ධයෙන් අදහස් දැක්වූ **කන්තලේ ගොවි ව්‍යාපාර එකමුතුවේ සභාපති ඉන්දික ප්‍රියදර්ශන පරණවිතාන මහතා,**

" දිවුල්ගස් වැව කියන්නේ පහත් වතුරෙන් පිරෙන වැවක්. ඒ නිසා ඊළඟ මාස් කන්නයට කලින් කඩාගෙන ගිය තැන හැදුවේ නැති නම් එන වතුර පාරට බැම්ම ගලවගෙන ගිහිල්ලා ලොකු විනාශයක් වෙනවා. හැමදාම පොහොර බෑග් 500ක් ගෙනල්ලා සිවිල් ආරක්ෂක භටයෝ ගොවීන් එක්ක වැලිගෝනි ගහනව යැයි පැවසීය.

මේ සම්බන්ධයෙන් කළ විමසුමකට පිළිතුරු දුන් **ත්‍රිකුණාමලය සහකාර ගොවිජන සේවා සංවර්ධන කොමසාරිස් වරුණි සර්වානන්දන් මහත්මිය** මෙසේ පැවසීය.

"සිරිසර පිවිසුම ව්‍යාපෘතිය යටතේ වැවේ ප්‍රතිසංස්කරණ අතර මග වැඩ නැවතුණා. වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ මෙම වැව හදන්න යොජනා කළත් ඒක හරි ගියේ නැහැ. ඒ නිසා සිරිසර පිවිසුම ව්‍යාපෘතිය යටතේ ඉතිරි වැඩ කරන්න ඉල්ලීම් කරලා තියනවා යැයි පැවසීය.



ගලේවෙල මධ්‍යම සමූහ

## මවගේ අනියම් සැමියා දියණියටත් හදි කරලා

තිදරු මවකගේ බාල වයස්කාර 15 හැවිරිදි දියණිය අතවරයට ලක් කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් පසුගියදා (29) හැවිරිදි පුද්ගලයෙක් සැකපිට අත්අඩංගුවට ගත් බව පොලීසිය පවසයි. මෙම පුද්ගලයා දැරියගේ මවගේ අනියම් සැමියා බව පරීක්ෂණවලදී අනාවරණය වී තිබේ.

මෙම සිද්ධිය සැලවීමත් සමඟම ගලේවෙල ළමා හා කාන්තා කාර්යංශයේ ස්ථානාධිපති පොලීස් පරීක්ෂක ශානිකා මධුවන්ති මහත්මිය විසින් සැකකරු අත්අඩංගුවට ගන්නා ලදි. අනතුරුව ඔහු දඹුල්ල මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලබන 16 දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට නියෝග කළේය.

ගලේවෙල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක රුක්ෂාන්ත පෙරේරා මහතාගේ උපදෙස් පිට ළමා හා කාන්තා කාර්යාංශය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

එස්.පී. උඩබේපාල - කැබිතිගොල්ලෑව සමූහ

## වාරි සෞභාග්‍යා සමාරම්භක උලෙළදා...



රට හදන සෞභාග්‍යයේ දැක්ම බලගන්වමින් "වාරි සෞභාග්‍යා" ජාතික වැඩසටහන යටතේ ග්‍රාමීය වැව්, අමුණු සංවර්ධනය කිරීමට සමගාමීව අනුරාධපුර වැව සංවර්ධනය කිරීමේ කටයුතු ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ජාතික සංවිධායක සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන සංවර්ධන රාජ්‍ය ඇමැති දුමින්ද දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා (13) සමාරම්භ කෙරිණි. රුපියල් ලක්ෂ 17ක මුදලකින් මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීමට නියමිතය.

මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මිහින්තලය ආසන සංවිධායක හිටපු පළාත් සභා ඇමැති සරත් ඉලංගසිංහ, තිරප්පනය ප්‍රාදේශීය සභාවේ සභාපති රොෂාන් ඉලංගසිංහ යන මහත්වරු ඇතුළු දේශපාලන නියෝජිතයෝ ඇතුළු විශාල පිරිසක් සහභාගී වී සිටියහ.

නුවන් ජයසේකර - සූරියවැව විශේෂ

## ගංජා හේනකින් ගංජා හොරෙන් කපලා



යාල ජාතික වන උයනේ හොරට වගා කර තිබූ ගංජා හේනකින් ගංජා කපාගෙන රැගෙන එමින් සිටි දඩයක්කරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන තිබේ.

වියළි ගංජා කිලෝ 16යි ග්‍රෑම් 400ක් සමඟ දඩයක්කරුවන් දෙදෙනකු තංගල්ල කොට්ඨාස දූෂණ මර්දන ඒකකයේ නිලධාරීන් විසින් පසුගියදා (14) අත්අඩංගුවට ගෙන තිබේ. මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ කතරගම ගෝතමීගම පදිංචි 25 හැවිරිදි අවිවාහක පුද්ගලයකු හා 56 හැවිරිදි විවාහක පුද්ගලයෙකි.

සැකකරුවන් දෙදෙනා හා වියළි ගංජා තොගය අධිකරණ කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට කතරගම පොලීසියට බාර දී තිබේ.

තංගල්ල කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රවින්ද්‍ර අඹේපිටිය, තංගල්ල කොට්ඨාස දූෂණ මර්දන ඒකකයේ ස්ථානාධිපති හිශාන්ත ලාල් යන මහත්වරුන්ගේ උපදෙස් පරිදි නිලධාරීහු එක්ව වැටලීම සිදු කර තිබේ.

පරාක්‍රම ගුණසේකර - සූරියවැව සමූහ

## සූරියවැව ප්‍රා. සම්බන්ධීකරණ කමිටු රැස්වීම හෙට

සූරියවැව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම මෙම 17 (හෙට) පෙරවරු 09.30ට සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

සූරියවැව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති, හම්බන්තොට දිසත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මෙවර කමිටු රැස්වීමේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ක්‍රියාත්මක ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති සහ නව සංවර්ධන වැඩසටහන් පිළිබඳව සාකච්ඡා කර තීන්දු තීරණ ගැනීමට නියමිතව ඇත.

සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන සහ සංස්ථා, මණ්ඩල සියලු ප්‍රධානින් මෙම අවස්ථාවට සහභාගි වීමට නියමිතයි.

ඇඹිලිපිටිය සමූහ සේන වී. ගමගේ



# යහන්ගල ලෙන් රජමහ වෙහෙරට පුරා විද්‍යාවෙන් කුඩම්මාගේ සැලකිලි



විහාරාධිපති කැලණිය විශ්වවිද්‍යාලයේ බෞද්ධ චින්තනය පිළිබඳ අධ්‍යයන අංශයේ අංශාධිපති වඩිනාගල පඤ්ඤාලෝක හිමි

හම්බන්තොට දිස්ත්‍රික්කයේ බඳගිරිය නම් වූ ප්‍රදේශයේ ඓතිහාසික යහන්ගල ලෙන් රජමහ වෙහෙර පිහිටා ඇත. මෙය මහානාග රජු විසින් පිහිටුවනු ලැබූ ඓතිහාසික රෝහණ ජනපදයේ පිහිටි අනුරාධපුර යුගයට අයත් විහාර සංකීර්ණයකි. මෙය ක්‍රි.පූ. 2 වන සියවසේදී රෝහණ පුර රාජධානියේ රාජ්‍ය පාලකයා වූ වළගම්බා රජු විසින් කරන ලද්දකි. අක්කර 15 පමණු වූ භූමියක විශාල ගල් පර්වත මුදුනෙහි පාත්‍රාකාර චෛත්‍යයක්, පරිවාර චෛත්‍යයන් දෙකක්ද පිහිටා ඇත. පර්වත පා මුල මහ රහතුන් වැඩසිට කටාරම් කොටන ලද විශාල ලෙන් පිහිටා ඇති අතර අක්කර ගණනක විහිදී ගියා විශාල ගල් පර්වතය මත දිය නොසිඳෙන මහා පොකුණක් හා තවත් පරිවාහක පොකුණු කිහිපයක් ද වේ. ප්‍රදේශය පුරා විහාර හා මාලිගා වැනි ස්ථානවල ගල්කණු, නටබුන් පමණක් ඉතිරිව ඇත. ශිලා ලේඛන ද අභාවයට යමින් පවතී. බඳගිරිය ජනපදය බිහිවන්නට පෙර 1954 වසරේ පමණ මෙම ස්ථානය සොයාගෙන පැමිණ වන සතුන්ගේ උවදුරු මැද බණ භාවනායෝගීව වැඩ සිට ඇත්තේ පුහුල්වැල්ලේ සීලවංශ හිමිපාණෝ ය. අකක්ර 15 පමණ වූ මෙම ඓතිහාසික යහන්ගල රාජමහා විහාර භූමිය 2004 දී පමණ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවය පවරාගෙන ඇති අතර කිසිදු සංවර්ධනන කටයුත්තක්ද සිදුකර නොමැත. පසු කාලීනව මෙම ස්ථානයට පැමිණි භික්ෂුන් වහන්සේ නමක් ජනපද ජනතාව සමඟ කුඩා ආරාමයක් සෑදීම සඳහා උත්සාහ ගත් අවස්ථාවේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව උන් වහන්සේ අත්අඩංගුවට පත්කළ අවස්ථාවේ ජනපද වැසියන් ප්‍රාදේශීය ලේකම්, පුරා විද්‍යා නිලධාරීන් හා බලධාරීන් කැඳවා සාකච්ඡා කිරීමෙන් පසුව එම භූමියෙන් අක්කර 03 ක් පමණ ආරාමයක් සඳහා වෙනකර දී ඇත. මේ වන විට කුඩා ආරාමයක් සාදා භික්ෂුන් වහන්සේ නමක් වැඩසිට ජනපද ජනතාවගේ ආගමික කටයුතු සිදු කරමින් දහම් පාසලක්ද පවත්වාගෙන යමින් සිටිති. මේ වන විටත් එම භූමිය මහා වනාන්තරයෙකි. මෙම යහන්ගල රාජමහා විහාරය සංවර්ධන කර සංරක්ෂණය කරන මෙන් ප්‍රදේශයේ ජනතාව හා වත්මන් විහාරාධිපති හිමියන් ද ඉල්ලා ඇතත් එයට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සවන් දී නොමැත. සංවර්ධන කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නොකිරීමත් ජනතාවට හා විහාරාධිපති වහන්සේට එය ඉටුකරගැනීමට අවසර නොදීමත් හේතුවෙන් මෙම ඓතිහාසික ලෙන් රජමහා වෙහෙර අනාරක්ෂිතව හා විනාශයට යමින් පවතී. විහාරස්ථානයක් ලෙස ධර්ම ශාලාවක්, සංඝාවාසයක් මෙන්ම විහාර මන්දිරයක්ද නිසියාකාරව නොමැතිව ප්‍රදේශයේ ජනපද වැසියන්ගේ දූ දරුවන්ට දහම් දැනුම ලබාදෙන ශිලවංශ දහම් පාසලද පවත්වාගෙන යනු ලබන්නේද දැඩි දුෂ්කරතා මධ්‍යයේය. මෙම ඓතිහාසික ස්ථානය අංග සම්පූර්ණ විහාරස්ථානයක් බවට පත්කර පුරාවිද්‍යාත්මක කොටස් කැනීම් කර සංරක්ෂණය කර සංවර්ධනය කරන්නේ නම් මෙම ස්ථානය රුහුණු පුරයේ දෙස් විදෙස් සංචාරකයන්ගේ තෝතැන්නක් බවට පත්වනු ඇත. බදගිරියේ ගොවිජන පද මැද පිහිටි මෙම ස්ථානය ස්වාභාවිකවම කෙනෙකුගේ සිත දැහැන්ගත කිරීමට සමත් පරිසරයකින් යුක්ත වන අතර ගලමතට නැගී අයෙකුට එක්තරා ආකාරයකින් තමා ලෝකය මැදට පැමිණ සිටිය යන අදහස මතුකරන ආකාරයට සමස්ත පරිසරයම දර්ශනය වේ. රුහුණු රාජ්‍යය ආශ්‍රිතව නිර්මාණය වූ පුරාතණ සංස්කෘතිය දැක ගැනීමටත් අධ්‍යයනය කිරීමටත් ලාංකීය උරුමය කෙතරම් ඈත අතීතයක සිට පැවැතෙන්නක්දැයි වටහා ගැනීමට ස්ථානය කදිම නිදසුනකි.

රවීන්ද්‍ර මැදගෙදර - අම්පාර සමූහ

## කතක් යට කර පලාගිය කැබ් රියැදුරුට ඇප නියම වෙයි

සිය දරුවා රැගෙන යෑම සඳහා පාසල අසලට පැමිණ සිටි කාන්තාවක් අනතුරට ලක්කර පලාගිය සුබෝපභෝගී ඩබල් කැබ් රථයක් අත්අඩංගුවට ගැනීමට අම්පාර පොලිස් රථවාහන අංශයේ නිලධාරීහු සමත් වූහ.

අම්පාර ප්‍රදේශයේ මාර්ග සංවර්ධන කටයුතු සඳහා අනුයුක්ත කර ඇති මේ කැබ් රථය, අම්පාර - හිඟුරාන ප්‍රධාන මාර්ගයේ ගමන් කරන අවස්ථාවේ තම දරුවා රැගෙන යෑමට ශ්‍රී හැගොඩ ඉන්ද්‍රසාර විද්‍යාලය අසලට පැමිණ සිටි මවක් අනතුරට ලක්කර නොනවත්වා යන අවස්ථාවේ එම ස්ථානයට ආසන්නයේ රථ වාහන රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරියකු කැබ් රථය නතර කරන ලෙස සංඥා කළවිට නොනවත්වා පලාගොස් ඇති බවත් වාහනය පසුපස හඹා ගොස් ඇතත් සොයා ගැනීමට නොහැකිවී ඇති බැවින් අම්පාර මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ලසන්ත දඩල්ලගේ මහතාගේ උපදෙස් පරිදි රථවාහන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලන්ත විජේසිංහ මහතාගේ අධීක්ෂණය යටතේ නිලධාරීන් ප්‍රධාන මාර්ගයට ආසන්නව වෙළෙඳ ආයතනවල සවිකර ඇති සී.සී.ටී.වී. කැමරා පරීක්ෂා කිරීමෙන් පසු ලැබුණු දත්තවලට අනුව කැබ් රථය හඳුනා ගැනීමෙන් පසු අත්අඩංගුවට ගත් බවත් පොලීසිය අධිකරණයට වාර්තා කර ඇත.

අනතුරට ලක්වූ කාන්තාව අම්පාර මහ රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන අතර ඇගේ තත්ත්වය බරපළ නොවන බව රෝහල් ආරංචි මාර්ග පවසයි. අධිකරණයට ඉදිරිපත් කළ රියැදුරා රු .100000ක ශරීර ඇප දෙකක් මත මුදා හැර ඇත.

කරාපිටිය සමූහ - එස්. ලොකුකරවිට





## වසර 172කට පසු ගාල්ලෙන් ‘කනපුස්වැල්’ සොයා ගනී

ඉතාමත් දුර්ලභ, ‘කනපුස්වැල්’ නමින් හැඳින්වෙන ශාක දෙකක් ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව හා අම්බලන්ගොඩ අතර පිහිටි මාදම්පාවිල අභයභූමිය ආසන්න ප්‍රදේශයේ තිබී හමුවූ බව ගාල්ල වනජීවී සංරක්ෂණ සංගමය පවසයි. ඔවුන් පවසන්නේ මෙම ශාකය පිළිබඳව වාර්තා වී ඇත්තේ වසර 172කට පසුව බවයි.

2012 වර්ෂයේ දී නිකුත් කළ රතු දත්ත වාර්තාවට අනුව මෙම ශාකය වඳ වී යාමේ දැඩි තර්ජනයට ලක් වූ විශේෂයක් ලෙස වර්ගීකරණය කර තිබේ.

මෙම ශාක දෙක හමුවී ඇත්තේ පසුගිය සතියේ දී මාදම්පාවිල අභයභූමිය හා ඒ අවට ප්‍රදේශයේ ජෛව විවිධත්වය පිළිබඳ කරන ලද පරීක්ෂණයකිනි. රනිල කුලයට අයත් මෙම වැල් විශේෂය උද්භිද විද්‍යාත්මකව ‘මුකුනා ගයිගන්ටියා’ (Mucuna gigantea) ලෙස හැඳින්වේ. කන පුස්වැල් නමින් සිංහල භාෂාවෙන් හඳුන්වන මෙම වැල් දෙකම හමුවී ඇත්තේ එකිනෙනකට ආසන්නව පිහිටි ගෙවතු දෙකක තිබූ කොට්ටම්බා ගස් දෙකක එතී ඉහළට වැඩෙමින් තිබිය දී ය.

මෙම පර්යේෂණයට සම්බන්ධ වූ පේරාදෙණිය ජාතික ශාකාගාරයේ හිටපු නිලධාරියකු මෙන්ම ශාක විශේෂ පිළිබඳ පර්යේෂකයකු වන භාතිය ගොපල්ලව මහතා පවසන්නේ Flora of Ceylon (Vol VII) ග්‍රන්ථයට අනුව කන පුස්වැල් ශාකය පළමුවෙන් ම වාර්තා වී ඇත්තේ 1849 වර්ෂයේදී පමණ මඩකලපුව ප්‍රදේශයෙන් බවයි. ඉන් පසු 1894 දී ට්‍රයිමන් නම් පර්යේෂකයා විසින් මෙම ශාකය පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ශාක එකතුවේ තිබූ බවට වාර්තාවක් තබා තිබේ. ඒ අනුව පර්යේෂකයන් පවසන්නේ එක් නිදර්ශකයක් පමණක් ඇති මෙම ශාකය සම්බන්ධ වාර්තා සීමිත බවයි.

ගාල්ල වනජීවී සංරක්ෂණ සංගමයේ සභාපති මධුර ද සිල්වා මහතා මෙසේ කීවේය.

“මෙය උද්භිද විද්‍යා ක්ෂේත්‍රයේ ඉතාමත් වටිනා සොයාගැනීමක්. මෙම පුස්වැල් විශේෂය වඳ වී යන්නට ඇතැයි විශ්වාස කළ ශාකයක්. මාදම්පේ අභයභූමිය ආසන්නයේ අභයභූමියට පිටත පිහිටි පුද්ගලික ඉඩම්වලින් අපිට මේ ශාක දෙකම හමුවුණේ. ඒ නිසා මෙය සංරක්ෂණය සඳහා වහාම පියවර ගත යුතුයි. එමගින් මේ ශාක විශේෂය ආරක්ෂා කිරීමට අපිට හැකි වේවි.”

ශාක විශේෂ පිළිබඳ පර්යේෂක භාතිය ගොපල්ලව මහතා මෙසේ කීවේය. “ මෙය අපට හමුවන විටත් මල් පිපී ගෙඩි හටගෙන තිබුණා. ඒ නිසා පහසුවෙන් ප්‍රචාරණය කිරීමේ හැකියාව තිබෙනවා. උද්භිද උද්‍යානයන්හි ශාක එකතුවටත් මේ ශාක එක්කිරීමේ හැකියාවක් තිබෙනවා.”

මෙම පර්යේෂණය සඳහා මධුර ද සිල්වා, භාතිය ගොපල්ලව, සුපුන් දේශප්‍රේම, සිසිර දර්ශන ජයසිංහ, රොහාන් පාඩියප්පෙරුම, සම්පත් උඩුගම්පොළ, ලසිත් සිරිවර්ධන, ප්‍රදීප් කුමාර හා සම්පත් ගුණසිංහ යන පිරිස සහභාගී වූහ. වනජීවී දෙපාර්තමේන්තුවේ අඩවි සහකාර චමිල් ප්‍රදීප් මහතාගේ ද සහයෝගය මේ සඳහා ලැබුණු බව පර්යේෂකයෝ පවසති.

ගම්පහ දිස්ත්‍රික් විශේෂ - සිසිල ගුණතිලක

## දොම්පේ යෞවන සමාජ ප්‍රාදේශීය සම්මේලනයේ නව නිල මඬුල්ල



2021 වසර සඳහා දොම්පේ මැතිවරණ කොට්ඨාසයේ යෞවන සමාජ ප්‍රාදේශීය සම්මේලනයේ නිලවරණය කිරිදිවැල මධ්‍ය මහා විද්‍යාලයේදී ඉකුත්දා පැවැත්විණි.

එහිදී සභාපති ලෙස සෙහාන් රත්නායක, උපලේකම් ලෙස ඔරේෂා ඩිල්හාරා පත්වූ අතර, භාණ්ඩාගාරික ලෙස උපේඛා සෙව්මිණි , සංවිධායක ලෙස ඉරේෂා උදාරි, උපසභාපති ලෙස ලහිරු ජයසිංහ යන අය තේරී පත්වූහ. එම තේරී පත්වූ නව නිලධාරී මඬුල්ලට සුබපැතීමට ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මිලාන් ජයතිලක මහතාද එක්වී සිටියේය.

අනුරාධපුර මධ්‍යම විශේෂ - බී.එම්. විජේසූරිය

## පොල්වතු හිමියන් අස්වනු නෙළීම පමා කිරීමෙන් පොල් මිල වැඩි වන ලකුණු

පොල්වතු හිමියන් විසින් අස්වැන්න වෙළෙඳ පොළට නිකුත් නොකිරීම නිසා අනුරාධපුර දිස්ත්‍රික්කය ඇතුළු සෙසු පළාත්වල පොල් මිල නැවතත් ඉහළ යෑම වළක්වාලීමට නොහැකි තත්ත්වයක් උද්ගතව ඇති බව පොල් තොග ගැනුම්කරුවෝ පවසති.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ හා අනුරාධපුර දිස්ත්‍රික්කයට මායිම්ව ඇති ගල්ගමුව, මීගලෑව, කරුවලගස්වැව ඇතුළු ප්‍රදේශ රැසක පොල් වගාකරුවන් මෙවර අස්වැන්න කැඩීම ප්‍රමාද කරන බවත් ඉදිරි උත්සව සමයේ නැවත පොල් මිල අහස උසට නැංවීම ඔවුන්ගේ බලාපොරොත්තුව බව තොග ගැනුම්කරුවෝ ප්‍රකාශ කළහ.

මාස කිහිපයකට ඉහතදි පැවති අධික පොල් මිල ශීඝ්‍රයෙන් අඩුවෙමින් පැවතියත් කෘතිමව පොල් මිල වැඩිකිරීම සඳහා පොල්වතු හිමියන් විශාල උත්සාහයක නිරත වන බව ඔවුන් කීහ. මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ පොල් තොග ව්‍යාපාරිකයෝ මෙසේ කීය.

පසුගිය සති කිහිපයකම අනුරාධපුර කුරුණෑගල පුත්තලම වගේ දිස්ත්‍රික්ක වල පොල් මිල ඉතා ඉහළ මට්ටමක පැවතුණේ. ලෙලි සහිත පොල් ගෙඩියක් රුපියල් 65ට අධික මිලකට අලෙවි වුණා. ලෙලි ඇරපු (පොල් කවලම්) රුපියල් 70-85 අතර තොග මිලට ගියා. මේ වනවිට පොල් මිල අඩුවෙමින් පැවතියත් පොල්වතු හිමියන් මෙවර අස්වැන්න කඩන්නේ නෑ. ඔවුන් අප්‍රේල් මාසයේ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනකොට තවත් පොල් මිල ඉහළ නංවලා පාරිභෝගිකයාට එලොව පොල් පෙන්නන්න තමයි ලෑස්ති වෙන්නේ. සමහරු මීට පෙර කඩපු පොල් තොග තාමත් රුපියල් 70-85 අතර මිලට තමයි අලෙවි කරන්නේ. ඒ නිසා පාරිභෝගිකයාට සහනයක් ගන්න විදියක් නෑ.නැවත ඇතිකරලා තියන පොල් හිඟය සමඟ ඉදිරියේදී පොල් ගෙඩියක සිල්ලර මිල රුපියල් 100-110 අතරට එනවා යනුවෙන් ඔවුහු පැවැසූහ.

දිනමිණ දසත දස අත ම එක තැන

රවීන්ද්‍ර මැදගෙදර - අම්පාර සමූහ

## උහන රක්ෂිත ඉඩමකින් දැව කැපූ තිදෙනකුට ඇප

උහන පොලිස් වසමට අයත් හිමිදුරාව ප්‍රදේශයේ රජයට අයත් උහන පොලිස්රක්ෂිත ඉඩමකට අයුතු ලෙස ඇතුළු වී යාන්ත්‍රික කියතක් උපයෝගි කර ගනිමින් දැව ඉරා සන්තකයේ තබාගෙන සිටි පුද්ගලයන් තිදෙනකු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු එක් අයකුට රු.15,000ක මුදලින් ඇප සමඟ රු. 100,000ක ශරීර ඇපයක් බැගින් වෙන් වෙන්ව චූදිතයන් තිදෙනාට නියම කළ අම්පාර අතිරේක මහෙස්ත්‍රාත් ප්‍රදීප් ජයසිංහ මහතා ඔවුන්ට සතියේ සෑම ඉරු දිනකම පෙ.ව. 9.00 – 12.00 අතර, උහන පොලිස් ස්ථානයට වාර්තා කරන ලෙසට නියෝග කර, නැවත මේ මස 23 වැනි දින අධිකරණය හමුවේ පෙනී සිටින ලෙස නියම කළේය.

වැටලීම සඳහා සැරයන් ගුණතිලක (39852), කොස්තාපල් බණ්ඩාර (95798), සිවිල් ආරක්ෂක සෙබළ එම්. හේරත් (010758) සහ පොලිස් රියැදුරු (89948) අජිත් යන නිලධාරීන් සහභාගි වූ අතර උහන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එල්. ඩී. එන්. කරුණාරත්න මහතා සමග නඩු මෙහෙයුම් අංශයේ සැරයන් වේරගොඩ (58004) මහතා සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කරමින් කරුණු දැක්වීය.

රාගම සමූහ

## භික්ෂූන් වහන්සේ වෙනුවෙන් ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර



ආරණ්‍යවාසී ස්වාමීන් වහන්සේ උදෙසා කැපකරු ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර සේවයක් ආරම්භ කිරීම දේශීය වෛද්‍ය ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය නීතිඥ සිසිර ජයකොඩි මහතාගේ ප්‍රධානත්වයෙන් ගාල්ල කහව ගල්දූව ආරණ්‍ය සේනාසනයේදී 9වනදා උදෑසන සිදුකරන ලදි.

මෙය දීපව්‍යාප්තව පැවැත්වීමට නියමිත කැපකරු ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමයේ ආරම්භක වැඩ සටහන වන අතර මෙය දිවයිනේ ඉතා දුෂ්කර පළාත්වල පවා පිහිටි ආරණ්‍ය සේනාසනවල භාවනානුයෝගීව වැඩවාසය කරන ගිලන්ව වැඩවාසය කරන ස්වාමීන් වහන්සේ සොයා ගොස් ප්‍රතිකාර කිරීමට ආරම්භ කර ඇත.

මේ සේවාව සදහා ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, ආයුර්වේද වෛද්‍යවරුන් ඇතුළු පිරිසක් ශ්‍රම දායකත්වය ලබාදෙන අතර දේශීය වෛද්‍ය ප්‍රවර්ධන හා ග්‍රාමීය ආයුර්වේද රෝහල් සංවර්ධනය ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය නීතිඥ සිසිර ජයකොඩි මහතාගේ සහයෝගය හා උපදෙස් මත සිදු කෙරෙන බව අමාත්‍යාංශයේ මාධ්‍ය පෙන්වා දී ඇත.

ප්‍රථම ප්‍රතිකාර සේවය සංකේතවත් කරමින් ගාල්ල කහව ගල්දූව ආරණ්‍ය සේනාසනාධිපති ත්‍රිපිටකාචාර්ය ත්‍රිපිටක විශාරද කහගොල්ලේ සෝමවංශ හිමිපාණන්ට ප්‍රතිකාර ලබාදුන් අතර දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි,අමාත්‍යාංශයේ ලේකම් කුමාරි වීරසේකර, ආයුර්වේද කොමසාරිස් චතුර කුමාරතුංග දකුණු පළාත් ආයුර්වේද කොමසාරිස් සී. එල්. ගුරුගේ, චමල් රාජපක්ෂ පර්යේෂණ රෝහලේ අධ්‍යක්ෂ ලක්ෂ්මී වරුසවිතාන මහත්ම මහත්මීහු ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

එස්. දීයගහගේ - දකුණු පළාත් සංචාරක

## ස.ජ.බ. තරුණ බල මණ්ඩලයේ උප සභාපති තාරක නානායක්කාර



සමගි ජන බලවේගය පක්ෂයේ තරුණ බල මණ්ඩලයේ උප සභාපතිවරයකු ලෙස සමගි ජන බලවේගය පක්ෂයේ හබරාදූව ප්‍රධාන සංවිධායක නීතිඥ තාරක නානායක්කාර මහතා එම පක්ෂයේ නායක සජිත් ප්‍රේමදාස මහතා විසින් පත් කර තිබේ.

සමගි ජන බලවේගය පක්ෂයේ සාමාජිකත්වය ලබා ගැනිමට පෙර තාරක නානායක්කාර මහතා එක්සත් ජාතික පක්ෂයේ ජාතික යොවුන් පෙරමුණේ ප්‍රධාන ලේකම්වරයා ලෙස කටයුතු කළේය. හිටපු ආණ්ඩුකාවරයකුවන හේමකුමාර නානායක්කාර මහතා තාරක නානායක්කාර මහතාගේ පියා ය.

ඌරුබොක්ක විශේෂ - ඒ.පී. දයාචන්ද්‍ර

## නිවෙසකට ඇතුළු වී දේපළ සොරාගත් සැකකරුට අත් හිටවූ සිර දඬුවම්

2013 වර්ෂයේදී මාතර වල්ගම නිවෙසකට නිවැසියන් නොමැති අවස්ථාවක ඇතුළු වී රුපියල් දොළොස්දහසක් වටිනා දේපළ සොරකම් කිරීම පිළිබඳ දීර්ඝ නඩු විභාගයකදී වරදකරු වූ පුද්ගලයකුට මාතර ප්‍රධාන මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු ඉසුරු නෙත්තිකුමාර මහතා දඬුවම් නියම කරමින් සැකකරුට පළමු චෝදනාවට වසර එකක බරපතළ වැඩ ඇතිව සිර දඬුවමක් නියම කර එම සිර දඬුවම වසර දහයකට අත්හිටුවා රුපියල් 1500ක දඩ මුදලක් ගෙවීමට නියෝග කළේය.

දඩ මුදල නොගෙවන්නේ නම් මාස එකක සිර දඬුවමක් නියම කෙරිණි. දෙවැනි චෝදනාවට වසර එකක බරපතළ වැඩ ඇතිව සිර දඬුවමක් නියම කර එම දඬුවම වසර දහයකට අත්හිටුවන ලදි. දඬුවමට අමතර දෙවැනි චෝදනාවට රුපියල් 1500ක දඩ මුදලක් ගෙවන ලෙසත් එම දඩ මුදල නොගෙවන්නේ නම් මාස එකක සිර දඬුවමක් නියම කෙරිණි.

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

**විදුලි පාරිභෝගිකයින්ට අනර්ඝ සැපයුමක් හා සේවාවක් ලබාදීමේ අරමුණ සපුරා ගනු වස්, ලංකා විදුලිබල මණ්ඩලය පහත සඳහන් ප්‍රදේශවල විදුලි පද්ධතියේ නඩත්තු, පුනරුත්ථාපන හෝ තැනීම් කටයුතු කිරීමට අදහස් කරයි. මේ නිසාවෙන්, එම ප්‍රදේශවල විදුලිබල සැපයුම, පහත දක්වා ඇති දිනයන් හි / වේලාවන් හිදී තාවකාලිකව අත්හිටුවීමට සිදුවේ. මේ නිසා විදුලි පාරිභෝගිකයින්ට සිදුවන අපහසුතාවයට අපගේ කණගාටුව ප්‍රකාශ කරන අතරම, සැලසුම් කරන ලද වැඩ අවසන් වූ වහාම නැවත විදුලි සැපයුම යථා තත්ත්වයට පත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් පියවර ගනු ලැබේ.**

# මධ්‍යම පළාත - 01

## විදුලි ඉංජිනේරු බලප්‍රදේශය : කුණ්ඩසාලේ

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : දුම්බර

2021.03.16 — පෙ.ව.08.00 සිට17:00 ප.ව. දක්වා
ඉත්තමල්ලියගොඩ

2021.03.27 — පෙ.ව.08.00 සිට 17:00 ප.ව. දක්වා
මහවත්ත-i, මහවත්ත-ii, මහමෙව්නා අසපුව

2021.03.16 — පෙ.ව.08.30 සිට 17:00 ප.ව. දක්වා
A.R.M බිල්ඩර්ස්, අලුත්වත්ත - ii, සමරසිංහ ඩොලමයිට්, අලුත්වත්ත - i, නිහාල් ඩොලමයිට්

2021.03.20 — පෙ.ව.08.00 සිට 17:00 ප.ව. දක්වා
සන්කෙන් ඉදිකිරීම්, දිගන පරණ නගරය, ක්‍රීඩා සංකීර්ණය, දිගන මල්පාන, දූල්වල වත්ත UD ටවුන් විලේජ්, , මල්පාන - ii (10 වෙනි සැතපුම් කණුව), මැණික්හින්න රෝහල, කෙන්ගල්ල නගරය, කේසර මිනරල් ඇන්ඩ් කෙමිකල්ස්, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව, ටෙලිකොම් රජවැල්ල, වික්ටෝරියා රේන්ජ් ඒෂියන් ෆිනෑන්ස්, දිගනගම-v, දිගනගම-vi, අහස්පොකුණ ii, අමිල එන්ටර්ප්‍රයිසස්, සමර් ෆීල්ඩ් - ii, දිගනගම-iii, දිගනගම-iv, මල්පාන - i, නුවර කඩේ, ඔරුතොට, අහස්පොකුණ i, අරලිය එන්ටර්ප්‍රයිසස්, බලගොල්ල - කෙන්ගල්ල රේන්බෝ උද්‍යානය, කාගිල්ස් ෆුඩ් සිටි දිගන, කැන්ඩි ෆර්ටිලයිසස්, ධම්මිකා ගල් මෝල, ගොමගොඩ එලමල්පොත, දිගන - ලං.වි.ම. නිලනිවාස, කන්නන් සහ සමාගම, නව නගරය රජවැල්ල, රත්නායක හාල්මෝල කොලොන්ගහවත්ත, සම්පත් බැංකුව, දිගනගම-ii, කෙන්ගල්ල කොලොන්ගහවත්ත , නෙටෝ ඩිසයිනර්, සත්මැච් රජවැල්ල (අලුත්වත්ත), දිගනගම-i, ACM ඩොලමයිට්, මැණික්හින්න නගරය, කිරි මණ්ඩලය (මිල්කෝ රජවැල්ල)

2021.03.20 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
නිතුලේමඩ, නිතුලේමඩ පරකැටවෙල, සෙනරත්වෙල, මාබේරියතැන්න කාර්යාලය, ගොල්ෆ් ක්ලබ්, මාබේරියතැන්න - ii, රජවැල්ල ගොල්ෆ්, යුධ හමුද කඳවුර මාබේරියතැන්න, රජවැල්ල හෝල්ඩින්ස්

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : හසලක

2021.03.23 — පෙ.ව.10.00 සිට 16:00 ප.ව. දක්වා
දමිත් ගල්මෝල - ගුරුවෙල යාය, අබේනායක ගල් මෝල, 2 ඇල, මල්ගම්මන, මහඅස්වැද්දුම, දුනුවලපිටිය ගණේයාය, දේවගිරිය, ගුරුවෙලයාය යෝජනා ක්‍රමය, මාරක, මැදකන්ද, දේවගිරිය එගොඩගම, බෝගස්වැව අංක 02 යෝජනා ක්‍රමය, රදුන්නේවැව යෝජනා ක්‍රමය, හසලක ඇල්හේන, කුඹුකන්දන, කාර්මික විද්‍යාලය - හසලක, මාරක ගණේයාය, කීනපැලැස්ස, තෝරපිටිය ඉලුක, තෝරපිටිය වැල්ගහවාඩිය, ජල පිවිසුම - දුණුවලපිටිය, රත්නැල්ල දඹවැල්ගොල්ල

2021.03.22 — පෙ.ව.08.00 සිට 17:00 ප.ව. දක්වා
ජුවෙලෙක්ස් ඇග්‍රි (පුද්.) සමාගම, ශ්‍රීමා ගල්, හීන්ගඟ, සුළුගුනේ, නාමිණීගම ඇහැරන්ද , සෝනුත්තර, සෝනුත්තර ගණේයායගම, බත්ගම්පොල ඉහලගම, පේරකනත්ත, නාමිණීගම, නුගගොල්ල, ජනෝදය ප්‍රජාමූල සංවිධානය, තොටිල්ලගස්ඇල්ල ඇදගල කිරිපට්ටිය, අලිකන්ද, නාමිණීගම වනරව, පේරකනත්ත, දියවර ගම්මානය, නාමිණීගම ලග්ගල, දූන්ගොල්ල

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : උඩදුම්බර

2021.03.18 — පෙ.ව.08.00 සිට 17:00 ප.ව. දක්වා
හුන්නස්ගිරිය හෙයා ෆාක්, කොබොනිල්ල, දෙහිගොල්ල, මීමුරේ ගම්මානය, කන්දෙගම, කහටලියද්ද දඹගහපිටිය, කයිකාවෙල, තලගුනේ, පුස්සැල්ල, කරබාකැටිය, උඩවලකන්ද, කුඹුක්ගොල්ල, නාරන්තලාව ගැරඬිගල, මූණමල්පැලැස්ස, උඩඉලුක

2021.03.18 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
මූණමල්පැලැස්ස

2021.03.20 — පෙ.ව.08.30 සිට 17:00 ප.ව. දක්වා
මැදිවක ගංගොඩ, මහවෙල , උඩපිටවල, දේවහන්දිය, එයාර් ටෙල් කුළුණ ගලපිටමඩ - මඩුගල්ල, හපුකන්ද, ගලපිටගම මිනුවන්ගමුව, පල්ලෙ පිටවල, මඩුගල්ල, කලල්ගමුව, කළුන්තැන්න, කලවල, මැටිවලතැන්න, නව මඩුගල්ල, උඩදුම්බර - කලවැල්ල

2021.03.27 — පෙ.ව.08.30 සිට 17:00 ප.ව. දක්වා
මැදිවක ගංගොඩ, මහවෙල , උඩපිටවල, දේවහන්දිය, එයාර් ටෙල් කුළුණ ගලපිටමඩ - මඩුගල්ල, හපුකන්ද, ගලපිටගම මිනුවන්ගමුව, පල්ලෙ පිටවල, මඩුගල්ල, කලල්ගමුව, කළුන්තැන්න, කලවල, මැටිවලතැන්න, නව මඩුගල්ල, උඩදුම්බර - කලවැල්ල

2021.03.30 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
උඩඉලුක

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : කරල්ලියද්ද

2021.03.20 — පෙ.ව.08.00 සිට 17:00 ප.ව. දක්වා
තෙල්දෙණිය ලං.ග.ම., ගඟසිරිපුර මඩපොල

2021.03.21 — පෙ.ව.08.00 සිට 17:00 ප.ව. දක්වා
කන්දෙකුඹුර රේටියගම, උඩිස්පත්තුව නගරය - ii, වටපාන, ඩක්වාරි කර්මාන්ත ශාලාව, එලිසලාට් ලංකා (පුද්.) සමාගම - රංගල, ගැටගහවෙල, වේරපිටිය -I, ඩක්වාරි කර්මාන්ත ශාලා ප්‍රදේශය, ගලබොඩවත්ත -i, උඩිස්පත්තුව නගරය - i, ඉස්කෝලමුදුන, කොටගඟ, රන්දිවෙල වරදිවේල, ඊඩන් ගෲප්, රත්මුල්ල, උඩුමුල්ල, ගලබොඩවත්ත -ii, මකුල්දෙනිය බෝබැබිල, රංගල ටෙලිකොම්, මකුල්දෙනිය, පුටුහපුව, රංගල තේ කම්හල, රත්ගම රත්විලා නිවාස සංකීර්ණය, රංගල ජල සැපයුම, බර්න් සයිඩ්, දූන්හින්න, හීල්ඔය වටගල කොටස, තංගප්පුව කල්දූරිය, වේරපිටිය -ii, පොද්දල්ගොඩ, සිරිදිගන

2021.03.29 — පෙ.ව.08.00 සිට 17:00 ප.ව. දක්වා
එලිසලාට් ලංකා (පුද්.) සමාගම - රංගල, රංගල ටෙලිකොම්, රංගල තේ කම්හල, රත්ගම රත්විලා නිවාස සංකීර්ණය, රංගල ජල සැපයුම, බර්න් සයිඩ්, තංගප්පුව කල්දූරිය

## විදුලි ඉංජිනේරු බලප්‍රදේශය : කටුගස්තොට

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : අකුරණ

2021.03.18 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
කොනකලගල, දුනුවිල හන්දිය, කුරුගොඩ නව (සමාධි මාවත), පන්ගොල්ලාමඩ, රතුකොහොදීගල (උඩදීගල පාර) හීපිටිය, මල්ගමන්දෙනිය

2021.03.18 — පෙ.ව.08.30 සිට 16:30 ප.ව. දක්වා
අකුරණ ටෙලිකොම්, ෆුඩ්සිටි අකුරණ, රණවන ගල් වැඩපල, මූසින්, ඔරියන්ට් ලංකා, ෆෙයාලයින්, කහවත්ත පොම්පාගාරය, කවින් පොලිමර්ස්, අලවතුගොඩ (බලකඩුව), අරඹේපොල (ගලේකඩේ), අකුරණ නගරය (ප්‍රාදේශීය කාර්යාලය අසල), අස්වැද්දුම, බුළුගහතැන්න, කුඩුගල - 11 (අකුරණ දම්රෝ ප්‍රදර්ශනාගාරය අසල), කුරුගොඩ 1 (මලකඩේ), කුරුගොඩ නව (සමාධි මාවත), අකුරණ ප්‍රාදේශීය සභාව, දෙල්ගස්තැන්න හන්දිය, කුඩුගල, තෙලඹුගහවත්ත, 7 වෙනි සැතපුම් කණුව(නිරල්ල), 8 වෙනි සැතපුම් කණුව (මොරටු), අලවතුගොඩ -11 (තැපැල් කන්තෝරුව අසල), දෙඩම්ගොල්ල, කිංන්ස් කෝට්, කුරුගොඩ 11 (පිට්ටනිය), මල්ගමන්දෙනිය, මාවතුපොල (9 වෙනි සැතපුම් කණුව), අලවතුගොඩ - 1 (MPCS), දිප්පිටිය, දුණුවිල උග්ගල, කොනකලගල

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : මඩොල්කැළේ

2021.03.21 — පෙ.ව.08.00සිට 17:00 ප.ව. දක්වා
තුනිස්ගල

2021.03.25 — පෙ.ව.08.30සිට 16:30 ප.ව. දක්වා
පෙන්ගුයින් (කුන්ඩන්මාල්ස්) ගාමන්ට්, රාක්ෂාව තේ කම්හල, උනනගල තේ කම්හල, හාතලේ තේ කම්හල, බැද්දේගම තේ කම්හල ල, මවුන්ට් හුන්නස්ගිරිය ගවතැන්න, මොරහෙල, අප්පලාබැද්ද, මඩොල්කැලේ බසාර්, පත්විල අංගම්මන ගල්පිහිල්ල වත්ත, හාතලේ ඉහල කොටස, අරත්තන පොම්පාගාරය, උනනගල (මඩොල්කැලේ), මේරිලෑන්ඩ් කොලනිය, අරත්තන, හාතලේ ඉහල කොටස (කොලනි), පත්විල

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : වත්තේගම

2021.03.23 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
කැන්ඩි සි ෆුඩ් නාපාන ආදහනාගාරය, නාපාන( පට්ටියතැන්න හන්දිය)

2021.03.23 — පෙ.ව.08.30 සිට 16:30 ප.ව. දක්වා
අයිලන්ඩ් ක්ලෝතින් කැන්ඩි (පුද්.) සමාගම, වත්තේගම ෆුඩ් සිටි, කැන්ඩි සි ෆුඩ්, : මඩවල සුළු නගර සභාව, නාපාන හාල් මෝල (ඌරාදෙනිය), පිටියෙගෙදර, පොලුඅඹේ (උඩුරාවන), සිරිමල්වත්ත පාර, වත්තේගම, කුඩුගල පාර වත්තේගම, රාක්ෂඇල්ල, සරසවි මාවත (පොල්ගොල්ල), නාපාන( පට්ටියතැන්න හන්දිය), උඩුරාවන, බෝරුප්ප, ටෙලිකොම් වත්තේගම, වත්තේගම නගරය, 6 වෙනි සැතපුම් කණුව, බෝගස්කුඹුර, නාපාන ආදහනාගාරය, යටිරාවන

2021.03.24 — පෙ.ව.08.30 සිට 17:00 ප.ව. දක්වා
මීගම්මන උතුර, උඩතලවින්න ඩයලොග් බේස් ස්ටේෂන්, වලඅරඹ, වියනමුල්ල

2021.03.25 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
ගල්පිහිල්ල උපපොල, මක්කානිගම, වැලිකන්ද ගෝනගම, අංගම්මන, ඊරියගස්තැන්න, අලවතුගිරිගම, ගල්පිහිල්ලගම, උඩුගොඩ, උඩුගොඩ කර්මාන්තපුරය, වාවින්න, පිටවල හන්දිය

## විදුලි ඉංජිනේරු බලප්‍රදේශය : මාතලේ

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : මාතලේ

2021.03.17 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
අකුරම්බොඩ මැදලන්ද වත්ත, නාගහපොල

2021.03.23 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
නාගහපොල , අකුරම්බොඩ මැදලන්ද වත්ත

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : වේරගම

2021.03.17 — පෙ.ව.09.00 සිට17:00ප.ව.දක්වා
දම්මන්තැන්න යෝජනා ක්‍රමය, පුවක්පිටිය

2021.03.19 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
පුවක්පිටිය, දම්මන්තැන්න යෝජනා ක්‍රමය

201.03.20 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
පොල්වත්ත කන්ද - 11, කඩුව ගම්මානය, පොල්වත්ත කන්ද -1, වෙනිවැල්ගොල්ල

201.02.22 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
දම්මන්තැන්න යෝජනා ක්‍රමය, පුවක්පිටිය

201.02.24 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
දම්මන්තැන්න යෝජනා ක්‍රමය, පුවක්පිටිය

201.02.29 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
පට්ටක්කරේ, මැදකුඹුර - උඩතැන්න, හොරගල, මාවුස්සාගල වත්ත, වෙලන්ගහවත්ත, නිකල්ඔය

## විදුලි ඉංජිනේරු බලප්‍රදේශය : දඹුල්ල

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : දඹුල්ල

2021.03.17 — පෙ.ව8.00 සිට 17:00 ප.ව. දක්වා
නිකවටවන අරුනෝදයගම, වැවලවැව, දඹුලුවැඩිය, කුරටියාය යෝජනා ක්‍රමය, අලකොලවැව, වෙලන්ගොල්ල - 2, වැවලවැව ඉහලයාය යෝජනා ක්‍රමය, වැවලවැව වහකෝට්ටේයාය යෝජනා ක්‍රමය, හුඹස්ගමුව, කෝන්ගහමුල, වැවල වෙලන්ගොල්ල, නිකවටවන හන්දිය, වැවලවැව.

2021.03.17 — පෙ.ව.08.30 සිට 17:00 ප.ව. දක්වා
ඇල්වෙම් හෙවි මෙට්ල්, වසන්ත හාල් මෝල, රංගිරි හාල්මෝල, සෙල්ටෙල් කුළුණ, මාස් ට්‍රොපිකල් ෆුඩ් නිෂ්පාදන, හෝටල් සංකීර්ණය කන්ඩලම, දඹුල්ල සංවර්ධන සැලැස්ම, ඉහල ඇරැව්වල වෙලකන්ද පරණයාය යෝජනා ක්‍රමය, කන්ඩලම පාර 1 වෙනි සැතපුම් කණුව, පහල ඇරැව්වල පරණගම, කොලොන්ගහ ඇල 2, කොලොන්ගහ ඇල 3, නිකවටවන අරුනෝදයගම, කොලොන්ගහ ඇළ - 1 (කන්ඩලම පාර), යක්කුරුගල, හුඹස්ගමුව, පහල ඇරැව්වල, පිහිල්ල මූකලාන, වැවලවැව, වැවලවැව ඉහලයාය යෝජනා ක්‍රමය, අලකොලවැව, ඉහල ඇරැව්වල, කුරටියාය යෝජනා ක්‍රමය, විල්හත (29 කොටස), වැවල වෙලන්ගොල්ල, ඇරැව්වල 1 කණ්ඩලම පාර 2 වෙනි සැතපුම් කණුව, කන්ඩලම වැව, කොලොන්ගහ ඇල 1, කෝන්ගහමුල, නිකවටවන හන්දිය, වෙලන්ගොල්ල - 2, වැවලවැව දඹුලුවැඩිය, ඇරැව්වල, වැවලවැව, වහකෝට්ටේයාය යෝජනා ක්‍රමය

2021.03.20 — පෙ.ව.08.00සිට 17:00 ප.ව. දක්වා
ඇපා (බීජ) පැල්වැහැර, සි.අයි.සි පැල්වැහැර (කෘෂිකර්ම ව්‍යාපාර), හැටන් නැෂනල් බැංකුව, පැල්වැහැර දඹුල්ල ජල වැඩපල, පැල්වැහැර ගොවිපල (සිඅයිසි ගොවිපල), සම්පත් බැංකුව, තැනීම් කොටස කමාන්ඩර් 53 කොටස, ශ්‍රේටර් දඹුල්ල සංවර්ධන ව්‍යා. අදියර 1, ඔික්රේ ලී කැටයම් මධ්‍යස්ථානය, කණිෂ්ඨ තාක්ෂණික, සමරසූරිය ජෙම් හවුස්, ගාමිණී මැණික් හා ස්වර්ණාභරණ, පැල්වැහැර විලේජ් රිසෝට් (පුද්.) සමාගම, මහජන බැංකුව - දඹුල්ල, ගිමන්හල, පැල්වැහැර ගොවිපල (සිඅයිසි ගොවිපල), පැල්වැහැර ගොවිපල, ස්විස් ලංකා ව්‍යාපෘතිය, ෆුඩ් සිටි, ඒඩ්ජ් (බීජ) පැල්වැහැර, ලංකා බැංකුව - දඹුල්ල, පැල්වෙහෙර කෘෂිකර්ම නේවාසිකාගාර ගොඩනැගිල්ල, ලං.ග.ම. දඹුල්ල, දඹුල්ල නගරය -3, දඹුල්ල නගරය 2, දඹුල්ල හුවමාරුව, දඹුල්ල නගරය 5 (නව) - (සම්පත් බැංකුව අසල), රත්දෙනිය වැව, අතුපරයාය 2 ඇල සිට 6 ඇල, දඹුළුගම, පැල්වැහැර වංගුව, රත්දෙනිය ඇල පාර (පැල්වැහැර 2), දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය, දඹුල්ල නගරය, දඹුල්ල නගරය නව - 4 (මිරිස්ගෝනියාව හන්දිය අසල), දඹුල්ල නගරය -6 (හැටන් නැෂනල් බැංකුව ඉදිරිපිට), දඹුල්ල නව බස් නැවතුම්පොළ, ඉනාමළුව ගැමි විදුලි යෝජනා ක්‍රමය

2021.03.23 — පෙ.ව.08.00 සිට 17:00 ප.ව. දක්වා
දඹුල්ල හොටෙල් රිසෝට් සහ කන්ට්‍රි ක්ලබ්, දඹුල්ල ක්‍රිකට් ක්‍රීඩාංගණය, නිවර්තන ගම්මාන නිකේතනය, අයිස් කම්හල, සී.අයි.සී ඩයරීස් (පුද්) සමාගම., මැලිබන් ඩේරි (පුද්.) සමාගම, පොහොරන්වැව යෝජනා ක්‍රමය, තලකිරියාගම, නෙත්නකෝන්පුර - 2, ජනඋදනගම (ඉබ්බන්කටුව), මිරිහෙල සහල් මෝල, ඉබ්බන්කටුව පාලම, නව උපපොළ තලකිරියාගම, ඉඩන්ලොලුවත්ත මාළිගාතැන්න, නෙත්නකෝන්පුර - 1, කිරිවල්හින්නගම ජල ව්‍යාපෘතිය, පොහොරන්වැව පැළ තවාන

2021.03.27 — පෙ.ව.08.00 සිට 17:00 ප.ව. දක්වා
සීගිරිය විලේජ් හෝටලය, ප්‍රේස්කෝ වෝටර් විලා, සීගිරිය ඩයලොග් කුළුණ - කායංවල, විල්උයන (රෝයල් හෙරිටේජ්), ඇහැලගල ලේක් රිසෝට්, සීගිරිය නානායම, ටෙලිකොම් සීගිරිය, ගුවන් හමුද කඳවුර, අප්සරා හෝටලය, ෆොන්ටයින් බ්ලු සීගිරිය (පුද්) සමාගම, සීගිරිය නානායම - නව, එලිෆන්ට් කොරිඩෝ හෝටලය, හොටෙල් ව්‍යාපෘතිය - නව (කාශ්‍යපගම), නිකව තවාන, එගොඩවැව දඹුල්ල, මයිලන්තව අලුත්යාය, ලේනව නිකවටවන, සීගිරිය නෙත්නකෝන් මාවත එලගල පාර, ගොවි ගම්මානය, කිඹිස්ස 2, සීගිරිමුල්ල, කායම්වල දූවන්ගල, පලුටාව, රන්ගිරිගම, සීගිරිය ( නව නගරය), සීගිරිය නව කෞතුකාගාර යෝජනා ක්‍රමය, දියකැපිල්ල, ගල්කොටුව, කැගල්ලයාය -2 මයිලන්තාව, කිඹිස්ස, මහසෙන්ගම, මයිලත්තාව/ කලාපුරයාය සීගිරිය, තල්කොටේ යෝජනා ක්‍රමය, වැව අද්දර - කායන්වල, සීගිරිය හෝටලය, කාශ්‍යපගම

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : නාවුල

2021.03.16 — පෙ.ව.10.00 සිට 14:00 ප.ව. දක්වා
හයිරා ෆාම් අන්කන්ද, තලගහකොටුව (රජ්ජම්මන), නාලන්ද කර්මාන්ත පුරවරය - සේවා ස්ථානය, පෙල්ඩිසක්පෝ තවාන- කවුඩුපැලැල්ල, ඩයනා බිස්කට්, ගෝල්ඩන්චේන් ඇගලුම් කම්හල (EAM මැලිබන්), ESCPS අන්කන්ද (පුද්) සමාගම, ඉමේජ් කර්මාන්ත ශාලාව (පුද්.) සමාගම - 11, ඉමේජ් ඉන්ඩස්ට්‍රිස් (පුද්) සමාගම, නාලන්ද වත්ත, මාතලේ - උතුර-11 යෝජනා ක්‍රමය, අකරහඩුව, දිඹුල්ගමුව, රජමල්උයන, කුඹල්ඔලුව හන්දිය (ආදවල මූකලන්යාය), ආදවල, හපුගහලන්ද - අන්කන්ද පුවක්පිටිය,ජලපොම්පාගාරය මඩවල උල්පොත, අකරහඩුව අදියර ii, මොරගහමඩ, රජ්ජමන ජල සැපයුම, උතුරු මාතලේ - 1, හතමුනගාල, නාගල කොලණිය, ආදවල ලිහිනිපිටිය, හතමුනගල වත්ත මොරගහමඩ, ගල්වඩුකුඹුර වල්ලිවෙල, කැටවල, කර්මාන්තපුර, නාරංගමුව ජල ව්‍යාපෘතිය, කවුඩුපැලැල්ල

2021.03.16 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
ගෝල්ඩන්චේන් ඇගලුම් කම්හල (EAM මැලිබන්), නාලන්ද කර්මාන්ත පුරවරය - සේවා ස්ථානය, තලගහකොටුව (රජ්ජම්මන), පෙල්ඩිසක්පෝ තවාන- කවුඩුපැලැල්ල, ඩයනා බිස්කට්, ඉමේජ් ඉන්ඩස්ට්‍රිස් (පුද්) සමාගම, ඉමේජ් කර්මාන්ත ශාලාව (පුද්.) සමාගම - 11, ගල්වඩුකුඹුර වල්ලිවෙල, කවුඩුපැලැල්ල, කැටවල, නාගල කොලණිය, මාතලේ - උතුර-11 යෝජනා ක්‍රමය, රජමල්උයන,රජ්ජමන ජල සැපයුම, නාලන්ද වත්ත, අකරහඩුව, දිඹුල්ගමුව, මඩවල උල්පොත, නාරංගමුව ජල ව්‍යාපෘතිය, ආදවල ලිහිනිපිටිය, කර්මාන්තපුර,කුඹල්ඔලුව හන්දිය (ආදවල මූකලන්යාය), අකරහඩුව අදියර ii, ආදවල, හපුගහලන්ද

2021.03.23 — පෙ.ව.08.30සිට 17:00 ප.ව. දක්වා
තලගහකොටුව (රජ්ජම්මන), හයිරා ෆාම් අන්කන්ද, සුගියම, ESCPS අන්කන්ද (පුද්) සමාගම, ඉමේජ් ඉන්ඩස්ට්‍රිස් (පුද්) සමාගම, සික්වාටස් එම්බිඅයි (පුද්.) සමාගම, අඹන හන්දිය, හතමුනගල වත්ත මොරගහමඩ, පොල්ගහහින්ය, රජමල්උයන, නාගල කොලණිය, අකරහඩුව අදියර ii, ආදවල, ඕපල්ගල වත්ත, කුඹල්ඔලුව හන්දිය (ආදවල මූකලන්යාය), අකරහඩුව, ආදවල ලිහිනිපිටිය, හතමුනගාල , මොරගහමඩ, කැටවල, ඕපල්ගල, පුවක්පිටිය පොම්පාගාරය, සේනාගම, දේවරාදපොල, රජ්ජමන ජල සැපයුම

2021.03.26 — පෙ.ව.08.30සිට 17:00 ප.ව. දක්වා
රෝයල් හාල් මෝල, නව ලංකා හාල්මෝල - ලෙනදෙර, පැලැටිනම් බ්‍රීඩර්ස් (පුද්.) සමාගම - තිග්ගොල්ලයාය, රම්සම් , ආණ්ඩුකාර නිවාසය, ලියා වෝටර් විලා - ඇඹුල්අඹේ, ඩයලොග් කුළුණ (පන්නම්පිටිය) , බයෝ ෆුඩ් පුද්ගලික සමාගම -1, ක්‍රිස්බෝ (ෆෝචූන් ජී.පී. ගොවිපල), ඩේවිඩ් පීරිස් - දඹුල්ල, KST එවර්ග්‍රීන් වෙයාර් හවුස්, හේලිස් ඇග්‍රෝ, බයෝ ෆුඩ් -2 (රියාල්ඩීන් හාල්මෝල), චන්ද්‍රානි හාල්මෝල,රිසානා හාල්මෝල, වන්නිය වැව ගම, ජනකම්තිපුර නව , වැල්ලම්ටියාව යෝජනා ක්‍රමය - දඹුල්ල, ඇඹුලඹේ මොබිටෙල් කුළුන, ලෙනදෙර හාල්මෝල, වඩිලඹේ තිග්ගොල්ල යාය යෝජනා ක්‍රමය, ඇතාබැදිවැව, කිරලගොල්ල, කිරලැස්ස, ජනකම්තිපුර (පැරණි), මැණික්දෙන, ඇඹුලඹේ

## විදුලි ඉංජිනේරු බලප්‍රදේශය : ගලගෙදර

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : නුගවෙල

2021.03.16 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
ඩයලොග් ටෙලිකොම්, කුළුගම්මන, කුළුගම්මන හන්දිය, කුළුගම්මන, දූල්වල, උඩදූල්වල

2021.03.26 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
ලං.ග.ම. නුගවෙල, : බටුඅඹේ, එඩරුතැන්න

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : හතරලියද්ද

2021.03.24 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
පැලෑන, රන්ගමුව, කොටිකම්බේ, කොටිකම්බේ ගාමන්ට්

2021.03.29 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
පැලෑන, කොටිකම්බේ, කොටිකම්බේ ගාමන්ට්, රන්ගමුව

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : පූජාපිටිය

2021.03.19 — පෙ.ව.08.00 සිට 16:30 ප.ව. දක්වා
උඩ කිතුල්ගොල්ල

2021.03.16 — පෙ.ව.08.00 සිට 16:30 ප.ව. දක්වා
සියපත්ගම

2021.03.22 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
මිරිස්සල ලීමෝල, මිරිස්සල අඹතැන්න

2021.03.25 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
සිල්මියා ලී මෝල, මුල්ලේගම (දිවානවත්ත) , ඇහැලගස්හින්න11, බමුණුපොල, බටගල්ල, ඇහැලගස්හින්න 1, පළමු වන සැතපුම් කණුව වෙලේකඩේ, කළුවාන (බටුගොඩ ), හපුගොඩ 1 (ලකී විමෝල අසල), මුල්ලේගම ලීමෝල

2021.03.30 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
මිරිස්සල අඹතැන්න, මිරිස්සල ලීමෝල

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මධ්‍යම පළාත),**
**ලංකා විදුලිබල මණ්ඩලය,**
**අංක 04, අස්ගිරිය පාර, මහනුවර.**
**දුරකථන : 081-2234000**

*විදුලි බලයෙන් සසිරිමත් දිවියක්*

**ඔබගේ මාසික විදුලි බිල www.ceb.lk වෙබ් අඩවිය මගින් ගෙවිය හැක**


අනාගත සිහින සැබෑකර ගැනීමේ එකම මග
දිනමිණ මවපිට
මංගල යෝජනා තීරයයි...
දශක ගණනාවක විශ්වසනීය සේවාව...
classified@lakehouse.lk
රු. 560/-
පියුමි - 011 2 429 383 , රමනි - 011 2 429 347 , ගයනි - 011 2 429 342 / 343

දිනමිණ The Dinamina

# ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක.77, කටුවාපිටිය පාර, මීගමුව පදිංචි කැකුලාවල විදානෙලාගේ බර්නදීන් සුමිත්‍රා පෙරේරා වන මා 10.06.2008 දින ඕමාන්හි තානාපති කාර්යාලයේ C.D.W.ජයවර්ධන තානාපති ඉදිරියේ අත්සන් කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මඟින් කැකුලාවල විදානෙලාගේ කැමිලස් ඇන්ටන් රංජිත් පෙරේරා යන අය වෙත ලබාදුන් සියලුම බලයන් 2021.02.15 දින සිට අහෝසි කර, එකී ඇටෝර්නි බලපත්‍රය අවලංගු කළ බව සියලු දෙනාගේම දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරනු ඇත.

2021.03.12 දින දිය.

---

මගේ අංකය : MUN/LND/PMTAQ/05/04/06
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
මුන්දලම.
2021.03.08

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ / සංශෝධන පනතින් සංශෝධන පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත, 460 වැනි පරිච්ඡේදය

## 07 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම පොදු කටයුත්තක් සඳහා රජයට පවරා ගැනීමට අදහස් කර ඇත. මේ පිළිබඳව වැඩි විස්තර සඳහා අංක 2218/59 හා 2021.03.10 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය බලන්න.

### උපලේඛනය

| | | |
|---|---|---|
| ඉඩමේ නම | : | මුන්දල් මාතුරස |
| ගමේ නම | : | මුන්දලම |
| සැලැස්මේ අංකය | : | PU/MND /2018/310 (2019.01.09) |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | : | මුන්දලම |

ප්‍රාදේශීය ලේකම්,
මුන්දලම
2021.03 මස 08 දින

මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

---

ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

## ඕෂන් වීව් ඩිවෙලොප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
## (Ocean View Development Co. (Pvt) LTD

## ලංසු සඳහා ආරාධනයයි (IFB)

### කහතුඩුව, (හරිත කැදැල්ල හි,) යෝජිත නිවාස ව්‍යාපෘති - අදියර II)

1. ඕෂන් විව් ඩිවෙලොප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් වෙනුවෙන්, ප්‍රසම්පාදන කමිටුවේ, සභාපති විසින් රුපියල් මිලියන 190 කට පිරිවැය ඇස්තමේන්තුකර ඇති සහ පහත විස්තර කර ඇති පරිදි වන "කහතුඩුව හි (හරිත කැදැල්ල හි) යෝජිත නිවාස ව්‍යාපෘතිය - අදියර II" සඳහා, යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.
   **කාර්යයේ විෂය පථය :** කහතුඩුව, "හරිත කැදැල්ල" මැද ආදයම් නිවාස යෝජනා ක්‍රමය සඳහා සය (06) මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම.
   **ඉදිකිරීම් කාල සීමාව :** දින 455 කි.
2. ලංසුකරණය : ජාතික තරගකාරි ලංසුකරණ (NCB) පටිපාටිය යටතේ මෙහෙය වනු ලැබේ.
3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු, අසාධු ලේඛනගත නොවී සිටිය යුතු වන අතර, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) සමග ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ, C3 හෝ C2 ශ්‍රේණිය සඳහා ලියාපදිංචි වී සිටිය යුතු වන අතර, එකී ලියාපදිංචිය, ලංසු භාරගන්නා අවසාන දින දක්වා වලංගුව යුතුය. තවද එකී ලියාපදිංචිය, කොන්ත්‍රාත් ප්‍රදනය කරනු ලබන දිනය දක්වාද වලංගු විය යුතුය. "ලංසුකරුවන්, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත්තු පනත හි විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාවේ. පොදු කොන්ත්‍රාත්තු රෙජිස්ට්‍රාර් හා සමග, තමන් ලියාපදිංචි වී සිටිය යුතුය.
   එම ලියාපදිංචියේ (PCA 03) හි, මුල් සහතික පත්‍රය, ලංසු සමග, ඉදිරිපත් කළ යුතුය. එම PCA 03 සහතිකය ඉදිරිපත් කරනු නොලබන ලංසුකරුවන්හට, මෙම ප්‍රසම්පාදනය ප්‍රදනය කරනු නොලැබේ.
4. අභිලාෂී ලංසුකරුවන්හට, වැඩිදුර තොරතුරු **කොළඹ 04, ඕෂන් ටවර් හි, (Ocean Tower) හි, 19 වන මහලේ, ඕෂන් විව් ඩිවෙලොප්මනට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් හි, සාමාන්‍යාධිකාරි** වෙතින් වැඩිදුර තොරතුරු ලබාගත හැකි වන අතර, ලංසු ලිපිලේඛන ඕනෑම රාජකාරි දිනයකදී **පැය 9.00 සිට පැය 16.00 දක්වා** අතරතුර එම ලිපිනයේදීම පරික්ෂා කර බැලිය හැකිය.
   **විමසුම් අංක : දුරකථන** : 011-2507496 **ෆැක්ස් අංකය** : 011-2507495
5. අභිලාෂී, යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංග සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක්, ආපසු ගෙවනු නොලබන **රුපියල් තිස්පන්දහසක් (රු. 35,000/- ක්)** පමණක් වන ගාස්තුවක් ගෙවීමෙන් හා කොළඹ 04, ඕෂන් ටවර් හි, (Ocean Tower) හි 19 වන මහලේ, ඕෂන් විව් ඩිවෙලොප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් හි, සාමාන්‍යාධිකාරි, වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්ද අනතුරුව, **2021-03-16 වන දින සිට 2021-03-31 වන දින දක්වා,** පැය 9.00 සිට පැය 15.00 දක්වා අතරතුර මිලදීගත හැකිය.
6. ලංසු **2021-04-05 වන දින පැය 14.00 ට හෝ ඉන් පෙර** ලැබෙනසේ, **කොළඹ 04 "ඕෂන් ටවර්" හි 19 වන මහලේ, ඕෂන් විව් ඩිවෙලොප්මනට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් හි, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ, සභාපති** වෙත, ලේඛනගත තැපැලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම හෝ කළ යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු, පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී **කොළඹ 04 "ඕෂන් ටවර්" හි, 19 වන මහලේ, ඕෂන් විව් ඩිවෙලොප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් හි,** සම්මන්ත්‍රණ කාමරයේදී, එම ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම, විවෘත කරනු ලැබේ.
7. ලංසු, එම ලංසු භාරගැනීමට නියමිත අවසාන දින සිට දින 91 ක් දක්වා වන කාල පරාසයකට, වලංගු විය යුතුය.
8. සියලුම ලංසු සමග පහත සඳහන් ආකාරයෙන් වන ලංසු සුරක්ෂණ ඇපකරයක්ද ඉදිරිපත් කළ යුතුය.
   - ලංසු ලිපිලේඛනවල 11 වන කොටසේ / වගන්තියේ සඳහන් ආකෘතියට අනුව
   - ඕෂන් විව් ඩිවෙලොප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්හි, සභාපති නමට ලියන ලද.
   - **රුපියල් 2,400,000/- ක් වන (ලක්ෂ 24 ක්) වන වටිනාකමකට සරිලන.**
   - 2021-08-02 වන දින දක්වා වලංගු.
   - ලංසුකරණ දත්තවල 17.2 වන ඡේදයේ දක්වා ඇති, නියෝජිත ආයතනයක් මඟින් නිකුත් කරන ලද.
9. පූර්ව ලංසු හමුවක් / සම්මන්ත්‍රණයක්, 2021-03-30 වන දින පැය 10.00 ට **කොළඹ 04, "ඕෂන් ටවර්" හි, 19 වන මහලේ, ඕෂන් විව් ඩිවෙලොප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් හිදී,** පැවැත්වේ.

**සභාපති,**
**ඕෂන් විව් ඩිවෙලොප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්,**
**19 වන මහල, "ඕෂන් ටවර්", කොළඹ 04.**

---

## ප්‍රසම්පාදන දැන්වීමයි

## කැලණිය ප්‍රාදේශීය සභාව

### කැලණිය ප්‍රාදේශීය සභාව සතු කිරිබත්ගොඩ සතිපොළ 2021.05.01 දින සිට 2021.12.31 දින දක්වා කාලයකට බදුදීම සඳහා ලංසු ආරාධනාවයි

කැලණිය ප්‍රාදේශීය සභාවට අයත් කිරිබත්ගොඩ සතිපොළ බදුදීම සඳහා ලංසු ඉල්ලුම්පත් 2021.03.29 වන දින ප.ව. 3.00 දක්වා කැලණිය ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැකි අතර, සම්පූර්ණ කළ ලංසු ඉල්ලුම්පත් 2021 මාර්තු මස 30 වන දින පෙ.ව. 10.00 දක්වා භාර ගනු ලැබේ.

ලංසු ඉදිරිපත් කිරීමේ ආකෘතිපත් නිකුත් කරනු ලබන්නේ ලිඛිත ඉල්ලීමක් සමග ආපසු නොගෙවනු ලබන රු. 3,000.00 ක පෝරම ගාස්තු හා පහත දක්වා ඇති ඉල්ලුම් කරන ලද දේපළට අදාළව ආපසු ගෙවනු ලබන ලංසු ඇප තැන්පත් ගාස්තු ගෙවා ලබාගත් ලදුපත් ඉදිරිපත් කිරීමෙන් පසුව පමණි.

ලංසු ඉල්ලුම්පත් පිටපත් දෙකකින් නිකුත් කරනු ලබන අතර, එම පිටපත් දෙක මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර, වෙන වෙනම සීල් තබා නැවත එම කවර එක් කවරයක බහා ලේකම්, කැලණිය ප්‍රාදේශීය සභාව යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් එවීම හෝ ලංසු බහාලන පෙට්ටියට බහාලිය හැකිය. ලංසුකරුවන් විසින් ලංසු බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලංසු විෂය ද සඳහන් කළ යුතුය. අවම ලංසුවට අඩුවෙන් ඉදිරිපත් කරනු ලබන ලංසු ප්‍රතික්ෂේප කර ඇප මුදල් සභාව සතු කරනු ලැබේ.

ලංසු විවෘත කිරීම 2021.03.30 දින පෙ.ව. 10.00 ට මෙම කාර්යාලයේ දී සිදු කරනු ලබයි. එම අවස්ථාවට ලංසුකරුට හෝ ලංසුකරු විසින් නම් කරන ලද නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

සාර්ථක ලංසුකරුවන් වෙත ලංසු පිළිගත් බව දන්වා එවීමෙන් පසු ලංසුකරු විසින් පිළිගත් ලංසු මුදලින් මාසික කුලී මුදල මෙන් **මාස 03 ක** මුදලක් මෙම කාර්යාලයේ තැන්පත් කර ගිවිසුමකට ඇතුළත් විය යුතුය. එමෙන්ම රජයට ගෙවිය යුතු බදු මුදල් ද ගෙවිය යුතු වේ. ඊට අමතරව ඉදිරිපත් කරන ලද ලංසු මුදල සඳහා දේපළ ඇපයක් හෝ පිළිගත හැකි රක්ෂණාවරණයක් ඉදිරිපත් කළ යුතු වේ.

තවද, ලංසුකරුවන් විසින් කැලණිය ප්‍රාදේශීය සභාව මගින් පනවා ඇති හා මතුවට පනවනු ලබන අතුරු ව්‍යවස්ථා හා කොන්දේසිවලටත් යටත් වියයුතුය. ටෙන්ඩරය පිළිගැනීම පිළිබඳ අවසාන තීරණය කැලණිය ප්‍රාදේශීය සභා ටෙන්ඩර් මණ්ඩලය සතුය.

**දුරකථන අංකය - 0112914110**

### උපලේඛනය

| අනු අංකය | වෙළඳ ස්ථානය | අවම ලංසුව | ලංසු තැන්පත් | පෝරම ගාස්තුව |
|---|---|---|---|---|
| 01 | කිරිබත්ගොඩ සතිපොළ | රු. 3,733,334.00 | රු. 37,334.00 | රු. 3,000.00 |

**ඩබ්.ඩී. ශාන්ති කුමුදිනී**
**සභාපති,**
**කැලණිය ප්‍රාදේශීය සභාව.**
**2021.03.15**

---

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

**විදුලි පාරිභෝගිකයින්ට අනර්ඝ සැපයුමක් හා සේවාවක් ලබාදීමේ අරමුණ සපුරා ගනු වස්, ලංකා විදුලිබල මණ්ඩලය පහත සඳහන් ප්‍රදේශවල විදුලි පද්ධතියේ නඩත්තු, පුනරුත්ථාපන හෝ තැනීම් කටයුතු කිරීමට අදහස් කරයි. මේ නිසාවෙන්, එම ප්‍රදේශවල විදුලිබල සැපයුම, පහත දක්වා ඇති දිනයන් හි / වේලාවන් හිදී තාවකාලිකව අත්හිටුවීමට සිදුවේ. මේ නිසා විදුලි පාරිභෝගිකයින්ට සිදුවන අපහසුතාවයට අපගේ කණගාටුව ප්‍රකාශ කරන අතරම, සැලසුම් කරන ලද වැඩ අවසන් වූ වහාම නැවත විදුලි සැපයුම යථා තත්ත්වයට පත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් පියවර ගනු ලැබේ.**

## මධ්‍යම පළාත - 02

### විදුලි ඉංජිනේරු බලප්‍රදේශය : පේරාදෙණිය

**පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : යටිනුවර**

2021.03.18 — පෙ.ව.08.30 සිට 17:00 ප.ව. දක්වා
නිව් බැන්ඩ් ලී මෝල, ගිරාගම ටෙලිකොම්, ගිරාගම තේ කර්මාන්ත ශාලාව, මුංවතුගොඩ, උඩවෙල, කුරුඳුවත්ත, නාඩිතලාව, සියඹලාගොඩ

2021.03.26 — පෙ.ව.08.30 සිට 17:00 ප.ව. දක්වා
දෙහිවත්ත තේ කර්මාන්ත ශාලාව, හපුගහයටතැන්න, දස්කර, උයන්වත්ත

2021.03.27 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
මාලිගාතැන්න බූස්ටර් පොම්පාගාරය, දඹගොඩ (ජල සැපයුම), හාලියද්ද, ජයසිරිගම, මාමුඩුවෙල, යහලතැන්න

**පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : ඊරියගම**

2021.03.22 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
විජේතුංග මාවත

2021.03.17 — පෙ.ව.08.30 සිට 17:00 ප.ව. දක්වා
ශ්‍රී ලංකා ගුවන් විදුලි විකාශන මධ්‍යස්ථානය -සෙංකඩගල

### විදුලි ඉංජිනේරු බලප්‍රදේශය : නුවරඑළිය

**පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : රිකිල්ලගස්කඩ**

2021.03.30 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
රත්මැටිය 11 (සැමිල්කො), රත්මැටිය 1

**පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : නුවරඑළිය**

2021.03.16 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
කාගිල්ස් ෆුඩ් සිටි, කාල්ටන් ස්පෝට්ස් මාධ්‍ය ජාලය, ජනාධිපති මන්දිරය, ශාන්ත ඇන්ඩෘ හෝටලය, පිදුරුතලාගල රේඩාර් මධ්‍යස්ථානය, පිදුරුතලාගල රූපවාහිනී මධ්‍යස්ථානය, ගුවන් හමුදා කඳවුර පිදුරුතලාගල , කාගිල්ස් ක්‍රීඩාංගනය, අන්ඩර් බෑන්ක් ගම, පරන කඩවීදිය

**පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : වලපනේ**

2021.03.20 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
වැරැල්ල ජල සම්පාදන, උඩමාදුර, මල්ලගම, මීරියබැද්ද, දම්බරේ, මිරිස්වත්ත, බෝලගන්දවෙල, අඹනැල්ල, තෙරිපැහැ ගල්කන්දවල, නිල්දන්ඩාහින්න, රුප්පේ නයාකැලේ, ගොරදියගොල්ල, එගොඩකන්ද, වැවතැන්න, වලහිඳ ඉඹුල්පතන යෝජනා ක්‍රමය, තේ කම්හල, කලගන්වත්ත, තෙරිපැහැ (රෝහල අසල), වැලිහිඳ, වැරැල්ලපතන

2021.03.21 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
බෝලගන්දවෙල, වැලිහිඳ, මිරිස්වත්ත, වලහිඳ ඉඹුල්පතන යෝජනා ක්‍රමය, කලගන්වත්ත, මල්ලගම, තෙරිපැහැ ගල්කන්දවල, මීරියබැද්ද, රුප්පේ නයාකැලේ, තෙරිපැහැ (රෝහල අසල)

**පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : තවලන්තැන්න**

2021.03.18 — පෙ.ව.09.00 සිට 16:00 ප.ව. දක්වා
කරගස්තලාව ග්ලෙන්ලොච්

**පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : රිකිල්ලගස්කඩ**

2021.03.30 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
රත්මැටිය 11 (සැමිල්කො), රත්මැටිය 1

### විදුලි ඉංජිනේරු බලප්‍රදේශය : මාවනැල්ල

**පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : හෙම්මාතගම**

2021.03.16 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
අම්බලාව-බාලත්ගම

2021.03.19 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
අම්බලාව-බාලත්ගම

2021.03.23 — පෙ.ව.09.00 සිට11:00 පෙ.ව. දක්වා
කෙහෙල්පත්තල

2021.03.27 — පෙ.ව.09.00 සිට 11:00 පෙ.ව දක්වා
කෙහෙල්පත්තල

**පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : මාවනැල්ල**

2021.03.27 — පෙ.ව.09.00 සිට 16:00 ප.ව. දක්වා
පහල කඩුගන්නාව - වටවංගුව

### විදුලි ඉංජිනේරු බලප්‍රදේශය : ගිනිගත්හේන

**පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : නෝර්ටන්**

2021.03.20 — පෙ.ව.10.00 සිට 16:00 ප.ව. දක්වා
බගතුළුව

**පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : මස්කෙළිය**

2021.03.30 — පෙ.ව.08.00 සිට 17:00 ප.ව. දක්වා
කර්කස්වල්ඩ් කම්හල, කැම්පියන් වත්ත, ෆෙට්‍රෙසෝ තේ කම්හල, වෙන්චර් වත්ත, ලොයිනෝන් වත්ත, කොටියාගල වත්ත, බොගවානා කම්හල, බොගවන්තලාව වත්ත, නෝර්වුඩ් වත්ත , ටියන්සින්ට් වත්ත, කිව් වත්ත, තේරේසියා වත්ත, මෝරා වත්ත, ආරියපුර සිරිපුර, කොටියාගල ඉහල කොටස, ආල්ඩි, නෝර්වුඩ් නගරය, සින්ග්‍රා වත්ත, ෆෙට්‍රෙසෝ ගම, බගවන්තලාව නගරය, සෙන්ට් ජෝන්ස් ඩිලරි , පෝට්‍රි වත්ත, කිරි මණ්ඩලය නෝර්වුඩ් , බොගවානා ගම , කැම්පියන් කඩ වීදිය, රොබ්හිල් උඩ කොටස

### විදුලි ඉංජිනේරු බලප්‍රදේශය : නාවලපිටිය

**පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : නාවලපිටිය**

2021.03.16 — පෙ.ව.08.30 සිට 17:00 ප.ව. දක්වා
ඉඟුරුඔය -11

2021.03.17 — පෙ.ව.09.00 සිට 16:00 ප.ව. දක්වා
බෝහිල් වත්ත

2021.03.25 — පෙ.ව.08.30 සිට 17:00 ප.ව. දක්වා
ඉඟුරුඔය -11

### විදුලි ඉංජිනේරු බලප්‍රදේශය : කෑගල්ල

**පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : තුල්හිරිය**

2021.03.16 — පෙ.ව.08.00 සිට 17:00 ප.ව. දක්වා
කන්දේගම

2021.03.23 — පෙ.ව.08.00 සිට 17:00 ප.ව. දක්වා
කන්දේගම

**පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : මොරොන්තොට**

2021.03.24 — පෙ.ව.08.00 සිට 17:00 ප.ව. දක්වා
ප්ලයිවුඩ් (ලක්මැනියර් මීදෙනිය), හපුවිට උඩගම, මීදෙනිය, උඩුගම/ පත්දෙනිය, හෙට්ටිමුල්ල හන්දිය, වතුර

**පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : රඹුක්කන**

2021.03.19 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
පුවක්මොටේ, දැලිවල දඹුල්ල , පදවිගම්පොල හන්දිය (ජනාධිපති විද්‍යාලය), තිස්මල්පොල, මීදුම පන්සල

**පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : කෑගල්ල**

2021.03.17 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
සණස මාකුර, අම්බලන්පිටිය, ඇකිරියගල, හෙට්ටි මුල්ල ඩයලොග් කුළුණ(ඩයලොග් කන්කේරිය), අටුගොඩ දමුණුපොල, රූනපාන, ගෝලින්ද වතුයාය, බුළුගහදෙනිය, පුස්සැල්ලදෙනිය, පරගම්මන, බුල්රුප්ප, මල්වත්ත නිල්මල්ගොඩ

2021.03.25 — පෙ.ව.09.00 සිට 17:00 ප.ව. දක්වා
හමුදා කඳවුර, සණස, යොවුන් සේනාංකය මල්වත්ත නිල්මල්ගොඩ, දික්ඇල්ල, ඇකිරියගල, ගෝලින් ද වතුයාය, අටුගොඩ දමුණුපොල, බුළුගහදෙනිය, වල්දෙනිය, බුල්රුප්ප, වල්දෙනිය, රූනපාන, පරගම්මන, පුස්සැල්ලදෙනිය

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මධ්‍යම පළාත),**
**ලංකා විදුලිබල මණ්ඩලය,**
**අංක 04, අස්ගිරිය පාර, මහනුවර.**
**දුරකථන : 081-2234000**

*විදුලි බලයෙන් සසිරිමත් දිවියක්*

**ඔබගේ මාසික විදුලි බිල www.ceb.lk වෙබ් අඩවිය මගින් ගෙවිය හැක**

ක්‍රීඩා SPORTS

sports.dinamina@lakehouse.lk

# මාතලේ අන්තර් ක්‍රීඩා සමාජ පාපන්දු තරගාවලිය
# සභාපති කුසලානය ගෝල්ඩ් මූන් පිලට



තරගාවලියේ වීරයා දිවාකරන් ( වමේ ) සහ අවසන් තරගයේ වීරයා අසාමි.



අවසන් තරගයේ අවස්ථාවක් ඡායාරූප මාතලේ දිසා විශේෂ

**අසෝක හිඳගොඩ**
**මාතලේ දිසා විශේෂ**

මාතලේ පාපන්දු ලීගය සංවිධාන කළ මාතලේ දිසා අන්තර් ක්‍රීඩා සමාජ සභාපති කුසලාන පිළිමලුන් පිටුදැකීමේ පාපන්දු තරගාවලියේදි ශූරතාව දිනා ගැනීමට උකුවෙල ගෝල්ඩ් මූන් ක්‍රීඩා සමාජය සමත් විය.

කණ්ඩායම් 12 ක සහභාගීත්වයෙන් පසුගියදා මාතලේ බර්නාඩ් අලුවිහාරේ ක්‍රීඩාංගණයේ පැවති මේ තරගාවලියේ අවසන් මහා තරගයට ගොල්ඩ් මූන් පිල සමඟ මාතලේ යූත් ක්‍රීඩා සමාජය තරග වැදුණු අතර, මුල් අර්ධයේදි ගෝල්ඩ් මූන් පිල පළමු ගෝලය වාර්තා කළේය. දෙවැනි අර්ධයේදී යූත් පිල ගෝලයක් වාර්තා කිරීමත් සමග ගෝල් 1-1 ලෙස ගෝල සම වීමෙන් තරගය නිමා විය.

ගෝල්ඩ් මූන් පිල වෙනුවෙන් එම්.ආර්. එම් රුස්ඛාන් සහ යූත් පිල වෙනුවෙන් අබ්දුල් රහුමාන් එම ගෝල් වාර්තා කළහ.

අනතුරුව දඬුවම් පහර මගින් ජයග්‍රාහකයා තෝරා ගැනීම සිදු වූ අතර, එහිදී ගෝල් 5-4 ක ජයක් ගෝල්ඩ් මූන් පිලට හිමි විය.

ශූරතාව දිනාගත් ගොල්ඩ් මූන් පිල එම්.ඒ.එම් අයිසන් අලී විසින් මෙහෙයවූ අතර, අනු ශූරතාව දිනු යූත් පිල ආර්.එම් ඉෂාම් මෙහෙයවනු ලැබීය.

මාතලේ ජුනියර් ක්‍රීඩා සමාජයේ එම්. එන් උස්මාන් තරගාවලියේ නැගී එන දැල්රකින්නා ලෙස සම්මාන ලැබූ අතර, තරගාවලියේ ශූරයා ලෙස ගොල්ඩ් මූන් පිලේ ජී දිවාකරන් සම්මාන දිනා ගත්තේය. අවසන් තරගයේ ශූරයා ලෙස ගොල්ඩ් මූන් පිලේ පී.එල්.එම් අසාම් සම්මාන ලැබුවේය.

මාතලේ දිසාවේ පාපන්දු ක්‍රීඩකයන්ට තරග අවස්ථා ලබාදීමට සභාපති කුසලාන පාපන්දු තරගාවලිය සංවිධාන කළ බවත්, ඉදිරියට වාර්ෂිකව පැවැත්වීමට සැලසුම් කර ඇති බවත් මාතලේ පාපන්දු ලීගයේ සභාපති කේ.ආර්.එම් හාරිස් මහතා දිනමිණට පැවසීය.

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ වෛද්‍ය කමිටු සභාපති මනිල් ප්‍රනාන්දු මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති ජයසංකේත ප්‍රදානෝත්සවයට මාතලේ දිසා පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ දිසානායක, ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ සභාපති අනුර ද සිල්වා මහත්වරු ඇතුළු ආරාධිතයන් රැසක් එක්වූහ. මාතලේ පාපන්දු ලීගයේ සභාපති කේ.ආර්.එම් හාරිස්, සහ ලේකම් යූ. එල්.එම් ලතීබ් මහත්වරුද එම අවස්ථාවට සහභාගි වූහ.



පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ දිසානායක මහතා අතින් ශූරයන්ට පදක්කම්.



ශූරතාව දිනූ ගොල්ඩ් මූන් පිල ආරාධිතයන් සමග.

## ඔන්ලයින් චෙස් ශූරයා **හරිත**

**කරන්දෙණිය සමූහ**
**අනුරාධ ප්‍රියදර්ශන**



ශ්‍රී ලංකා චෙස් සම්මේලනයේ මෙහෙය වීමෙන් පැවැති අවුරුදු 12න් පහළ විවෘත ඔන් ලයින් රැපිඩ් චෙස් තරගාවලියේ ශූරතාව දිනා ගැනීමට මාතර දෙනිපිටිය ප්‍රාථමික විද්‍යාලයේ හරිත හංසන සමත් විය.

ශ්‍රී ලංකා චෙස් සම්මේලන නිල වෙබ් අඩවිය ඔස්සේ එම සම්මේලනයේ සභාපති අන්තර්ජාතික චෙස් ක්‍රීඩා විනිසුරු ලක්ෂ්මන් විජේසූරිය මහතාගේ පූර්ණ අධීක්ෂණය යටතේ මේ තරගාවලිය පැවැත්විණි.

දිවයිනේ චෙස් ක්‍රීඩාවට නම් දරන ප්‍රධාන පාසල් රැසක අවුරුදු 12න් පහළ චෙස් ක්‍රීඩකයන් රැසක්ම සහභාගී වූ මේ තරගාවලියේදී මාතර දිසාවේ දුෂ්කර පාසලක් වන දෙනිපිටිය ප්‍රාථමික විද්‍යාලයේ එකොළොස් හැවිරිදි චෙස් ක්‍රීඩකයකු වන හරිත මේ ජය හිමි කර ගැනීම විශේෂත්වයකි.

මේ වන විට හරිත හංසන චෙස් ක්‍රීඩාවෙන් සිය වයස් කාණ්ඩවල ජාතික හා අන්තර්ජාතික පදක්කම් රැසක්ම දිනා ගැනීමට සමත්ව ඇත.

## විද්‍යාර්ථයට
## කඩුලු 3ක ජයක්

**මහනුවර ක්‍රීඩා විශේෂ**
**උපනන්ද ජයසුන්දර**

මහනුවර ධර්මරාජ විදුහල සමඟ පැවැති සුහද ක්‍රිකට් තරගය කඩුලු 3කින් ජය ගැනීමට මහනුවර විද්‍යාර්ථ විදුහල සමත් විය.

තරගයේ පළමුව පන්දුවට පහර දෙමින් ධර්මරාජ පිල දුන් ලකුණු 178ක ඉලක්කය හඹා ගිය විද්‍යාර්ථ ක්‍රීඩකයෝ ඕවර 49.2කදී ජය හිමිකර ගත්හ.

**ධර්මරාජ විදුහල - 177 (ඕවර 49.4)** ෂාන් සිරිවර්ධන 43, දිනුක පතිරණ 37, ෂාන් පතිරණ 37 (මදුවන්ත විජේතිලක 21/2, ආදිත්‍ය කලයටිය 32/2, රවිඳු ආරියරත්න 33/2)

**විද්‍යාර්ථ විදුහල - 180 (ඕවර 49.2)** කවිශ්ක දිල්හාර නොදැවී 48, හේෂාන් බණ්ඩාර 39 (මලිත් හපුආරච්චි 48/2)

## වසර 13කට පසු නුවරඑළියට
## වොලිබෝල් ශූරතාවක්



නුවරඑළිය දිස්ත්‍රික් කණ්ඩායම (ශූරයෝ)



මාතලේ දිස්ත්‍රික් කණ්ඩායම (ශූරියෝ)

**මහනුවර ක්‍රීඩා විශේෂ**
**උපනන්ද ජයසුන්දර**

වසර 13කට පසු මධ්‍යම පළාත් වොලිබෝල් පිරිමි ශූරතාවක් දිනා ගැනීමට නුවරඑළිය දිස්ත්‍රික් ක්‍රීඩකයෝ සමත් වූහ.

දිගන පිහිටි මධ්‍යම පළාත් සභා ක්‍රීඩාගාරයේදී පැවැති මධ්‍යම පළාත් වොලිබෝල් තරගාවලියේ පිරිමි අවසන් තරගයේදී ප්‍රතිවාදී මහනුවර දිස්ත්‍රික්කයට එරෙහිව වට 3 - 1ක ජයක් අත් කර ගැනීමට නුවරඑළිය දිස්ත්‍රික්කයට හැකි විය.

මේ තරගාවලියේ කාන්තා ශූරතාව මාතලේ දිස්ත්‍රික් ක්‍රීඩිකාවන් සතු වූ අතර, එම කණ්ඩායම හමුවේ අවසන් තරගයේදී මහනුවර දිස්ත්‍රික් පිල වට 3 - 0ක් ලෙස පරාජයට පත් විය.

ඒ අනුව පිරිමි සහ කාන්තා දෙඅංශයේම අනුශූරතා මහනුවර දිස්ත්‍රික්කයට හිමි විය.

මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් මේ තරගාවලිය පැවැත්විණි.

## රත්නපුර-කුරුණෑගල සැහැල්ලු පන්දු
## ක්‍රිකට් තරගාවලිය ඇරඹීමට සැරසේ

ශ්‍රී ලංකා සැහැල්ලු පන්දු ක්‍රිකට් සම්මේලනයේ අධීක්ෂණය යටතේ රත්නපුර හා කුරුණෑගල දිස්ත්‍රික්කවල මැතිවරණ කොට්ඨාස සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලි ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

රත්නපුර දිස්ත්‍රික් සැහැල්ලු පන්දු තරගාවලිය එම දිස්ත්‍රික්කයේ සැහැල්ලු පන්දු ක්‍රිකට් සංගමයේ සංවිධානයෙන් පැවත්වෙන අතර, කුරුණෑගල දිස්ත්‍රික් සැහැල්ලු පන්දු ක්‍රිකට් සංගමය එම දිස්ත්‍රික්කයේ තරගාවලිය සංවිධාන කරයි.

මේ තරගාවලි මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් පැවැත්වෙන අතර, රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ, රක්වාන, කලවාන, රත්නපුර, බලංගොඩ, කොලොන්න, නිවිතිගල මැතිවරණ කොට්ඨාසවලට අයත් ක්‍රීඩා සමාජවලට මේ සඳහා සහභාගි විය හැකිය.

කුලියාපිටිය, බිංගිරිය, කුරුණෑගල, නිකවැරටිය, දඹදෙණිය, කටුගම්පළ, හිරියාල, දොඩම්ගස්ලන්ද, ගල්ගමුව, යාපහුව, වාරියපොල, පඬුවස්නුවර, පොල්ගහවෙල මැතිවරණ කොට්ඨාසවලට අයත් ක්‍රීඩා සමාජවලට කුරුණෑගල දිස්ත්‍රික් තරගාවලියට සහභාගි විය හැකිය.

මේ තරගාවලි ද්විත්වයේහිම ශූරතාව, අනුශූරතාව, තරගාවලියේ වීරයා, හොඳම පිතිකරු, හොඳම පන්දු යවන්නා, හොඳම තුන්ඉරියව් ක්‍රීඩකයා, තරගයේ වීරයා ඇතුළු ජයග්‍රාහකයන්ට කුසලාන හා මුදල් ත්‍යාග පිරිනැමීමට කටයුතු යොදා ඇතැයි සැහැල්ලු පන්දු ක්‍රිකට් සම්මේලනය නිවේදනය කරයි.

රත්නපුර දිස්ත්‍රික් තරගාවලියට සහභාගිවීම සඳහා සියලු විමසීම් එම දිස්ත්‍රික්කයේ සංවිධායක ලේකම් එල්. එච්.ප්‍රේමරත්න මහතා (දුරකතන අංක 0718549301) ඇමතීමෙන් ගත හැකි බවත්, කුරුණෑගල දිස්ත්‍රික් තරගාවලිය සඳහා සියලු විමසීම් එම දිස්ත්‍රික්කයේ සැහැල්ලු පන්දු ක්‍රිකට් සංගමයේ සංවිධායක ලේකම් ඩබ්.සේනාධීර මහතා (දුරකතන අංක 0773508715) ඇමතීමෙන් ගත හැකි බවත් ශ්‍රී ලංකා සැහැල්ලු පන්දු සම්මේලනය දැනුම් දෙයි.

## ‘ඉන්ඩිපෙන්ඩන්ට්’ ක්‍රීඩකයෝ
## ක්‍රිකට් ශූරතාව දිනති







ඡායාරූප - නාත්තන්ඩිය සමූහ

**නාත්තන්ඩිය සමූහ**
**විමලසේන නම්මුනි**

මහවැව මාලිගාවත්ත ක්‍රීඩාංගණයේ පැවැති මහවැව ඩිල්ෂාන් සමූහ ව්‍යාපාර ක්‍රිකට් තරගාවලියේ ශූරතාව අත් කර ගැනීමට ඉන්ඩිපෙන්ඩන්ට් ක්‍රිකට් කණ්ඩායම සමත් විය.

ඩිල්ෂාන් සමූහ ව්‍යාපාරයේ අධ්‍යක්ෂ කේ.බී. ඩිලක්ෂන් ප්‍රනාන්දු මහතා තම ආයතනයේ සේවක සුහදත්වය වෙනුවෙන් ඩිල්ෂාන් නිදහස් අභියෝගතා කුසලානය වෙනුවෙන් සංවිධාන කළ මේ තරගාවලියට එම ආයතනයේ සහ අනුබද්ධ ශාඛාවල ක්‍රිකට් කණ්ඩායම් 16ක් එක්ව සිටියේය.

ඕවර 5කට සීමා කරමින් පැවැති තරගාවලියේ අවසන් මහා තරගය ප්‍රධාන කාර්යාලය නියෝජනය කළ ඩොමිනේටර්ස් සහ උගස් අංශය නියෝජනය කළ ඉන්ඩිපෙන්ඩන්ට් අතර පැවැත්විණි.

එම තරගයේ පළමුනව පන්දුවට පහර දුන් ඉන්ඩිපෙන්ඩන්ට් ක්‍රීඩකයෝ කඩුලු 3ක් දැවී ලකුණු 55ක් රැස් කළ අතර පිළිතුරු ඉනිම ක්‍රීඩා කළ ඩොමිනේටර්ස් කණ්ඩායමට ඕවර 5 අවසානයේ කඩුලු 2ක් දැවී රැස් කර ගත හැකි වූයේ ලකුණු 42ක් පමණි.

තරගාවලියේ වීරයා ලෙස ඉන්ඩිපෙන්ඩන්ට් කණ්ඩායමේ දමිත් අසංක සම්මාන දිනාගත් අතර, තරගයේ වීරයා එම කණ්ඩායමේ සුනෙත් සංජීන් සහ හොඳම පන්දු යවන්නා ලෙස ටිරෝල් පෙරේරා සම්මාන දිනා ගත්හ.

තරගාවලියේ ජය සංකේත ප්‍රදානය ඩිලක්ෂන් ප්‍රනාන්දු සහ බ්ලූමින් සමූහ ව්‍යාපාරයේ අධ්‍යක්ෂ කේ.බී. ජූඩ් ප්‍රනාන්දු යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

## අම්පාර දිස්ත්‍රික් යෞවන සමාජ තරගවලට
## ලියාපදිංචිය ඇරැඹෙයි

**දමන සමූහ**
**කේ.ඒ.මෛත්‍රීපාල**

ක්‍රීඩාවට දස්කම් දක්වන අම්පාර දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් වෙනුවෙන් අදාළ ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ අන්තර් යෞවන සමාජ ප්‍රාදේශීය ක්‍රීඩා තරග සඳහා අවුරුදු 15-29ත් අතර සාමාජික සාමාජිකාවන් ලියා පදිංචි කිරීම මේ දිනවල සිදු කෙරේ. ඒ අනුව ඉදිරියේදී සියලු වැඩසටහන් සඳහා මේ ලියාපදිංචි වීම අත්‍යවශ්‍ය වන බැවින් www.nyscsports.lk වෙබ් අඩවියේ සියළු යෞවන සමාජ සාමාජික සාමාජිකාවන් ලියාපදිංචි විය යුතුය. කණ්ඩායම් තරග සඳහා කණ්ඩායම් නායකයා විසින් තම කණ්ඩායම වෙනම ලියාපදිංචි කළ යුතුය. පාසල් නියෝජනය කරමින් ඉදිරිපත් වන යෞවන සමාජ අදාළ පාසල පිහිටි ප්‍රදේශයේ ලියාපදිංචි විය යුතුය.

# MARKET PRICE

**පොල් සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශිත පොල් ද්‍රව්‍ය මිල ගණන්**
**ප්‍රකාශිත දිනය 2021-03-15**

**1. පොල් මිල**
(අ) වෙළෙඳ පොළ මිල ගණන් 2021.02.26-2021.03.04 (මූලාශ්‍රය - HARTI) තොග මිල සිල්ලර මිල
ලොකු ප්‍රමාණය ගෙඩියක මිල රු. 88.00-90.00 95.00-120.00
කුඩා ප්‍රමාණය ගෙඩියක මිල රු. 80.00-85.00 85.00-100.00

(ආ) පොල් සංවර්ධන අධිකාරියේ පොල් වෙන්දේසිය (කොළඹ) 24/09/2020 (කර්මාන්තයට යොදනු ලබන)
සාමාන්‍ය මිල ලෙළි ගසන (රු.ගෙඩි 1000ක්) 56,493.75 වි
ඉදිරිපත් කළ ගෙඩි 707,125 විකුණු ගෙඩි 529,709
(ඇ) පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය පොල් වෙන්දේසිය (කුලියාපිටිය) – (2020/09/08)
සාමාන්‍ය මිල ලෙළි ගසන (රු./කි.ග්‍රෑ.01 ක් සඳහා 92-93 වි ඉදිරිපත් කළ ගෙඩි 195,481 විකුණු ගෙඩි 40,281
(ඈ) දේශීය ගොවිපල මිල රු/ගෙඩි 1000ක් (ලෙළි නොගසන)
**රු/මෙ.ටො.1ක මිල (ලෙළි ගසන ලද)**
කුරුණෑගල දිස්ත්‍රික්කය 50,000 - 55,000 95,000 -102,000
පුත්තලම් දිස්ත්‍රික්කය 45,000 - 55,000 97,000 -102,000
ගම්පහ දිස්ත්‍රික්කය 50,000 - 60,000 95,000 -102,000
හම්බන්තොට දිස්ත්‍රික්කය 60,000-65,000 97,000-100,000

**2.කොප්පරා - දේශීය වෙළෙඳ පොළ මිල 15/03/2021**
ඛාද්‍ය කොප්පරා (රු./කි.ග්‍රෑ.250ක්)
තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා රු./කි.ග්‍රෑ.250ක්) 80,000
තෙල් සිඳින විශිෂ්ට අංක 2 කොප්පරා රු./කි.ග්‍රෑ.250ක්) 62,500
තෙල් සිඳින සාමාන්‍ය කොප්පරා රු./කි.ග්‍රෑ.250ක්)
කොප්පරා
පොල් සංවර්ධන අධිකාරියේ කොප්පරා වෙන්දේසිය (කොළඹ)
ඉදිරිපත් කළ කොප්පරා ප්‍රමාණය (කි.ග්‍රෑ.) -
විකුණු කොප්පරා ප්‍රමාණය (කි.ග්‍රෑ.) -
තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා ඉහළ මිල (රු./කි.ග්‍රෑ.250ක්)
තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා සාමාන්‍ය මිල (රු./කි.ග්‍රෑ.250ක්)
තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා වෙළෙඳ පොළ මිල (රු./කි.ග්‍රෑ.250ක්)
තෙල් සිඳින විශිෂ්ට අංක 2 සහ 3 කොප්පරා සාමාන්‍ය මිල (රු./කි.ග්‍රෑ.250ක්)
තෙල් සිඳින විශිෂ්ට අංක 2 සහ 3 කොප්පරා වෙළෙඳ පොළ මිල (රු./කි.ග්‍රෑ.250ක්)

**3. දිසිදි පොල්**
සියුම් මධ්‍යම ශ්‍රී ලංකා (දේශිය) (රු./කි.ග්‍රෑ.1 ක්) 480-500 සා
ශ්‍රී ලංකා - නැවතෙක් මිල (රු./කි.ග්‍රෑ.1 ක්) 485-505

**4. පොල් තෙල් (තොග මිල)**
දේශිය මිල (රු./මෙ.ටො.1ක්) 480,000-505,000 සා
පිලිපීන් (මි.ර.ගැ/රොටඩෑම්) ඔයිල් වල්ඩ් (2021.03.11) (රු./මෙ.ටො.1ක්) 317,859
**5. පුන්නක්කු** (රු./මෙ.ටො.1ක්) 60,000 – 75,000 වි
**6. ගුදිරි කොහු** (රු./කි.ග්‍රෑ.50 ක්) 950-1,250 වි
**7. ඕමැට් කොහු** (රු./කි.ග්‍රෑ.50 ක්) 3,750 – 5,000 වි
**8. මිශ්‍ර කොහු** (රු./කි.ග්‍රෑ.50 ක්) 1,400 – 1,500 වි
**9. බ්‍රිස්ටල් කොහු බැමි 1** (රු./කි.ග්‍රෑ.50 ක්) 5,000 – 7,000 වි
**10. බ්‍රිස්ටල් කොහු බැමි 2** (රු/කි.ග්‍රෑ. 50ක්) 7,500 - 8,500 වි
**11. පොල් ලෙලි මිල** (18-02-2021)
දිස්ත්‍රික්කය පොල් ලෙලි 1000ක මිල (රුපියල්)
පුත්තලම 4,500 - 5,000
ගම්පහ 4,500 - 5,000
මාතර 4,500 - 5,000
කුරුණෑගල 4,500 - 5,5 00
තෙතමනය 50% වැඩි පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 7.00
තෙතමනය 40% - 50% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 7.50
තෙතමනය 30% - 40% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 8.50
තෙතමනය 20% - 30% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 9.50
තෙතමනය 10% - 20% අතර පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 10.50
තෙතමනය 10% අඩු පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 13.00
**12. පොල් කටු** (රු/මෙ. ටො. 1ක්) 29,500 - 30,500 වි
**13. පොල් කටු අඟුරු** (2021-02-26 - 2021-03-04) (රු/මෙ.ටො. 1ක්) 110,000.00 වි
(තෙතමනය - 12%, අඟුරු කුඩු - 3%)
14. පොල් ඉරටු (රු./මෙ.ටො. 1ක්) 43,000 - 46,000 වි
**වි - විකුණුම් මිල** **සා.- සාමාන්‍ය මිල**

# සෙලාන් බැංකුව රුපියල් බිලියන 3ක බදු පසු ලාභයක්

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා අභියෝගාත්මක වාතාවරණයක් තුළ, සෙලාන් බැංකුව රු.බි.3 ක බදු ගෙවීමෙන් පසු ලාභයක් වාර්තා කළේය.

ආදායම් ප්‍රකාශයසමාලෝචනයට භාජනය වූ වර්ෂයේ රු. බි. 19.5 ක ශුද්ධ පොළී ආදායමක්, 4.6% ක වාර්ෂික වර්ධනයක් සහිත ව වාර්තා කළ බැංකුවේ පොළී ආදායම රු.බි. 52.3 ක් හා පොළී වියදම රු.බි. 32.8 ක් ලෙස සටහන් විය.


සභාපති රවී ඩයස්


අධ්‍යක්ෂ
කපිල ආරියරත්න

බැංකුවේ 2019 මූල්‍ය වර්ෂයේ වාර්තා වූ 4.20% ක ශුද්ධ පොලි ආන්තිකය මෙම වසරේ 3.95% දක්වා පහත වැටී ඇත්තේ ණය සඳහා නැවත මිල නියම කිරීම තැන්පතුවලට වඩා වේගවත් වීම හේතුවෙනි. තවද,මෙමගින් අඩු පිරිවැය තැන්පතු මගින් ලැබූ ධනාත්මක බලපෑම හීන කිරීමට ද සමත් විය.

වාර්ෂිකව 11.89% ක හැකිලීමක් සනිටුහන් කරමින් ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම 2019 මූල්‍ය වර්ෂයේ වාර්තා කළ රු.බි. 4.2 සිට රු.බි. 3.7 දක්වා අඩු විය. සමස්ත මෙහෙයුම් ආදායමෙහි 4.36% ක වර්ධනයක් අත් කර ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් උපකාරී වූයේ භාණ්ඩාගාර වෙළෙඳ ආදායමයි- මෙම වර්ෂය තුළ අනෙකුත් මෙහෙයුම් ආදායම රු.මි.600 කින් අඩු වී ඇත්තේ ප්‍රධාන වශයෙන් වෙළෙඳාම හා සම්බන්ධ ක්‍රියාකාරකම් අඩු වීම හේතුවෙනි.

2019 දී වාර්තා වූ රු.බි. 3.9 ට සාපේක්ෂව බැංකුවේ හානිකරණ වියදම රු.බි. 6.9 ක් ලෙස සටහන් වූයේ 80% ක වර්ධනයක් සහිතවය. ව්‍යාපාර කෙරෙහි කොවිඩ්-19 වසංගතයේ බලපෑම හේතුවෙන් වර්ෂය තුළ තුන්වන අදියරේ දී අත්තිකාරම් සඳහා වන හානිකරණ ගාස්තු රු.බි. 3.9 සිට රු.බි. 5.7 දක්වා ඉහළ ගොස් තිබේ. තවද, අවදානම් ඉහළ ගිය කර්මාන්ත" ලෙස හඳුනාගෙන ඇති ව්‍යාපාර ද මෙම තත්ත්වය කෙරෙහි බලපා ඇත. අදියර එක සහ දෙක සඳහා වන හානිකරණ වියදම් පිළිවෙලින් රු.මි. 103 සිට රු.මි. 628 දක්වා ද,රු.මි. 246 ක් වූ ආපසු හැරවීම රු.මි.359 ක වියදමක් දක්වා ද වර්ධනය විය.

ඊට සමගාමීව, වෙනත් මූල්‍ය උපකරණ හා වත්කම්වල හානිකරණයද රු.මි. 290 කින් ඉහළ ගොස් ඇති අතර ප්‍රධාන වශයෙන් හේතු වූයේ විදේශ මුදල් බැඳුම්කර හිමි ණය ශ්‍රේණිගත කිරීම පහත වැටීමයි. සමස්ත හානිකරණය සඳහා 2020 දෙසැම්බර් 31 වන විට ප්‍රතිපාදන ආවරණ අනුපාතය 43.68% දක්වා වැඩි කර ඇත.

බැංකුවේ සමස්ත මෙහෙයුම් වියදම් 2019 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 1.40% කින් සුළු වශයෙන් ඉහළ ගොස් තිබේ. ආයතන වියදම් 2019 මූල්‍ය වර්ෂයේ වාර්තා වූ රු.බි. 6.0 සිට රු.බි. 5.9 දක්වා සුළු වශයෙන් අඩු වී ඇත.

මෙම තත්ත්වය ඇති වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රමුඛතා ව්‍යාපෘති සඳහා තෝරාගත් ආයෝජන, සීමාසහිත බැංකු ක්‍රියාකාරකම්,ඩිජිටල්කරණ පද්ධති, පුනරාවර්තන කාර්යයන් ස්වයංක්‍රීය කිරීම සහ වර්ෂය තුළ අනුගමනය කරන ලද පිරිවැය පාලනය කිරීමේ මුල පිරීම් හේතුවෙනි.

# රට වටා මිල ගණන්



| | නාරාහේන්පිට ආ. ම. | රත්මලාන ආ. ම. | වැලිසර. ආ. ම. | මීගොඩ ආ. ම. | තඹුත්තේගම ආ. ම. | දඹුල්ල ආ. ම. | නුවරඑළිය ආ. ම. | මිල රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|
| **පහත රට එළවළු** | සිල්ලර මිල රු. | සිල්ලර මිල රු. | සිල්ලර මිල රු. | තොග මිල රු. | තොග මිල රු. | තොග මිල රු | | තොග මිල රු. |
| වට්ටක්කා | 120 | 120 | 80 | 70 | 65/80 | 50/55 | ගෝවා | 90 |
| අළු කෙසෙල් | 120 | 120 | 70 | 60/70 | 30/40 | | කැරට් | 140 |
| පිපිඤ්ඤා | 90 | 100 | 40 | 40/50 | 25/30 | 30/40 | ලීක්ස් | 80 |
| වැටකොළු | 160 | 200 | 120 | 120 | 120/140 | 100/110 | රාබු | 60 |
| බණ්ඩක්කා | 140 | 160 | 100 | 70 | 70 | 90/100 | බීට්රූට් | 70 |
| කරවිල | 160 | 200 | 140 | 130 | 130 | 120/130 | අර්තාපල් | 90 |
| පතෝල | 140 | 120 | 90 | 80 | 60/70 | 70/80 | අර්තාපල් රතු | 120 |
| මාළු මිරිස් | 280 | 300 | 270 | 230 | 200/240 | 180/220 | නෝකෝල් | 120 |
| බටානා | - | 140 | 100 | 90 | 80/100 | 90/100 | බෙල්පෙපර් රතු | 900 |
| මුරුංගා | - | | | - | | - | කහ | 1000 |
| එළබටු | 120 | | 90 | - | 50 | 60/70 | කොළ | 600 |
| කැකිරි | 100 | 120 | 50 | 60 | 30/40 | 60/80 | බැසිල් | 330 |
| නෝකෝල් | 140 | 160 | 100 | 90/100 | 40/50 | 70/80 | චයිනීස් කැබේජ් | 220 |
| මඤ්ඤොක්කා | 80 | 100 | 50 | | 35 | 25/50 | රෙඩ් කැබේජ් | 800 |
| බතල | - | | 60 | | 50 | | සැල්දිරි | 100 |
| දඹල | 140 | 160 | 50 | 70/80 | 60/70 | 60/70 | කොත්තමල්ලි කොළ | 400 |
| මැකරල් | 140 | 160 | 110 | 80/90 | 60/80 | 90/100 | අයිස්බර්ග් | 300 |
| **උඩරට එළවළු** | | | | | | | සලාද | 110 |
| බෝංචි | 240 | 220/160 | 220 | 190/200 | 220/240 | 160/180 | රතුසලාද | 550 |
| ගෝවා ගෙඩි | 160 | 220 | 120 | 120/130 | 90/100 | 95/100 | මිංචි | 170 |
| කැරට් | 200 | 140 | 160 | 170/180 | 170/180 | 160/180 | පාස්ලි | 550 |
| ලීක්ස් | 120 | 100 | 100 | 90/100 | 90/100 | 90/100 | රුබා | 170 |
| රාබු | 100 | 180 | 40 | | 30 | 15/30 | රෝස්මරි | 550 |
| තක්කාලි | 160 | 180 | 150 | | 90/100 | 100/110 | බ්‍රොකෝලි | 80 |
| බීට්රූට් | 120 | 140 | 100 | 80/85 | 90/100 | 60/65 | මල්ගෝවා | 700 |
| සලාද | | 200 | 300 | | | | රතුරාබු | 1000 |
| ගෝවා කොළ | 100 | | | 30 | 20 | 80/90 | පැවර්ලි | 850 |
| **පලතුරු** | | | | | | | සුකිනි | 450 |
| අන්නාසි | 110 | 120 | 110 | 110 | 100 | 80/100 | කහ සුකිනි | 150 |
| ඇඹුල් කෙසෙල් | 120 | 100 | 70 | 70 | 30/50 | 60/65 | දිගරාබු | 150 |
| කෝලිකුට්ටු | 220 | 170 | 140 | 160 | 120/150 | | තක්කාලි | 120 |
| සීනි කෙසෙල් | 120 | 120 | 75 | 80 | 50/60 | 60/65 | මාළුමිරිස් | 130 |
| ඇම්බුන් | 200 | 180 | | | | | | |
| ගස් ලබු (රෙඩ්ලේඩි) | | 80 | 110 | | | | | |
| ගස්ලබු | 160 | 100 | 110 | 120 | 100/110 | 65/80 | | |
| ඇපල් (ආනයනික) | 70/80 | 180 | | | 30/65 | | | |
| මිදි (දේශිය) | | | | | | | | |
| මිදි (ආනයනික රතු) | 1100 | 1200 | 850 | | | | | |
| මිදි (ආනයනික කොළ) | 1000 | 1200 | 900 | | | | | |
| **මස්** | | | | | | | | |
| කුකුළු මස්- අලුත් (සම රහිත) | | 580 | 560 | | | | | |
| කුකුළු මස් -ශීත කළ (සම සහිත) | | 420 | 500 | | | | | |
| **අනෙකුත්** | | | | | | | | |
| අමු මිරිස් | 280 | 290 | 90 | | 250 | | | |
| දෙහි | 120 | 190 | 50 | 80/90 | 60 | 60/70 | | |
| අමු ඉඟුරු | 240 | 320 | 200 | | | 140/150 | | |
| **සහල්** | | | | | | | | |
| රතු නාඩු | 96 | 110 | 106 | 94 | | | | |
| සුදු නාඩු | 96 | 105 | 108 | 94 | 95 | | | |
| රතු කැකුළු | 93 | 98 | 93 | 95 | | | | |
| සුදු කැකුළු | 93 | 100 | 95 | 98 | 91/94 | | | |
| සුදු කැකුළු සම්බා | 98 | 135 | 120 | 98 | | | | |
| තම්බපු කැකුළු සම්බා | 98 | 150 | 120 | | | | | |
| කීරි සම්බා | 150/160 | 155 | 150 | | | | | |



දැනගෙන ගන්න
රන් මිල

| | |
|---|---|
| කැරට් 21 - 91875 |
| කැරට් 22-96250 |
| කැරට් 24-105000 |

# කොළඹ කොටස් වෙළෙඳපොළ

2021. 03. 15 දින වෙළෙඳපොළ දත්ත

# MARKET PRICE

| සුරැකුම | ප්‍රමාණය | පෙර වසා දැමූ බර තැබූ සාමාන්‍ය පරිමාව | විවෘත | ඉහළ | පහළ | ඊයේ වසා දැමූ බර තැබූ සාමාන්‍ය පරිමාව | වෙනස (රු.) |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන පුවරුව | | | | | | | |
| එයිට්කන් ස්පෙන්ස් හොටෙල්ස් හෝල්ඩිංග් | 19,632 | 30.30 | 30.00 | 30.60 | 30.00 | 30.00 | (0.30) |
| අබාන්ස් | 99,835 | 170.00 | 153.00 | 160.00 | 153.00 | 156.00 | (14.00) |
| ඇක්සස් ඉන්ජි. ශ්‍රී ලංකා | 97,746 | 23.30 | 23.20 | 23.50 | 23.00 | 23.00 | (0.30) |
| ඒසීඑල් | 88,314 | 39.70 | 40.40 | 40.40 | 38.80 | 38.90 | (0.80) |
| ඒ.සී.එල්. ප්ලාස්ටික් | 11 | 250.00 | 249.75 | 249.75 | 241.25 | 250.00 | 0.00 |
| ඇක්මී | 34,386 | 6.60 | 6.60 | 6.70 | 6.30 | 6.50 | (0.10) |
| අගලවත්ත | 5,580 | 29.10 | 29.40 | 29.40 | 29.00 | 29.00 | (0.10) |
| ඇහොට් ප්‍රොපටීස් | 100 | 39.00 | 38.00 | 38.00 | 38.00 | 38.00 | (1.00) |
| එයිට්කන් ස්පෙන්ස් | 49,241 | 60.00 | 60.00 | 62.50 | 58.80 | 58.90 | (1.10) |
| අමානා බෑන්ක් | 140,368 | 3.40 | 3.30 | 3.30 | 3.20 | 3.20 | (0.20) |
| අමායා ලෙෂර් | 5,318 | 17.60 | 18.30 | 19.50 | 18.00 | 18.00 | 0.40 |
| ඒෂියා ඇසෙස්ට් | 92,421 | 5.90 | 6.00 | 6.10 | 5.70 | 5.70 | (0.20) |
| ආසිරි | 18,481 | 25.20 | 26.00 | 26.00 | 24.00 | 24.30 | (0.90) |
| ඔටෝ ඩ්‍රොම් | 100 | 70.10 | 70.60 | 70.60 | 70.50 | 70.50 | 0.40 |
| බයිරහා ෆාම්ස් | 707 | 131.50 | 137.00 | 137.00 | 130.00 | 131.25 | (0.25) |
| බලන්ගොඩ | 2,390 | 13.40 | 13.00 | 13.60 | 13.00 | 13.00 | (0.40) |
| සී.එම්. හෝල්ඩිංග්ස් | 1,257 | 88.90 | 88.90 | 89.00 | 88.00 | 88.10 | (0.80) |
| කාර්ගිල්ස් | 33,204 | 240.00 | 239.00 | 239.00 | 235.00 | 235.00 | (5.00) |
| කාර්ගෝ බෝට් | 219 | 62.50 | 62.00 | 62.80 | 56.00 | 56.10 | (6.40) |
| කාර්සන්ස් | 12 | 270.00 | 284.00 | 284.00 | 271.50 | 270.00 | 0.00 |
| සී.ඩී.බී | 458 | 113.75 | 114.00 | 114.25 | 113.00 | 113.50 | (0.25) |
| සී.ඩී.බී (CDB. X0000) | 16,847 | 73.30 | 74.50 | 74.50 | 68.00 | 72.20 | (1.10) |
| සෙන්ට්‍රල් ෆිනෑන්ස් | 10,475 | 84.80 | 85.00 | 85.00 | 83.30 | 84.10 | (0.70) |
| සෙන්ට්‍රල් ඉන්ඩස්ට්‍රීස් | 20,016 | 106.00 | 105.25 | 105.25 | 102.75 | 102.75 | (3.25) |
| සෙලින්කෝ ඉන්ෂුවරන්ස් (CINS.X0000) | 8 | 1,099.75 | 1,070.00 | 1,070.00 | 1,062.00 | 1,099.75 | 0.00 |
| සිලෝන් ගාර්ඩියන් | 601 | 120.00 | 119.25 | 119.25 | 118.50 | 118.50 | (1.50) |
| සිලෝන් ඉන්වෙස්මන්ට් | 6,621 | 61.20 | 63.80 | 63.80 | 61.20 | 61.20 | 0.00 |
| සිලෝන් ටුබැකෝ | 37 | 999.50 | 1,010.00 | 1,010.00 | 1,000.00 | 999.50 | 0.00 |
| කෙමනෙක්ස් | 28,152 | 80.00 | 80.00 | 82.80 | 75.70 | 80.00 | 0.00 |
| චෙව්රෝන් | 87,250 | 93.00 | 93.20 | 94.20 | 92.90 | 92.90 | (0.10) |
| සී.අයි.සී | 57,099 | 55.00 | 55.00 | 55.00 | 54.50 | 54.60 | (0.40) |
| සී.අයි.සී (CIC.X0000) | 199,742 | 44.30 | 45.20 | 45.20 | 43.30 | 43.40 | (0.90) |
| සිට්‍රස් ලෙෂර් | 502 | 8.60 | 8.50 | 8.60 | 8.50 | 8.60 | 0.00 |
| කෝල්ඩ් ස්ටෝර්ස් | 5,680 | 620.00 | 637.75 | 710.00 | 621.00 | 641.50 | 21.50 |
| කළම්බු සිටි | 1 | 920.00 | 900.00 | 900.00 | 900.00 | 920.00 | 0.00 |
| කළම්බු ලෑන්ඩ් | 9,520 | 25.30 | 25.50 | 25.50 | 25.00 | 25.50 | 0.20 |
| කොමර්ෂල් බෑන්ක් | 245,291 | 86.90 | 87.50 | 90.00 | 87.00 | 87.70 | 0.80 |
| කොමර්ෂල් බෑන්ක් (COMB.X0000) | 58,834 | 81.60 | 80.50 | 81.00 | 80.00 | 80.10 | (1.50) |
| කන්වීනියන්ස් ෆුඩ් | 40 | 1,250.25 | 1,231.00 | 1,231.00 | 1,228.00 | 1,250.25 | 0.00 |
| දන්කොටුව පෝසිලේන් | 10,627 | 11.60 | 11.80 | 11.80 | 11.20 | 11.20 | (0.40) |
| ඩී.එෆ්.සී.සී.බෑන්ක් (PLC) | 81,842 | 61.00 | 61.80 | 61.80 | 59.60 | 60.00 | (1.00) |
| ඩයලොග් | 1,889,938 | 13.10 | 13.00 | 13.20 | 13.00 | 13.10 | 0.00 |
| ඩිමෝ | 85 | 526.00 | 560.00 | 560.00 | 530.00 | 526.00 | 0.00 |
| ඩිප්ඩ් ප්‍රඩක්ට්ස් | 1,920,561 | 51.00 | 52.00 | 52.70 | 48.40 | 48.70 | (2.30) |
| ඩොක්යාඩ් | 13,211 | 74.80 | 74.80 | 75.50 | 74.80 | 75.10 | 0.30 |
| ඩොල්ෆින් හොටෙල්ස් | 28,058 | 24.10 | 24.40 | 24.50 | 23.00 | 23.30 | (0.80) |
| ඩර්ඩන්ස් (CHL.X0000) | 120 | 95.10 | 85.10 | 85.10 | 80.00 | 84.30 | (10.80) |
| ඊ.බී.ක්‍රීසී | 30,538 | 33.00 | 32.70 | 32.70 | 32.00 | 32.20 | (0.80) |
| ඊස්ට් වෙස්ට් | 33,401 | 10.70 | 10.60 | 10.70 | 10.50 | 10.60 | (0.10) |
| ඊස්ටර්න් මර්චන්ට් | 13,310 | 5.30 | 5.40 | 5.40 | 5.10 | 5.10 | (0.20) |
| එක්ස්පෝ ලංකා | 1,594,060 | 47.60 | 48.00 | 48.50 | 46.30 | 46.60 | (1.00) |
| ෆෝර්ට්ලෑන්ඩ් | 7,124 | 13.80 | 13.80 | 13.80 | 13.00 | 13.00 | (0.80) |
| ග්‍රේන් එළිවේටර්ස් | 8,694 | 120.00 | 121.00 | 121.00 | 117.00 | 118.00 | (2.00) |
| හේකාබ් | 154,219 | 101.00 | 100.00 | 102.00 | 98.00 | 98.20 | (2.80) |
| හේලීස් | 490,587 | 60.70 | 60.90 | 60.90 | 58.00 | 58.70 | (2.00) |
| හේලීස් ෆැබ්රික් | 107,665 | 14.60 | 15.00 | 15.00 | 14.40 | 14.50 | (0.10) |
| හේලීස් ෆයිබර් | 4,884 | 48.50 | 50.00 | 50.00 | 47.20 | 47.30 | (1.20) |
| එච්.ඩී.එෆ්.සී | 6,570 | 36.00 | 34.50 | 34.50 | 34.00 | 34.00 | (2.00) |
| හේමාස් හෝල්ඩිංග්ස් | 28,511 | 81.10 | 82.50 | 82.50 | 80.00 | 80.00 | (1.10) |
| එච්.එන්.බී. | 2,964 | 129.25 | 129.25 | 132.00 | 129.25 | 130.00 | 0.75 |
| එච්.එන්.බී. ඇෂුවරන්ස් | 34,708 | 58.90 | 57.00 | 59.90 | 56.00 | 56.10 | (2.80) |
| එච්.එන්.බී.(HNB. X0000) | 15,754 | 102.25 | 103.00 | 103.00 | 100.75 | 101.25 | (1.00) |
| හොරණ | 201 | 20.90 | 23.30 | 23.30 | 21.00 | 21.00 | 0.10 |
| හොටෙල්ස් කෝපරේෂන්ස් | 905 | 12.00 | 11.50 | 11.80 | 11.50 | 11.60 | (0.40) |
| හන්ටර්ස් | 4 | 610.00 | 610.00 | 610.00 | 610.00 | 610.00 | 0.00 |
| ඉන්ඩස්ට්‍රියල් ඒ.එස්.පී.එච්. | 4,681,295 | 0.50 | 0.50 | 0.50 | 0.40 | 0.40 | (0.10) |
| ජේ.කේ.එච්. | 421,322 | 149.75 | 149.00 | 150.00 | 147.50 | 148.00 | (1.75) |
| කැන්ඩි හොටෙල්ස් | 2,756 | 5.10 | 5.10 | 5.30 | 5.00 | 5.10 | 0.00 |
| කේගෝල් | 8,713 | 102.00 | 102.00 | 102.50 | 100.00 | 100.25 | (1.75) |
| කැලණි කේබල්ස් | 1,263 | 114.00 | 118.00 | 119.75 | 110.50 | 111.25 | (2.75) |
| කැලණි ටයර්ස් | 8,556 | 76.50 | 77.00 | 77.50 | 75.60 | 75.80 | (0.70) |
| කැලණිවැලි | 1,817 | 40.10 | 40.10 | 42.90 | 40.00 | 40.10 | 0.00 |
| කිංග්ස්බරි | 7,602 | 6.20 | 6.30 | 6.30 | 6.10 | 6.10 | (0.10) |
| කොටගල | 12,400 | 6.00 | 6.10 | 6.10 | 6.00 | 6.00 | 0.00 |
| එල්.ඕ.එල්.සී.හෝල්ඩිංග්ස් | 164,160 | 315.50 | 320.00 | 320.00 | 303.00 | 304.75 | (10.75) |
| ලංකා ඇලුමිනියම් | 11,692 | 16.40 | 16.50 | 17.00 | 16.00 | 16.10 | (0.30) |
| ලංකා අශෝක් | 36 | 839.25 | 920.00 | 920.00 | 770.00 | 839.25 | 0.00 |
| ලංකා හොස්පිටල්ස් | 405 | 41.00 | 41.00 | 41.80 | 41.00 | 41.00 | 0.00 |
| ලංකා අයි.ඕ.සී | 60,911 | 20.40 | 20.40 | 20.80 | 20.00 | 20.00 | (0.40) |
| ලංකා ටයිල්ස් | 7,577 | 188.75 | 188.50 | 195.25 | 186.00 | 186.75 | (2.00) |
| ලංකා වෙන්චර්ස් | 100 | 48.40 | 48.60 | 48.60 | 48.60 | 48.60 | 0.20 |
| ලංකා වෝල්ටයිල් | 6,211 | 195.75 | 198.00 | 198.00 | 190.25 | 191.00 | (4.75) |
| ලාෆ් ගෑස් | 1,145 | 21.10 | 21.80 | 21.80 | 21.00 | 21.00 | (0.10) |
| ලාෆ් ගෑස් (LGL.X0000) | 4,110 | 15.60 | 15.60 | 16.20 | 15.60 | 16.20 | 0.60 |
| ලක්ෂපාන | 8,788 | 14.10 | 14.30 | 14.30 | 14.10 | 14.20 | 0.10 |
| ලී හෙජර්ස් | 1,429 | 72.80 | 72.10 | 72.10 | 66.60 | 66.60 | (6.20) |
| ලයන් බෲවරි | 269 | 540.00 | 540.00 | 555.00 | 540.00 | 540.00 | 0.00 |
| එල්.එම්.එෆ් | 9,940 | 155.00 | 155.00 | 156.00 | 150.00 | 150.75 | (4.25) |
| එල්.වී.එල්.එනර්ජි | 30 | 9.30 | 9.50 | 9.50 | 9.50 | 9.30 | 0.00 |
| මල්වත්ත | 19 | 13.40 | 13.10 | 13.40 | 13.10 | 13.40 | 0.00 |
| මල්වත්ත (MAL.X0000) | 309 | 8.10 | 7.70 | 8.90 | 7.70 | 7.80 | (0.30) |
| මෙල්ස්ට කෝප් | 137,194 | 47.40 | 47.60 | 47.60 | 46.10 | 46.30 | (1.10) |
| මර්චන්ට් බෑන්ක් | 38,449 | 7.20 | 7.00 | 7.20 | 7.00 | 7.00 | (0.20) |
| මුලර්ස් | 122,337 | 1.10 | 1.00 | 1.10 | 1.00 | 1.00 | (0.10) |
| නැෂනල් ඩිවලප්මන්ට් බෑන්ක් එක්ස්.ඩී | 9,589 | 82.20 | 82.70 | 82.70 | 81.10 | 81.20 | (1.00) |
| නේෂන්ස් ට්‍රස්ට් | 6,446 | 56.50 | 55.40 | 57.40 | 55.10 | 55.80 | (0.70) |
| නවලෝක | 9,915 | 5.00 | 5.00 | 5.00 | 4.90 | 4.90 | (0.10) |
| නෙස්ලේ එක්ස්.ඩී | 10 | 1,152.00 | 1,174.75 | 1,174.75 | 1,155.00 | 1,152.00 | 0.00 |
| ඕවර්සීස් රියැලිටි | 421,305 | 16.00 | 16.20 | 16.20 | 15.90 | 16.00 | 0.00 |
| පෑන් ඒෂියා | 73,365 | 16.60 | 16.80 | 16.80 | 15.50 | 16.00 | (0.60) |
| පෑන් ඒෂියන් පවර් | 1,124,156 | 3.60 | 3.50 | 3.60 | 3.50 | 3.50 | (0.10) |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් | 80,751 | 31.00 | 31.20 | 31.30 | 30.50 | 31.00 | 0.00 |
| පීපල්ස් ලීසින් | 152,629 | 12.30 | 12.50 | 12.50 | 12.20 | 12.30 | 0.00 |
| පිරමල් ග්ලාස් | 618,650 | 9.80 | 9.90 | 9.90 | 9.60 | 9.70 | (0.10) |
| ආර්.අයි.එල්.ප්‍රොපර්ටි | 32,321 | 6.70 | 6.60 | 6.60 | 6.40 | 6.40 | (0.30) |
| රෙග්නිස් | 26,212 | 46.60 | 47.50 | 47.50 | 45.00 | 45.40 | (1.20) |
| රේණුකා ඇග්‍රි | 174,784 | 3.60 | 3.50 | 3.70 | 3.40 | 3.60 | 0.00 |
| රේණුකා සිටි හොටෙල් | 2,566 | 222.75 | 225.00 | 239.00 | 221.00 | 225.00 | 2.25 |
| රේණුකා ෆුඩ්ස් | 2,001 | 13.80 | 13.70 | 13.80 | 13.60 | 13.70 | (0.10) |
| රේණුකා ෆුඩ්ස් (COCO.X0000) | 11,834 | 11.70 | 11.20 | 12.10 | 11.00 | 11.70 | 0.00 |
| රේණුකා හෝල්ඩිංග්ස් | 8,800 | 14.70 | 14.70 | 15.00 | 14.50 | 14.50 | (0.20) |
| රේණුකා හෝල්ඩිංග් (RHL.X0000) | 11,460 | 11.40 | 11.10 | 11.20 | 10.90 | 10.90 | (0.50) |
| රිසර්ස් එනර්ජි | 3,376 | 24.00 | 24.00 | 24.20 | 24.00 | 24.10 | 0.10 |
| රිචඩ් පීරිස් | 1,156,106 | 16.40 | 16.30 | 16.40 | 16.30 | 16.30 | (0.10) |
| රෝයල් සෙරමික් | 12,753 | 259.25 | 260.00 | 260.00 | 252.00 | 253.25 | (6.00) |
| එස්.එම්.බී. ලීසිං | 25,496 | 0.60 | 0.60 | 0.60 | 0.60 | 0.60 | 0.00 |
| එස්.එම්.බී. ලීසිං (SEMB.X0000) | 1,885,268 | 0.30 | 0.40 | 0.40 | 0.30 | 0.30 | 0.00 |
| සම්පත් | 595,268 | 155.00 | 155.00 | 156.00 | 154.00 | 154.25 | (0.75) |
| සණස ඩිවලොප්මන්ට් බෑන්ක් | 2,346 | 56.90 | 57.30 | 58.00 | 56.80 | 56.80 | (0.10) |
| සෙලාන් බෑන්ක් | 26,423 | 51.10 | 51.40 | 53.00 | 51.40 | 51.90 | 0.80 |
| සෙලාන් බෑන්ක් (SEYB.X0000) | 659,725 | 45.90 | 45.10 | 45.80 | 44.50 | 44.50 | (1.40) |
| සෙලාන් ඩී.ඊ.වී.ටී.එස් | 2 | 15.70 | 16.40 | 16.40 | 16.20 | 15.70 | 0.00 |
| සියරා කේබල්ස් | 13,503 | 6.20 | 6.10 | 6.40 | 6.10 | 6.20 | 0.00 |
| සීගිරිය විලේජ් | 49 | 34.00 | 34.00 | 34.00 | 34.00 | 34.00 | 0.00 |
| සිංගර් ෆිනෑන්ස් | 38,500 | 14.10 | 14.00 | 14.00 | 13.80 | 13.80 | (0.30) |
| එස්.එල්.ටී. | 46,921 | 33.50 | 34.00 | 34.50 | 32.10 | 32.80 | (0.70) |
| සන්ෂයින් හෝල්ඩිංග් | 73,550 | 80.40 | 81.80 | 81.80 | 79.20 | 80.10 | (0.30) |
| ස්විස්ටෙක් | 241 | 107.25 | 113.25 | 113.50 | 103.50 | 107.50 | 0.25 |
| තලවකැලේ | 4,760 | 40.10 | 39.50 | 41.50 | 39.50 | 39.90 | (0.20) |
| ටී ස්මෝල් හෝල්ඩර් | 403 | 36.80 | 35.90 | 38.00 | 35.90 | 35.90 | (0.90) |
| ටී.ජේ. ලංකා | 459,631 | 40.10 | 40.10 | 40.50 | 39.70 | 40.00 | (0.10) |
| ත්‍රී ඒකර් ෆාම්ස් | 1,804 | 199.25 | 196.50 | 204.00 | 196.50 | 196.50 | (2.75) |
| ටෝකියෝ සිමෙන්ට් | 63,457 | 69.50 | 69.50 | 69.50 | 67.00 | 68.00 | (1.50) |
| ටෝකියෝ සිමෙන්ට් (TKYO.X0000) | 35,805 | 63.60 | 64.90 | 64.90 | 61.20 | 61.60 | (2.00) |
| යූනියන් බෑන්ක් | 28,508 | 11.00 | 11.00 | 11.00 | 10.80 | 10.90 | (0.10) |
| යුනිසිස්ට් | 6,660 | 7.40 | 7.80 | 8.40 | 7.40 | 7.40 | 0.00 |
| යුනයිටඩ් මෝටර්ස් | 2,714 | 60.00 | 60.00 | 60.00 | 60.00 | 60.00 | 0.00 |
| වැලිබල් | 397,333 | 7.40 | 7.50 | 7.50 | 7.20 | 7.30 | (0.10) |
| වැලිබල් ෆිනෑන්ස් | 4,203 | 107.00 | 109.00 | 109.00 | 105.00 | 105.00 | (2.00) |
| විදුල් ලංකා | 392,849 | 5.50 | 5.60 | 5.60 | 5.50 | 5.50 | 0.00 |
| වටවල | 2,515 | 57.00 | 57.00 | 57.60 | 56.50 | 56.50 | (0.50) |
| යෝර්ක් ආර්කේඩ් | 166 | 151.00 | 169.25 | 185.00 | 160.75 | 161.00 | 10.00 |
| දෙවන පුවරුව | | | | | | | |
| අබාන්ස් ෆයිනෑන්සල් | 192 | 27.90 | 27.70 | 27.70 | 26.00 | 27.70 | (0.20) |
| ඇම්බියෝන් කැපිටල් | 5,010 | 5.10 | 4.70 | 5.20 | 4.70 | 4.70 | (0.40) |
| ආර්පිකෝ | 160 | 175.00 | 179.75 | 180.00 | 179.75 | 180.00 | 5.00 |
| ඒසියා කැපිටල් | 2,604 | 5.70 | 5.70 | 5.70 | 5.50 | 5.50 | (0.20) |
| දෙවන පුවරුව | | | | | | | |
| කොමර්ෂල් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් | 94,411 | 6.00 | 6.10 | 6.10 | 5.90 | 5.90 | (0.10) |
| ඩිස්ටිලරීස් | 19,822 | 20.40 | 20.90 | 20.90 | 20.00 | 20.00 | (0.40) |
| ෆස්ට් කැපිටල් | 35,442 | 51.00 | 50.70 | 51.80 | 50.00 | 50.20 | (0.80) |
| හුනස් ෆෝල්ස් | 20 | 152.00 | 158.00 | 158.00 | 156.75 | 152.00 | 0.00 |
| ජනශක්ති ඉන්ෂුවරන්ස් | 317 | 28.90 | 28.10 | 28.90 | 28.10 | 28.10 | (0.80) |

| සුරැකුම | ප්‍රමාණය | පෙර වසා දැමූ බර තැබූ සාමාන්‍ය පරිමාව | විවෘත | ඉහළ | පහළ | ඊයේ වසා දැමූ බර තැබූ සාමාන්‍ය පරිමාව | වෙනස (රු.) |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන පුවරුව | | | | | | | |
| එල්.ඕ.එල්.සී. ෆිනෑන්ස් | 239,760 | 6.10 | 6.30 | 6.30 | 5.90 | 6.00 | (0.10) |
| මඩොල්සිම | 300 | 9.00 | 8.50 | 8.70 | 8.50 | 8.60 | (0.40) |
| ඔඩෙල් පී.එල්.සී. | 19,613 | 20.00 | 18.50 | 18.80 | 18.50 | 18.50 | (1.50) |
| ඔරියන්ට් ෆිනෑන්ස් | 6,667 | 14.80 | 13.80 | 14.00 | 13.70 | 13.70 | (1.10) |
| පීපල්ස් මර්චන්ට් | 1,136 | 7.20 | 7.20 | 7.30 | 7.20 | 7.30 | 0.10 |
| සිංගර් ශ්‍රී ලංකා | 14,151 | 17.40 | 18.50 | 18.50 | 17.60 | 17.70 | 0.30 |
| දිරිසවි පුවරුව | | | | | | | |
| ඇග්ස්ටාර් පී.එල්.සී. | 103,475 | 7.10 | 7.10 | 7.40 | 7.10 | 7.10 | 0.00 |
| ඇලුමෙක්ස් පී.එල්.සී. | 297,195 | 10.60 | 10.80 | 10.90 | 10.50 | 10.50 | (0.10) |
| අමානා තකාෆුල් | 1,332 | 7.50 | 7.60 | 7.60 | 7.50 | 7.50 | 0.00 |
| ඇම්බියොන් හෝල්ඩිංග්ස් | 6,726 | 17.10 | 16.90 | 17.30 | 16.30 | 16.40 | (0.70) |
| ආර්පිකෝ ඉන්ෂුවරන්ස් | 277 | 22.20 | 23.90 | 23.90 | 23.80 | 23.90 | 1.70 |
| ඒසියා සියාකා | 70,625 | 2.60 | 2.60 | 2.60 | 2.60 | 2.60 | 0.00 |
| බේරුවල රෙසෝට්ස් | 19,500 | 0.90 | 0.90 | 0.90 | 0.80 | 0.80 | (0.10) |
| බෝගල ග්‍රැෆයිට් | 4,000 | 25.90 | 26.30 | 26.30 | 25.00 | 25.10 | (0.80) |
| බොගවන්තලාව | 11,387 | 12.40 | 12.00 | 12.30 | 11.50 | 11.60 | (0.80) |
| බී.පී.පී.එල්. හෝල්ඩිංග්ස් | 16,463 | 13.50 | 13.70 | 13.80 | 13.50 | 13.50 | 0.00 |
| බ්‍රවුන්ස් | 9,953 | 168.00 | 168.00 | 170.75 | 160.50 | 161.25 | (6.75) |
| බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් | 5,199,598 | 5.30 | 5.50 | 5.50 | 5.20 | 5.20 | (0.10) |
| සී.ටී. ලෑන්ඩ් | 30 | 28.80 | 28.00 | 28.00 | 28.00 | 28.80 | 0.00 |
| සී.ඩබ්ලිව්. මැකී | 8,510 | 44.70 | 44.00 | 44.50 | 43.00 | 43.80 | (0.90) |
| සිලෝන් ටී බ්‍රෝකර්ස් | 5,030 | 3.20 | 3.30 | 3.40 | 3.20 | 3.30 | 0.10 |
| සී.එෆ්.අයි. | 200 | 66.50 | 67.50 | 67.50 | 67.50 | 67.50 | 1.00 |
| සිට්‍රස් හික්කඩුව | 5,256 | 5.00 | 5.00 | 5.10 | 5.00 | 5.00 | 0.00 |
| සිට්‍රස් වස්කඩුව | 33,614 | 3.10 | 3.20 | 3.30 | 3.20 | 3.20 | 0.10 |
| කොමර්ෂල් ක්‍රෙඩිට් | 1,300 | 22.20 | 22.70 | 22.90 | 22.70 | 22.70 | 0.50 |
| කොමර්ෂල් ඩිවලොප්මන්ට් | 11,980 | 103.75 | 101.00 | 104.00 | 100.00 | 100.00 | (3.75) |
| ඩිල්මා සිලෝන් | 2 | 650.00 | 680.00 | 680.00 | 680.00 | 650.00 | 0.00 |
| ඊ-චැනලින් | 1,110 | 5.80 | 5.60 | 5.80 | 5.60 | 5.80 | 0.00 |
| ඒඩ්න් හොටෙල් ලංකා | 21,621 | 10.50 | 10.40 | 10.50 | 10.30 | 10.40 | (0.10) |
| ඇල්පිටිය | 47,612 | 45.50 | 45.10 | 45.50 | 44.00 | 44.40 | (1.10) |
| ඉක්විටි ටූ පී.එල්.සී. | 76 | 53.50 | 53.10 | 53.10 | 53.10 | 53.50 | 0.00 |
| ෆෝට්‍රස් රෙසෝට්ස් | 1,699 | 10.10 | 11.20 | 11.20 | 10.60 | 10.60 | 0.50 |
| ගලධාරි | 1,896 | 8.10 | 8.30 | 8.30 | 8.00 | 8.00 | (0.10) |
| ගාඩියන් කැපිටල් | 332 | 28.00 | 28.00 | 28.00 | 28.00 | 28.00 | 0.00 |
| හැටන් | 2,501 | 8.50 | 8.80 | 8.80 | 8.50 | 8.60 | 0.10 |
| එච්.එන්.බී. ෆිනෑන්ස් | 45 | 8.60 | 8.60 | 8.60 | 8.50 | 8.60 | 0.00 |
| එච්.වී.ඒ. ෆුඩ්ස් | 22,966 | 5.30 | 5.30 | 5.30 | 5.00 | 5.10 | (0.20) |
| ජෙට්වින්ග් සිම්පනි | 2,100 | 9.50 | 9.50 | 9.50 | 9.00 | 9.00 | (0.50) |
| ජෝන් කීල්ස් | 10,031 | 76.50 | 61.20 | 75.50 | 61.20 | 62.20 | (14.30) |
| කීල්ස් ෆුඩ් | 1 | 167.25 | 167.25 | 167.25 | 167.25 | 167.25 | 0.00 |
| කීල්ස් හොටෙල්ස් | 135,111 | 10.00 | 10.00 | 10.20 | 9.50 | 9.50 | (0.50) |
| දිරිසවි පුවරුව | | | | | | | |
| ලංකා සෙරමික් | 929 | 114.50 | 115.50 | 115.50 | 110.00 | 110.00 | (4.50) |
| ලාෆ්ස් පවර් | 5,750 | 9.20 | 9.30 | 9.30 | 9.10 | 9.10 | (0.10) |
| ලාෆ්ස් පවර් (LPL-X0000) | 13,460 | 6.30 | 6.30 | 6.30 | 6.00 | 6.00 | (0.30) |
| ලෝටස් හයිඩ්‍රෝ | 90,462 | 11.90 | 12.00 | 12.00 | 11.70 | 11.80 | (0.10) |
| මහවැලි කොකනට් | 220 | 27.00 | 28.50 | 28.50 | 28.50 | 28.50 | 1.50 |
| මාරවිල රෙසෝට්ස් | 204,200 | 1.90 | 1.90 | 1.90 | 1.70 | 1.80 | (0.10) |
| මස්කෙලිය | 29,269 | 10.90 | 10.90 | 11.00 | 10.00 | 10.10 | (0.80) |
| මිලේනියම් හවුස් | 11,031 | 6.00 | 6.00 | 6.00 | 5.70 | 5.70 | (0.30) |
| නුවරඑළිය | 1,909 | 1,014.00 | 1,014.00 | 1,014.00 | 1,014.00 | 1,014.00 | 0.00 |
| ඔනාලි | 2,500 | 31.30 | 30.00 | 30.00 | 29.10 | 29.20 | (2.10) |
| ෆාම් ගාඩ්න් හොටෙල් | 25,030 | 30.50 | 27.00 | 29.00 | 23.00 | 23.10 | (7.40) |
| පෙගාසස් හොටෙල්ස් | 100 | 30.20 | 30.80 | 31.70 | 30.80 | 31.70 | 1.50 |
| ප්‍රයිම් ෆිනෑන්ස් | 1,100 | 13.30 | 12.90 | 12.90 | 12.80 | 12.80 | (0.50) |
| රයිගම් සෝල්ටන්ස් | 72,502 | 5.30 | 5.40 | 5.40 | 5.20 | 5.30 | 0.00 |
| රේණුකා කැපිටල් | 36,551 | 6.40 | 6.30 | 6.30 | 6.10 | 6.10 | (0.30) |
| රිචඩ් පීරිස් එක්ස්පෝර්ට් | 434 | 344.75 | 354.00 | 355.00 | 349.50 | 353.50 | 8.75 |
| රෝයල් ෆාම්ස් | 38,200 | 14.00 | 14.10 | 14.10 | 14.00 | 14.10 | 0.10 |
| සෙරන්ඩිබ් ඉංජිනියරින් ගෲප් | 35,313 | 6.20 | 6.10 | 6.30 | 6.10 | 6.10 | (0.10) |
| සිංගර් ඉන්ඩ්‍රස්ට්‍රීස් | 3,521 | 49.40 | 49.50 | 52.20 | 47.20 | 51.00 | 1.60 |
| සිංහ හොස්පිටල්ස් | 145,360 | 2.00 | 2.00 | 2.00 | 2.00 | 2.00 | 0.00 |
| සිංහපුත්‍ර ෆිනෑන්ස් (SFLP0000) | 1,816 | 3.90 | 3.50 | 4.00 | 3.50 | 3.90 | 0.00 |
| සොෆ්ට්ලොජික් | 1,003 | 11.40 | 11.30 | 11.90 | 11.30 | 11.70 | 0.30 |
| සොෆ්ට්ලොජික් කැපිටල් | 13,906 | 3.90 | 3.80 | 3.90 | 3.80 | 3.80 | (0.10) |
| සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් | 1,081 | 10.20 | 10.10 | 10.10 | 10.10 | 10.10 | (0.10) |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 863,088 | 32.40 | 34.00 | 34.00 | 32.00 | 32.10 | (0.30) |
| ට්‍රාන්ස්ඒෂියා | 2,773 | 55.00 | 52.00 | 52.00 | 50.90 | 51.00 | (4.00) |
| උඩපුස්සැල්ලාව | 299 | 21.50 | 21.40 | 21.40 | 21.10 | 21.10 | (0.40) |
| වැලිබල් වන් එක්ස් ඩී | 814,569 | 52.00 | 53.00 | 53.00 | 50.00 | 50.00 | (2.00) |
| වොච් ලිස්ට් | | | | | | | |
| ඇනිලානා හොටෙල්ස් | 12,520 | 1.10 | 1.10 | 1.10 | 1.10 | 1.10 | 0.00 |
| බිම්පුත් ෆිනෑන්ස් | 3,259 | 7.40 | 7.60 | 7.70 | 6.90 | 7.10 | (0.30) |
| බ්ලූඩයමන්ඩ්ස් | 76,500 | 0.60 | 0.60 | 0.70 | 0.60 | 0.60 | 0.00 |
| බ්ලූඩයමන්ඩ්ස් (Blue-X0000) | 61,251 | 0.30 | 0.40 | 0.40 | 0.30 | 0.30 | 0.00 |
| ලංකෙම් ඩිවලොප්මන්ට් | 8,210 | 3.50 | 3.50 | 3.50 | 3.40 | 3.40 | (0.10) |
| මැක්වුඩ්ස් එනර්ජි | 37,160 | 2.70 | 2.70 | 2.80 | 2.60 | 2.70 | 0.00 |
| නේෂන් ලංකා | 25,701 | 0.70 | 0.70 | 0.80 | 0.70 | 0.80 | 0.10 |
| ටෙස් ඇග්‍රෝ | 10,086 | 0.60 | 0.60 | 0.60 | 0.50 | 0.60 | 0.00 |
| ටෙස් ඇග්‍රෝ (Tess-X0000) | 20,052 | 0.50 | 0.50 | 0.50 | 0.40 | 0.40 | (0.10) |

**වෙළෙඳපොළ දත්ත**

| කොටස් සම්බන්ධ දත්ත | අද දින | කළින් දින |
|---|---|---|
| පිරිවැටුම් වටිනාකම (රු.) | 812,447,869.55 | 1,026,365,863.15 |
| පිරිවැටුම් ප්‍රමාණය (ගණන) | 31,507,275 | 29,322,436 |
| විකුණුම්කරුවන් (ගණන) | 10,454 | 10,856 |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රු.) | 3,131,296,302,244. | 553,169,370,948,058.10 |
| **ආණ්ඩුවේ සුරැකුම්** | **අද දින** | **කළින් දින** |
| පිරිවැටුම් වටිනාකම (රු.) | - | - |
| පිරිවැටුම් ප්‍රමාණය (ගණන) | - | - |
| විකුණුම්කරුවන් (ගණන) | - | - |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රු.) | - | - |

| ණය ප්‍රමාණය | අද දින | කළින් දින |
|---|---|---|
| | | 12 - මාර්තු -21 |
| පිරිවැටුම් වටිනාකම (රු.) | 32,297,506.63 | 120,377,000.00 |
| පිරිවැටුම් ප්‍රමාණය (ගණන) | 326,400 | 1,241,000 |
| විකුණුම්කරුවන් (ගණන) | 3 | 11 |

| කොටස් දර්ශකය | අද දින | කළින් දින |
|---|---|---|
| මිල දර්ශකය | | |
| සීඑස්ඊ සියලු කොටස් දර්ශකය | 7,160.41 | 7,247.48 |
| එස් ඇන්ඩ් පී එස්එල් 20 දර්ශකය | 2,862.81 | 2,893.44 |
| සමස්ථ ප්‍රතිලාභ දර්ශකය | | |
| සියලුම කොටස්වල ටීආර්අයි දර්ශකය (ඇස්ට්‍රී) | 9,598.46 | 9,715.18 |
| එස් ඇන්ඩ් පී හි ටීආර්අයි එස්එල් 20 දර්ශකය (එස් ඇන්ඩ් පී එස්එල් 20 (ටී ආර් අයි)) | 4,719.79 | 4,770.29 |

**විනිමය අනුපාත 15-03-2021**
**විනිමය අනුපාත කොළඹ කොමර්ෂල් බැංකුවේ**
**ටෙලිග්‍රැෆික් සේවාවේ දැක්වෙන දත්තයන් ඇසුරිනි.**

| | ගැනුම් මිල | විකුණුම් මිල |
|---|---|---|
| අමෙරිකානු ඩොලරය | 193.12 | 200.50 |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | 147.37 | 157.07 |
| බ්‍රිතාන්‍ය පවුම | 268.33 | 280.45 |
| ජපන් යෙන් | 1.7642 | 1.468 |
| යූරෝ | 228.90 | 240.77 |
| සිංගප්පූරු ඩොලරය | 142.79 | 149.97 |
| කුවේට් ඩිනාර් | 584.80 | 662.28 |
| ඕමාන් රියාල් | 489.34 | 520.79 |
| සවුදි රියාල් | 49.74 | 54.62 |
| එක්සත් අරාබි එමීර් ඩිරාම් | 51.05 | 55.80 |
| භූතාන් ඩිනාර් | 449.73 | 531.83 |

# කොමර්ෂල් ඊ-පාස්බුක් ලියාපදිංචි පිරිස මිලියනය පනී



ශ්‍රී ලංකාවේ විශාලතම පුද්ගලික වාණිජ බැංකුව වන කොමර්ෂල් බැංකුවේ ඊ-පාස්බුක් ජංගම දුරකතන ඇප් සේවාව සඳහා ස්වයං-ලියාපදිංචි වීමේ අවස්ථාව දෙමින් යාවත්කාලීන කිරීමෙන් පසු මාස හයක් ඇතුළත ඊ-පාස්බුක් නව ඇප් පහසුකම ඩවුන්ලෝඩ් කර ගැනීම් 150,000 කින් වැඩිවී ඇතැයි බැංකුව වාර්තා කරයි.

ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ බැංකු ක්ෂේත්‍රයේ පළමු ඩිජිටල් පාස්පොත වන කොමර්ෂල් බැංකුවේ ඊ-පාස්බුක් ඇප් සේවාව මේ වන විට රටවල් 100කට වැඩි ගණනක සිට ගිණුම් හිමියන් භාවිත කරන අතර ඒ සඳහා තත්පරයකට 20 දෙනෙක් පමණ ලොග් වන බව බැංකුව සඳහන් කරයි. මිනිත්තුවකට සාමාන්‍යයෙන් ක්‍රියාකාරී ගනුදෙනුකරුවන් 1,000කට වැඩි ගණනක් මේ ඇප් සේවාව භාවිත කරන බවත් මේ සඳහා මිලියනයකට වැඩි ගනුදෙනුකරුවන් ප්‍රමාණයක් ලියාපදිංචි වී තිබෙන බවද බැංකුව අනාවරණය කරයි.

බැංකුව විසින් මේ ඇප් සේවාවට ආකර්ෂණීය නවාංග එකතු කරමින් මෑතකදී වැඩි දියුණු කළ අතර එයට ස්වයංව ලියාපදිංචි වීම සහ ඒ මොහොතේදීම ගනුදෙනු වාර්තා ගැනීම මේ නවාංගවලට ඇතුළත් විය.

## කොටස් මිලට ගැනීම

කොටස් මිලට ගැනීමට ඔබ අපේක්ෂා කරන්නේ නම් ක්‍රම දෙකක් යටතේ සිදු-කළ හැකිය. එනම් ප්‍රාථමික වෙළෙඳපොළ (Primary market) සහ ද්විතීක වෙළෙඳපොළ (secondary market) මඟිනි. ප්‍රාථමික කොටස් වෙළෙඳපොළ යනු කිසියම් සමාගමක් කොටස් නිකුත් කරන අවස්ථාවේදීම සෘජුවම කොටස් මිලට ගැනීම සිදු කරන වෙළෙඳපොළ වේ. දෙවන ක්‍රමය වන්නේ ප්‍රාථමික වෙළෙඳපොළෙන් කොටස් මිලට ගත් අයකුගෙන් නැවත එම කොටස් දෙවන වරට මිලට ගැනීමයි. එසේ කොටස් මිලට ගැනීම "ද්විතීක කොටස් වෙළෙඳපොළෙන්" කොටස් මිලට ගැනීම ලෙස හඳුන්වයි. මේ කුමන ආකාරයකට වුවද කිසියම් ආයෝජකයකුට කොටස් මිලට ගත හැකිය. කුමන ආකාරයකට කොටස් මිලට ගත්තත් පළමුවෙන්ම කළයුතු කාර්ය වන්නේ කොටස් තැරැව්කාර ආයතනයක් වෙත ගොස් ලියාපදිංචි වීමයි.

* **කොටස් තැරැව්කාර ආයතනයක් යනු කුමක් ද? (Broker Agencies)**

කොටස් තැරැව්කාර ආයතනයක් යනු තැරැව්කාර සේවාවක් සපයමින් එම සේවාව වෙනුවෙන් කිසියම් මුදලක් උපයාගන්නා ආයතන වේ. එය සරලව හැඳින්වුවහොත් වාහන හෝ ඉඩම් අලෙවියේදී හමුවන බ්‍රෝකර්ස්ලා විසින් සපයනු ලබන සේවාව ම මෙම කොටස් වෙළෙඳපොළේදී කොටස් තැරැව්කාර ආයතන විසින් ද සිදු කරනු ලබයි.ඉඩම් මිලට ගැනීමට අවශ්‍ය කෙනකු සහ ඉඩම් අලෙවිකර ගැනීමට අවශ්‍ය ඉඩම් අලෙවිකරුවකු එකිනෙකට මුණගස්වා දෙපාර්ශ්වයෙන් ම කොමිස් මුදලක් ගැනීම ඉඩම් Broker විසින් සිදුකරනු ලබයි. කොටස් වෙළෙඳපොළේදී ද කොටස් තැරැව්කාර ආයතන මඟින් සිදු කරනු ලබන්නේ ද මෙවැනිම කාර්යයකි.

කොටස් අලෙවිකරනු ලබන ලැයිස්තුගත සමාගම් සහ කොටස් මිලදී ගැනීමට අපේක්ෂාවෙන් සිටින කොටස් ආයෝජකයින් එකිනෙකට මුණගස්වා එම දෙපාර්ශ්වයෙන්ම කිසියම් මුදලක් අයකර ගැනීම තුළින් තම ආදායම වැඩි කර ගැනීම කොටස් තැරැව්කාර ආයතනයක් මඟින් සිදු කරනු ලබයි. මෙහිදී කිසියම් මුදලක් සේවා ගාස්තු වශයෙන් හැම ආයතනයක්ම ලබා ගත්තද ඔහුන් විසින් විශාල සේවාවක් සිදුකරනු ලබයි. එනම් කොටස් වෙළෙඳපොළ පිළිබඳ ඔබට කිසියම් අවබෝධයක් නොමැති වුවද කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීමට කැමැත්තක් පවතී නම් කොටස් වෙළෙඳපොළේ තැරැව්කාර ආයතනයක් හරහා ඔබට අවශ්‍ය සියලුම තොරතුරු, කොටස් වෙළෙඳපොළේ වර්තමාන තත්ත්වයන් සහ වැඩිම ප්‍රතිලාභයන් ලබා ගත හැකි සමාගම් යනාදී සියලුම කරුණු පිළිබඳ විමසීමක් කිරීමට හැකියාව තිබේ.

එහිදී ඔබ සතුව පවතින සුළු මුදල් ප්‍රමාණයක් වුව ද කොටස් තැරැව්කාර ආයතනයක් හරහා වඩාත් එලදායි සමාගමක කොටස් මිලදී ගැනීම සඳහා ආයෝජනය කළ හැකිය. කොටස් තැරැව්කාර සමාගම්වලට කොටස් වෙළෙඳපොළ පිළිබඳ ප්‍රායෝගික පුළුල් අවබෝධයක් පවතින නිසා තැරැව්කාර ආයතනයක් හරහා කොටස් මිලට ගැනීම වඩාත් සුරක්ෂිත වේ.

**මධ්‍යම තැම්පතු ක්‍රමය යනු කුමක්ද? (Central Depositary System) CDS.**

කොටස් වෙළෙඳපොළේ ගනුදෙනු කළ හැක්කේ කොටස් තැරැව්කාර ආයතනයක් මඟින් පමණි. ඒ නිසා ඔබට කොටස් මිලට ගැනීමට අවශ්‍ය නම් පළමුවෙන් ම කළ යුතු කාර්ය වන්නේ කොටස් තැරැව්කාර ආයතනයක් වෙත ගොස් ලියාපදිංචි වීමයි. එනම් ඔබ වෙනුවෙන් මධ්‍යම තැන්පතු ක්‍රමය ගිණුමක් විවෘත කර ගැනීමයි. එය කොටස් ආයෝජකයකු කොටස් වෙළෙඳපොළ ගනුදෙනු ආරම්භ කිරීමේ මූලික පියවරයි.

2021 මාර්තු 16 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.




# බද්දර මල්ල

සතියේ 'තුන පහ' මඩිස්සලේ



# මතකයක් පමණක් වූ පාරුව

කැලණි ගඟේ ඉවුරකට වී ගලා බසින කැලණි ගඟ දෙස මඳ වෙලාවක් බලා සිටියෙමි. ගංදිය ඔහේ ගලා යයි. අදින් දශක දෙකකට තුනකට පමණ එහා ගඟ මෙතරම් හුදෙකලා වූයේ නොවේ. එදා ගඟේ පැදයන ඔරු, අඟුල් ආදිය මෙන් ලී පරිවහනය කරන පහුරු ද දකින්නට තිබිණි. එක් දහස් කවසිය හතළිහෙන් එපිටට ගඟ දුටු අයට නම් එදවස ගඟේ යාත්‍රා කළ විසල් පාරු දැකගත හැකිව තිබිණි. එහෙත් පරිවහනයේ දියුණුව විසින් ගඟ හුදෙකලා කළ සේය.


අවුරුදු අසූවකට පමණ එපිට අතීතයේ දී මහවැලි, කැලණි, කළු, නිල්වලා ආදී බොහෝ ගංගාවල ගමන් කරන පාරු දක්නට ලැබිණි. එදවස ගමෙන් කොළඹට යැවෙන පුවක්, පෙති පුවක්, කරුංකා, කොප්පරා, කරාබුනැටි ආදී සියලු ද්‍රව්‍ය කොළඹ බලා ගියේ පාරුවෙනි. ආපසු එන විට හිස් අතින් ඒමක් නොවී ය. කොළඹ සිට ප්‍රාදේශීය නගරවල වෙළෙඳසල්වලට එන පරිප්පු, අර්තාපල්, කඩල, සහල්, මිරිස් ආදිය ද පාරුවෙන් ම ආවේය.

පාරුවක් සාදා ගැනීම ද වියදම් සහගත කාර්යයකි. ඊට ශක්තිමත් දැව අවශ්‍යය. වතුරේ ගමන් කරන බැවින් දිරායාමෙන් තොර කල්පවතින දැව වර්ග ඒ සඳහා යොදාගත යුතුය. පාරුවක් හදන විට මුලින්ම ඊට සම්බන්ධ විශාල ඔරු දෙක තැනිය යුතුය. ඒ සඳහා එක් ඔරුවකට කඩතීරු දෙක බැගින් කඩතීරු හතරක් ඉරා ගැනේ. ඒ කොස් වැනි ශක්තිමත් දැව වර්ගයකිනි. කඩතීරු එකතු කොට ඔරුව සම්පූර්ණ වන්නට ගසන ලෑලි ඉරා ගන්නේ ද කොස්, හොර වැනි ඔරොත්තු දෙන ලී විශේෂයකිනි. ඔරු දෙක එක්කරන වියල සාදාගන්නේ ද බෝඹු වැනි ශක්තිමත් දැවයකින් බාල්ක දමමිනි. අනතුරුව ඒ බාල්ක මත යොදන ලෑලි ද කල්පවතින දැවයෙන් ඉරාගත් ලී වෙයි. පාරුව තනා නිම වූ පසු විශාල අඟුලක් සේය. එහෙත් එතෙකින් කාර්යය නිම නොවෙයි. පාරුවේ ද කරත්තයෙන් මෙන් වෙළෙඳ භාණ්ඩ ගෙනයන බැවින් ඒවා නොතෙමී පරිවහනය කරන්නට කරත්තයට සේ පියස්සක් තිබිය යුතුය. එබැවින් පාරුව වැසෙන සේ අඹරාවක් බැඳෙයි. බොහෝ විට පොල්ලතුවලිනි. පෝරුවේ අඹරාව කරත්තයේ අඹරාවට වඩා වෙනස්ය. කරත්තයේ අඹරාවේ දක්නට ලැබෙන්නේ ආරුක්කු හැඩයයි. එහෙත් පාරුවේ අඹරාව ත්‍රිකෝණාකාර හැඩයකට ආසන්න වෙයි.

අඹරාව බැඳුණු පාරුව ගඟ මතුපිට යන ගෙයක් සේය. පැරණි ජන කවියාද පාරුව දකින්නේ ගෙයක් සේය.

"සීරුව ඔබට කණු නොම සිටුවා හත
වාරුව ඇතුව දිය පිට තැනු ගෙයක් ඇත
මාරුව තැනින් තැන බඩු ගෙන ගමන් යත
පාරුව වැනි ගෙයක් මේ මුළු ලොවේ නැත"

ගැල් පෙළක නායකයා හැඳින්වෙන්නේ තණ්ඩලේ නමිනි. එසේම ගැලක ගොන් දෙන්නාට ඉදිරියෙන් යොදන අතිරේක ගවයා ද තණ්ඩලේ වෙයි. පාරුවක නායකයා හැඳින්වෙන්නේ ද තණ්ඩලේ නමිනි. පාරුවේ තණ්ඩලේ පාරුවේ සිටින අය අතුරින් ජ්‍යෙෂ්ඨයා මෙන්ම වැඩිම පළපුරුද්දක් ලත් තැනැත්තා ද වෙයි. වෙළෙඳ බඩු සහිතව ගඟ දිගේ යන දිගු ගමන්වල දී කණ්ඩායම මනාව හසුරුවා ගනිමින්, සියලු ගැටලු විසඳාගෙන, අතරමග හමුවන සොර සතුරු උපද්‍රව වළක්වාගෙන, පිරිස හා බඩු භාණ්ඩ ආරක්ෂා කරගෙන පැමිණීමේ ප්‍රධාන වගකීම ඔහු සතුය.






කැලණි ගඟේ පාරු ගමන් කරන විට, නතර ඔරුව නමින් කුඩා ඔරුවක් තිබුණු බව පාරු ගැන දන්නෝ කියති. එහි ගමන් කරන්නේ දෙදෙනෙකි. ඒ දෙදෙන කිත්තම් කඹය රැගෙන ගොස්, ඈතින් ඇති ගසක නැත්නම් අත්තක ගැට ගසති. පාරුවේ සිටින්නෝ කිත්තම් කඹය අදිමින් පාරුව ගෙනයති. දෙපැත්තෙන් සිටින රිටිකාරයෝ දෙදෙනෙක් රිටි ආධාර කරගෙන පාරුව නිසි මගට ගනිති. මේ මෑතක් වන තුරුම තිබුණු (සමහර තැන්වල තවමත් තිබෙන්නට ඉඩ ඇත.) මඟීන්, වෙළෙඳ බඩු, වාහන ආදිය එතෙර කරන පාලම් පාරුවේ ගමන් ආකෘතියයි.

එහෙත් මීට වඩා වෙනස් පාරු ප්‍රවාහන ක්‍රමයන් ද තිබී ඇත. පුවත්පතකට නීල් විජේරත්න මහතා විසින් ලියන ලද ලිපියක් මම කලකට පෙර කියැවීමි. නවසිය හැත්තෑවේ පමණ ඔහුගේ තුරුණු වියේ දී හමු වූ ඊට බොහෝ කලකට පෙර ලන්දේසි ඇළේ පාරු කර්මාන්තයේ නියැලුණු අයකු පැවසූ තොරතුරු ඇසුරින් ලිපිය ලියා තිබිණි. පාරුකරුවා එදා කියූ තොරතුරු ඇතුළත් සටහන් නැවත කියවා ලිපිය ලියූ බව ද ඔහු කියා තිබිණි. මම ඔහුට දුරකතනයෙන් අමතා වැඩි විස්තර ද විමසූ බව මතකය. විජේරත්න මහතා සඳහන් කර තිබූ ආකාරයට ලන්දේසි ඇළේ පාරු ගමන් කළ ආකාරය වෙනස්ය. එහි නතර ඔරුවක් නැත. පාරුවට යෙදූ කඹ දෙකක් ඇළේ දෙපැත්තේ සිටින දෙදෙනෙක් ඇදගෙන දුවති. ඒ අනුව පාරුව ගමන් කරයි. ගඟකට වඩා වෙනස් ඊට වඩා පටු ලන්දේසි ඇළ වෙනුවෙන් වෙනස් පාරු පරිවහන ක්‍රමයක් යෙදෙන්නට ඇත.

කොහොමටත් පාරුකරුවෝ කරත්ත කරුවන් මෙන්ම දිගු කලක් සිය නිවෙසින් මෙන්ම අඹු දරුවන් වෙතින් ද බැහැරව වෙසෙන්නෝය. අවුරුදු දවස්වල නිවෙසින් බැහැරව සිටි පාරුකාරයකුගේ දුක පාරුමාලයේ සටහන් වී තිබුණේ මෙසේය.

"රෑ දාවල් නැතිව අපි විඳින දුක දැනේ
පහදා පවසන්නෙ අපි කාට ද නොදැනේ
ලැබුදා අවුරුද්ද ගිනි කූසය ඇවිළුණේ
වෙනදා නම් අපිත් තෙල් ගානවා අනේ"

**මහානාම දුනුමාල**




# නැවත උපන් විලී ලෝමන්

1949 දී ප්‍රථම වරට වේදිකාගත වූ ආතර් මිලර්ගේ "වෙළෙඳ නියෝජිතයාගේ මරණය" (Death of a Salesman) නාට්‍යයෙහි එන විලී ලෝමන් නමැති චරිතය, සමකාලීන අමෙරිකානු සමාජය තුළ ආන්දෝලනයක් ඇති කරන්න සමත් විය.

විලී ලෝමන් නමැති හැට හැවිරිදි වෙළෙඳ පුද්ගලයාගෙන් නිරූපිත වූයේ වෙළෙඳ සමාගමක භාණ්ඩ අලෙවියෙහි වෙහෙසෙන සේවකයකු පමණක් නොව, ජීවන අරගලයේ ආතතියෙන් පෙළෙන අමෙරිකානු පොදු පුරවැසියාගේ ආත්මයයි.

මිලර්ගේ නාට්‍ය තුළදී මිය යන නමුදු, සැබෑ සමාජයෙහි සිටි ලෝමන් දිගින් දිගටම තම භූමිකාවෙහි යෙදුණේය. එරට පමණක් නොව මුළු ලෝකයෙහිම ආර්ථික අර්බුද හටගන්නා විට, විලී ලෝමන් නැවත ඉදිරියට පැමිණියේය.

ආතර් මිලර් තම නාට්‍යයේ තේමාව ලෙස දුටුවේ, ජීවිතයේ අභියෝගයන්ට ශක්තිමත්ව මුහුණ දීමට නොහැකි වූ විට මිනිසාට අත්වන ශෝචනීය ඉරණමය. එහෙත් ඇතැම් විචාරකයන්ගේ මතය වූයේ ධනේශ්වර ආර්ථිකය තුළ ශ්‍රමිකයාගේ සැබෑ ජීවන අර්බුදය, ඔහුගේ අවිනිශ්චිත හා අසරණ දිවි පැවැත්ම, මිලර්ගේ "සේල්ස්මන්" තුළින් ප්‍රබලව ඉස්මතු වන බවය.

එසේම එය ආතර් මිලර්ගේ නාට්‍යාවලියෙහි මෙන්ම අමෙරිකානු නාට්‍යවංශයෙහි ද විශේෂ ස්ථානයක් හිමි කර ගනී. කීර්තිමත් පුලිට්සර් සම්මානය ද දිනූ "සේල්ස්මන්" බ්‍රෝඩ්වේ රඟහලෙහි දර්ශන වාර 742ක් පැවැත්වීමෙන් එහි වාර්තා පොතට ද එක්විය.

වෙළෙඳ ආයතනයක භාණ්ඩ අලෙවිය සඳහා සැතපුම් සිය ගණින් ගෙවා දුර බැහැර නගරවලට ගමන් කරන විලී ලෝමන්, ක්‍රමයෙන් තම රැකියාවෙන් වෙහෙසටත්, අතෘප්තියටත් පත්ව සිටී. ඔහුගේ බිරිය ලින්ඩා, තම සැමියාගේ මානසික තත්ත්වය වටහාගෙන සිටින ඔහුට බොහෝ ආදරය කරන කාරුණික කාන්තාවකි. පුත්තු දෙදෙන වන බිෆ් සහ හැපී අනාගතය පිළිබඳ දහසක් බලාපොරොත්තු හිස මත තබාගත් සෙල්ලක්කාර, කඩවසම් තරුණයෝය. එහෙත් ඔවුහු දෙදෙන තවමත් රැකියාවන්හි නොයෙදෙන බැවින්, පවුලේ මාසික වියදම් සඳහා කිසිවක් නොඋපයති. එය විලී ලෝමන්ගේ කනස්සල්ලට හේතුවකි.

"ඒ ළමයි හැමදාම ඔහොම ඉන්න එකක්යෑ... ළඟදීම රස්සාවල් හොයා ගනීවි."

ලින්ඩා, එසේ කියමින් සිය සැමියා අස්වසයි.

රැකියාවේ මුල් අවදියේදී විලී ඉතා සතුටින් කාලය ගත කළේය. ඔහුගේ වෙළෙඳාම ද සාර්ථක වූ අතර, ආයතනයේ ප්‍රධානියා ද හොඳින් සැලකුවේය. ඔහුගේ මරණයෙන් පසු එම තනතුරට පත් ඔහුගේ පුතා - හොවාර්ඩ් වැග්නර් - විලී ගැන එතරම් ප්‍රසාදයක් දැක්වූයේ නැත.

විලීගේ නිවෙසට වාරික ගෙවීම් කළ යුතුය. ඊට අමතරව රක්ෂණ ගාස්තු වැනි අනිවාර්ය ගෙවීම් ගණනාවකි.


මානසික ආතතිය නිසා විලී තනිව කතා කරයි. එය ඔහුගේ දරුවන්ගේ සරදමට ලක් වෙයි. දුර ගමන් යන විලීගේ රථය නිතර අනතුරුවලට ද ලක් වන අතර, දරු දෙදෙනා දකින්නේ එයද තම පියාගේ දුබලතාවක් ලෙසිනි.

බිෆ් සහ හැපී ණය මුදලක් ගෙන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සැලසුම් කරති. ඉන්පසු තම පියා ඔහුගේ වෙහෙසකර රැකියාවෙන් ගලවා ගත හැකිය.

විලී සිය දිවි නසා ගැනීමට උත්සාහ කරන බව බිරිය ලින්ඩා දැන සිටියත් ඒ බව තම දරුවන්ට හෙළි නොකරයි. ඇය විලීට යෝජනා කරන්නේ ආයතන ප්‍රධානියා හමු වී කාර්යාලයීය රැකියාවක් ලබා ගන්නා ලෙසය. අවසානයේ ඊට එකඟවන විලී, හොවාර්ඩ් වැග්නර් හමුවීමට යයි. එය මෙම නාට්‍යයේ එන හැඟීම්බර අවස්ථාවකි.

විලී තම අතීතය සිහිපත් කරමින් ආයතනය හා තමා අතර පැවති සබඳතාව ගැන කියන්නට වෙයි.

"මම මෙතන පරණම කෙනෙක්. ඔයාගෙ තාත්තා ඔයා පොඩි කාලෙ මෙහෙට වඩාගෙන එනවා... ඔයා උපන් දවසෙත් මගෙන් ඇහුවා, මම පුතාට හොවාර්ඩ් කියල නම දාන්නයි ඉන්නෙ, විලී මොකද ඒ ගැන හිතන්නෙ කියලා..."





මෙබඳු පරණ කතා ගැන, හොවාර්ඩ් උනන්දුවක් දක්වන්නේ නැත. විලී බැගෑපත් වෙයි.

"මම ලොකු දේවල් ඉල්ලන්නෙ නෑ. මට පොඩි ඉඩක් දෙන්ඩ මේසයක් දාලා සුමානෙකට ඩොලර් පනහක් දෙන්ඩ, ඒ ඇති මට දැන් දුර ගමන් යන්ඩ අමාරුයි මං ඔෆිස් එකේ ඉඳල වැඩ කරන්නම්."

"ඒක කරන්ඩ බෑ විලී. මෙහෙ වැඩට ටික දෙනයි ඕනෙ... බිස්නස් කියන්නෙ බිස්නස්... මේක සෙල්ලමක් නෙවෙයි. හැමෝම මහන්සි වෙලා වැඩ කරන්ඩ ඕනේ."

"තරුණ කාලෙ නං මං ඇලස්කාවට වුණත් යන්ඩ සතුටින් හිටියෙ. ඒත් දැන් මට මහන්සියි. ඔයාගෙ තාත්තා දන්නව මම වැඩ කරපු විදිහ. හොඳයි, මට පොඩි මේසෙකුයි, සුමානෙකට ඩොලර් හතළිහකුයි දෙන්ඩ. මං මෙහෙ ඉඳල ටෙලිෆෝන් එකෙන් බඩු විකුණන්නං.

විලීගේ දුක්මුසු අයැදුමට හොවාර්ඩ්ගේ හිත උණු වන්නේ නැත. අවසානයේ හොවාර්ඩ් තම තීරණය කියයි.

"විලී - තමුසෙට රස්සාව කරන්ඩ අමාරුනං ගෙදර නැවතිල ටිකක් විවේක ගන්නවා... ඊට පස්සෙ වැඩ කරන්ඩ පුළුවන්නං විතරක් ආපහු එනවා."

"නෑ... කමක් නෑ. එහෙමනං මං පරණ පුරුදු විදිහටම බොස්ටන්වලට ගිහිං වැඩ කරන්නං."

"නෑ... ඕනෙ නෑ විලී... මං තමුසෙ වෙනුවට වෙන කෙනෙක් පත් කරනවා, බොස්ටන්වලට. මේක මං කියන්න කියලම තමයි හිතං හිටියෙ."

මෙම සංවාදය නිම වන්නේ ප්‍රේක්ෂකයා තුළ, විලී ලෝමන් කෙරෙහි දැඩි ශෝකයක්, කම්පනයක් උපදවමිනි.

පරාජිත හැඟීම විසින් විලී ලෝමන් නැවතත් දිවිනසා ගැනීම වෙත පොලඹවයි. හදිසි අනතුරක් සේ ඇඟවෙන ලෙසින් දිවි නසාගත් විට පවුලේ උදවියට විශාල රක්ෂණ වන්දියක් ලැබෙනු ඇත. එයින් නිවෙසේ වාරික ගෙවා අවසන් කළ හැකිය. දරු දෙදෙනාටද ඔවුන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කළ හැකිය. විලී ලෝමන් නමැති පොදු පුරුෂයාගේ ජීවිතය පරමාදර්ශී පියකු ලෙසින් නිමවා දකිනු ඇත.

නාට්‍ය අවසාන වන්නේ, විලීගේ මිනීවළ අසල ලින්ඩා හා දරුවන් අවසන් ගෞරවය දක්වන කෙටි දර්ශනයකිනි. ලින්ඩා මෙසේ දුක් වෙයි.

"ඔයා මෙහෙම දෙයක් කරගන්න හේතුව මට තේරෙන්නෙ නෑ. අද අපේ ගෙදරට ගෙවන්න තිබුණු අන්තිම ණය වාරිකෙත් ගෙවල ඉවර කෙරුවා. දැන් අපි නිදහස්. ඒත් දැන් ගෙදර ඉන්න කවුරුත් නෑ."

විචාරකයින්, විලී ලෝමන්ගේ චරිතය හඳුන්වන්නේ ශෝකාන්තයක් සහිත වීරයකු (A tragic hero) ලෙසිනි.

ඩස්ටින් හොෆ්මාන්, විලීගේ චරිතය රඟපෑ නිෂ්පාදනය පිළිබඳව 1984 දී අමෙරිකාවේ 'ද නිව්ලීඩර්' පුවත්පතට විචාරයක් ලියූ ලියෝ සොවේග් (Leo Sauvage) විලී ලෝමන් දිවි නසා ගත්තේ සමාජයේ වරදකින් නොවේ යැයි කීමට උත්සාහ ගනී. ඔහු දකින ආකාරයට එය විලී තුළ පැවති මානසික රෝගී තත්ත්වයක ප්‍රතිඵලයකි. එහෙත් නාට්‍ය තුළින්ම පැහැදිලිව දිස්වන ආකාරයට විලී ලෝමන්ගේ මානසික ව්‍යාකූලතාවයට හේතුව වෙහෙසකර ජීවන රටාවය. ළඟා විය නොහැකි ඉලක්කයන්ය. වෙළෙඳ ලෝකය, සිත්පිත් නැති අමානුෂික තැනක් බව මිලර්ගේ "සේල්ස්මන්" ඉඟි කරයි.

ආයතන ප්‍රධානි හොවාර්ඩ් හමුවීමට ගිය අවස්ථාවේ විලී ලෝමන් මෙසේ පවසයි.

"මම මේ සමාගමට අවුරුදු තිස්හතරක් මගේ ශ්‍රමය වැය කරල තියෙනවා. දොඩම් ගෙඩියක් කාලා, පොත්ත පැත්තකට විසි කරනවා වාගේ දෙයක් ද මේක. මිනිස්සු ගැන එහෙම හිතන්ඩ එපා. මම දැන් ඉන්නෙ මගෙ ඉන්ෂුවරන්ස් එකවත් ගෙවා ගන්ඩ බැරි අමාරු අඩියක... ඒත් ඔයාගෙ තාත්තා යටතේ ඉන්න කාලෙ මම සුමානෙකට කොමිස් එක විතරක් ගත්තා ඩොලර් එකසිය හැත්තෑවක්. මං ගැනත් ටිකක් හිතන්ඩ."

"අමෙරිකානු සිහිනය" ආරක්ෂා කිරීමට යත්න දරන සොවේග් වැනි විචාරකයන් විලී ලෝමන්ට වරද පවරනුයේ ඔහු සමාජ හා ජීවන අභියෝගයන්ට මුහුණ දිය නොහැකි දුබලයකු සේ දකිමිනි.

## උඩුපෙළ සහ යටිපෙළ

කොරෝනා වසංගතය තුළ, ලක්ෂ සංඛ්‍යාත ජනකායකට රැකියා අහිමි වෙද්දී වැටුප් කප්පාදු වෙද්දී විලී ලෝමන් නමැති පොදු වෙළෙඳ නියෝජිතයා නැවත උපන්නේය.

විවෘත ආර්ථිකයත් සමගම ශ්‍රී ලංකාව තුළ ද විලී ලෝමන්ලා දහස් ගණනින් බිහි වූයේය. ටයි පටියක් පැලඳ පදික වේදිකාවේ ඇවිද යමින් පපඩම්, මදුරු දඟර යනාදිය විකුණන, දහදිය පෙරාගත් වෙහෙසකර මුහුණු සුලබ දසුනක් වීය. ආතර් මිලර් 1949 දී අමෙරිකාවේ සිට සිය නාට්‍ය දෘෂ්ටියෙන් හෙළි කළ සත්‍යය අද අප රටේ "ලෝමන්"ලාටත් සාධාරණය.

1991 දී සේනාරත්න වීරසිංහ විසින් මෙම නාටකයේ සිංහල පරිවර්තනයක් "වෙළෙන්දාගේ මරණය" නමින් පළ කරන ලදි. ඩබ්. එස්. විජේසිංහ කළ පරිවර්තනය 2010 රාජ්‍ය නාට්‍ය උළෙලේදී ජෙරොම් ද සිල්වාගේ නිෂ්පාදනයක් ලෙසින් (වෙළෙන්දාගේ මරණය) වේදිකාගත කෙරිණි.

**කපිල කුමාර කාලිංග**

# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ



## ඔන්න බබෝ ඇතින්නියා

**ඔන්න බබෝ ඇතින්නියා**
**ගල් අරඹේ සිටින්නියා**
**ගලින් ගලට පනින්නියා**
**බබුට බයේ දුවන්නියා**

අපේ රටෙහි අම්මලා එදා මෙන්ම අදත් එවැනි නැළවිලි ගීතයකින් දරුවන් නළවති. අලියා නමැති විශාල සත්වයා කෙරෙහි ඇති බිය ඒ නැළවිල්ල අසන දරුවන්ගේ සිත්වලින් ගිලිහී යනවා ඇත.

"ඔන්න අලියෙක් එනවා."

එදවස කුඩා අප අලියකු එන බව තීරණය කරන්නේ ඇතින් ඇසෙන දම්වැල් සහ සීනු හඬින්ය. බොහෝ හීලෑ අලි ඇතුන්ගේ ගෙලෙහි සීනුවක් බැඳ තිබූ අතර පාද දෙකක් දම්වැල්වලින් එකට ගැටගසා තිබිණි.

පාරේ එහා වංගුවෙන් මතු වන අලියා මෙහා වංගුවෙන් නොපෙනී යන තුරුම මහත් උනන්දුවෙන් අප බලා සිටින්නේ අලුතින්ම දකින සත්ත්වයකු දෙස බලන්නා වාගේය.

හඬා වැලපෙමින් සිටි දරුවකු වුව ද අලියා නරඹන්නේ කඳුළු පිස දමමින් සිනාසිසීය.

එහෙත් එකල අලියා අපට එතරම් ආගන්තුක සත්ත්වයෙක් නොවූයේය. මන්ද, අපේ නිවෙස් පසුකොට අලියකු දෙදෙනකු නොගිය දවසක් වී නම් ඒ කලාතුරෙකිනි.

ඒ සියලු දෙනාම හීලෑ අලි ඇත්තුය. ඔවුන් ඒ ඇවිද ගියේ දැවැන්ත දැව කඳන් අදින්නටය; නැතහොත් ලොරි තුළට පටවන්නටය.

ඒ කාලයේ අපේ ගම් පළාතේ දැව ජාවාරම එතරම් ම සරුවට කෙරී තිබිණි. අපගේ පුරාණ රජවරු තුටු පඬුරු වශයෙන් මෙන්ම වෙළෙඳ අරමුණු අරබයා ද හීලෑ අලි ඇතුන් නැවුවලට පටවා පිට රටවලට යවා ඇත. ඒ වග සනාථ කෙරෙන සාධක, සාක්ෂි ඕනෑ තරම් තිබේ.

1505 දී මුහුදුකරය ආක්‍රමණය කළ පෘතුගීසින් ද, 1655 දී අප යටත් කරගත් ලන්දේසීන් ද අපේ රටේ අලි ඇතුන් පිළිබඳව දැක්වූයේ මහත් කෑදරකමකි. 1815 දී ඉංග්‍රීසි ජාතිකයන් එම ව්‍යාපාරය සම්බන්ධයෙන් ඊටත් වඩා දරුණු හා අසාධාරණ වූ බව පෙනී යයි. ඔවුහු අලි දඩයම විනෝදාංශයක් කොටගන්නට තරම් කුරිරු වූහ. ඉංග්‍රීසි පාලන තන්ත්‍රයෙහි හවුල්කරුවකුව සිටි මේජර් තෝමස් රොජර් නමැත්තෙක් හුදු විනෝදය සඳහා පමණක් ලංකාව තුළදී අලි ඇතුන් එක් දහස් පන්සියයක් මරා දැමූ බව කියැවේ. වයස අවුරුදු 41 දී හෙතෙම මියගොස් ඇත්තේ ලංකාවේදීමය.

එම විදෙස් ආක්‍රමණිකයින් වනාන්තර තුළින් අලි ඇතුන් අල්ලා හීලෑ කිරීමේදී කණ්ඩායම් නායකයෙක් පත් කෙරුණි. හීලෑ කරන ලද අලි ඇතුන්ගෙන් එකකු දෙන්නකු ළඟ තබා ගැනීමට එකී නායකයාට අවසර ලැබී ඇත. අදත් අපට ලංකාවේ ගෘහාශ්‍රිත අලි ඇතුන් දක්නට ලැබෙන්නේ එම අවසරයේ ප්‍රතිඵලයක් වශයෙන් විය හැකිය.

කෙසේ වෙතත් 2019 දී සිදු කෙරුණු සංගණනයකට අනුව ලංකාවේ ගෘහාශ්‍රිත අලි ඇතුන් සංඛ්‍යාව 214 ක් තරම් සුළු සංඛ්‍යාවකි.

************

දකින හැම අලියාම වාගේ අපට නම් අදටත් පෙනෙන්නේ එක සමානවය. එහෙත් එය එසේ නොවේය.

පාසල් සමයේ මගේ යෙහෙළියකගේ නිවෙසේ අලියෙක් සිටියේය. ඔවුන් අලියා රැක බලා ගත්තා සේම අලියා ද ඔවුන් රැක බලා ගත්තේ යැයි පැවසුවහොත් එය නිවැරැදිය. අලියා ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වූයේය.

බොහෝ විට ඇයත් මාත් පාසල් ආවේ ගියේ එකටය. දැව සංස්ථාවට අයත් කිතුල්ගල ලී මෝල ඉදිකොට තිබුණේ මහා මාර්ගයට යාබදවය. මහා දැව කඳන් පිරී තිබූ එම විවෘත භූමියෙහි නිතර අලි ඇත්තු කිහිප දෙනෙක්ම සිටියහ.

"ආං අපේ රාජු."

මගේ යෙහෙළිය යන එන අතරතුර හිටි හැටියේ ලී මෝල අසල මඳකට නවතී.

"එයා අර විශාල, බර කොට අදිනකොට මට බලන්ඩත් දුකයි."

ඇය පවසන්නේ අඬන්නට වාගේ මුහුණ බෙරි කොටගෙනය.

එහි එක සමාන අලි ඇතුන් අටක් දහයක් පමණ සිටිය ද ඇය තම පවුලට අයත් අලි සාමාජිකයා පහසුවෙන් ම හඳුනාගනී. රාජු ඇය දුටුව ද නුදුටුව ද ඇය ඔහුගෙන් සමුගන්නේ සුරත හැකි තරම් ඔසවා ආචාර දක්වමිනි.

සිංහල අලුත් අවුරුදු දිනයකදී මම ඇගේ නිවෙසේදී අපූරු දසුනක් දුටුවෙමි.

සුබ නැකතට ඔවුන්ගේ පියාණන් අතින් පළමුවෙන්ම අවුරුදු කෑම ලැබෙන්නේ රාජුටය. කෙසෙල් පමණක් නොව කැවුම් කිරිබත් යනාදී රසකැවිලි පිරවූ අලුත් කුල්ලක් රැගෙන මගේ යෙහෙළියගේ පියා පළමුව යන්නේ රාජු ළඟටය. නිවෙසෙහි අන් අය අවුරුදු මේසයට වාඩිවන්නේ ඉන් අනතුරුවය. හිසතෙල් ගෑමේ අවුරුද්ද ද එසේමය. රාජුගේ හිසෙහි හරියටම නැකතට නානු සහිත හිසතෙල් ගැල්වේ.

අලියකුගේ හෝ ඇතකුගේ හිමිකරුවකු වීම වාසනාවකැයි අපි සිතමු.

එහෙත් අලියකු හෝ ඇතකුගේ මද කිපෙන කාලයට අදාළ අයිතිකරු අප්‍රමාණ සංකීර්ණ ගැටළු රාශියකට මුහුණ දෙනු මම දැක ඇත්තෙමි. මද කිපීමේදී අලියාගේ කපෝල ග්‍රන්ථි ඉදිමේ. කම්මුල් දෙපසින් තෙල් වැනි ද්‍රවයක් ගලා යයි. එවැනි අලියකු තමා නහවා කවා පොවා රැක බලාගත් ඇත්ගොවුවා අනපේක්ෂිත ලෙස පාගා මරා දමන්නට තරම් සැහැසි විය හැකිය..

මද කිපුණු අලියා හෝ ඇතා ඇත්ගොවුවාට ද හෙණ්ඩුවට ද වලංගු කරගැනීම පහසු නොවේ. වරක් එවැනි මද කිපුණු අලියකු කොටු කරගනු ලැබුවේ තවත් අලින් දෙදෙනකු යොදා ගනිමිනි.

මහත් වූ දුෂ්කරතා මධ්‍යයේ බැඳ දැමූ අලියාට ආහාර හැරුණු කොට ජලය සැපයීම අත්‍යවශ්‍ය විය. ඒ සඳහා අලි හිමියා හට තවදුරටත් අප්‍රමාණ වෙහෙසක් විඳින්නට සිදු විය. ඒ වෙනුවෙන්ම ඔහු ජල නල පද්ධතියක් සවි කරවූයේය.

අලියා හීලෑ කරගන්නට ඔහුට දෙසතියකට ආසන්න කාලයක් ගත වී තිබිණි.

ඒ අතර ඔහුට විසි එක් වතාවක් එම ජල නල පද්ධතිය පිළිසකර කරන්නට සිදුවිණ; කුපිතව සිටි අලියා එය විසි එක් වතාවක්ම කඩා බිඳ දමූ හෙයිනි.

රඹුක්කන ප්‍රදේශයෙහි වසන මගේ තවත් යෙහෙළියකගේ නිවෙසෙහිදී මට අපූරු සිහිවටනයක් දැකගත හැකි විය. ඇයගේ විසිත්ත කාමරය විසිතුරු කරමින් අලංකාර ලේස් ගෙතුම් ආවරණ යොදා සකසන ලද කුඩා මිටි අසුන් සතරක් තබා තිබිණි. ඒ බොහෝ කලක් ඔවුන් රක්ෂා කොට මියගිය අලියාගේ පාද සතරයි. "මේ අපේ කණ්ඩුගෙ කකුල්. කණ්ඩු මැරෙනකොට අවුරුදු පනස් අටයි. මේ කකුල් හතර විසි අවුරුද්දක් දළදා පෙරහරේ ගිහින් තියෙනව."

මගේ යෙහෙළිය කතා කළේ එම තිරිසන් සත්ත්වයා පිළිබඳව මහත් වූ ගෞරවයකිනි.

හීලෑ අලි ඇතුන් පිළිබඳව අසා දැක ඇති අනේක වූ රසවත් සහ දුක්මුසු සිදුවීම් අතර අපූරු ම සිද්ධියක් මේ මොහොතේ මට සිහිපත් වේ.

ඒ ඇසළ මාසයේ දවසක් විය.

මාවනැල්ලට නුදුරු ගමක ගෙවත්තක බැඳ සිටි තරුණ හස්තියෙක් හිමිදිරි උදෑසන වන විට අතුරුදන් ව සිටියේය. මහනුවර දළදා පෙරහරට සහභාගි වූ හස්තියා නිවෙසට පැමිණ සිටියේ ඊට දින දෙක තුනකට කලිනි.

මහත් සේ කලබල වූ ඇත් හිමියා සත්ත්වයා සොයන්නට සතර අතේ මිනිසුන් යැව්වේය. මේ අතර ඊට සැතපුම් දෙක තුනක් එපිටින් වූ තවත් ඇත් හිමියකුගේ නිවෙසක වෙනත් කලබලයකි. ඔහුට සිටියේ එක් ඇතින්නක් පමණකි. දැන් ගෙවත්තෙහි ඇතෙක් ද සිටී.

කෙසේ හෝ ඔහු ඇතා හඳුනාගන්නට සමත් විය. හේ වහා අදාළ ඇත් හිමියාට පණිවිඩයක් යැවුවේය. දළදා පෙරහරට සහභාගි වන්නට ගොස් සිටි දින කිහිපය තුළදී එකී ඇතා සහ ඇතින්න අතර හාදකමක් ඇති වූ බවට කරුණු හෙළිදරව් වූයේ එහිදීය.

**සුනිලා විජේසිංහ**

## දුරු රටක තනිව සිටියදී





**ඒ දිවස සොඳුරුමය**

මා බාල කාලේ අම්මාගෙ තුරුලේ නැළවුණු තාලේ නම් මට මතක නෑ. ඒත් බාල කාලෙ මුලින්ම ඉස්කෝලෙ ගිය දවස්වල ඉඳලා ජීවිතේ හත්වන දශකයෙ මැදට ඇවිත් ඉන්න මට මගේ ජීවිතේ බොහෝ දේ ඉගෙන ගත්ත පාසල් උගන්වපු ගුරුවරු ජීවිතේ අත් විඳි සුබ දුක්ඛ වේදනා මිහිරි අමිහිරි මතක විශ්වවිද්‍යාල ජීවිතේ යාළුවෝ මේ හැම දෙයක්ම වගේ කිසිම අඩුවක් නැතුව මතක තියෙන්නෙ කොහොමද කියල මට කල්පනා වෙන වාර අනන්තයි. බිරිය, දරුවො දෙන්නෙක් සමග ගෙවුණු අවුරුදු විසි නවයක කුටුම්බ ජීවිතයෙ හැම දෙයක්ම සිදුවීමක්ම මතක් කරන්න පුළුවන් ශක්තිය මට කොහෙන් ලැබුණ ද කොහොම ලැබුණ ද කියල මම දන්නෑ. හිතේ නොමැකී තියෙන මතකවලට අමතරව මගේ ළඟ එක් රැස්වෙලා තියෙන මතක සැමරුම් පිරුණු පොත පත, ලියුම් කරදාසි, දිනපොත්, මා ළඟ සුරැකිව තියෙන්නෙ හරි, ඒවා සුරැකිව තියාගෙන ඉන්නෙ හරි ඇයි ද කියලා මට නිශ්චිත හේතුවක් හොයාගන්න බෑ.

මේ ළඟදි දවසක හමුවුණ මගේ මිතුරකුට මේ මතක පිරුණු ලියකියවිලි ගැන කියලා ඒවා විනාස කරල දාන්න මට හිතයි කියල කිව්වම මිත්‍රය මට කිව්වෙ 'අපෝ බුද්ධි පිස්සු ද, ඒව එකක්වත් විනාස කරන්න එපා, ඔහේ තියෙන්න අරින්න.' කියලයි. ඉතිං එහෙම තියෙන ලියුම් ගොන්නෙ ඉතිහාසයට අදාළ ලියුම් මට ලැබිල තියෙන්නෙ හැත්තෑව අසූව දශකවල. තිස්ස කාරියවසම් සර් ආචාර්ය උපාධියට එංගලන්තයට ගිහිං හිටි කාලෙ එවපු ගුවන් ලියුම් ටික, සරච්චන්ද්‍ර සර්, හවායි ඊස්ට් වෙස්ට්වල හිටපු කාලෙ ප්‍රංසයෙ තානාපති වෙලා හිටපු කාලෙ ලැබුණු ලියුම් ටිකත් ඒ වගේම මා ළඟ සුරැකිව තියෙනව. වරින්වර ඒව කියවල බලන කොට සතුටක් වගේම දුකකුත් දනෙනවා.

ඒ ලියුම්වලින් අපි කතාබහ කළ සාහිත්‍යය, රටේ දේශපාලනය, කලාව වගේ විෂයන්ට වඩා සම්පූර්ණයෙන් ම වෙනස් ඉතාමත් සුන්දර මෙන්ම දුක්බර මතක රැසක්, මව් බිමෙන්, යොදුන් සිය දහස් ගණින් ඈත එතෙර රටක කුටුම්බයෙන් මිතුරන්ගෙන් ඈත් වී තනි වූ කලක දරුවන්ගෙන් බිරියගෙන් හෝ මිතුරකුගෙන් ලැබුණු ලියුමකින් සිතට ගෙනා සැනසීම, මානසික සුවය කෙසේ විස්තර කරම් ද?

මගේ දෙවන විදේශ සංචාරය සිදුවන්නේ 1993 මැයි මාසයේදීය. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයකුව සිටිය දී ස්විට්සර්ලන්තයේ ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය, තායිලන්ත වාණිජ මණ්ඩලය හා ෆින්ලන්ත රජයෙ මූල්‍ය අනුග්‍රහයෙන් ලැබුණු තෙමසක පුහුණු පාඨමාලාවක දෙවන අදියර සඳහා යුරෝපයට යන්නට ලැබුණේ පළමු අදියරේදී තායිලන්තයේ මසක පුහුණුව නිමා කළ පසුවය. මා සමග ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංස්ථා අංශයෙන් රාජ්‍ය මිනිරන් සංස්ථාවේ මිලින්ද ඔබේසේකර සහභාගී වූ අතර කරුණාදස උඩගේ (පේෂකර්ම දෙපාර්තමේන්තුව) කීත් පෙරේරා (සීමාසහිත රෙකිට් හා කොල්මන් ලංකා) හා ඇෂ්ලි ප්‍රනාන්දු (සීමාසහිත ග්ලැක්සෝ සමාගම) ආදීහු අපගේ අනෙක් පිරිස වූහ. පුහුණු පාඨමාලාවේ සුන්දරම කාලය ගෙවුණේ ස්විට්සර්ලන්තයේ ජිනීවාහිදී හා ෆින්ලන්තයේ හෙල්සින්කි හි දී ය. වාසනාවකට මෙන් ජිනීවාහිදී මුණ ගැසුණු මගේ පැරණි මිතුරකු, නීල් විජේවර්ණකුල (ලේක්හවුසියෙ හිටපු ඡායාරූප ශිල්පී) හා ඔහුගේ තවත් මිතුරන් දෙදෙනකු නිසා නුහුරු නුපුරුදු රටක සිටිනවාය යන හැඟීමෙන් මිදුණ ද ගම රට දූ දරුවන් යාළු මිත්‍රයන් සිහි වන කල දනුණු පාළුව හා තනිකම මඳක් හෝ තුනී වූයේ ගීතාගෙන්, උපේඛා හා වාගීෂ දරුවන්ගෙන් හෝ සෝමේ (අයි.පී.බී) වැනි මිතුරකුගෙන් ලැබුණු මෙවන් ලිපියකිනි. මේ ලිපිවල ඇත්තේ අතිශය පෞද්ගලික තොරතුරු සේ පෙනුණ ද අඹු සැමි, දූ දරු සෙනෙහස, මිතුරු බැඳීමක අගය ආදී වේදයිත නොඅඩුව ඇතැයි මට සිතේ. තනි වූ බිරියකගේ සංවේදනා, දූ පුතුන්ගේ ළමාලෝකයේ අහිංසක ඉල්ලීම්, මිතුරු සමාගමයක්ට දැනෙන පාළුව මේ ලිපි තුළින් දැනුණේ තනි වූ සිත තවත් රිදවමින්දැයි නොසිතුණා නොවේ. දෙවන සංචාරයට රටින් බැහැර යන්නට සිදු වූ 1993 මැයි පළමුවැනිදාව එවකට ජනාධිපති ආර්. ප්‍රේමදාස මහතා ඝාතනය කළ දින වීම නිසා තිදෙනාගේම ලිපිවල ඒ පිළිබඳ තොරතුරු සඳහන්ව තිබිණ.

ජිනීවා ගොස් සතියක් යන්නට පෙර පළමු ලිපිය ලැබෙන්නේ ගීතාගෙනි. මැයි අටවනදා ඈ ලියන්නේ මෙහෙමයි.

'මට නම් ඔයා නැතුව දැනෙන්නේ පුදුම පාළුවක්, තනිකමක්. ගිය සැරේට වඩා වැඩියෙන් මෙවර ඒ තනිකම පාළුව දැනෙනවා කියල මට හිතෙන්නෙ. ඉක්මනින් දවස් ගතවෙනකම් මම බලාගෙන ඉන්නෙ. සමහර විට ඒ අපිට නිවාඩු නිසා වෙන්න ඇති. කොහොමද ඉතින් ඔයාගේ සැපදුක්? උයාගෙන කනව ද? ගෙදර ආවම අපිටත් වේලක් උයල දෙන්න රහ බලන්න. හත්වැනිදා නිවාඩු දුන්නා මුළු රටටම. රෑට නිදාගන්න ගියාම මට හරි බයක් දැනෙනවා. නින්ද යන්නේ නෑ. නින්ද ගියත් සැරින් සැරේ ඇහැරෙනවා. මේ දිනවල ටී.වී. එකේ මොකුත් නෑ. දවස් හතක් තිස්සේ ටී.වී.එක ඇඬුවා. ඩී.බී.විජේතුංග, රනිල්; ජනාධිපති අගමැති. නිතරගයෙන්. සිරිමාවෝ, අනුර, මාදුළුවාවේ හාමුදුරුවන් ආදීන් මරණෙට සහභාගී වුණා. අයි පී බී සෝමේ ආවෙවත් කෝල් කළේවත් නෑ. සඳුදාට මම කතාකරලා බලන්න ඕනෑ.'

11 දා ආයෙමත් ගීතා ලියනවා.' ඔයා නැතුව නම් මට හරි පාළුයි. ඔයාගේ කෑම ගැන මට හරි දුක හිතුණා. බඩු ටික පැත්තකට දාලා පිටින් කන්න, සල්ලි තියෙනව නේ. බඩගින්නෙ ඉන්න එපා, බඩු අහක ගියත් ඔයා උයන්න ඉගෙන ගන්න. ඔය පැත්ත තදින් සීතල ද? වාගීෂගෙ ටර්ම් ටෙස්ට් එකේ ලකුණු අඩුවෙන් අරන් තියෙන්නෙ. සිංහලවලට 64 යි. ගණිත්වලට 52යි. දැන් එයා මාත් එක්කලා නිදාගන්නේ. ගෙදරට හොරු පනී කියල මට හරි බයක් දැනෙනවා. රෑට නින්ද යන්නෙ නෑ. මම දොළහ එක විතර වෙනකල් අවදියෙන් ඉන්නෙ. නින්ද යන්නෙ නෑ. ආයෙත් නම් ඔයාට ඔයවගේ ගොඩක් දවස් වෙන රටවල ඉන්න වෙන්න එපා කියල මම කියනවා. හිතට දැනෙන තනිකම මකා ගන්න හරිම අමාරුයි. ඔයා කියයි ඔයා ඈත රටක අපි කවුරුත් නැතුව කොයිතරම් තනිවෙලා ද කියලා. ඔයා ඔය රටින් යන්න ඉස්සරවෙලා ගන්න පුළුවන් දේ අරගන්න. ඔර්ලෝසු, කතුරු, පිහියා, තව ඔයාට හොඳයි කියල හිතෙන දේවල්. ගෑනු ඇර. හැරල්ඩ් පී. ප්‍රවෘත්ති ලේකම් කරලා. බඩගින්නේ ඉන්න එපා සල්ලි වියදම් වෙයි කියලා. දැන් මෙහෙ වහින්න පටන් අරන්. අපි හරියට තනිවෙලා. ඉක්මනට දවස් යනකල් බලාගෙන ඉන්නෙ.' සති දෙකකින් ආයෙමත් ගීතා මට ලියනවා. 93.05 23 දා ජිනීවා කාර්ල්ටන් හෝටලයට. 'මට නම් දැන් පාළුව තනිකම හොඳටම ඇතිවෙලා. ඒත් මොනව කරන්න ද? දවස් යනව දැනෙන්නෙත් හරිම හිමින්. තව මාසයකට වැඩි කාලයක් බලාගෙන ඉන්න ඕනෑනේ. ඡන්දයෙන් පො.ජ.එ.පෙ. බස්නාහිර පළාත දිනාගත්තා. වයඹත් දකුණත් ඒ ගොල්ලන්ටම එන්න ඕනෑ. ඒත් එ.ජා.ප.ය ඒක අරගෙන දැන් ඉතින් ඒකට උසාවිවල ප්‍රශ්න. විනී සහ සුනිල් ඇතුළු ස්ටාෆ් එක ලක්බිමෙන් අයින් වෙලා කියල මම පත්තරේ දැක්කා. අද හවස ඒ දෙන්නා ඔයා හොයාගෙන මෙහේ ආවා. අලුත් පත්තරයක් පටන් ගන්න බව කීවා. උදේ ඉඳන් රෑ වෙනකල්ම වහිනවා. ළිඳත් පිරිලා. කාලෙකට ඉහින්න ලැබෙන්නෙ නෑ. සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් පොත් 50කට රුපියල් 2000 ක චෙක් එකක් ආවා. ඉතිං බුද්ධි ඔයා 13 දා මොකද කළේ? මම උපේඛාට මතක් කළා අද අපේ වෙඩිං ඇනිවර්සරි එක කියලා. මම ඉතිං ඔයා ගැන හිත හිතා නිදා ගත්තා. පුළුවන් නම්, වෙලා තියෙනව නම් තව ලියුමක් එවන්න. ඉක්මනින් දවස් ගෙවෙන කල් මග බලාගෙන ඉන්නේ මම' මාස දෙකක් තරම් කෙටි කාලයකට වුව දරුවන් දෙදෙනකු සමග තනිවුණු බිරියකට දරාගත නොහෙන පාළුවක තනිකමක බියක සිතිවිලි බොහොමයක් මේ ලිපි තුළ සැඟවී තිබෙනවා නොවෙ ද?

දියණිය හා පුතුගේ ලිපි පුරා ඇත්තේ ළමා ලෝකයේ කවර හෝ දුවකගේ හා පුතකුගේ සිතක උපදින ඉල්ලීම්ය. ඔවුන්ගේ දැනුමට හසුවන කතාබහය. අම්මාගේ ලිපි සමග උපේඛා එවූ පළමු ලිපිය මේ. 'තාත්තාගේ සැප දුක් කෙසේ ද? මම නම් සැපෙන් සිටිමි. ලියුම් එවන්න පරක්කු වුණේ ජනාධිපතිතුමාගේ මරණය ගැන ලියලා එවන්න ඕනෑ කියලා හිතපු නිසා. ඔය රට සීතල ද? ගිය ඉරිදා දිවයින පත්තර තුනක් විකිණුවා. සාමාන්‍ය ඉරිදා පත්‍රය හැර විශේෂ අතිරේක 2ක් නිකුත් කරලා. අපිට ඒවා ගන්න බැරිවුණා. පත්තර විකුණන එක්කෙනා ආවෙ හවස 6.30 ට විතර. අම්මා බොහොම අමාරුවෙන් පස්සෙන් ගිහිල්ලා ලංකාදීප විශේෂ අතිරේකයක් ඉල්ලන් ආවෙ. ජනාධිපතිගේ අවමඟුල දවසේ කලබල තිබුණේ නෑ. හුඟක් මිනිස්සු (ජනසවියේ, ඇඟලුම් කම්හල්වල අය) තමයි හිටියෙ. සමහර හාමුදුරුවරුත් ඇඬුවා. හේමා ප්‍රේමදාසත් වටපිට බල බලා බොරුවට ඇඬුවා. ගොඩක් රටවලින් කට්ටිය ආවා. බෝම්බය තිබ්බ කෙනා ප්‍රේමදාසත් ටිකක් අඳුනන කෙනෙක්ලු. එයා ගාව වැඩකරන කෙනෙක්ගේ හොඳ යාළුවෙක්ලු. අද තමයි ලංකාවෙ මිනිසුන්ට ශෝකදිනයක් කියලා නිවාඩු දුන්නේ. ඊයේ රෑ 10 සිට අද පාන්දර 5 දක්වා ඇඳිරි නීතිය දාලා තිබුණා කලබල ඇතිවෙයි කියල. කිසිම කලබලයක් තිබුණෙ නෑ. අපි වෙසක් දවසේ පන්සල් ගියා. බකට් පත්තු කළා. ඉරිදා ලාල් මාමලයි, ජය ශ්‍රී මාමයි ඇවිත් ගිහිං තිබුණා. මේ සැරෙත් අපේ ඉස්කෝලෙ කූඩු තරගෙන් 10 වසරේ කූඩුව තමයි හොඳම කූඩුව වුණේ. ගිය සැරෙත් අපේ පන්තියමයි. අපිට ඒ නිසා ටොෆි හම්බ වුණා. අඟහරුවාදා සිල් ගත්තා ඉස්කෝලෙ. තාත්තට පුළුවන් නම් ඉස්කෝලෙ දාන්න පුළුවන් සපත්තු 2ක් ගේන්න, පාට පාට මේස් ගන්න. ඔහේ පොත් ලාබ නම් (Nancy Drew Files, The Black Window, Bad Medicine, Last Dance, Win Place or die, Sisters in Crime, Heart of Danger) මේ පොත්වලින් පුළුවන් ඒව ගේන්න. පාට පාට තියෙන ඔර්ලෝසුවක් ගේන්න. චොක්ලට් ගේන්න.

වාගීෂ පුතුගේ ලිපියේ ඉල්ලීම්ම තමයි. පටන් ගන්නෙම වරදකින්.

'සෙත් වේවා! ආදරණීය තාත්තා වෙත. තාත්තාගේ සැපදුක් කෙසේ ද? මම නම් හොඳින් සිටිමි. තාත්තා සිටින රට ලස්සන රටක් ද? එහේ සීතල ද? ලංකාවෙ නම් හරියට රස්නෙයි. තාත්තා රෑට කන්න කෑම හදා ගත්ත ද? මම සඳුදා ඉස්කෝලෙ ගියා. ළමයි 9 දෙනයි පන්තියෙ හිටියේ. මට ඉස්කෝලෙ ගෙනියන්න බෑග් එකක් ගන්න. කරේ දාන කැල්ල ස්පොන්ජ් විදිය හොඳ බෑග් එකක් ගන්න. ටී.වී.ගේම් එකේ නම (Game Boy) ඒකට පොඩි කැසට් දානවා විශේෂයෙන්ම (Ninja Turtles ) කැසට් එක ගන්න. මගේ ඔරලෝසුවේ වෙලාව හදා ගත්ත ද? මම හැමදාම වගේ පහන පත්තු කරනවා. ටීවී ගේම් එක කොහොම හරි ගේන්න. ඒක නැත්නම් වෙඩි තියෙන එකක් ගන්න. එහෙනම් මම මෙතනින් නවත්වන්නම්. මෙම ලිපියට තාත්තාගෙන් උත්තරයක් ලැබෙනකම් මම බලා සිටිමි. තුනුරුවන් සරණයි.'

පුතුගේ ලිපිය දුවගේ ලිපියට වඩා මොනතරම් වෙනස්දැයි දැන් කියවන විට සිතේ.

දුරු රට තනි ව සිටි කාලයේ මිතුරෙකුගෙන් ලැබුණු එකම ලිපිය අද අප අතර නැති අපි හැමගේම කල්‍යාණ මිත්‍ර (IPB) සෝමෙගෙනි. එය මට ලැබෙන්නේ ෆින්ලන්තයේ හෙල්සින්කි හෙල්කා හෝටලයේ සිටි කාලයේය.

'ඔබ දිවයිනෙන් පිටවන දා ඇඳිරි නීතිය නිසා හමුවීමට එන්න නොහැකි වුණා. ඔබේ දුරකතනය ද වැඩ කළේ නෑ. ඒ මොනවා වුණත් කමක් නෑ අවශ්‍යම දෙයක් සිදු වූ නිසා. දැන් තරමක සැහැල්ලුවෙන් රටවැසියා ජීවත් වෙනවා. පළාත් සභා 7 න් 4 ක් එ.ජා.ප. ය ජය ලබුවා. 3ක් බස්නාහිර කෙලින්ම පුටුව. දකුණ සහ වයඹ ලලිත්ලයි ශ්‍රී.ල.නි.ප. එකතුව. වෙනස එක ආසනයයි. බස්නාහිර මහ ඇමති චන්ද්‍රිකා. හැරල්ඩ් කෙලින්ම රජ ගෙදර. මාලිමගේ වෙනුවට අපෙ සුනිල් සරත් පෙරෙරා. සිළුමිණ කර්තෘකම තිලකරත්න කුරුවිට බණ්ඩාරට ලැබෙන හැඩයි. සෙරෙප්පුවාට දැන් වැලේ වැල් නෑ. ලූෂන් සමග බන්දුල ආපසු ගන්න කටයුතු යොදන ලෙස හැරල්ඩ්ට කිව්වා. අවසඳත් කොහොමහරි පෙන්නගන්න ඕනෑ. ලොරන්ස් යටතෙ තිබුණ මැර හමුදාව විසුරුවා හැරියා ඔවුන්ගේ කාර්යාලයට සීල් තිබ්බා. විනී හෙට්ටිගොඩ, සුනිල් මාධව ඇතුළු මුළු ලක්දිව කර්තෘ මණ්ඩලයම ඉල්ලා අස්වුණා. සොඳුර කියා කුනුහරුප පත්තරයක් ගහනවා. ලක්දිවේ ලිපියක් සුනිල්ට නොකියා අරගෙන දාලා. පෙරේදා පොලිස්පති දාපු නඩුව තිබුණා ලක්දිවට විරුද්ධව. ඇපයට අත්සන් කළේ සුනිල් ආරියරත්න සමග සුනන්ද මහේන්ද්‍ර. ඔබේ ගෙදර ගියා දූල දෙන්නත් සමග. මේ ඉරිදටත් යනවා.

ඉඩ ඇති විට ගොස් ඕනෑ එපාකම් සොයා බලන්නම්. පුළුවන් තරම් ඇවිදින්න. නරක වැඩ කරන්න යන්න එපා. ඔබ නැතුව තරමක් පාළුයි. හවසට ලිෆ්ට් දෙන්න කෙනෙක් නෑ. යමක් ඇතොත් මට දන්වන ලෙස ගීතාට කියන්න. අපෙ ආදරය හා ලබැඳියාවත් ඔබට.' ළබැඳි මිතුරකුගේ එවන් ප්‍රාර්ථනාවක අගය දැනෙන්නේ දුරු රටක තනි වූ සිතකට පමණකැයි සිතේ.

ගීතා එවා තිබූ ලිපි වසර විසි අටකට පමණ පසුව කියවන්නට ලැබීමෙන් අළු යට ගිනි පුපුරක් ලෙසින් සැඟවී තිබෙමින් වේදනා දුන් මතකය යළි අවදි වූ සෙයක් දැනිණ. මොනයම් හෝ හේතුවකින් මේ ලිපි විනාශ කොට තිබුණා නම් මෙලෙස දුකක් නොදැනෙන්නට ඉඩ තිබිණ. එහෙත් මේ අතීත මතක වේදනා සොඳුරුය. ඒ වේදනා මැද ඇගේ දයාබර මුහුණ මෙන්ම සොඳුරු මිතුරකුගේ මුහුණ ද මැවී පෙනුණ නිසාය. අද වැඩිහිටියන් වී සිටින දූ පුතුන්ගේ ළමා ලෝකයට යන්නට ඉඩ ලද නිසාය.

**බුද්ධදාස ගලප්පත්ති**



# ටොම්සන් මහත්තයා

## සටන

උන්නැහේ මොකද මේ උදේම ලෑස්ති වෙන්නේ ... කොහේ යන්නද? මේ වතුර බෝතලේකුත් කරේ එල්ලා ගෙන. හරියට ඉස්කෝලේ ළමයෙක් වාගේ...” කියා ටොම්සන් මහත්තයා ඇසුවේ උදේම හරි බරි ගැහෙන උන්නැහේගෙනි.

උන්නැහේ ටොම්සන් මහත්තයාට පිළිතුරු නොදී කුරහන් රොටී දෙකක් ද කඩදාසියක ඔතා මල්ලක දමා කරේ එල්ලා ගත්තේය.

“ඒ කියන්නේ... උන්නැහේ අද බොහොම බරසාර වැඩකට යනවා වාගේ...” කියා ඇම්බන් මහත්තයා ද සාලයට එමින් කීවේය.

“ඔව්... මං යනවා සටනකට....” කියා උන්නැහේ කීවේය.

“ඇත්තට... ඒ කියන්නේ විජිතපුර සටන වගේ එකකට ද? ඒකට නං අලිත් ඕනැ වෙයි.. නැතිනම් තාප්ප පෙරළන්න බැරි වෙයි.” කියා ටොම්සන් මහත්තයා සිනාසුණේය.

“නෑ... ටොම්සන් මහත්තයා... මේකත් එක විදිහක විජිතපුර සටන වගේ එකක් තමයි... විජිත නැතුව සටන් තියෙනව ද? අනික මේ කාලේ තාප්ප පෙරළන අලි නම් හොයා ගන්න නෑ... ඔය ගම්වැදිලා ගෙවල් පොඩි කරන අලි නම් ඔය කැලෑබද ඉන්නවානේ...”කියා උන්නැහේ යන්නට පිටත් වුණේය.

“හරි ඉතින් උන්නැහේ... ටිකක් කියලා ගියා නම්, අපටත් ඔය සටනකට කර ගහන්න බැරි කමක් නැනේ... අනික උන්නැහේත් සම්බන්ධ වෙන සටනක් නම් අපිත් ඒකට හවුල් වෙන්න එපායැ...” කියා ඇම්බන් මහත්තයා හරස් වුණේය.

“මේක මේ මිල සටනක් ඇම්බන් මහත්තයා... දැන් බලන්ඩ බඩු මිල අහස උසට නැගලානේ... ඉතින් මම මේ යන්නේ බඩුමිල ඉහළ යෑමට එරෙහිව කෙරෙන සටනකට... කැමති නම් එන්න මාත් එක්ක...” කියා උන්නැහේ ආපිට හැරී කීවේය.

ටොම්සන් මහත්තයා “හොක් හොක්” ගා සිනාසුණේය.

“ඒක මිසක්.... බඩු මිල ඉහළ යන එකට විරුද්ධව සටන් කරන්නම ඕනෑ... උන්නැහේ පරණ පත්තර කියවලා තියෙනවා ද?” කියා ටොම්සන් මහත්තයා ඇසුවේය.

“ඇයි මං පරණ පත්තර කියවන්නේ...? මං ඔය විභාගවලට ඉගෙන ගන්නවා ද? නැහැ නේ... මං කියවන්නේ අද පිට වෙන පත්තර විතරයි... ඒවයේ තමයි හොඳ හොඳ ප්‍රවෘත්ති තියෙන්නේ... නිකම් හිතන්න ටොම්සන් මහත්තයා... පවුලකට අද ලුණුයි බතුයි කාලාවත් ජීවත් වෙන්න පුළුවන් ද? ඒ තරම් බඩු මිළ ඉහළ ගිහින්නේ...” කියා උන්නැහේ තරමක කේන්තියෙන් කීවේය.

“හරි ඉතින්... බඩු මිල ඉහළ යන එකට කාට විරුද්ධව ද ඔය සටන් කරන්න යන්නේ....? කවුද ඕක සංවිධානය කරන්නේ...? සටන් කරපුවාම බඩු මිල අඩු වෙනව ද?” කියා ඇම්බන් මහත්තයා ප්‍රශ්න පෙළක්ම ඇසුවේය.

උන්නැහේ ගමන නවතා පුටුවක හිඳ ගත්තේය.

“අපි යන්නේ ආණ්ඩුවට විරුද්ධව සටන් කරන්න... මේ සටන සංවිධානය කරන්නේ විජිතපුර බලකොටුවේ අයම තමයි... අපි මේවට නිකම් ඉඳලා හරි යනව ද?”

“නැතුව නැතුව... ඔය නිදහසෙන් පස්සේ ගත වෙච්චි මුළු කාලෙම කරලා තියෙන්නේ සටන් කරන එක තමයි... හැබැයි එක මිරිස් පැළයක් හිටුවන්න සටනක් කරලා නෑ...” කියා ඇම්බන් මහත්තයා කීවේය.

“මිරිස් හිටවන එක අපේ වැඩක් නෙවෙයි... ඒවා ආණ්ඩුවේ වැඩ...” කියා ගෙන කඩා ගෙන බිඳ ගෙන ආවේ විජිතපුර බළකොටුවේ කෂ්ටියකි. ටොම්සන් මහත්තයාත්, ඇම්බන් මහත්තයාත් අන්දුන් කුන්දුන් වූහ.

“අනේ.. විජිතපුර මහත්තයෝ... මං මේ පිටත් වෙන්න හදන කොටම මේ වාදයකට පැටලුණා නේ... යමු යමු...” කියා උන්නැහේ පිටත් වෙන්නට හැදුවේය.

“නෑ... කමක් නෑ... තව ටිකක් වෙලා පරක්කු වුණාට කමක් නෑ... සටනට වුණත් පස් මහ බැලුම් බලන්න එපායැ...” කියා විජිතපුර මහත්තයා පුටුවක හිඳ ගනිමින් කීවේය.

“මොකක්ද ටොම්සන් මහත්තයා... අර පරණ පත්තර කතාව.. මට ඒක තේරුණේ නෑ...” කියා ඇම්බන් මහත්තයා කතාව ආපස්සට හැරෙව්වේය.

“පරණ පත්තර කියන්නේ... ඔය ඕනෑ කාලෙක පරණ පත්තරයක් අරන් බලන්න... එදා ඉඳන් අද වෙනකං බඩු මිල සටන කරලා තියෙනවා... හැබැයි... බඩු හදන සටනක් කරපු කවුරුවත් නෑ... දැන් නිකම බලන්න... අපිට මේ බඩු මිල ප්‍රශ්නය එන්නේම ඔය කුඹුරේ හේනේ වැවෙන දේවලින් නේ... ඒවා හදන්නේ කවුරුවත්... විකුණන්නේ කවුරුවත්... හදන අයට හරි මිලක් ලැබෙන්නෙත් නෑ... විකුණන අය තමයි ගාණ කපා ගන්නේ... ඒකනේ බඩු මිල ප්‍රශ්නේ හැමදාම සටනක් කියන්නේ...” කියා ටොම්සන් මහත්තයා ඇසුවේය.

“එතකොට ආණ්ඩුවක් තියෙන්නේ මොකට ද?” කියා විජිතපුර මහත්තයා කෝපයෙන් ඇසුවේය.

“ඒ ප්‍රශ්නේ වැරැද්දක් නෑ... ආණ්ඩුව මේවාට වග කියන්න ඕනැ තමයි.. හැබැයි ආණ්ඩුව පත් කරපු මිනිස්සුත් වග කියන්න ඕනෑ.. ඒ වගකීම පැහැර හැරලා ආණ්ඩුවත් එක්ක සටන් කරලා ඇති පලේ මොකක්ද?” කියා ටොම්සන් මහත්තයා ඇසුවේය.

“මොකක්ද ඒ කතාව... ආණ්ඩුව ගත්තා නම් බඩු මිල අඩු කරන්න ඕනෑ... එච්චරයි මං කියන්නේ...?” කියා විජිතපුර මහත්තයා ආයෙත් කීවේ සැරෙනි.

“ඔව්... ඔව්... ආණ්ඩුවට ඒ වගකීමෙන් බේරෙන්න බෑ... ඒකට නේ වෙළෙඳ ඇමති කෙනෙක්... කෘෂිකර්ම ඇමති කෙනෙක් පත් කරලා තියෙන්නේ... ඒ ගොල්ලෝ තමයි මේ බඩු මිල ප්‍රශ්නයට විසඳුම් දෙන්න ඕනෑ...” කියා උන්නැහේ කීවේය.

“මං මේ තරහට අහනවා නෙවෙයි විජිතපුර මහත්තයෝ... දැන් ඔය බඩු මිලට එරෙහි සටන කරන්නේ ඇත්තටම මිනිස්සුන්ට ආදරේට ද? ඇත්තටම බඩු මිල අඩු කරන්නම හිතා ගෙන ද?” කියා ටොම්සන් මහත්තයා විජිතපුර මහත්තයාගෙන් ඇසුවේ බොහොම ළාවටය.

විජිතපුර මහත්තයා ඒ මේ අත බැලුවේය.


“ඕක මෙතන කෑ ගහන්න එපා ටොම්සන් මහත්තයා... අපිත් දන්නවා රටක බඩු මිල වැඩි වෙන කොට ඒකට කරන්න ඕනෑ සටන් කරන එක නෙවෙයි... රටේ නිෂ්පාදනය වැඩි කරන එක කියලා... ඒ වුණාට නිෂ්පාදනය වැඩි කරන වැඩ අපේ ගාව නැහැනේ... ඒකයි ප්‍රශ්නේ... අපි ඉන්නවා කියලා රටට දැනෙන්නත් එපායැ.. අනික ආණ්ඩුව වුණත් හොල්ලලා තියා ගන්න ඕනෑ නේ... ඒකයි මේ...”

“ඒක මිසක්... නැතිනම් විජිතපුර මහත්තයෝ... ඇත්තටම රටට ආදරේ නං ඔය ගෝල බාලයෝ ටිකත් එක්ක කෘෂි බලකායක් හදා ගෙන, රට පුරා ගොවිපොළවල් දැම්මා නම්... ආණ්ඩුවත් නන්නත්තාර වෙනවා.. විජිතපුර මහත්තලාට රටේ මිනිස්සුත් කැමති වෙනවා.. ඒ ගැන ටිකක් හිතුවොත් මොකද?” කියා ටොම්සන් මහත්තයා ඇසුවේය.

“වැඩේ නම් හොඳයි... ඒ වුණාට අපට ඒවා කරලා පුරුදු නෑනේ... අපට පුරුදු ඔය වගේ සටන් කරලා විතරයි... අපි ඒකම කර ගෙන ඉන්නම්... අපි යමු උන්නැහේ ... දැන් නම් සටන් සගයෝ ඇවිල්ලා ඇති... අපි යමු...” කියා විජිතපුර මහත්තයා උන්නැහේද ඇද ගෙන යන්නට ගියේය.

**බන්දුල පී. දයාරත්න**











# හිමි වීම් අහිමි වීම් ජීවිතය නොවේ ද?

අවුරුද්ද 1999ය. නෝර්වේජියානු වැසියකු වන ට්‍රොන්ඩ් හැට හත් හැවිරිදි වියේදී සිය විශ්‍රාමික දිවිය ගත කරන්නට එන්නේ එයට වසර හතළිහකට පෙර තමන් ජීවත් වූ බිම්කඩටමය. එය ඝන වනාන්තරයකින් වැසුණු, එමෙන්ම ගඟකින් හැඩ වුණු සුන්දර නිම්නයකි. රුස්ස ගස් වැඩී ඇත්තේ පවුරක් විලාශයෙනි. අවුරුදු පහළොවේදී ඔහු මේ වනාන්තරය දැක්කේ මේ ආකාරයටමය. ජීවිතය වෙනස් වුවද පරිසරය වෙනස්ව ගොස් නැත. ශීත ඍතුව බැවින් හැම තැනම පාහේ හිමෙන් වැසී ඇත.

මෙයට මාස කිහිපයකට පෙර සිදු වූ රිය අනතුරකින් ඔහුගේ භාර්යාව මිය ගොස්ය. එම මරණය ඔහුට පීඩාවකි. එය සිදු වූ සිදු වුණේ ඔහු අතින් යැයි හෘදය සාක්ෂිය ඔහුට වධ දෙයි. එබැවින් ඔහු තම උපන් ගම් පෙදෙසට ආපසු එන්නේ හිත හදා ගන්නටත් එක්කය. ඔහු ජීවත් වන්නේ හුදෙකලාවය. මේ කතාව අපට කියන්නේ ද ඔහුමය.

2019 වසරේ ඇකඩමි සම්මාන උලෙළ සඳහා නෝර්වීජියානු ඉදිරිපත් කිරීම වූ Out Stealing Horses ඇරඹෙන්නේ එහෙමය. ගිය වසරේ බර්ලින් සිනමා උලෙළේ හොඳම චිත්‍රපටය සඳහා ලැබෙන ගෝල්ඩන් බෙයා සම්මානය සඳහා තරග වැදුණු චිත්‍රපටය විශිෂ්ට නිර්මාණ දායකත්වය උදෙසා සිල්වර් බෙයා සම්මානය දිනා ගත්තේ, එය කිසිසේත් නොසලකා හැරිය නො හැකි චිත්‍රපටයක් ලෙස සමස්ත චිත්‍රපට රසිකයන්ගේ ආදරය දිනා ගත් නිසාමය.



Out Stealing Horses අධ්‍යක්ෂණය කරන ලද නෝර්වේජියානු සිනමාකරුවකු වන Hans Petter Moland ගේ මුල්ම සිනමා කෘතිය 1993 වසරේ දී එළිදුටු The Last Lieutenant නම් වෙයි. පසුව Aberdeen, the beautiful country, A Conspiracy of Faith ඇතුළු ඔහු විසින් නිර්මාණය කරන ලද සිනමාපට ප්‍රේක්ෂකයන්ගේ මෙන්ම විචාරකයන්ගේ ද අති මහත් ප්‍රශංසාවට බඳුන් විය. ඔහු විසින් ඉංග්‍රීසි බසින් නිර්මාණය කරන ලද Cold Pursuit මෙරට පහසුවෙන් සොයාගත හැකි චිත්‍රපටයකි. එය කලකට ඉහත නෝර්වේ දී ඔහු නිෂ්පාදනය කළ In Order of Disappearance චිත්‍රපටයේ ප්‍රති නිර්මාණයක් විය.

COME AND SEE

ඔහුගේ Out Stealing Horses චිත්‍රපටයේ ප්‍රධාන චරිතය රඟපාන සුප්‍රකට සිනමාකරු Out Stealing Horses, හාන්ස්ගේ දිගුකාලීන මිතුරෙකි. හාන්ස් නිර්මාණය කළ බොහෝ චිත්‍රපට සඳහා රංගනයෙන් නිතර දායක කරගන්නා රංගන වේදියකු වන්නේ ද ඔහුය. තෝර්, ඇවෙන්ජස්, මමාමියා ඇතුලු මෙරට ප්‍රේක්ෂකයන් අතර ජනප්‍රිය චිත්‍රපට රාශියකම මේ කෘතහස්ත නෝර්වේජියානු රංගවේදියා අපට දැකගත හැකිය.

Out Stealing Horses චිත්‍රපටයට හාන්ස් පාදක කර ගන්නේ පෙර් පීටර්සන් විසින් 2003 වසරේ දී නෝර්වීජියානු බසින් රචනා කරන ලද නවකතාවකි. එය විවිධ භාෂාවන් රැසකට පරිවර්තනය වූ නවකතාවක් වන අතර ලොව ඉහළම ත්‍යාග මුදලක් හිමි වන සාහිත්‍ය ත්‍යාගය වන ඩබ්ලින් ඉම්පැක්ට් සම්මානය ද හිමි කර ගත්තකි.

නිස්කලංක ජීවිතයක් ගත කරන්නට තමා මුලින් ජීවත් වූ පරිසරයට පැමිණෙන ට්‍රොන්ඩ්ට නිසලව දිවි ගෙවන්නට ලැබෙන්නේ ටික දිනකි. ඒ පළාතටම පැමිණි අලුත් අමුත්තකු ඔහුට මුණ ගැසේ. කවදාක හෝ අතීතයේ දවසක ඔහු මුණ ගැසුණ වග ට්‍රොන්ඩ්ට විස්වාසය.

සිනමා පටය තවත් අතීතය කරා ඇදී යයි. ඒ සුලබ අතීතාවර්ජනයක් නොවේ. අතීතාවර්ජනය බොහෝ විට සිනමා තිර රචකයන් අපේ රටේ නම් උපයෝගී කරගන්නේ චිත්‍රපටය ගොතා ගන්නට බැරි වූ විට සක්කයක් හැටියට ය. එහෙත් මේ සිනමා කෘතිය එසේ නොවේ. එය වර්තමානය හා අතීතය අතර දෝලනය කරවන්නට සිනමාකරු සමත් වෙයි. මේ අලුත් ආගන්තුකයා වසර හතළිහකට පෙර තම අසල්වැසි ගැටවරයා වූ බැව් ට්‍රොන්ඩ්ගේ විශ්වාසයයි.

1948 වසරේ පහළොස් හැවිරිදි ට්‍රොන්ඩ් මේ වෙසෙන්නේ තම කඩවසම් පියා සමඟය. පියා ගස් කපන්නකු හැටියට ජීවත් වෙයි. තාත්තාත් පුතාත් සතුටින් එහි දිවි ගෙවයි. අසල්වැසි ගැටවරයෙකු වන ජෝන් ඔහු හා මිතුරු වෙයි. ඔවුන් වනයේ නිදැල්ලේ හැසිරෙන්නේ අසුන් අල්ලා ගන්නටය. මේ සෙල්ලමක් වුවත් අනතුරුදායකය. ජෝන්ගේ පවුලේ කුඩා නිවුන් දරුවන් දෙදෙනකු ඇත. මේ දරුවන් බලා ගැනීමේ වගකීම පැවරී ඇත්තේ ද ඔහුට ය. එහෙත් එකෝමත් එක දවසක මේ නිවුන් දරුවන් අතුරින් එක් අයකු අතින් නිවෙසේ තිබූ තුවක්කුවක් පත්තු වෙයි. එයින් අනෙකා ජීවිතක්ෂයට පත්වෙයි.

දරුවා ගේ අවමඟුල දා ට්‍රොන්ඩ්ට ඔවුන්ගේ පියකරු මව මුල් වරට මුණ ගැසෙයි. ගැටවර වියට එළැඹෙන ට්‍රොන්ඩ් මේ සුරූපී කාන්තාවගේ දැක්මෙන් වශීකෘත වෙයි. මේ වනාන්තර අඩවියේ ඔහු දකින වෙනත් කාන්තාවක් ද නැත. එහෙත් මේ කාන්තාව පිළිබඳව ඔහුගේ බලාපොරොත්තු බිඳ වැටුණේ ඇය ඊට පෙර යුද සමයේ සිය පියා ආදර සබඳතාවයක් තිබුණු කාන්තාවක් වග පෙනී යාමත් සමගය. පියා මෙන්ම ඇය අයත් වන්නේ නාසි විරෝධී කණ්ඩායමක සාමාජිකයන්ටය. මේ සබඳතාව තවමත් ඉතිරි වී පැවතීම ට්‍රොන්ඩ්ගේ අපේක්ෂා භංගත්වයට හේතු වේ. කපන ලද ගස්, ගඟ දිගේ ස්වීඩනයට ගෙන යාමට වෑයම් කරන පියාගේ සහයට ජෝන් ගේ පියා ද එයි. එහෙත් ගසක් කඩා වැටීමෙන් ඔහු අනතුරට පත් වෙයි.

චිත්‍රපටය පුරාම පුතු විසින් සිය පියා ද අසල්වැසියන් ද දුටු ආකාරය ඉතා සියුම් අන්දමින් විග්‍රහ කරනු ලැබේ. සිය පළමු ආදරවන්තිය ද භාර්යාවද අහිමිවන මිනිසකු ගේ අත්දැකීම් හරහා ගොඩනගන ඔහුගේම හෘද සාක්ෂිය අභ්‍යන්තරය සිනමාකරුගේ විවරණයට බඳුන් වෙයි. එය අවසන් වනුයේ තම ආදරණීය භාර්යාව ගේ මරණය පිළිබඳව පශ්චාත්තාප වීමෙන් ඔහු මිදීමත් සමඟමය. රිය අනතුර සිදු වන්නේ ඔහු අතිනි. මරණයට පත් වූ භාර්යාව පමණක් නොව ජීවිතයේ වරින් වර සිදු වන හිමි වීම් සහ අහිමිවීම් සාමාන්‍ය මිනිසකුගේ ජීවන අන්දරයේ කොටස් බවට පත් වෙයි.

මෙය ඉතා රමණීය සහ හෘදයාංගම සිනමා අත්දැකීමක් බවට පත් වනුයේ ඉතා ඉක්මනින් හැසිරෙන රූපරාමු මෙන්ම රිද්මයානුකූලව සංස්කරණයත් සමඟය. සිනමාකරු කැමරාව ඉදිරියේ පරිසරයට ද ජීවිතය ද බද්ධ කරයි. හැම රූපයක්ම සංස්කරණයක්ම ද හැම ශබ්දයක්ම සංස්කරණයක්ම ද සිනමාකරු මනා වෙළුමකින් බඳවා තබාගනියි කාලගුණ විපර්යාසය හා මුසු වන ශබ්ද රටාවන් ගෙන් සිනමාකරු ගෙන එන්නේද පෙර සිනමාකරුවකු නුදුටු තරම් නවමු අත්දැකීමක් බව සටහන් කළ යුතුමය. විශිෂ්ට සිනමා සංගීත භාවිතය එය තවත් ඉහළ නංවයි. සුන්දර පරිසරයක වුව මිනිසුන්ගේ යටි සිත අවදි කළ පසු ඔවුන්ගේ සැඟවුණු අතීතයක දුක්ඛ දෝමනස්සයන් ද ඉන් අභ්‍යන්තරයෙහි සැඟවුණු ශෝකජනක කතාව ද අපට ඉස්මතු වේ. ළමා හා ගැටවර වියේ දී දුටු සිහින ජීවිතය මිහිරි හා අමිහිරි සිහින, ජීවිතයේ අවසානය දක්වා හඹා යයි. අසල්වැසියා හා තමා අතර පැවති හෙළි නොවන අත්දැකීම් අතර ඇත්තේ පොදු එකඟතාවකි.

හදවත බිඳී ගිය ද ඒ සිනමාකරු වචනයෙන් විස්තර කරන්නට යන්නේ නැත. ඒ වෙනුවට ඔහු විටෙක චාල්ස් ඩිකන්ස්ගේ ඩේවිඩ් කොපර්ෆීල්ඩ් ග්‍රන්ථය එහිලා අපූරුවට භාවිත කරයි. ජීවිතයෙන් පලා යා නොහැකි බොහෝ සිහිවටන එමටය. ජීවිතය යනු ඇති වීම් හා නැති වීම්වල සිදුවීම් මාලාවකි. සමහර නිර්මාණ ලොව ඉහළම සම්මානවලින් පිදුම් නොලබන බව ඇත්තය. එහෙත් ඒ සිනමා කෘති ප්‍රේක්ෂක සන්තානයේ සදාකාලික සිහිවටන බවට පත් වේ. සමහරවිට එදා සම්මාන නොලැබුණු දේට අදටත් වඩා හෙට ලෝකය සලකනු ඇත. ලෝකයේ මහා සිනමා කෘතිය වූ සිටිසන් කේන් ද එබඳු ගණයේ චිත්‍රපටයකි. Out Stealing Horses චිත්‍රපටය සිටිසන් කේන් හා සම තත්ත්වයේ තබා සලකන්නේ නැති වුව ද ඒ චිත්‍රපටය ගැන පෞද්ගලිකව මට සිතෙන්නේ අදටත් වඩා හෙට වටිනා බව ය.

**අරුණ ගුණරත්න**

## ගිනි නොදෙන් තාත්තේ මගේ බුදු අම්මාට

දඩු මොනරෙ පිටිපස්සෙ පිට කොන්ද බදාගෙන
අම්මගේ අයිතියට කණකොකා හඬාගෙන
ඉගිළ ගිය තැනැත්තී නොදුටු සේ දරාගෙන
ගෙදර ආවේ එදා මං කඳුළු පුරෝගෙන

අම්මගේ වත කමල ටිකෙන් ටික මැලවුණා
හිනා මල් වසාගෙන කඳුළු ගස් පැලවුණා
හයට ගෙට ආව නුඹ දොළහටත් නැති වුණා
තාත්තේ මමත් අම්මට හොරෙන් වැලපුණා

ආදරේ ඉතිර ගිය අපෙ කුරුලු කැදැල්ලේ
අඬදබර ඉගිළුණා නිදහසේ නිදැල්ලේ
උණු කඳුළු හංගගෙන දිවා රෑ මුළුල්ලේ
අම්ම අප සැනසුවා තියා ඇගෙ තුරුල්ලේ

කියයි තහනම් ගහේ ගෙඩි බොහොම රස කියා
ඒ රසය විඳින්නට නුඹ අපෙන් දුර ගියා
රස යටින් තිබුණු වස දුටිම් පැතිරෙන නියා
කැදැල්ලේ තිබු සතුට ඒ විසෙන් මිය ගියා

ආදරේ නොදුන්නත් අම්ම ඔබ නැති දාට
ඉකි බිඳුම් හිර කරන් අඬනවා මහ රෑට
තටු සිඳුණු කෙවිලියක් නිල් අහස දුටුවාට
කොහොම ඉගිලෙම් ද දුක හිතෙනවා ඇති ඈට

නුඹෙ ඇසට පරඟනක් රසඳුනක් වූවාට
නිවෙසෙ දෙවඟන අම්ම විතරමයි හැම දාට
හිතින් මැරි මැරි තවත් නුඹෙ හෙවණෙ උන්නාට
ගිනි නොදෙන් තාත්තේ මගේ බුදු අම්මාට

**දිල්රූ ජයසේකර**





# පන්නකාරයෝ

ඇඩ්ඩිං අයියාගේ පුංචි කඩේ තිබුණෙ වැල්ලට ළං වෙන්න. තොඩුවාව වැල්ල ළඟින් තමයි; ඇඩ්ඩිං අයියාගෙ පැලලි කඩේ. එතෙන්ට ආවගිය හුග දෙනෙක් වැල්ලෙ දැල් පන්නකරුවො. තෙප්පම ඇදං වැල්ලෙ එපිටහ මූදට යන කොට, ඇඩ්ඩිං අය්යාගෙ කඩේ දොර කෑල්ලක් ඇරෙනව. කෝපි උගුරක් හරි, උදේ පාන්දරිං තොලගාන්න කවුද ඉතිං කැමති නැත්තෙ?

දර ලිපේ තඹ මුට්ටියේ වතුර ටික කොච්චරවත් කොඩ්ච්ච වෙච්චි ගමං. හොඳට උතුරල උණුවෙච්ච වතුර දාපු කෝපි උගුර පහලට වැටෙද්දි; පෙණහලු පිරිල පිපිල යනව. කට්ට සම්බලක් එක්ක උණු උණුවෙ කැකුළු හාලෙ බත් හැන්දයි, ජාඩි හොද්දයි වැල්ලෙ උන්ට දිව්ය බෝජන වගෙ. සන්තානං මෑණියන්ට පඬුරු ගැට ගහල වැල්ලෙන් එහා කරිජ්ජ දියඹ දකින එකත් ලේසිපාසු සෙල්ලමක් නං නෙවේ.

බෙන්ජල, රෝජල, ඇන්ටනිල, ජෝසප්ල මහ පාන්දර පපුවෙ කුරුසය ඇඳල පිටත් වෙන්නෙ වැල්ල එපිටහ සප්ත මහ සාගරේට. තෙප්පම් බෝට්ටු එක පෙළට වගෙ රුවල් දිග ඇරෙනව මහ ඈත දියඹට. සාල දැලකට, සූඩ දැලකට, වාරු දෙන්න ගොඩ වැල්ලෙ සපිරිවර ඉන්නෙ බලාපොරොත්තු මහ හුගක් පුරෝගෙන. ඉර උඩහින් යන්තමට මෝදු වෙද්දි තෙප්පම් මාලු බෝට්ටු ගොඩට වඩින්නෙ අපූරුවට. කොල්ලො කුරුට්ටො, පවුලේ එවුන් නෑ සනුහරේම වගෙ එන්නෙ; මාලු තෙප්පංවලට අත් ගහන්න. දැන් වාගෙ ට්‍රෝලර් බෝට්ටු ඒ දවස්සල එමට නෑ. වැල්ලෙ හැම පවුලකටම වගෙ වැල්ලෙ තෙප්පමක් දෙකක් තිබුණ, කරුමාන්තෙ කරගෙන යන්න.

මේ වෙලාවට තමයි ඇඩ්ඩිං අයියගෙ වැල්ලෙ කඩේට ඇතිපදං වැඩ වැටෙන්නෙ. ඊයෙ රාත්තිරියෙ ඉඳල ඉවුව වෑංජන ඉවර වෙන්නත් ඇවිදිං. ඒත් මාලුපිනි රත් කර කර ආයෙම ගන්නව. පිළුණු වෙලා, බලු පැටියකුටවත් දෙන්න ඉඩක් නැතුවම හොදි මාළු පිනිවලට ඉල්ලුම ඕනෑ තරං. ඇඩ්ඩිං කුඩු තමයි රහටම තියෙන්නෙ, ඇඩ්ඩිං අයියගෙ කඩේ. ඇතිලිවල ඉතුරු වෙච්ච සේරෝම වෑංජන එකට එකතු කරල හොඳට හින්දවල කෑමට ගන්නවා. ඒකටයි කියන්නෙ 'ඇඩ්ඩිං කුඩු' කියල. වැල්ලෙ ගනුදෙනුකාර හවතුන් ඔක්කොම වගෙ ඉල්ලන්නෙම ඇඩ්ඩිං කුඩු. මිරිස් මාළු පිනි පදමට පෙළක්දාට



ඇහෙන් කටෙන් සැර පිටවෙන ගානටයි රහ තුන් ලෝකෙවත් නැතුවැති එහෙම රහක්. දියඹෙ කරක් ගහල කරක් ගහල, වැල්ලට පය තියපු ගමන් දැනෙන මහ නිස්කලංකයි සන්හිඳියාවයි එක්ක ඇඩ්ඩිං අයියගෙ කඩේ කහට කෝප්පය හිතේ සතුට උළුප්පනව. ඊළඟ වාරෙ තෙප්පමේ මාළු දැල් බේරල කොටහ අරන් මාළු මණ්ඩියෙ මුදලාලිට දෙන එක ඇතුළු වැඩ කන්දරාව තෙප්පමේ අයිතිකාරයන්ගෙ ගෙදර ඇත්තො තමයි ඊළඟ වැඩවලට දෙන්නෙ අත්උදව්. ඒ ඇසිල්ලකට තමයි දැල් පන්නකාරයො කඩේ කොට බංකුවෙ වාඩියක් ගහන්නෙ. දැල්පන්න කාරයන්ගෙ වැඩයි; ඇඩ්ඩිං අයියගෙ කඩෙයි ජීවිත එකටම ඇඳිල.

ඇඩ්ඩිං මුදලාලිට දැන් පනහත් පැනල මහිතෙ. කසාදයක් කර ගන්නනං තිවුනෙම නෑ ඕනෙ කමක් උන්නැහෙට. හැබැයි ඇඩ්ඩිං ගෙ අම්මා තමයි දවාලක් රැයක් නැතුවම ඉවුම් පිහුම් කෙරුවෙ. හැත්තෑව පැන්නට මොකද උන්දැ දැලි පෙරාගත්ත ගමං වැඩ. ඇඩ්ඩිංගෙ නගිවං බන්දල දුන්නෙත් දැල් පන්නකාරයකුට. ඒකිටත් ළමයි දෙන්නෙක්. තොඩුවාව වැල්ලෙ විතරක් නෙවේ තලවිල, මාරවිල, මීගමු කොයි මාළුකාරයන්ගෙත් ජීවිත ගැට ගැහුණෙ ඕන් ඔයි විදිහට. වලාලෙ මූදට දියඹ දැකල, වාරකං වෙද්දි දැල් ආම්පන්න ලිහුම් පිළියම් කරන්නයි කාවි බඳින්නයි තමයි පටන් ගන්නෙ. පාන්දර තුවානං ගහද්දි මඩිස්සලේ ලෑස්ති කරගෙන ඉස්සන් දැලට හරි යන්නයි; බලන්නෙ. කක්කුට්ටෙක්වත් දැලට නැතුව සෝදා පාළුවෙලා ගෙදර එන දවස් එමටයි. සාගින්දරේ උහුලන්නම බැරිවුණොත් මාලයක් මුද්දක් උගසට තියලයි කීයක්හරි හොයාගන්නෙ. ඔක්කෝටමත් වැඩියෙ පල්ලියෙ මංගල්ලෙට කොඩිගහ උස්සන්න කලිං ගත්තු උගස් බේරලා කරල නුවානෙට ලෑස්ති වෙන්ඩෝන.

පල්ලියෙ සුවාමි ඉරිදා පූජාව ඉවර වෙලා හවස්කරේ එනව වැල්ලෙ අයගෙ දුක සැප බලන්නත්. "පර මණ්ඩල නමෝ මරියනි" කියාගෙන ලොක්කම්මල මහම්මල අප්පල තාත්තල සුරුවමට අතගහල වැඳල පවු සමා කරගන්නව පෙලක් දවස්සල....

පල්ලියෙ මංගල්ලය කියන්නෙ ගෙවල්වලටත් මහ මංගල්ලයක් වැල්ලෙ එවුන්ගෙ. මූදු පන්නකාරයන් ගෙ නෑයන් මිත්‍රයන් එනව මංගල්ලෙට සාද දාන්න, කෑම කන්න, පොඩි අඩියක් පුඩියක් ගහල සතුටු වෙන්න.

කොඩි ගහ උස්සපු දවසෙ ඉඳන් වැල්ලටම වැඩ. නුවාන සතියෙම පල්ලියෙ පූජාවට යන්න පේවෙනව බවලත් උදවිය. පල්ලියෙ ඉඳං වැල්ලට එන පාර පිරෙන්නම කඩ ලෑලි දිලිසෙනව සෙල්ලම් බඩු, සාරවිටකාරයො, රස කැවිලි විකුණන අය, කළුදොදොල් මස්කට් බූන්දි, ඉවරයක් නැති කෑම. පල්ලියෙ මංගල්ලෙ තමයි මංගල්ලෙ. එදාටම තමයි අලුත්ම ඇඳුම් කලේලි බහින්නෙ.

ඒත් මේ කාලෙට නං ඇඩ්ඩිං අයියාගෙ කඩේට කෝඩෙ ගහල. වාරකං ඇවිදිං වගෙ. යන්තං ඇඩ්ඩින් අයියගෙ අම්ම මේරි නෝනෙයි, ඇඩ්ඩිනුයි පල්ලියෙ මහ මංගල්ලෙට, මහ පූජාවට යන්න දැං ඉස්පාසුවක් නැතුවම වගෙ. සීනුව මහ හඬින් ගහනව. රතිඤ්ඤා පුපුරනව. මේරි නෝනාගෙ බඳ වටා අලුත් චීත්ත රෙද්දක් එතෙනව. හිස වටා දැල් රෙද්ද එතෙනව. වැල්ලේ බැතිමතුන් එක්කම මේරි අම්මයි ඇඩ්ඩිං පුතයි යනව ජේසු සුවාමි දරුවන් වෙනුවෙන් යදින්නට වැල්ලෙ පල්ලියට.

"මා මවුනී ඔබ... ප්‍රේමයෙන්....යාත්‍රාවේ !! ඔබ... ආධාරේ.....!!"

**ලක්ෂ්මී බෝම්බුවල**

# බිලි පූජා

## කැදැල්ලක නෙත



ඇය අරුණෝදයේ අසිරියට නැවුම් අරුතක් එක් කළාය. මිත්තණියගේ අතේ එල්ලී හැකිළෙන පැකිළෙන ඇගේ සොහොයුරා පවා දිරිමත් කරවන ඒ ළමා සිනාව මනසින් විනා දෙනෙතින් දකින්නට භාග්‍යවත් නොවන ඇගේ මව දුරු රටක වෙසෙන බව මම සිහිපත් කළෙමි.

මුනුපුරා සහ මිනිපිරිය පාසලට කැටිව යන මිත්තණිය දිගු දිවි ගමන් මග වෙහෙස නොතකා කැකුළු මල් පුබුදන්නට වෙර දරන අපූරුව.... වීරයෝ නැතැයි ආඩපාලි කියන අපට ඇය වීරවරියක නොවන්නේ මන්ද? දරුවන් උදෙසාම දරුවන්ගෙන් වෙන්ව දුක් දරන ඇගේ ලේලිය ද වීරවරියක් නොවේද?

අප කවර අන්දමේ අලංකාරික කතා කීවද අපේ රට මේ තරමින් හෝ පෙරට ඇදෙන්නේ මව් උණුසුම අහිමි මේ පොඩිත්තන්ගේ මව වැනි මැදපෙරදිග ශ්‍රමික කාන්තාවන් හේතු කොටගෙන බව අප සිහිපත් කළ යුතු වෙමු.



අධ්‍යාපනයේ ආලෝකය සොයා ඇදෙන දරුවන් දැකීම ද ප්‍රිය දසුනකි. එහෙත් ඒ අතරේ වේවැල් පහරින් මිය ගිය නව හැවිරිදි දැරිය පිළිබඳව අපේ සිත් සතන් නොරිදෙන්නේ නම් අප මනුෂ්‍යත්වයට නිගා නොකරන්නේ ද? රටක් ලෙස අප ලජ්ජාවට පත් විය යුත්තක් නොවේ ද මේ ඛේදජනක මරණය.

මිථ්‍යාවට ආවඩන සමාජයක මෙවන් සිදුවීම් අරුමයක් නොවේ. අමනුෂ්‍ය දෝෂයක් වැලඳී ඇතැයි කියමින් යකැදුරුවරියක වෙත ගිය මවකගේ ඇස් ඉදිරිපිට නව හැවිරිදි දැරියක වේවැල් පහර කා මරණයට පත්වීම? අධ්‍යාපන ඇමතිතුමනි වහාම ක්‍රියාත්මක වන පරිදි පාසල තුළ විද්‍යාව විෂයය ඉගැන්වීම අත්හිටුවන්න. හය වසරේ සිට විද්‍යාව උගත්තද අපේ රට වැසියන් දේවාල හා කට්ටඩියන් කරා ඇදී යන්නේ නම් විද්‍යාව විෂය ද එය ඉගැන්වීමට ගුරුවරුන් දරන වෙහෙස ද නිෂ්ඵල නො වේ ද?

වඩාත් සංවේග ජනක කාරණය වන්නේ නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ ද එකී සිදුවීම පිළිබඳව නිවේදනය කළ ආකාරයයි. දිවා පුවත් විකාශනයේදී නියෝජ්‍ය පොලිස්පති පොලිස් මාධ්‍ය ප්‍රකාශක අජිත් රෝහණ පවසා සිටියේ "නව හැවිරිදි දියණිය අමනුෂ්‍ය දෝෂයකින් පෙළෙන බව දැනගැනීමෙන් පසු, මව ඒ සඳහා ප්‍රතිකාර කරන කාන්තාවක් කරා යාමෙන් පසු, තෙල් සාත්තුවක් සිදුකර වේවැලෙන් පහර දෙන අතරතුර සිහිසුන් වූ දැරිය රෝහල්ගත කළ පසු මියගොස් සිටින බව දැනගන්නට ලැබුණු බවය." යනුවෙනි. එම ප්‍රකාශයෙහි "නව හැවිරිදි දියණිය අමනුෂ්‍ය දෝෂයකින් පෙළෙන බව දැනගැනීම" යනුවෙන් සඳහන් කිරීම වැරදි සහගත නොවේ ද? අමනුෂ්‍ය දෝෂ යන්නෙන් යන්නක් තිබෙන බව එයින් හැඟවෙන්නේ නැති ද? මිනිසාට වැලඳෙන කායික හා මානසික රෝග පිළිබඳව විද්‍යාත්මක තතු සහ පැහැදිලි කිරීම් පසෙක දමා මිථ්‍යා මත වැලඳ ගැනීම නිසාම පිපෙන්නටත් පෙර මිලින වූ මල් කැකුළෙන් අප සමාව අයැදිය යුතු නැද්ද?

පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයාගේ නිවේදනයේ අවසාන අඩ මා තුළ නම් දැන්වූයේ සංවේගය මුසු කෝපයකි.

මෙවැනි අවිධිමත් ප්‍රතිකාර ක්‍රම නිසා මීට පෙරත් කුඩා ළමයින් මෙන්ම වැඩිහිටි අය ද මරණයට පත්ව තිබෙන නිසා මේ පිළිබඳව මහජනතාව විමසිල්ලෙන් පසුවිය යුතුය.

මහජනතාව මුළා කොට බඩ වඩා ගන්නා තක්කඩියන් පිළිබඳව විමසිල්ලෙන් පසු වියයුත්තේ මහජනතාව පමණක් ද? නීතිය හා සාමය රකින්නේ යැයි කියනු ලබන ආයතනයන්ට ඒ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් නැද්ද? මේ කවර විලම්භීත කතාවක් ද ඕනෑම තක්කඩියකුට ඕනෑ හැටියේ හිටි පිනුම්, බඩ පිනුම් ගසන්නට ඉඩ හැර මෙබඳු ප්‍රකාශ කිරීමට සිදු වීම පොලිස් මාධ්‍ය ප්‍රකාශක ලජ්ජාවට හා කණගාටුවට පත් විය යුතු නැද්ද?

ගමක මෙබඳු අවිධිමත් හා අවිද්‍යාත්මක ප්‍රතිකාර සිදු කරන උදවිය පිළිබඳ ග්‍රාම නිලධාරී, පාසල, පන්සල ඇතුළු අනේක රාජ්‍ය නිලධාරීන් නොදැන සිටින බව ඇදහිය හැකි ද? දුටුවද නොදුටුවා සේ පසුවෙමින් රිස්සක් කරගන්නට ඉඩ හැරීම නිසාම මෙබඳු ඛේදවාචක සිදුවන බව වටහාගන්න ගැනීමට මහා ලොකු ඥාණයක් වුවමනා නැත.

යකැදුරුවරියකගේ අවිද්‍යාත්මක ප්‍රතිකාරය නිසා මියගිය දැරිය ඔබේ, මගේ, අපේ දියණියක් නොවන්නේ ද? ඇය ආදරයෙන් වැලඳගෙන සිප සනසනවා වෙනුවට, ඇය යම් රෝගාබාධයකින් පෙළුණේ නම් නිසි වෛද්‍ය ප්‍රතිකාර ලබා දී සුවපත් කර ගන්නවා විනා මෙබඳු ම්ලේච්ඡ හා අමානුෂික වූ ද කෲර වූ ද වධ බන්ධනයකට ලක් කිරීම පිළිබඳව හෘදය සාක්ෂියක් සහිත මිනිසුන් ලෙස අපට ඉවසා දරාගත හැකි ද?

පසුගාමී හා ගතානුගතික සමාජයක ගෝත්‍රික අදහස් පිරුණු ඝන අන්ධකාර යුගයක උපත ලැබූ පුංචි දුවේ, වේදනා විඳ අකල් මරණයකට ලක් වන්නට තරම් වන වරදක් නොකළ පුංචි දුවේ, ඔබට වැඩෙන්නට, අධ්‍යාපනය ලබන්නට ජීවිතයේ තව මහා දුරක් පිය නගන්නට ඉඩ නොදුන්නේ ඔබව හැදූ ඔබට තැළූ යකැදුරුවරිය පමණක් නොවේ. මුළු මහත් රටම ඔබේ මරණයට වගකිවයුතු වෙයි. ඔව් නිසැකවම කට්ටඩි තක්කඩින්ට නීති නොපැනවෙන්නේ නම්.... ඉහත සඳහන් කළ පරිද්දෙන්ම, අධ්‍යාපන ඇමතිතුමනි, විද්‍යාව විෂය පාසලෙන් ඉවත් කළ මැනව. සෞඛ්‍ය ඇමතිතුමියනි, සියලු රෝහල්වල වෛද්‍යවරුන්, හෙදියන් ඉවත් කර මේ ඊනියා මන්තරකරුවන්ට භාර දුන මැනව. එසේ වී නම් මෙවන් විපත් සිතට මහත් ශෝකයක් උරුම කර නොදෙනු ඇත.

**ශාන්ති දිසානායක**

# නොමැරී ඉන්න ඕනෑම නම්

යාළුවෙක් ගෙ ගෙදර පාඩම් කරන්න ගිය මල්ලිව ඒ ගෙදර බල්ලා හපලා. දකුණු කකුලේ දත් පාරවල් දෙකකුත් තියෙනවා. කට්ටිය ඉස්පිරිතාලෙ යන්න ලෑස්ති වෙනවා දැකපු එහා ගෙදර ඇන්ටි කිවුවෙ "ගෙදර හදන බල්ලෙක් නිසා කොහෙන් හරි තුවාලෙට බෙහෙත් ටිකක් දා ගත්තම ඇති." කියලා.

පිස්සු බලු රෝගය, එහෙමත් නැත්නම් ජල භීතිකාව ගැන අපි හැමෝම අහලා තියෙනවා. ගොඩක් වෙලාවට මේ ලෙඩේ හැදෙන්නෙ බල්ලෙකුගේ සපා කෑමක් නිසා වුණත් පූසො මුගටියො වගේ තවත් ගොඩක් සත්තුන්ගෙන් මේ ලෙඩේ හැදෙන්න පුළුවන්. හරියටම කියනවා නම් ගොඩක් කිරි බී වැඩෙන සතුන්ට මේ ලෙඩේ හැදෙන්නත් කිරි බී වැඩෙන සතුන් ගෙන් තව කෙනකුට බෝ වෙන්නත් පුළුවන්. ඒ නිසා සතෙක් හැපුවොත් බල්ලෙක් නෙවෙයි කියලා හොයන්නෙ බලන්නේ නැතුව ඉන්න එක නරකයි. අපිට අමතක වුණත් වවුලත් කිරි බී වැඩෙන සතෙක් නිසා උගෙනුත් අපිට ලෙඩේ හැදෙන්න පුළුවන්.

මේ ලෙඩේ තියෙන භයානකම දේ තමයි කෙනකුට ලෙඩේ හැදුණොත් අනිවාර්යෙන් ම මැරෙනවා කියන එක.

ඒ නිසා ම අපි හරියටම බෙහෙත විදගත්තොත් කාටවත්ම ලෙඩේ හැදෙන්නේ නෑ කියන පණිවිඩය හැමෝම දැනගන්න ඕනෑ.

ලෙඩේ වළක්වා ගන්න කරන්න ඕනෑ ලොකුම දෙයක් තමයි ඔබේ ගෙදර ඉන්න සුරතල් බල්ලට හරියට බෙහෙත් විදගන්න එක. මොකද පහුගිය අවුරුදු කීපය ගත්තම මේ ලෙඩෙන් මැරුණු ගොඩ දෙනකුට ලෙඩේ බෝ වෙලා තිබුණෙ ගෙදරක සුරතලයට ඇතිකරන සතකුගෙන්.

ඒ නිසා මුලින්ම ඔබේ සුරතලාව එන්නත් කරගන්න. ඊට පස්සෙ අනෙත් අයගෙත් සුරතල් සතුන් එන්නත් කරගන්න උපදෙස් දෙන්න.

බැරි වෙලාවත් ලෙඩේ තියෙන එන්නත් නොකරපු සතෙක් අපිව හැපුවොත්, නැත්නම් සීරුවොත් සතාගෙ කටේ නැත්නම් නියපොතුවල තියෙන විෂබීජය, හරියටම කියනවා නම් ජලභීතිකා වයිරසය තුවාලයට ඇවිත් අපේ ඇඟට ඇතුළු වෙනවා. ඊට පස්සෙ අපේ ස්නායු පද්ධතියට ඇතුළු වෙලා අපේ මොළයට යනවා. අන්න එහෙම වෙලා අපිට ජලභීතිකාව හැදුණොත් ඒක හොඳ කරන්න මේ වෙනකල් බෙහෙතක් හොයාගෙන නෑ.

ඒ නිසා සතෙක් හැපුවොත් හරි සීරුවොත් හරි ඉක්මනින් ඉස්පිරිතාලෙකට ගිහින් වුවමනා ප්‍රතිකාර ගන්න එක වැදගත්. විශේෂයෙන්ම සතා අසනීපෙන් ඉන්න, කෑම වතුර ගිලින්න අපහසුවක් පෙන්වන, ඇඟ පන නැති, කටෙන් කෙළ බේරෙන, දකින් දකින දේවල් හපන්න උත්සාහ කරන සතෙක් නම් සතාට ලෙඩේ තියෙන්න ගොඩක් ඉඩ තියෙනවා.

ඒ වගේම සතෙක් සපා කෑවාම තුවාලය හොඳට ගලා යන වතුරෙන් සබන් දාලා පිරිසුදු කරන එකත් වැදගත්. එතකොට තුවාලයේ තියෙන විෂබීජ ටික අයින් කරගන්න පුළුවන්.

ලෙඩේ තියෙන සතෙක් කෙනෙක්ව හැපුවම බෙහෙත විදගත්තෙ නැත්නම් සාමාන්‍යයෙන් මාස දෙකක් තුනක් ඇතුළත එයාට ලෙඩේ හැදෙනවා. හැබැයි හපා කෑම වෙලා සතියක් යනකොට ලෙඩේ හැදුණ වෙලාවල් වගේම සපාකෑමෙන් අවුරුද්දකට විතර පස්සෙ ලෙඩේ හැදුණු අවස්ථාත් ලෝකෙ වාර්තා වෙලා තියෙනවා.

ඒ නිසා සතෙක් හැපුවොත් අවදානමක් නොගෙන කල් නොයවා ඉක්මනින්ම එන්නත විදගන්න එක හරිම වැදගත්.

අනිත් කාරණේ ලෙඩේ හැදෙන්න කලින් වයිරසය ඇඟට ඇතුළු වෙලාද කියලා හොයාගන්න පුළුවන් පරීක්ෂණයක් මේ වෙනකල් හොයාගෙන නෑ. ඒක දැනගන්න වෙන්නෙ ලෙඩේ හැදුණාම තමයි.

ඒ වගේම කකුලක් හැපුව වගේ නෙවෙයි තුවාලය තියෙන්නෙ මූණේ වගේ නම් අවදානම තවත් වැඩි වෙනවා.

අනිත් එක ලෙඩේ හැදෙන අයගෙන් වැඩි පිරිස ළමයි. ඒ නිසා මේ ගැන ළමයි දැනුවත් කරන එකත් හරිම වැදගත්.

අමතක වෙන දේ තමයි සතෙක් හැපුවම ජලභීතිකාව වගේම පිටගැස්ම හැදෙන්නත් පුළුවන් කියන එක. ඒ නිසා අවුරුදු පහක් ඇතුළත පිටගැස්ම එන්නත විදලා නැති අය අමතක නොකර පිටගැස්ම එන්නතත් විදගන්නම ඕනෑ.

අන්තිම කාරණය මෙච්චරයි. ජලභීතිකාව එහෙමත් නැත්නම් පිස්සු බලු රෝගය කියන්නේ හැදුණොත් අනිවාර්යෙන් මැරෙන ඒත් හරිම ලේසියෙන් වළක්වාගන්න පුළුවන් ලෙඩක්.

**නුවන් තොටවත්ත**



'බද්දර මල්ල' ගැන ඔබේ අදහස් අපට කියන්න

'බද්දර මල්ල', දිනමිණ, අංක 35, ලේක් හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.

baddaramalla@lakehouse.lk

බද්දර මල්ල
සතියේ 'තුනපහ' මඩිස්සලේ

සංස්කරණය - දිල්රූ ජයසේකර

2021 මාර්තු 16 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.